77 වන කාණ්ඩය
7 වන කලාපය

සෙනසුරාදා
1968 පෙබරවාරි 24

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

## නිල වාර්තාව

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 983]

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත [තී. 1005] :
දෙවන වර කියවා "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.

කල් තැබීමේ යෝජනාව [තී. 1138]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තී. 1155]

PUBLIC LIBRARY
JAFFNA.

3053

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 77
இல. 7

சனிக்கிழமை
24 பெப்ருவரி 1968

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

328.5493


வினுக்களுக்கு வாய்மூல விடைகள் [ப. 983]

உள்நாட்டு இறைவரி (திருத்த) மசோதா [1005] :
இரண்டாம் மதிப்பு இடம்பெற்று நிலையற்குழு " ஏ " க்குச் சாட்டப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை [ப. 1138]

வினுக்களுக்கு எழுத்துமூல விடைகள் [ப. 1155]


Volume 77
No. 7

Saturday
24th February 1968

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS


ORAL ANSWERS TO QUESTIONS [Col. 983]

INLAND REVENUE (AMENDMENT) BILL [Col. 1005] :
Read a Second time, and allocated to Standing Committee "A"

ADJOURNMENT MOTION [Col. 1138]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 1155]


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලිපි ලේඛනාදිය

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

## பிரதிநிதிகள் சபை

## *House of Representatives*

**1968 පෙබරවාරි 24 වන සෙනසුරාදා**

*சனிக்கிழமை, 24 பெப்ருவரி 1968*

*Saturday, 24th February 1968*

---

**අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. කථානායකතුමා [ගරු එස්. සී. ෂර්ලි කොරයා] මූලාසනාරූඪ විය.**

*சபை, பி.ப. 2 மணிக்குக் கூடியது. சபாநாயகர் அவர்கள் [கௌரவ எஸ். சி. ஷேளி கொறயா] தலைமை தாங்கினார்கள்.*

*The House met at* 2 P.M., MR. SPEAKER [THE HON. S. C. SHIRLEY COREA] *in the Chair.*

---

# ලිපි ලේඛනාදිය පිළිගැන්වීම

## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்

## PAPERS PRESENTED

(1) A Regulation made under Section 6 of the Overseas Telecommunication Act, No. 61 of 1957, as amended by Act No. 8 of 1963.

(2) A Rule made under Section 94 (1) of the Ceylon State Mortgage Bank Ordinance (Cap. 398).—[*The Hon. Hurulle on behalf of the Minister of Finance.*]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

A set of Regulations made under Sections 143 (1) and 237 of the Motor Traffic Act (Cap. 203).—[*The Hon. Hurulle.*]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

පෙත්සම්

# පෙත්සම්

## மனுக்கள்

## PETITIONS

**ප්‍රින්ස් ගුණසේකර මයා.** (හබරාදූව)

*(திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ)*

(Mr. Prins Gunasekera—Habaraduwa)

ගරු කථානායකතුමනි, වැලිගම, වැලිපිටියේ, ඩී. එච්. සමරනායක නම් හිටපු ගුරු මහත්මයකු විසින් 1937 සිට අද දක්වා, අවුරුදු 31 කට අධික කාලයක් තුළ, තමාට විඳින්නට සිදු වී තිබෙන අමාරුකම් රාශියක් ගැන සඳහන් කරමින්, ඔබතුමාගේ මාර්ගයෙන් සහනයක් බලාපොරොත්තු වෙනවා. මේ හිටපු ගුරු මහත්මයාට මුහුණ පාන්නට සිදු වී තිබෙන ප්‍රශ්න ගැන සියලුම කරුණු මේ පෙත්සමේ සඳහන් කර තිබෙනවා. මේ පෙත්සමෙන් මා එක් වාක්‍යයක් පමණක් දැන් කියවන්නට අදහස් කරනවා :

"ලංකාණ්ඩුවේ ප්‍රසිද්ධ වෛද්‍ය සභාව වෙතට මා ඉදිරිපත් නොකර. මට විරුද්ධව මේ වෛද්‍ය සභාවේ සම්පූර්ණ අනුමතය හා සහතිකය ලබා නොගෙන මිට යා කර තිබෙන අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක ඒ ඊ 79/49 සහ 30. 8. 1958 දරණ ලිපියේ අඩංගු කර තිබෙන එයින් පෙන්නා දෙන තදබල අසත්‍ය අපරාධ චෝදනාව යටතේ 1937 වර්ෂයේ පෙබරවාරි මස 1 වෙනි දින සිට අද වන තුරු ගතවූ අවුරුදු 31 කට අධික කාලය තුළ,

(1) මගේ රැකීරක්ෂාව නැති කර දැම්මවද,

(2) මගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම නැති කර විනාශ කර දැම්මටද......... "

ආදී වශයෙන් කරුණු රාශියක් ගැන සඳහන් කරන මේ මහත්මයා ඔබතුමාගේ මාර්ගයෙන් යම්කිසි සහනයක් ලබා ගැනීමේ බලාපොරොත්තුවෙන් එවා තිබෙන මේ පෙත්සම මා ගරු සභාවට ඉදිරිපත් කරනවා.

**මහජන පෙත්සම් කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.**

*பொதுமனுக் குழுவுக்குச் சாட்ட கட்டளையிடப்பட்டது*

*Ordered to be referred to the Public Petitions Committee.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු

## வினுக்களுக்கு வாய்மூல விடைகள்

## ORAL ANSWERS TO QUESTIONS

### ඕපාත කුඩා තේවතු හිමියන්ගේ සමුපකාර සංගමය

### ஒப்பாத தேயிலை சிற்றுடைமையாளர் கூட்டுறவுச் சங்கம்

### OPATHA TEA SMALLHOLDERS' CO-OPERATIVE SOCIETY

2. **එච්. ජී. ඒ. කාරියවසම් මයා.** (බෙන්තර-ඇල්පිටිය)

(*திரு. எச். ஜீ. ஏ. காரியவசம்—பெந்தர-எல்பிற்றிய*)

(Mr. H. G. A. Kariyawasam—Bentara-Elpitiya)

**කෘෂිකර්ම හා ආහාර ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය:** (අ) ඕපාත කුඩා තේවතු හිමියන්ගේ සමුපකාර සංගමයේ සාමාජික සංඛ්‍යාව කොපමණද? (ආ) මෙතෙක් අයකළ කොටස් මුදල්වල වටිනාකම කොපමණද? (ඉ) කොපමණ මුදලක් බැංකුවේ තැන්පත් කර තිබේද? (ඊ) බැංකුවේ තැන්පත් මුදලක් නොමැති නම් එයට හේතු මොනවාද? (උ) ජූලි, අගෝස්තු, සැප්තැම්බර් යන මාසවලට සපයන ලද අමු දළුවලට සමහරුන්ට මෙතෙක් මුදල් ගෙවා නැති බව එතුමා දන්නේද? (ඌ) රජයේ වැවිලි සංස්ථාවට ජූලි, අගෝස්තු, සැප්තැම්බර් යන මාසවලදී සපයන ලද අමු දළුවලට මුදල් ලබාගෙන තිබෙන බව දන්නවාද? (එ) සමිතියේ සභාපති වශයෙන් සිටින ඇලෙක් සමරවික්‍රම මහතා 1948 සිට සභාපති වශයෙන් ක්‍රියා කරන බව දන්නවාද? (ඒ) මෙය සමුපකාර ආඥා පණතට පටහැනි නොවේද? (ඔ) සමිතියේ මුදල් තත්ත්වය පරීක්ෂාකර, වාර්තා කිරීමට විශේෂ නිළධාරියෙකු පත්කරනවාද? (ඕ) අලාභය අයකර ගැනීමට කිනම් මාර්ගයක් අනුගමනය කිරීමට බලාපොරොත්තු වෙනවාද?

*விவசாய, உணவு அமைச்சரைக் கேட்ட வினு: (அ) ஒப்பாத தேயிலை சிற்றுடைமையாளர் கூட்டுறவுச் சங்கத்தின் உறுப்பினர்களின் மொத்த எண்ணிக்கையென்ன? (ஆ) இதுவரையில் கொடுபட்டுள்ள பங்குகளின் பெறுமதியென்ன? (இ) வங்கியில் வைக்கப்பட்டுள்ள பணம் எவ்வளவு? (ஈ) வங்கியில் பணம் வைக்கப்படாமலிருந்தால், அதற்கான காரணங்களெவை? (உ) ஜுலை, ஆகஸ்து, செப்தம்பர் மாதங்களில் கொடுக்கப்பட்ட சில கொழுந்துகளுக்கு இன்னமும் பணம் கொடுபடவில்லையென்பதை அவர் அறிவாரா? (ஊ) ஜுலை, ஆகஸ்து, செப்தம்பர் மாதங்களில் அரசாங்கப் பயிர்ச் செய்கைக் கூட்டுத்தாபனத்திற்குக் கொடுக்கப்பட்ட கொழுந்துகளுக்குப் பணங் கொடுக்கப்பட்டு விட்டதை அவர் அறிவாரா? (எ) இப்பொழுது தலைவராயிருக்கும் திரு. அலெக் சமரவிக்கிரம அந்தப் பதவியில் 1948 ஆம் ஆண்டுமுதல் இருக்கிறுர் என்பதை அவர் அறிவாரா? (ஏ) இது கூட்டுறவுக் சட்டஜேச் சட்டத்தை மீறும் செயலல்லவா? (ஐ) இச் சங்கத்தின் நிதி நிலைமைபற்றி ஆராய்ந்து, அறிவிக்கவென விசேட உத்தியோகத்தர் ஒருவரை அவர் நியமிப்பாரா? (ஒ) நட்டங்களை மீட்பதற்கு என்ன நடவடிக்கைகளை எடுப்பதாக அவர் ஆலோசித்துள்ளார்?*

asked the Minister of Agriculture and Food: (*a*) What is the total membership of the Opatha Tea Smallholders' Co-operative Society? (*b*) What is the value of the shares subscribed so far? (*c*) What is the amount of money deposited in the bank? (*d*) If no money is in deposit in the bank, what are the reasons for this? (*e*) Is he aware that some of the green leaf supplied in July, August and September have not been paid for yet? (*f*) Is he aware that money has been received for green leaf supplied to the State Plantations Corporation in July, August and September? (*g*) Is he aware that the present president, Mr. Alec Samerawickrama, has functioned in that capacity since 1948? (*h*) Is this not a violation of the Co-operative Ordinance? (*i*) Will he appoint a special officer to investigate and report on the financial position of the society? (*j*) What action does he propose to take to recover the losses?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

**පී. සී. ඉඹුලාන මයා. (කෘෂිකර්ම හා ආහාර ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. பீ. சீ. இம்புலான—விவசாய, உணவு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. P. C. Imbulana—Parliamentary Secretary to the Minister of Agriculture and Food)

(අ) 337. (ආ) රු. 20,678.00. (ඉ) සමිතියේ ජංගම ගිණුමෙහි රු. 99.71 ක් දිනට ඉතිරිව ඇත. (ඊ) (ඉ) පිළිතුර අනුව පැන නොනගී. (උ) නැත. සපයන ලද අමු ද්‍රව්‍යවලට සියලුම සාමාජිකයින්ට මුදල් ගෙවා ඇත. (ඌ) ඔව්. (එ) ඔව්. (ඒ) නැත. (ඔ) දිනට අවශ්‍යතාවක් නැත. (ඕ) 67. 4. 30 දිනට කරන ලද ගණන් පරීක්ෂණය අනුව සමිතියට අලාභයක් සිදු වී නැත.

**කාරියවසම් මයා.**

*(திரு. காரியவசம்)*

(Mr. Kariyawasam)

මේ ඔපාත කුඩා තේ වතු හිමියන්ගේ සමුපකාර සංගමයේ සාමාජිකයන්ගෙන් කොටස්වලට මෙතෙක් අය කර තිබෙන මුදල රුපියල් 20,678 ක්ය කියා තමුන්නාන්සේ කිව්වා. නමුත් මේ සංගමයේ ජංගම ගිණුමෙහි තැන්පත් වී තිබෙන්නේ රුපියල් 99.71 ක් පමණයි. තැන්පත් මුදලක් වශයෙන් එපමණයි තිබෙන්නෙ. ඉතිරි මුදල් පිළිබඳව වංචාවක් සිදු වී තිබෙනවාය කියා හැඟීමක් සාමාජිකයන් අතර තිබෙනවා. ඇත්ත වශයෙන්ම වංචාවක් කර තිබෙනවා නම් එය කළ අයට දඬුවම් දෙන්නට ගරු ඇමතිතුමා යම්කිසි ක්‍රියා මාර්ගයක් ගන්නවාද යන ප්‍රශ්නය පමණක් මා අසනවා.

**ඉඹුලාන මයා.**

*(திரு. இம்புலான)*

(Mr. Imbulana)

වැරදි කර තිබෙනවා නම් දඬුවම් දෙන්නට අපි සෑම අවස්ථාවකදීම ලැහැස්තියි. මෙයට අතුරු පිළිතුරක් වශයෙන් මෙන්න මේ කොටස ගරු සභාවට කියෙව්වොත් මෙය අවබෝධ කර ගන්නට ගරු මන්ත්‍රීතුමාටත් පහසු වෙනවා ඇත කියා මා හිතනවා.

"පසුගිය මාස කීපය තුළ සාමාජිකයින්ගේ ද්‍රව්‍යවලට නිෂ්පාදකයින්ගේ වතුවලින් ලැබුණු මිල ගණන් අඩු නිසා සමිතිය සතු අරමුදලෙන් පමණ සාමාජිකයින්ට මුදල් ගෙවීමට සිදු වී ඇත. ණය වශයෙන් අය විය යුතු විශාල මුදලක්ද සාමාජිකයින්ගෙන් අයවීමට තිබේ."

සමහරවිට ඒ මුදල මේවාට යොදවා ඇති. ඕනෑ නම් දෙවනුව තවත් පරීක්ෂණයක් පවත්වනවා.

**කාරියවසම් මයා.**

*(திரு. காரியவசம்)*

(Mr. Kariyawasam)

දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි: මෙහි සාමාජිකයින්ගේ ද්‍රව්‍ය සභාපති මහත්මයාගේ වුවමනාවට ඒ සභාපති මහත්මයා කැමති ෆැක්ටරියකට නැත්නම් කම්හන්ත ශාලාවකට දී එයින් ලබාගත් රිසිට් පමණක් නේද ඒ අයට දෙන්නේ? එසේ නැතිව ඒවායේ ගණන් මිනුම් හරියට තබා තිබෙනවාද? ඒ නිසා තේ ද්‍රව්‍ය විකුණා අලාභයක් වුණාය කියන එක හරිද කියා සොයා බැලීමට නැවත සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වනවාද?

**ඉඹුලාන මයා.**

*(திரு. இம்புலான)*

(Mr. Imbulana)

අන්තිම වරට පරීක්ෂණයක් පවත්වා තිබෙන්නේ 1963 අප්‍රේල් 30 වැනිදායි. මන්ත්‍රීතුමාගේ ප්‍රකාශනය අනුව තවත් පරීක්ෂණයක් පවත්වන්නට කැමතියි.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

Question No. 5.

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ (ප්‍රවාහණ ඇමති)**

*(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)*

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

I have been asked by the Hon. Minister of Land, Irrigation and Power to ask for two weeks' time to answer this Question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

*வினாவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 6.

**ආර්. එම්. ධර්මදාස බණ්ඩා මයා.** (බිබිලෙ)
*(திரு. ஆர். எம். தர்மதாச பண்டா—பிபிலை)*
(Mr. R. M. Dharmadasa Banda—Bibile)
මම ඒ ප්‍රශ්නය ඉල්ලා අස් කර ගන්නවා.

**අවසර දෙන ලදුව, ප්‍රශ්නය ඉල්ලා අස් කර ගන්නා ලදී.**

**வினா அனுமதியுடன் வாபஸ் பெறப்பட்டது.**

***Question, by leave, withdrawn.***

## වෙල්ලස්සේ හාමාපොල වසමේ සිටි ග්‍රාම සේවක: බිබිලේ පොලීසියට කරන ලද පැමිණිල්ල

*வெல்லஸ ஹாமா பொல கிராம சேவகர் பிரிவு பிபிலை பொலிசில் செய்த முறைப்பாடு*

**GRAMASEVAKA, HAMAPOLA DIVISION, VELLASSA: COMPLAINT TO BIBILE POLICE**

7. **ධර්මදාස බණ්ඩා මයා.**
*(திரு. தர்மதாச பண்டா)*
(Mr. Dharmadasa Banda)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) මොනරාගල දිස්ත්‍රික්කයේ වෙල්ලස්ස ආදායම් පාලක කොට්ඨාශයේ හාමාපොල වසමේ, සිටි ග්‍රාම සේවක මහතාට පිරිසක් විසින් පහර දී දිනපොතද පැහැරගත් බව එතුමා දන්නවාද? (ආ) මේ පිළිබඳව එදිනම එකී ග්‍රාම සේවක මහතා විසින් බිබිල පොලීසියට පැමිණිල්ලක් කරන ලද බවත්, ඒ පිළිබඳව මෙතෙක් කිසිවක් කර නැති බවත් දන්නවාද? (ඉ) බදුල්ලේ සිටි සහකාර පොලිස් අධිකාරී මෙන්දිස් මහතා මේ පිළිබඳව විත්තිකරුවන්ට විරුද්ධව කටයුතු නොකරන ලෙසත්, පරීක්ෂණ ඇත්නම් ඒ සියල්ල නවත්වන ලෙසත්, බිබිලේ පොලිස් ස්ථානාධිපතිට නියෝග දී තිබේද? (ඊ) සහකාර පොලිස් අධිකාරී මෙවැනි නියෝගයක් දීමට පෙර මේ පිළිබඳව පරීක්ෂණයක් පවත්වා ලද්දේද? (උ) එසේ නම් ඒ කවදාද? කොහේදීද? (ඌ) එහි දී සාක්ෂි දුන් අය කවරහුද? (එ) මේ පිළිබඳව නැවත පරීක්ෂණ පවත්වා නීත්‍යානුකූලව කටයුතු කිරීමට අවශ්‍ය පියවර එතුමා ගන්නේද? (ඒ) නොඑසේ නම්, ඒ මන්ද?

*பிரதம அமைச்சரையும், பாதுகாப்பு வெளி விவகார அமைச்சரையும், திட்டவமைப்பு, பொருளாதார விவகார அமைச்சரையும், தகவல், ஒலிபர்ப்பு அமைச்சரையும் கேட்ட வினா: (அ) மொனருகலை மாவட்டத்தில் வெல்லஸ இறைவரி மாவட்டப் பிரிவிலுள்ள ஹாமபொல வசமத்தில் கடமையாற்றும் கிராமச் சேவகரை மக்கள் சிலர் கூட்டாகத் தாக்கி, அவரது நாட்பதிவேட்டையும் பறித்ததை அவர் அறிவாரா? (ஆ) இதுபற்றி இச்சம்பவம் நிகழ்ந்த நாளன்றே அக் கிராமச் சேவகர் பிபிலை பொலிசுக்கு முறைப்பாடு செய்த போதிலும், இதுபற்றி இற்றைவரை எவ்வித நடவடிக்கையும் எடுக்கப்படவில்லை என்பதை அவர் அறிவாரா? (இ) பதுளையிலுள்ள உதவிப் பொலிஸ் அதிகாரி மெண்டிஸ் அவர்கள் இதுபற்றி, குற்றஞ் சாட்டப்பட்டவருக்கு எதிராக எவ்வித நடவடிக்கையும் எடுக்க வேண்டாமென்றும் இதனுடன் தொடர்புடைய புலன் விசாரணைகள் நடாத்தப்படுகின்றனவாயின் எப்போது, எங்கே நடாத்தப்பட்டன? நிறுத்துமாறும், பிபிலை பொலிஸ் பொறுப்பதிகாரிக்கு அறிவுறுத்தியுள்ளாரா? (ஈ) உதவிப் பொலிஸ் அதிகாரி இவ்வண்ணம் அறிவுறுத்துவதற்கு முன்னர் இதுபற்றிப் புலன் விசாரணைகள் நடாத்தப்பட்டனவா? (உ) அங்ஙனமாயின், எப்போது. எங்கே நடாத்தப்பட்டன? (ஊ) விசாரணையின்போது சான்றளித்தவர்கள் யாவர்? (எ) இதுபற்றி மறு புலன் விசாரணை நடாத்துவதற்கும், வேண்டிய சட்ட நடவடிக்கை எடுப்பதற்கும் நடவடிக்கை எடுப்பாரா? (ஏ) அன்றேல், ஏன்?*

asked the Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting: (*a*) Is he aware that a group of people assaulted the Gramasevaka of Hamapola Division in the Vellassa District Revenue Officer's Division in the Monaragala District and grabbed

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

his diary ? (*b*) Is he aware that this gramasevaka made a complaint on that day itself to the Bibile Police regarding this matter and that no action has been taken so far about this matter ? (*c*) Had Mr. Mendis, who was the Assistant Superintendent of Police, Badulla, instructed the Officer-in-Charge, Bibile Police Station, not to take action against the accused and to stop all investigations if any are being conducted at the moment ? (*d*) Was an inquiry held regarding this matter before the assistant superintendent of police gave an order of this nature ? (*e*) If so, when and where ? (*f*) Who were the persons who gave evidence at that inquiry ? (*g*) Will he take steps to reinvestigate this matter and to take necessary legal action ? (*h*) If not, why ?

**ගරු ඩඩ්ලි සේනානායක (අග්‍රාමාත්‍ය, ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති, ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු පිළිබඳ ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමති)**

*(கௌரவ டட்லி சேனநாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்ட அமைப்பு, பொருளாதார விவகார அமைச்சரும், தகவல், ஒலிபரப்பு அமைச்சரும்)*

(The Hon. Dudley Senanayake—Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting)

(*a*) Yes. (*b*) The gramasevaka made a complaint and the Bibile Police have promptly conducted inquiries into the complaint. (*c*) No. (*d*) Does not arise in view of (*b*) and (*c*) above. (*e*) An inquiry was held on 24.6.67 at the Bibile Police Station. (*f*) M. P. Menika, witness to the incident. (*g*) Inquiries have already been made and action is being taken to file plaint against the respondents on the complaint of the gramasevaka. No reinvestigation is, therefore, necessary. (*h*) Does not arise.

**පළාත් පාලන සේවකයින්ට භාෂා වගන්තිය උඩ විශ්‍රාම ගැනීමට ඉඩ**

*உள்ளூராட்சி அரசாங்க ஊழியர் : மொழிச் சரத்துக் கமைய இளைப்பாறல்*

**LOCAL GOVERNMENT EMPLOYEES : RETIREMENT UNDER LANGUAGE CLAUSE**

**10. ආචාර්ය එන්. එම්. පෙරේරා** (යටියන්තොට)

*(கலாநிதி என். எம். பெரேரா—யட்டியாந் தோட்டை)*

(Dr. N. M. Perera—Yatiyantota)

පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්ගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) අංක 700 දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයේ විධි විධාන යටතේ භාෂා වගන්තිය උඩ විශ්‍රාම ගැනීමේ අයිතිය රජයේ සේවකයින්ට දෙන ලද බව එතුමා දන්නවාද? (ආ) පළාත් පාලන සේවයේ සේවකයින්ටත් මෙම සහනය දීමට අදහස් කර තිබේද? (ඉ) පළාත් පාලන සේවයේ සේවකයින්ටත් මෙම සහනය ලබා දීමේ යෝජනාව පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කර ඇති බව එතුමා දන්නවාද? (ඊ) මේ යෝජනාව ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වීමට හේතුව කුමක්ද?

*உள்ளூராட்சி அமைச்சரினதும் தகவல். ஒலி பரப்பு அமைச்சரினதும் பாராளுமன்றக் காரியதரிசியைக் கேட்ட வினா : (அ) 700 ஆம் இலக்கத் திறைசேரிச் சுற்றறிக்கையின்படி அரசாங்க ஊழியருக்கு மொழிச் சரத்திற் கமைய இளைப்பாறும் உரிமை வழங்கப் பட்டதை அவர் அறிவாரா? (ஆ) உள்ளூ ராட்சி அரசாங்க ஊழியர்கட்கும் இச்சலுகை யை வழங்க உத்தேசிக்கப்பட்டுள்ளதா? (இ) உள்ளூராட்சி அரசாங்கச் சேவை ஆணைக்குழு உள்ளூராட்சி அரசாங்க ஊழியர்கட்கு இச் சலுகை வழங்கப்பட வேண்டுமென்ற சிபார்சை அங்கீகரித்துள்ள தென்பதை அவர் அறிவாரா? (ஈ) இத்தீர்மானத்தை நடை முறைப்படுத்துவதில் காலதாமதமேற்படுவதன் காரணமென்ன?*

asked the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information and Broadcasting : (*a*) Is he aware

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

that under the provisions of Treasury Circular No. 700 government servants were given the right to retire under the language clause ? (b) Is it proposed to grant this concession also to empolyees of the Local Government Service ? (c) Is he aware that the L. G. S. C. has approved the proposal to extend this concession to employees of the Local Government Service ? (d) What is the reason for the delay in implementing this proposal ?

**ඉඹුලාන මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රචාරක හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්—වෙනුවට)**

*(திரு. இம்புலான—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி சார்பாக)*

(Mr. Imbulana—on behalf of the Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)

(a) Yes. (b) & (c) The matter is under consideration. (d) Does not arise in view of the answers to (b) and (c) above.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**

*(கலாநிதி என். எம். பெரேரா)*

(Dr. N. M. Perera)

Three years have passed and they are still making up their minds. I hope they will make up their minds after 1970 !

**එම්. පී. ද සොයිසා සිරිවර්ධන මයා.** (මිනුවන්ගොඩ)

*(திரு. எம். பீ. டி சொய்சா சிறிவர்தன—மினுவாங்கொட)*

(Mr. M. P. de Zoysa Siriwardena—Minuwangoda)

They will not have a chance after 1970.

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்லி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

We will still be here.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

1 වන ප්‍රශ්නය.

**ගාමිණී ජයසූරිය මයා. (අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. காமினி ஜயசூரிய—கல்வி, கலாசார விவகார அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Gamani Jayasuriya—Parliamentary Secretary to the Minister of Education and Cultural Affairs)

ඒ ප්‍රශ්නයට පිළිතුරු දීමට සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

**ටී. බී. එම්. හේරත් මයා.** (වලපනේ)

*(திரு. ரி. பி. எம். ஹேரத்—வலப்பனே)*

(Mr. T. B. M. Herath—Walapane)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුරු දීමට මේ කල් ඉල්ලන්නේ තුන් වැනි වතාවටයි. මෙහි තේරුම මොකක් ද ? මේ රටේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවක් නැද්ද ?

**නීල් ද අල්විස් මයා.** (බද්දේගම)

*(திரு. நீல் டி அல்விஸ்—பத்தேகம)*

(Mr. Neal de Alwis—Baddegama)

අවසානය ළං වන විට ඔහොම තමයි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදි.

விஞவை மற்ருெரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

3 වන ප්‍රශ්නය.

**ජයසූරිය මයා.**

*(திரு. ஜயசூரிய)*

(Mr. Jayasuriya)

ඒ ප්‍රශ්නයට පිළිතුරු දීමටත් සතියක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදි.

விஞவை மற்ருெரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## එච්. මර්සිලින් අප්පුහාමි දුම්මලසූරිය පොලීසියට කළ පැමිණිල්ල

திரு. எச். மார்சிலின், அப்புஹாமி, தும்மலசூரிய பொலிசில் செய்த முறைப்பாடு

## COMPLAINT OF MR. H. MARCELINE APPUHAMY TO DUMMALASURIYA POLICE

14. **ද සොයිසා සිරිවර්ධන මයා.** (ලක්ෂ්මන් ජයකොඩි මයා.—දිවුලපිටිය—වෙනුවට)

*(திரு. டி சொய்சா சிறிவர்தன—திரு. லக்ஷ்மன் ஜயக்கொடி—திவுலுபிட்டிய சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Lakshman Jayakody—Divulapitiya)

අග්‍රාමාත්‍ය සහ රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමති සහ ක්‍රම සම්පාදක හා ආර්ථික කටයුතු ඇමති සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) දුම්මලසූරිය පොලිස් වැසික්කියට අයිති කදුරුවැව ගමේ පදිංචි හදිරාගමගේ මර්සිලින් අප්පුහාමිට අයිති ගෙය බිඳ දොරවල් ජනෙල් කඩා දමා ඇති බවද, ඔහුගේ පියාවන එච්. ජෝකිනු අප්පුහාමිගේ අතද පොලු පහරක් වැදී කැඩී ඇති බවද, මෙය ඉහත කී පොලිසියට 1967 ජනවාරි 7 හෝ 8 වෙනිදා දැනුම් දුන් බවද එතුමා දන්නවාද? (ආ) මේ සම්බන්ධව එම පොලීසිය විත්තිකරුවන්ට නඩු නොපැවරුවේ මන්ද?

*பிரதம அமைச்சரையும், பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரையும் திட்ட அமைப்பு, பொருளாதார அமைச்சரையும் தகவல், ஒலிபரப்பு அமைச்சரையும் கேட்ட வினா: (அ) தும்மலசூரிய பொலிஸ் வட்டாரத்திற்குரிய கதுறுவெவ கிராமத்தில் இருக்கும் ஹதிராகமகே மார்சிலின் அப்புஹாமிக்கு உரிய வீடு இடிக்கப்பட்டு, கதவுகளும் சாளரங்களும் உடைக்கப்பட்டுள்ளன வென்பதையும் இவருடைய தந்தையான திரு. எச். ஜோக்கினு அப்புஹாமி அவர்களின் கைப்பொல்லினால் தாக்கப்பட்டுள்ள தென்பதையும், இதுபற்றி மேற்கூறிய பொலிசுக்கு 1967 ஆம் ஆண்டு ஜனவரி 7 அல்லது 8 ஆந் தேதி அறிவிக்கப்பட்ட தென்பதையும் அவர் அறிவாரா? (ஆ) இதுபற்றி மேற்படி பொலிசு எதிரிகள் மீது வழக்குத் தொடராததேன்?*

asked the Prime Minister, Minister of Defence & External Affairs, Minister of Planning & Economic Affairs and Minister of Information & Broadcasting; (*a*) Is he aware that the house belonging to Hadiragamage Marceline Appuhamy of Kaduruwewa in the Dummalasuriya Police area was burgled, its doors and windows smashed and that his father, H. Jokinu Appuhamy, fractured his arm due to a blow dealt with a club and this matter was reported to the Dummalasuriya Police on the 7th or 8th January 1967? (*b*) Why did not the police file action against the suspects?

**ගරු ඩඩ්ලි සේනානායක**

*(கௌரவ டட்ளி சேனநாயக்க)*

(The Hon. Dudley Senanayake)

(*a*) Yes. But the actual complaint made by Marceline Appuhamy on 8.1.67 was of mischief and causing simple hurt to him and his father, Jokinu Appuhamy. (*b*) The Dummalasuriya Police are taking action to file plaint against the respondent in the Kuliyapitiya Magistrate's Court.

## අඹනැන්න බැප්ටිස්ට් විද්‍යාලය

அம்பத்தென்ன பப்ரிஸ்ட் கல்லூரி

## AMBATENNA BAPTIST SCHOOL

8. **ද සොයිසා සිරිවර්ධන මයා.** (හේමචන්ද්‍ර සිරිසේන මයා.—අකුරණ පළමුවන මන්ත්‍රී—වෙනුවට)

*(திரு. டி சொய்ஸா சிறிவர்தன—திரு. ஹேமச்சந்திர சிரிசேன—அக்குறனை முதலாம் அங்கத்தவர் சார்பாக)*

(Mr. de Zoysa Siriwardena—on behalf of Mr. Hemachandra Sirisena—First Akurana)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: මහ/අඹනැන්න බැප්ටිස්ට් විද්‍යාලයේ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීමේදී සිදුවී ඇති අක්‍රමිකතාවයන් පිළිබඳව, 1967.9.1 දින, අධ්‍යාපන අමාත්‍යාංශයේ නව මුදල් වර්ෂයේ වැය ශීර්ෂය යටතේ කථා කරමින් අකුරණ පළමුවැනි පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විසින් ඉදිරිපත් කරනු ලැබූ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ද සොයිසා සිරිවර්ධන මයා.]

පැමිණිලි සම්බන්ධව දැනට කොපමණ දුරට ක්‍රියාකර තිබේදැයි එතුමා සඳහන් කරන වාද ?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா : 1.9.1967 அன்று, கல்வி அமைச்சுக்கான இவ்வாண்டுக்குரிய வரக்குப்பணம் எனும் தலைப்பில் உரையாற்றும்போது அக்குறணை முதல் பாராளுமன்ற அங்கத்தவர் கண்டி/அம்பத்தென்னை பப்ரிஸ்ட் கல்லூரிக் கட்டிடங்களைப் பழுதுபார்ப்பதில் ஏற்பட்டுள்ள சீர்கேடுகள் பற்றி குறிப்பிட்ட முறைப்பாடுகள் சம்பந்தமாக இற்றைவரை எவ்வளவுதூரம் நடவடிக்கை எடுக்கப்பட்டுள்ளது என்பதை அவர் தெரிவிப்பாரா ?*

asked the Minister of Education and Cultural Affairs : To what extent has action been taken so far regarding the complaints made by the first Member of Parliament for Akurana in the course of his speech of 1.9.1967 under the Votes of the Ministry of Education for the current financial year regarding the irregularities that have occurred in connection with the effecting of repairs to the buildings of the Ambatenna Baptist School ?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
**(Mr. Jayasuriya)**

I table the Answer to this Question.

**සභා මේසය මත තබන ලද පිළිතුර මෙසේ යි :**

*சபாபீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு :*

*The Answer tabled is as follows :*

අකුරණ 1 වැනි පාර්ලිමේන්තු මන්ත්‍රී හේමචන්ද්‍ර සිරිසේන මහතා විසින් 67.9.1 වැනි දින මැති සබයේදී අඹතැන්න බැප්ටිස්ට් විද්‍යාලයේ ගොඩනැඟිලි ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධයෙන් නගන ලද චෝදනාව වූයේ එම ප්‍රතිසංස්කරණ වැඩෙහි වහලයට යොදන ලද දැව් දඬු සමහරක් අනුමත නොවූ බාල වර්ගයේ ඒවා බවය. තවද එසේ එම බාල ලී වර්ග පාවිච්චියට ඉඩ දෙන ලද්දේ එම වැඩය කරන කොන්ත්‍රාත්කරු මහනුවර අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නෑයෙකු නිසා බව කියනු ලදී.

යථෝක්ත කොන්ත්‍රාත්තුව භාරගෙන කරන ලද්දේ ගුරු දෙගුරු සමිතිය විසිනි. එම ගුරු දෙගුරු සමිතියේ කිසිවකු මහනුවර අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නෑයෝ නොවෙති. වහලය ප්‍රතිසංස්කරණය කිරීමේදී බාල ලී වර්ග පාවිච්චි කළ [illegible] මත ද සත්‍යයෙන් තොර ප්‍රකාශයක් වග කියනු කැමැත්තෙමි. එම කොන්ත්‍රාත්තුවේ ප්‍රකාර පරණ වහලයේ තිබූ දිරා ගිය ලී අස් කර අලුත් ලී යොදා වැඩ නිම කිරීමටය භාරවී තිබුණේ. ඒ අනුව අලුතවයෙන් යොදන ලද දැව අනුමත ඒවා බව සඳහන් කරමි. එම වැඩය කරගෙන යාමේදී වහලයේ තිබුණු පරණ හොඳ ලී වර්ග පාවිච්චි කිරීමට ඉඩ තිබුනි. ඒ අනුව වහලය ප්‍රතිසංස්කරණය කිරීමේදී යොදන ලද ලී සියල්ල සතුටුදායකව තිබූ වග මගේ ගොඩනැඟිලි නියෝජිත නැන විසින්—පෞද්ගලිකව පරීක්ෂා කර බලා වාර්තා කර ඇත.

මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් මහනුවර දිසාපති කායසාලයේ පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ කාරක සභා රැස්වීමේදී ද ඇති වූ පැමිණිල්ලක් සම්බන්ධව අකුරණ මහජන මන්ත්‍රීවරුන් දෙදෙනා සහ මගේ ගොඩනැඟිලි ඉංජිනේරු නැන විසින් සාමූහිකව ගොඩනැඟිල්ල පරීක්ෂා කර බලා වාර්තා කිරීමට තීන්දුවක් ගන්නා ලදී. ඒ අනුව කලින් දැන්වීමක් කර මගේ ගොඩනැඟිලි ඉංජිනේරු නැන පාසැලට ගිය නමුත් ගරු මන්ත්‍රීවරුන් පැමිණ නැත. ගොඩනැඟිලි අලුත්වැඩියාව දෙපාර්තමේන්තුවේ—කොන්ත්‍රාත්තුවේ ප්‍රකාර සතුටුදායක ලෙස නිම කර දෙන ලද වග අවසාන වරට සඳහන් කරනු කැමැත්තෙමි.

The allegation made by the First Member of Parliament for Akurana (Mr. Hemachandra Sirisena) on 1.9.67 in the House of Representatives regarding the repairs to the buildings of Ambatenna Baptist School was that some of the timber used for the repair of the roof was of inferior and unapproved species. Further it was stated that the use of an inferior species of timber was allowed as the contractor who did the repair is a relative of the Regional Director of Education, Kandy.

The above contract was done by the Parent Teachers Association. None of the members of the Parent Teachers' Association was a relation of the Regional Director. I wish to state that it is a false declaration to say that inferior species of timber were used for the repair of the roof. The terms of contract were to remove the decayed timber from the roof and to complete the roof with new timber. Accordingly, the new timber used was of approved species. When the work was in progress there was a possibility of using the old good timber removed from the roof. My school works engineer has reported to me after personal inspection that all the timber used for the repair of the roof was satisfactory.

On a complaint made at a District Coordinating Committee meeting of the Kandy Kachcheri on this question it was agreed that both Members of Parliament for Akurana and my school works engineer should jointly inspect the building and furnish a report. Accordingly, although my school works engineer with

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

prior notice had gone to the school, the Members of Parliament had not turned up. Finally, I wish to state that according to the terms of the contract the repairs to the buildings had been completed satisfactorily.

## ඉලුපොතට යාමට මගුරු ගඟ හරහා බෝක්කුවක්

## இலுப்பொத்தவுக்கு—மகுறுகங்கைக்குக் குறுக்கே பாலம்

## BRIDGE ACROSS MAGURU-GANGA TO ILUPOTHA

9. ආචාර්ය එන්. එම්. පෙරේරා (ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා—අගලවත්ත—වෙනුවට)

(கலாநிதி என். எம். பெரேரா—கலாநிதி கொல்வின் ஆர். டி சில்வா—அகலவத்த—சார்பாக)

(Dr. N. M. Perera—on behalf of Dr. Colvin R. de Silva—Agalawatta)

රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අගලවත්ත ඡන්ද කොට්ඨාශයේ ලත් පඳුර තැපැල් ප්‍රදේශයට අයිති ඉලුපොත නමැති ගමට ඇනට ළඟා වීමට තිබෙන පාරවල් දෙකෙන් එකක් හැතැප්ම 3ක් පමණ පයින් ගමන් කරන්නට සිදුවී තිබෙන පාරක් බව එතුමා දන්නේද? (ආ) අනිත් පාර මෝල්කාවේ සිට අස්කෙලිය වත්ත හරහා මගුරු ගඟ ඉවුර දක්වා එන පුද්ගලික පාරක් බව එතුමා දන්නේද? (ඉ) අස්කෙලිය වත්ත හරහා ඇති පාරේ දුර හැතැප්ම 3 1/4 පමණ නිසාත් එම පාර මගින් ඉලුක්පොත ජනයාට විශේෂයෙන් හදිසි අවස්ථාවලදී ගමනාගමනය සඳහා වැඩි පහසුවක් සැලසෙන නිසාත් මගුරු ගඟෙන් එගොඩ වීමට පාලමක් නැතිකමේ අඩුපාඩුව පිරිමසා දීමට එතුමා සූදානම්ද? (ඊ) විශේෂයෙන් මගුරු ගඟ නිතර ගලන නිසා සාමාන්‍ය පාලමක් සෑදීම අමාරු නම් කම්බි පාලමක්වත් සෑදීමට එතුමා සූදානම්ද?

அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா (அ) அகலவத்தைத் தேர்தல் தொகுதியில் லத்பந்துற தபால் பகுதிக்குரிய இலுபொத்த என்னும் கிராமத்திற்குப் போவதற்கான இரண்டு பாதைகளில் ஒன்று 3 கட்டைவரை நடந்து செல்ல வேண்டிய பாதையாக இருப்பதை அவர் அறிவாரா? (ஆ) அடுத்த பாதை மோல்காவேயிலிருந்து அஸ்கெலிய தோட்டத்தினூடாக மகுறுகங்கைக் கரைவரை தனியாளுக்குச் சொந்தமான பாதை என்பதை அவர் அறிவாரா? (இ) அஸ்கெலிய தோட்டத்தினூடாக உள்ள பாதையின் நீளம் 3¼ கட்டையளவாக இருப்பதாலும், அப்பாதை இலுப்பொத்த மக்களுக்கு சிறப்பாக அவசரச் சந்தர்ப்பங்களின்போது போக்குவரத்திற்குப் போதிய வசதியாக இருப்பதாலும், மகுறு கங்கையைக் கடப்பதற்குப் பாலமில்லாத குறையை நீக்குவதற்கு அவர் தயாராயுள்ளாரா? (ஈ) சிறப்பாக, மகுறு கங்கை எப்பொழுதும் பெருக்கெடுப்பதால் சாதாரண பாலம் அமைப்பது கடினமாயின் கம்பிப் பாலம் அமைக்க அவர் தயாராயுள்ளாரா?

asked the Minister of Public Works, Posts and Telecommunications: (*a*) Is he aware that one of the two roads leading to the village called Ilupotha coming under the Lathpandura postal area in the Agalawatta Electorate, is a road where people have to travel on foot three miles? (*b*) Is he aware that the other road is a private road from Molkawa extending up to the banks of the Maguru-ganga through Askeliya Estate? (*c*) As the length of the road passing through Askeliya Estate is about 3¼ miles and as this road makes travelling more convenient for people, particularly during emergencies, is he prepared to fulfil the need for a bridge across Maguru-ganga for the people of Ilupotha to cross the river? (*d*) If it is difficult to construct an ordinary bridge, particularly because Maguru-ganga overflows its banks frequently, is he prepared to provide at least a suspension bridge?

**විජයපාල මෙන්ඩිස් මයා. (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමතියේ පාර්ලිමේන්තු ලේකම්)**

(திரு. விஜயபால மெண்டிஸ்—அரசாங்கக் கட்டுவேலை, தபால் தந்திப் போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. Wijayapala Mendis—Parliamentary Secretary to the Minister of Public Works, Posts and Telecommunications)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) නැත. (ඊ) නැත. මෙම පාරවල් රජයේ වැඩ දෙපාර්තමේන්තුවට අයත් නැත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කාරියවසම් මයා.**
(திரு. காரியவசம்)
(Mr. Kariawasam)

අතුරු ප්‍රශ්නයක් අසන්න කැමතියි. එම ගමට යාම සඳහා වෙනත් ප්‍රසිද්ධ හෝ අප්‍රසිද්ධ පාරක් නැති නිසා ඒ පාරවල් දෙක රජයට ගෙන රජයේ වැඩ දෙපාර්ත මේන්තුව යටතට ගැනීමට කටයුතු කරනවාද ?

**විජයපාල මෙන්ඩිස් මයා.**
(திரு. விஜயபால மெண்டிஸ்)
(Mr. Wijayapala Mendis)

ඒ ගැන සලකා බලන්නම්.

## දොඩන්ගස්ලන්දේ නැලඋල්ල රජයේ වැවිල්ල

தொடங்கஸ்லந்தை நெலவுல்ல அரசினர் விவசாயப் பண்ணை

NELAULLA GOVERNMENT PLANTATION, DODANGASLANDA

11. **ද සොයිසා සිරිවර්ධන මයා.** (ඩී. ඩී. එල්. ලෙටිෂියා රාජපක්ෂ මිය.—දොඩන් ගස්ලන්ද—වෙනුවට)
(திரு. டி சொய்ஸா சிறிவர்தன—திருமதி டீ. டீ. எல். லெரிஷியா ராஜபக்ஷ—தொடங் கஸ்லந்த—சார்பாக)
(Mr. de Zoysa Siriwardena—on behalf of Mrs. D. D. L. Leticia Rajapaksa—Dodangaslanda)

ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති ගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ දොඩන්ගස්ලන්ද ආසන යේ පිහිටි නැලඋල්ල රජයේ වැවිල්ල කොපමණ අක්කර ප්‍රමාණයකින් යුක් තද ? (ආ) මෙම රජයේ වැවිල්ලේ වගා කළ හා වගා නොකළ බිම් ප්‍රමාණයේ අක්කර ගණන කොපමණද ? (ඉ) එහි වගාකර ඇත්තේ කුමක්දැයි හා ඒ ඒ වගාවල් වල බිම් ප්‍රමාණය කොපමණදැයි එතුමා අක්කර ගණනින් සඳහන් කරන වාද ? (ඊ) මෙම වැවිල්ල රජයට පවරා ගත් දින සිට මේ තාක් කොපමණ මුදලක් පාඩු හෝ ලාබ වී ඇද්ද ? (උ) මෙම රජයේ වැවිල්ලේ වගා නොකළ සම් පූර්ණ බිම් ප්‍රමාණය මාදුරය කෝරලයේ හා හේවා විස්ස කෝරළයේ ඉඩම් නැති ගොවීන් අතර බෙදා දීමට එතුමා ක්‍රියා කරනවාද ? (ඌ) නොඑසේ නම්, ඒ මන්ද ?

காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரைக் கேட்ட வினா: (அ) குருநாகல் மாவட்டத்தில், தொடங்கஸ்லந்தைத் தொகுதியிலுள்ள நெல வுல்ல அரசினர் விவசாயப் பண்ணையின் பரப்பு யாது? (ஆ) இந்த அரசினர் கமத் தொழிற் பண்ணையில் பண்படுத்தப்பட்டுள்ள பிரதேசத்தின் பரப்பும், பண்படுத்தப்படா திருக்கும் பிரதேசத்தின் பரப்பும் யாவை? (இ) அங்கு பயிரிடப்பட்டிருக்கும் பயிர்களின் பட்டியலையும், அவை ஒவ்வொன்றும் விளை விக்கப்பட்டுள்ள ஏக்கர் அளவுப் பட்டியலையும் அவர் தருவாரா? (ஈ) வேளாண்மைக்கேற்ற இக்காணியை அரசாங்கம் ஏற்றுக்கொண்ட நாள் முதல் இதுவரை எவ்வளவு நட்டம் அல்லது இலாபம் பெற்றுள்ளது? (உ) இக் கமத்தொழிற் பண்ணையில் பண்படுத்தப்படாத பிரதேசத்தை, மாதுர கோறளையினதும், ஹேவாவிஸ்ஸ கோறளையினதும் காணியில் லாத கமக்காரர்களுக்கு பகிர்ந்தளிப்பதற்கு அவர் நடவடிக்கை எடுப்பாரா? (ஊ) இன்றேல், ஏன்?

asked the Minister of Land, Irrigation and Power: (*a*) What is the extent of the Nelaulla government plantation situated in the Dodangaslanda Eelctorate in the Kurunegala District? (*b*) What are the extents of the cultivated and uncultivated portions of this government plantation? (*c*) Will he specify the crops cultivated and state the acreage under each crop? (*d*) What is the loss incurred or profit earned since the date on which the plantation was taken over? (*e*) Will he take action to alienate the entire uncultivated area of this government plantation among landless cultivators in Maduraya Korale and Hewawissa Korale? (*f*) If not, why?

**ගරු හුරුල්ලේ** (ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති හා සභානායක වෙනුවට)
(கௌரவ ஹுருல்ல—காணி, நீர்ப்பாசன, மின்விசை அமைச்சரும் சபை முதல்வரும் சார்பாக)
(The Hon. Hurulle—on behalf of the Minister of Land, Irrigation and Power and Leader of the House)

(*a*) Nella Oolla plantation situated in the Kurunegala District in the Dodangaslanda Electorate is 884

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

acres in extent. (*b*) This government plantation consists of 532 acres cultivated and 352 acres uncultivated. (*c*) The crops cultivated and the acreage under each crop are as follows: tea 157 acres abandoned, and investigations are under way for replanting in avocado; rubber, 100 acres; cardamoms, 74 acres; cashew, 100 acres; mango, 100 acres; coffee, 1 acre. (*d*) Since this property was taken over by the Government a profit of Rs. 109,357.41 has been made. (*e*) No. (*f*) Mango and cashew have been cultivated in an extent of 100 acres, each on an experimental basis, and depending on the results it is proposed to expand the cultivation of these two crops by the corporation. Regarding the uncultivated land, action has already been taken to lease out small extents of cultivable land on annual agreements to the estate workers for the purpose of growing food.

## අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා විභාගශාලාධිපතීන් හා නිරීක්ෂකයින් පත් කිරීම

க. பொ. த. (சாதாரண) தேர்வு மேற்பார்வையாளர் களும் அவதானிகளும்

## SUPERVISORS AND INVIGILATORS, G.C.E. (ORDINARY LEVEL) EXAMINATION

12. **ද සොයිසා සිරිවර්ධන** මයා. (එම්. ඊ. රත්වත්තෙ මිය.—බලන්ගොඩ—වෙනුවට)

(*திரு. டி சொய்ஸா சிறிவர்தன—திருமதி எம். ஈ. ரத்வத்த—பலாங்கொடை—சார்பாக*)

(Mr. de Zoysa Siriwardena—on behalf of Mrs. M. E. Ratwatte—Balangoda)

අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) විභාග දෙපාර්තමේන්තුව මගින් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයට, විභාගශාලාධිපතීන් සහ නිත්‍ය නිරීක්ෂකයන් පත් කරන බව එතුමා දන්නේද? (ආ) එසේ නම්, මොන සුදුසුකම් උඩ ඔවුන් පත් කරන්නේද? (ඉ) එසේ පත් කිරීමේදී ගුරු මහතුන්ගේ හෝ මහත්මියන්ගේ ජ්‍යෙෂ්ඨ භාවය ගැන නොසලකන්නේද?

*கல்வி, கலாசார விவகார அமைச்சரைக் கேட்ட வினா: (அ) தேர்வுத் திணைக்களத்தின் வாயிலாக நடாத்தப்படும் கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண)த் தேர்வுக்கு தேர்வு மண்டப மேற்பார்வையாளர்களும், நிரந்தர அவதானிகளும் நியமிக்கப்படுவதை அவர் அறிவாரா? (ஆ) அங்ஙனமாயின். எத் தகைமைகளை அடிப்படையாக வைத்து அவர்கள் நியமிக்கப்படுகின்றார்கள்? (இ) அவ்வாறு நியமிக்கப்படும்போது ஆசிரிய, ஆசிரிகைகளின் மூப்புநிலை கவனிக்கப்படமாட்டாதா?*

asked the Minister of Education and Cultural Affairs: (*a*) Is he aware that supervisors and permanent invigilators are appointed for the General Certificate of Education (Ordinary Level) Examination by the Department of Examinations? (*b*) If so, what are the qualifications on which they are appointed? (*c*) Is the seniority of teachers taken into consideration in making these appointments?

**ජයසූරිය මයා.**

(*திரு ஜயசூரிய*)

(Mr. Jayasuriya)

(අ) විභාගශාලාධිපතීන් සහ නිත්‍ය නිරීක්ෂකයින් පත්කරනු ලබන්නේ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ සහ ප්‍රධාන අධ්‍යාපන නිලධාරීන්ගේ නිර්දේශයන් අනුව විභාග දෙපාර්තමේන්තුව මගිනි. (ආ) විශිෂ්ඨ ශ්‍රේනි සහ ශ්‍රේණි I, II සහ III විදුහල්පතීන්, අධ්‍යාපන උපදේශකවරුන්, මාණ්ඩලික අධ්‍යාපන නිලධාරීන්, පුහුණු උපාධිධාරීන්, නුපුහුණු උපාධිධාරීන්, පුහුණු ගුරුවරුන් සහ සහතික පත්‍ර ලත් ගුරුවරුන්. (ඉ) ඔවුන් තෝරා ගැනීමේදී ජ්‍යෙෂ්ඨතාවය පමණක් නොව, රාජකාරියට ඇති සුදුසු බව, විශ්වාසදායක බව සහ කාර්යශීලී බව ගැනද සැළකිලිමත් වේ.

**ටී. බී. එම්. හේරත් මයා.**

(*திரு. ரி. பி. எம். ஹேரத்*)

(Mr. T. B. M. Herath)

අතුරු ප්‍රශ්නයක් කථානායකතුමනි. මහ නුවර අධ්‍යාපන කායර්‍යාලයේ සහ නුවර එළිය අධ්‍යාපන කායර්‍යාලයේද විභාගශාලාධිපතීන් සහ නිත්‍ය නිරීක්ෂකයන් තේරීමේදී එහි නිලධාරීන්ට යම් යම් වාසි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]
සලසන අය පමණක් තෝරු බව එතුමා දන්නවාද? එසේ නම් ඔවුන් ගැන පරීක්ෂණයක් පවත්වනවාද?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
මා ඒ ගැන දන්නේ නැහැ. එහෙත් විශේෂයෙන් චෝදනාවක් ඉදිරිපත් කළහොත් සොයා බැලිය හැකියි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
එසේ නම් මා දැන් ඒ චෝදනාව නඟනවා. මහනුවර සහ නුවරඑළිය අධ්‍යාපන කාර්යාලවල ඒ තේරීම් කෙලේ පෞද්ගලික සැලකිලි උඩ නිසා ඒ ගැන කරුණාකර ඇමතිතුමා සලකා බලනවාද?

**ජයසූරිය මයා.**
*(திரு. ஜயசூரிய)*
(Mr. Jayasuriya)
ඒ ප්‍රශ්නයට මා පිළිතුරු දුන්නා.

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
Question No. 13.

**එන්. විමලසේන මයා. (මුදල් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. என். விமலசேன—நிதி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. N. Wimalasena—Parliamentary Secretary to the Minister of Finance)
I want a month's time to answer this Question.

**ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.**

**வினவை மற்றொரு தினத்துக்குச் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.**

***Question ordered to stand down.***

**ටී. බී. සුබසිංහ මයා. (කටුගම්පොළ)**
*(திரு. ரீ. பி. சுபசிங்க—கட்டுகம்பொளை)*
(Mr. T. B. Subasinghe—Katugampola)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධව ප්‍රශ්නයක් මතු කරන්නට පුළුවන්ද?

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
(Mr. Speaker)
The Question has not been answered.

**සුබසිංහ මයා.**
*(திரு. சுபசிங்க)*
(Mr. Subasinghe)
මෙවැනි ප්‍රශ්නයකට මීට පෙර වතාවක අධ්‍යාපන කටයුතු පිළිබඳ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා දුන් පිළිතුරකින් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය විස්තර කර තිබෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
Then why do you ask the Question?

**සුබසිංහ මයා.**
*(திரு. சுபசிங்க)*
(Mr. Subasinghe)
ඒ ප්‍රතිපත්තිය උඩ ක්‍රියා කරන්නේ නැහැ.

## නොපැමිණීමේ අවසරය: ඇලික් අලුවිහාරේ මයා.

## வராதிருக்க அனுமதி : திரு. அலிக் அலுவிஹார

## LEAVE OF ABSENCE: MR. ALICK ALUVIHARE

**ගරු ජේ. ආර්. ජයවර්ධන (රාජ්‍ය ඇමති සහ අග්‍රාමාත්‍යතුමාගේත් ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිගේත් පාර්ලිමේන්තු ලේකම්)**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன—இராஜாங்க அமைச்சரும் பிரதம அமைச்சரதும் பாதுகாப்பு வெளிவிவகார அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசியும்)*
(The Hon. J. R. Jayewardene—Minister of State and Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)
I move,

"That Mr. Alick Aluvihare, Member for Matale, be granted leave under Section 24 (i) (e) of the Ceylon (Constitution) Order in Council, 1946, to be absent

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

from the Sittings of the House for a period of three months from 24th February 1968."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

## දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත

*உள்நாட்டு இறைவரி (திருத்த) மசோதா*

## INLAND REVENUE (AMENDMENT) BILL

කල් තබන ලද විවාදය තව දුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය [පෙබරවාරි 22.]

"කෙටුම්පත් පණත දැන් දෙවන වර කියවිය යුතුය."—[ගරු වන්නිනායක.]

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.

பெப்ரவரி 22 ஆம் தேதிய வினா மீதான ஒத்திவைக்கப்பெற்ற விவாதம் மீள ஆரம்பிப்பதற்கான கட்டளை வாசிக்கப்பட்டது.

"மசோதா இப்பொழுது இரண்டாம் முறை மதிப்பிடப்படுமாக"—[கௌரவ வன்னிநாயக்க]

வினா மீண்டும் எடுத்தியம்பப்பெற்றது.

*Order read for resuming Adjourned Debate on Question—[22nd February.]*

"That the Bill be now read a Second time."—[*The Hon. Wanninayake.*]

*Questions again proposed.*

අ. භා. 2.17

**එම්. තෙන්නකෝන් මයා.** (නිකවැරටිය)

*(திரு. எம். தென்னக்கோன்—நிக்கவெரட்டிய)*

(Mr. M. Tennakoon—Nikaweratiya)

ගරු කථානායකතුමනි, ඊයේ අප විසින් විසිර යන අවස්ථාවේදී සාකච්ඡා කරමින් සිටියේ විදේශික රටවලින් මේ රටට සේවකයින්—

**ගරු ඩී. ෂෙල්ටන් ජයසිංහ** (වැඩ බලන කර්මාන්ත හා ධීවර ඇමති)

*(கௌரவ ஷெல்டன் ஜயசிங்ஹ—பதில் கைத்தொழில், கடற்றொழில் அமைச்சர்)*

(The Hon. D. Shelton Jayasinghe—Acting Minister of Industries and Fisheries)

පිළිතුරක් දෙනවා නම් කථා නොකරම වාඩි වෙනවාය කිව්වා.

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னக்கோன்)*

(Mr. M. Tennakoon)

විදේශික රටවලින් මේ රටට ගෙන්වන සේවකයන් පිළිබඳවයි, ඊයේ රැස්වීම කල් තැබීමේ අවස්ථාව වන විට අප සාකච්ඡා කරමින් සිටියේ. අද අපේ රාජ්‍ය කට යුතු පිළිබඳ ගරු ඇමතිතුමා මෙතැන සිටීම ගැන මා සන්තෝෂ වෙනවා. මා සන්තෝෂ වන්නේ ඇසූ ප්‍රශ්නවලට ඉතා පැහැදිලි ලෙස විස්තර සහිතව සම්පූර්ණ පිළිතුරු එතුමාගේ කථාවෙන් අපට අසන්නට ලැබේය යන විශ්වාසය මා තුළ තිබෙන නිසයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**

*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*

(The Hon. J. R. Jayewardene)

පින්තූරත් එක්ක.

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னக்கோன்)*

(Mr. M. Tennakoon)

ඉස්සරවෙලා පින්තූර බලා, අපට ඊළඟට විස්තර දෙනවාද? මා ඊයේ පෙන්වූ පින්තූර අද පෙන්වන්නේ නැහැ. එකම දේ නැවතත් පෙන්වනවායයි ඔබතුමා එතකොට කියනවා ඇති. ඒ නිසා එකම පින්තූර තවත් සැරයක් පෙන්වන්නට වුවමනා කරන්නේ නැහැ.

**කථානායකතුමා**

*(சபாநாயகர் அவர்கள்)*

(Mr. Speaker)

වැඩිය පෙන්වන්නට එපා.

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னக்கோன்)*

(Mr. M. Tennakoon)

කෙසේ වෙතත් ඊයේ අප සාකච්ඡා කරමින් සිටියේ විදේශික සේවකයින් මේ රටේ හෝටල් සංස්ථාවට සේවය පිණිස ගෙන්වන්නට ඇති ඉඩකඩ ගැනයි. මා ළඟ තිබෙන පොතෙන් කොටස් උපුටා කියවන්නම්:

"The savings of foreign personnel employed may be transferred abroad on retirement."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(கௌரவ ஷெல்றறன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)
සිංහලෙන්ද ඔය කියවන්නේ ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
පොතේ තියෙන්නේ ඉංගිරිසියෙනුයි. මම එය කියවා පසුව සිංහලයට පෙරළා කියවන්නම්. සිංහල පොතක් නැහැ නොවැ. සිංහලයෙන් තියෙනවාද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සේ විදේශිකයෙක් යැ ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ඒක හරි. පනතේ තියෙන හැටියට නම් විදේශිකයකු වීම, ස්වදේශිකයකු වෙනවාට වඩා වාසිදායකයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඔය පොත පොඩි පුතුන්ට නොවෙයි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ගරු කථානායකතුමනි, අප සාකච්ඡා කළේ වයසින් අවුරුදු දහඅටක පමණ තරුණයෙක් මේ රටේ හෝටල් සංස්ථාවේ සේවකයකු හැටියට ගෙන්වීමෙන් පසු—අවුරුදු දහ අටකැයි උදාහරණයකට ගත්තේ එය සාමාන්‍යයෙන් රක්ෂාවකට යන වයස නිසයි; ඒ වාගේම ඡන්දබලය පාවිච්චි කරන්නට පුළුවන්කම ලැබෙන වයස නිසයි—ඔහු ගල්කිස්සේ හෝටලයට හෝටල් සංස්ථාව යටතේ සේවයේ යොදනවාය කියා අපි හිතමු. මේ තරුණ මහත්මයා එහාට එනවා. ඔහු වයස අවුරුදු 18ක පමණ කෙනෙක්. ශාන්ත තෝමස් විද්‍යාලය තිබෙන්නේත් ඒ ළඟමයි. කොයි විධියේ සම්බන්ධකම් ඇති කර ගන්නවාදැයි කියන්නට මා දන්නේ නැහැ. ඔහු එහි හෝටල් සංස්ථාවේ සේවකයකු වෙනවා ඇති. ඒ සේවක මහත්මයාගේ පවුලේ හත් දෙනකු ඉන්නවා නම්—ඔහු ආවේ එංගලන්තයෙන් වෙන්නට පුළුවනි. එහෙම නැත්නම් ඇමෙරිකාවෙන් වෙන්නට පුළුවනි—ඒ සේවක මහත්මයාට තමුන්ගේ පවුලේ සම්පූර්ණ නඩත්තුව පිණිස ඕනෑ තරම් මුදල් යවන්නට අවස්ථාව ලැබෙනවා. මේ අවස්ථාවෙදි අපි පෙන්නුම් කර දෙන්ට ලැහැස්ති වෙන්නෙ මේ ව්‍යාපාර සඳහා මුදල් යොදවන ඒ ඒ විදේශික සමාගම්වලට මේ බලතල අයුතු විධියට පාවිච්චි කරමින් හෝටල් සංස්ථාව මගින් අයුතු ප්‍රයෝජන ලබා ගන්ට බැරිද කියන කාරණයයි. පසුගිය කාලයේදී මේ රටේ තේ සමාගම් කොයි තරම් කරදර කළාද කියන කාරණය අපි දන්නව. ගුණසිංහ මහත්මයා වෘත්තීය සමිති කටයුතුවල යෙදී සිටි මුල් කාලයේදී ලාංකිකයන්ට වතුවල රක්ෂාව ලබා දීම සඳහා විශාල ව්‍යාපාරයක් ගෙන ගියා. මේ සම්බන්ධයෙන් ඒ කාලයේ අමාත්‍යාංශයේ එක්තරා අංශයක් පිහිටුවා කටයුතු කරගෙන යන්ට සිද්ධ වුණා. ගොවිතැන පිළිබඳව විශේෂ දක්ෂතාවක් ලබා ගත් වතු සේවයේ යෙදෙන්ට පුළුවන්කම තිබෙන ඉතා දක්ෂ තරුණයන් ඒ කාලයේ මේ රටේ නොයෙකුත් විද්‍යාලවලින් පිට වුණා. එහෙත් වතු සමාගම් ඔවුන් සේවයේ යෙදෙව්වෙ නැහැ. හැම වෙලේම කොම්පැණිකාරයින් බලාපොරොත්තු වුණේ ඒ ඇත්තන්ගේ රටින් මිනිසුන් මෙහාට ගෙන්වා ඔවුන්ට නොයෙක් සැප පහසුකම් සලසමින් අපේ මුදල් ටික ඒ රටවලට යවන්ටයි. ඉදිරියට ඒ ක්‍රමයම මේ හෝටල් සංස්ථාවෙන් ඇති වෙන්නෙ නැද්ද කියා ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මා අහනව. මෙහි තිබෙන භයානකකම ඒකයි. [බාධා කිරීමක්] ඒවා ගැන කථා කරන්ට ගියොත් ඔබතුමා මට අණ කරයි ඉඳ ගන්න කියා. එතකොට ඒ අණට යටත් වෙලා මට ඉඳ ගන්ටයි වෙන්නෙ. ඒ නිසා මා ඒවා ගැන දිගට කියන්ට යන්නෙ නැහැ.

ගරු කථානායකතුමනි, මේ පොතේ යොදා තිබෙන ප්‍රශ්න සහ පිළිතුරු ගැන නම් වචනයක් දෙකක් කියන්ට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිංහල පොත ඇමතිතුමා මට නොදෙන නිසා මේ ප්‍රශ්න සහ උත්තර මට ඉංග්‍රීසි යෙන්මයි කියන්ට සිද්ධ වෙන්නෙ. ප්‍රශ්නය මේකයි :

"I hope to commence operating a hotel for tourists on January 1, 1968. For what period will I be entitled to a tax holiday ?"

"මම 1968 ජනවාරි මාසයේ 1 වෙනිදා හෝටලයක් පටන් ගන්නව. කොපමණ කාලයක් ගතවන තුරු මට ආදායම් බදු නිදහස ලැබෙනවාද ?" කියන එකයි ප්‍රශ්නය. උත්තරය මේකයි :

"Assuming that your undertaking will be gazetted by the Minister of Finance, the profits for the following periods will be exempt. . . . "

එහි තේරුම 1968-60 වර්ෂයේ සිට 1972-73 වර්ෂය දක්වා කාලය තුළ සම්පූර්ණ යෙන්ම ආදායම් බදු සහනයක් ලැබෙනවා කියන එකයි. ඊට වඩා තවත් දෙයක් තිබෙනව. සම්පූර්ණයෙන්ම අවුරුදු 15 ක බදු නිවාඩුවක් ලැබෙනව.

මේ විධියට තවත් ප්‍රශ්නයක් අහනව :

"I hope to construct a building and use it for the running of a hotel for tourists. Will I be entitled to a five-year tax holiday ?"

ගොඩනැගිල්ලක් සෑදීමේ කටයුත්ත සඳහා අවුරුදු 5 ක බදු සහනයක් කෙලින්ම දෙන බව ඒ ප්‍රශ්නයෙන් සහ පිළිතුරෙන් පැහැදිලි වෙනව.

මම ඊයෙ මතක් කළා වගේ යාපහුවේ කන්ද උඩ තිබෙන රාජධානිය බලන්ට යන උදවියට නවාතැන් ගැනීම සඳහා යම් කෙනෙකු ගෙයක් සාදා ගරු මුදල් ඇමතිතුමාට ඇවිත් ඔහු කිව්වොත් අපේ ඡන්ද කොට්ඨාශයේ මන්ත්‍රීතුමා හැටියට කරුණාකර මේක ගැසට් කර දෙන්න කියා එතුමා ඒක අනුමත කර රාජ්‍ය ඇමතිතුමාට ඉදිරිපත් කළොත් රාජ්‍ය ඇමතිතුමා ඒක රෙකමදාරු කරයිද ? ඒක කොහොමවත් වෙන්නෙ නැහැ. යාප හුවේ ගෙයක් හදාගෙන ඉන්න අපේ ගොවි මහත්මයෙක් සංචාරකයන් සඳහා ඒ නිවාසයේ පහසුකම් සලසන්න හිතා ගෙන ඒකෙ හොඳට හුණු ටිකක් එහෙම ගාල, කොලපාට තීන්ත ටිකක් එහෙම ගාල ඇවිත් ගරු මුදල් ඇමතිතුමාට කියයි, "අනේ මන්ත්‍රීතුමනි, ගරු මුදල් ඇමතිතුමනි, හෝටල් සංස්ථාවට මේක භාර දෙන්න කොහොම හරි රෙකමදාරු කර දෙන්න" කියා. එවිට සමහරවිට ගරු මුදල් ඇමතිතුමා කියයි, "මම ඔවට ඇඟිලි ගහන කෙනෙකු නොවෙයි. ඕනෑ නම් මම ඉල්ලුම් පත්‍රය කෙලින්ම රාජ්‍ය ඇමතිතුමාට අරින්නම්" කියා. එතුමා ඇඟිලි ගහන්නෙ නැහැ. ඒ ගැන ගරු මුදල් ඇමතිතුමාට අපි ගරු කරනව. නියම විධියට රාජකාරිය කරනව. රාජ්‍ය ඇමතිතුමා ඒ ඉල්ලුම් පත්‍රය අනුමත කරල කියයිද මේක ගැසට් කරන්න කියා

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඔව්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ස්තුතියි. මෙන්න ඒ පොතේ තිබෙන තවත් ප්‍රශ්නයක් :

"I am constructing a building to be used as a hotel. As from April 1, 1969, I shall be getting a rent of Rs. 25,000 per month. Will I be entitled to a five-year tax holiday ?"

උත්තරය මෙයයි :

"If your undertaking is gazetted by the Minister of Finance. . . "

මුදල් ඇමතිතුමා හැම විටම අත්සන් කරන්නට ඕනෑ. අපි අනුකම්පා කරනවා මුදල් ඇමතිතුමාට.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මොකක්ද ඔය පොත ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ඔබතුමා බලාපොරොත්තු වුණු දේවල් සනාථ වන අන්දමට කරුණු අඩංගු තිබෙන පොත මෙයයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කථානායකතුමා**
*(சபாநாயகர் அவர்கள்)*
**(Mr. Speaker)**
**ඔය පොතේ නම මොකක්ද?**

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
**(Mr. M. Tennakoon)**
"Tax Concessions for the Promotion of Tourism", published by the Inland Revenue Department, Colombo, Ceylon.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
**(The Hon. J. R. Jayewardene)**
ඒක මගේ නොවෙයි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
**(Mr. M. Tennakoon)**
මේ පොත පිටවී තිබෙන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් නිසා තමුන්නාන්සේ මෙය මුදල් ඇමතිතුමාගේය කියාවි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
**(The Hon. Dudley Senanayake)**
වන්නියේ පොතක්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
**(Mr. M. Tennakoon)**
පොත පදනම් වී තිබෙන්නේ, "Extracts from 'Government Policy on Private Foreign Investment'."
කියන ප්‍රතිපත්තිය උඩයි. ඒක ගරු අග මැතිතුමාගේ යි.

Issued by the Ministry of Planning and Economic Affairs in March 1966.

මේක තමුන්නාන්සේලාගේ නොවෙයිද?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
**(The Hon. J. R. Jayewardene)**
අපේ නොවේය කියන්නේ නැහැ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ඔය පොත අච්චු ගසා තිබෙන්නේ විදේශිකයන්ගේ මුදල් උරා ගැනීම පිණිසයි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
**(Mr. M. Tennakoon)**
විදේශිකයන්ගේ මුදල් උරා ගැනීම පිණිස මෙතරම් රසවත් කර කරුණු ඉදිරිපත් කළාට මොකද ඒ අය ඔය ඇම ගිලලා තිකම්ම ඉන්නේ නැහැ. මෙහි දිගටම කරුණු තිබෙනවා. [බාධා කිරීම්] මා ඊයේ මෙම පොත නැතුවයි සිටියේ. එතුමා මෙම පොත මට ඉක්මණින්ම සොයා දුන්නා. තවත් ප්‍රශ්නයක් තිබෙනවා. ඒ මෙසේ යි:

"A local company has made arrangements to borrow a sum of Rs. 1 million from a foreign credit institution. Is there provision to exempt the interest from Ceylon income tax?"

[බාධා කිරීමක්] මේවා පරිවර්තනය කර කර ඉන්නා එක තමයි කරන්නට තියෙන්නේ. 10 ලක්ෂයක් මම ණයට ගන්නවා. ඒ 10 ලක්ෂයට ආදායම් බද්දෙන් නිදහස ලැබෙනවාද කියා අහනවා. ඊට තිබෙන උත්තරය මෙසේ යි:

"There is no provision to exempt the interest. However, if the loan was channelled through the Ceylon Government, exemption can be granted on the basis that it is income derived from aid granted to the Ceylon Government."

ඊට තව සෙක්ෂන් එකකින් ආරක්ෂාව දී තිබෙනවා. කෙළින්ම අල්ලන්නේ නැතුව රවුමෙන් ඇවිත් නාහෙ අල්ලන්නා වාගෙ වැඩක් ඒක. අපේ රාජ්‍ය ඇමතිතුමා පිළිගන්නවාද මන්දා, අමෙරිකන් මුදල් හිමියන්——

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
**(The Hon. J. R. Jayewardene)**
අපි විදේශිකයන්ගේ ලේ බලන්නේ නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
**(Mr. M. Tennakoon)**
විදේශීය කොම්පැනි මේ රටට මුදල් යොදවන්නට සූදානම් වෙනවා නම් ඒ මුදල් හැකි තරම් වැඩියෙන් යෙදවීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සඳහා මෙය ඇමක් කර ගන්නා බවයි රාජ්‍ය ඇමතිතුමා කියන්නේ. ඒ ඇම කාලා ඔවුන් අපට නිකම්ම බිලිවේවිය කියා එතුමා කල්පනා කරනවා ද? ඒ අය අපේ ඇම කාලා අතික් ගමන අපවත් ඇමකට ගන්න කටයුතු කරන්නට තරම් දක්ෂතාවයක් තිබෙන උදවියයි. ඊයේ අප සඳහන් කරන්න යෙදුණා, මේ රටේ තිබුණු ෂෙල්, කැල්ටෙක්ස්, වැනි තෙල් සමාගම් මෙරට තෙල් බෙදා හැරීම කර ගෙන ගිය නමුත් නීතියෙන් කිසිම බලතලයක් නොලැබුණු බව. ඒ අය සාමාන්‍ය වෙළඳුන් මෙන් විදේශයෙන් තෙල් ගෙන්වා ගෙන නියෝජිතයින්ගෙ මාර්ගයෙන් තෙල් බෙදා හැරීම කර ගෙන ගියා. ෂෙල් සමාගමේ මෙන්ම කැල්ටෙක්ස් සමාගමේ මධ්‍යස්ථානය වූයේ කොළඹයි. ඒ වාගේම පරිපාලන කටයුතු කරගෙන ගිය අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යාල පිහිටියේත් කොළඹමයි. ඒ අන්දමට කොළඹ පිහිටි මධ්‍යස්ථානයෙන් රටපුරා සිටින නොයෙකුත් ජාතිවලට අයත් නියෝජිතයින්ගේ මාර්ගයෙන්, ලාංකිකයින්ගේ මාර්ගයෙන්, තෙල් බෙදා හැරීම කර ගෙන ගියා. එසේ බෙදා හැරීම කර ගෙන ගිය නමුත්, මෙම සමාගම්වලට නීතියෙන් අමුතු බලතල හිමිව තිබුණේ නැහැ. එවැනි බලයක් නැතුව සිටියත්, මේ කොම්පැනිකාරයින් අපේ ආර්ථිකත්වයට කොයි තරම් දුරට තර්ජන කර තිබෙනවා දැයි තමුන්නාන්සේ හොඳින් දන්නවා ඇති. ඒ අයට දේශීය ආදායම් පනත් සංශෝධනය කරමින් මේ වාගේ බදු සහනයක් දී තිබුණේ නැහැ. රාජ්‍ය ඇමතිතුමාගෙ සංචාරක සංවර්ධන පනත් යටතේ දෙන්නට යන නොයෙකුත් පහසුකම් වලට සමාන පහසුකම් ඒ අයට සලසා දී තිබුණේ නැහැ. එවැනි තත්ත්වයක් තිබියදීත් ඒ ඇත්තන්ට අපේ ආර්ථික තත්ත්වයට තර්ජනය කරන්න පුළුවන් කමක් තිබුණා නම්, විදේශිකයින්ට නිත්‍යානුකූලව බලතල දෙන්න යනවා නම්, පහසුකම් සලසන්න යනවා නම්, ඒ ගැන කා තුළත් සාධාරණ භීතියක් ඇති වෙනවා. එසේ දුන්නාම අපට මේ රටේ ඉන්න ලැබෙන්නෙත් නැහැ. අර මා පොතින් දැක්වූ පින්තූරයෙන් නිරාකරණය වන විධියට අපේ රටේ සංස්කෘතිය කවු ගෙට ගෙන යන්න වෙනවා. ඒ වාගේම අපේ රට ඇමෙරිකන් කාරයින්ට යටත් වෙනවාට කිසිම සැකයක් නැහැ. අන්න ඒ කාරණයයි විශේෂයෙන්ම මෙහිදී කියන්න තිබෙන්නෙ.

ගරු කථානායකතුමනි, හොඳයි, අපි සිතමු රාජ්‍ය ඇමතිතුමාගේ දේශ සංචාරක ප්‍රතිපත්තිය අවංකය කියා. හොඳයි, අවංක නම්, මේ රටට දේශ සංචාරකයින් ඇද ගැනීම පිණිස මෙහෙයන අංශයන් මොනවාද, අංගයන් මොනවා දැයි, එතුමාට පැහැදිලි කරන්න පුළුවන් ද? මේ රටේ දියුණු වූ කලාවක් තිබෙනවා. අප ප්‍රවෘත්තියක් දුටුවා, එක් එක් දිස්ත්‍රික්ක වල කලා සංදර්ශනයන් අවුරුදුපතා පවත්වා එමගින් අපේ ජාතික කලාවේ නියම දක්ෂතාවන් ඇති අය තෝරා ගෙන ඒ අයගේ මාර්ගයෙන් මෙරටට විදේශික සංචාරකයින් ඇද ගැනීමට උත්සාහයක් දැරීමට අදහස් කරගෙන සිටින බව. නමුත් මේ කටයුත්ත සපුරා ගැනීම සඳහා එතුමා සංස්කෘතික දෙපාර්තමේන්තුවත් සමග කොයි තරම් දුරට ක්‍රියා කර තිබෙනවා දැයි ඇමතිතුමාට කියන්න පුළුවන් ද? ඒ කොයි ලෙස වුණත්, ඇමතිතුමාට බොහොම ඕනෑකම තිබෙනවා, මුදල් ඇමතිතුමා ලවා බදු සහන ඉක්මන් කරවා ගන්න. නමුත් සංස්කෘතික ඇමතිතුමාත් සමග එවැනි පියවරක් ගන්න, අපේ දේශීය නැටුම් ගැයුම් සහ වැයුම් දියුණු කර එමගින් දේශ සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න. කල්පනා කර නැහැ. මා දැන ගන්න කැමතියි ඇමතිතුමාගෙන්, එතුමා ඒ අංශයෙන් ගෙන තිබෙන පියවර මොනවාද කියා. මා දන්න හැටියට කිසිම පියවරක් ගෙන නැහැ. නමුත් මුදල් ඇමතිතුමා අල්ලා ගෙන බදු සහන සැලසීම වාගේ පනත් සම්මත කර ගන්න උත්සාහ දරනවා. ඇයි සංස්කෘතික ඇමතිතුමා සමග ඒ සමානම උනන්දුවකින් ක්‍රියා කරන්න බැරි?

ගරු කථානායකතුමනි, මා ඊයේත් සඳහන් කළා, රාජ්‍ය ඇමතිතුමා වැනි පුද්ගලයකු අපේ රටේ සිටීම ගැන, එතුමා වැනි ලාංකිකයකු අප අතර සිටීම ගැන මා ආඩම්බර වන බව. මා එසේ කියන්නේ එතුමාට යම්කිසි පරමාර්ථයක් ඉෂ්ට කර ගන්න වුවමනා නම් එය ඉටු කර ගැනීමට එතුමා තුළ ඇති දක්ෂතාව නිසයි. ඇත්ත වශයෙන්ම එතුමා ගැන සලකන විට, පරමාර්ථයක් ඉටු කර ගැනීමට වුවමනා නම් ඊට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

දක්වන දක්ෂතාවය ගැන මුළු ලෝකයෙන්ම එතුමා වැනි පුද්ගලයන් සොයා ගැනීම අමාරුයි. එසේ වුණත් එතුමාගේ දක්ෂතාවය තමන්ගේ වුවමනාකම් මුදුන් පමුණුවා ගැනීමට පමණක් යොදා ගැනීමයි අපට ඇති එකම කණගාටුව.

**සුබසිංහ මයා.**
(திரு. சுபசிங்க)
(Mr. Subasinghe)
හොඳ වුණත් නොමග යනවා නම් මොකටද?

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)
ලෙඩා මළත් බඩ ශුද්ධ වෙලා ඇතැයි කථාවක් තිබෙනවා නොවැ. රාජ්‍ය ඇමතිතුමාගේ මේ වැඩේත් ඒ විධියයි. රාජ්‍ය ඇමතිතුමාගේ මෙම වැඩ පිළිවෙළට සහයෝගය දෙන්නට නම් අපේ සංස්කෘතියට හානියක් නොවන පරිදි, අපේ ජාතියට හානියක් නොවන පරිදි, අපේ අයිතිවාසිකම්වලට හානියක් නොවන පරිදි වැඩ කරගෙන යා යුතුයි. ඒ විධියට වැඩ කර ගෙන යනවා නම් මෙම දේශ සංචාරක ව්‍යාපාරයට සහයෝගය දෙන්නට අපට අමාරුවක් නැහැ. එහෙත් කටයුතු සිදු වී ගෙන යන අන්දමට නම් අපේ ඒ අරමුණු ඉෂ්ට වන්නේ නැහැ. ඒ අරමුණු ඉෂ්ට කර ගැනීමට ක්‍රියා නොකරන බව අපේ විශ්වාසයයි. අප කනගාටුවට පත් වන්නේත්, අපට මෙම වැඩ පිළිවෙල ගැන එකඟත්වය පළ කිරීමට අපහසු වන්නේත් ඒ නිසයි.

ගරු කථානායකතුමනි, හලාවත ප්‍රදේශයට යන කොට පෘතුගීසි ඇල කාගේත් ඇසට ලක් වෙනවා. මෙම ඇළ දෙපැත්ත ඉතාමත්ම දර්ශනීයයි. මෙම ඇළ දෙපැත්තේ ඇති දර්ශනීය භාවයෙන් ප්‍රයෝජන ගැනීමට පුළුවනි. දේශ සංචාරකයන්ගේ පහසුව පිණිස ඒ ඇළ දෙපැත්තේ කුඩා හෝටල් කීපයක් ඇති කරන්නට පුළුවන්කම තිබෙනවා. ඒ විධියට ක්‍රියා කළහොත් කොතරම් ප්‍රයෝජනයක් සැලසෙනවාද? නොඅනුමානවම දේශ සංචාරකයන් ඒ ඇළ දෙපැත්තේ දර්ශනවලට ප්‍රිය කරනවා ඇති.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මොන ඇළ ගැනද ඔය කියන්නේ?

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)
කොළඹ සිට හලාවත දක්වා යන ඇළක් තිබෙනවා නොවැ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
මෝඩ ඇළ?

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)
පුරාණ ඇළක් තිබෙනවා. විශාල මුදලක් වියදම් නොකර එය ප්‍රතිසංස්කරණය කරන්නට පුළුවනි. මේ දේශ සංචාරකයන්ගේ සිත් සතුටු කිරීම සඳහා සුළු මුදලකින් ඒ ඇළ ප්‍රතිසංස්කරණය කරන්නට පුළුවනි. ඒ අයගේ සාධාරණ විනෝදය පිණිස අවශ්‍ය පරිසරය සකස් කර දෙන්නට පුළුවනි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
දැන් හෝටල් විවෘත කරන්නට යනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)
කොහේද?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
පිටිපන, උස්වැටකෙයියාව, මීගමුව, යන තැන්වල.

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)
"ඩච් ලේක්" කියන එකටද පාරු ඇළ කියන්නේ? එහෙම නැත්නම් මෝඩ ඇළ කියන්නේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
නිකවැරටිය පැත්තට එහෙම කියනවා ඇති.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ගරු අගමැතිතුමා නිකවැරටිය පැත්තේ ගොස් කළ මෝඩකම් මා හොඳින් දැක තිබෙනවා. එතුමාගේ මෝඩකම් අද ජීවිත තුළින් දකින්නට තිබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
දැන් ඔය පනත ගැන කථා කරන්න.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
මේ රටේ සංස්කෘතිය දියුණු කිරීම පිණිස කර ඇති දේවල් මේ මේ යයි ද, කරන්නට යන දේවල් මේ මේ යයිද, අපට පෙන්වා දෙන්නට රාජ්‍ය ඇමතිතුමාට බැරි ඇයි? දේශ සංචාරකයන් ඇද ගැනීමට ප්‍රයෝජනවත් වන මේ රටේ කලා ශිල්ප දියුණු කිරීම සඳහා කර තිබෙන, කරන්නට යන, දේවල් මොනවාද? කලාකරුවන්ට ශිල්පීන්ට වඩා හොඳ පුහුණුවක් දෙන්නට කර තිබෙන දේවල් මොනවාද? පිහිටුවා තිබෙන අභ්‍යාස විද්‍යාල මොනවාද? නුවර පළාතේ තඹ පිත්තල වැඩ, පින්තාරු වැඩ, කරන දක්ෂ ශිල්පීන් සිටිනවා. ඒ අයගේ දක්ෂතාවන් දියුණු කර ගැනීමට දී තිබෙන උපකාර මොනවාද? කොටින්ම දේශ සංචාරයේ යෙදෙන්නන්ට මේ රට ප්‍රිය කිරීම සඳහා ක්‍රියා කරන අපේ කලාකරුවන්ගේ, ශිල්පීන්ගේ, දක්ෂතාවන් වැඩි දියුණු කර ගැනීමට දී තිබෙන උදව් මොනවාද? ඒ කලාකරුවන්ගේ ඒ ශිල්පීන්ගේ, දක්ෂතාව දේශ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ කර ගැනීමට ගෙන තිබෙන පියවරවල් මොනවාද? මේ කාරණා සම්බන්ධයෙන් සකස් කොට ඇති සැලැස්මක් අපට පෙන්වනවා නම් මේ ඉදිරිපත් කරන පනත්වලට අපේ සහයෝගය දෙන්නට පුළුවන්කම තිබෙනවා. එහෙත් අභාග්‍යයකට මෙන් රාජ්‍ය ඇමතිතුමා කළ යුතු දේ පැත්තකට දමා වෙනත් දේවල් කිරීමෙහි යෙදෙනවා. ඇත්තෙන්ම රාජ්‍ය ඇමතිතුමාගේ මේ වැඩ පිළිවෙළ භයානකයි.

මුල් පනත සාකච්ඡා කරන විටදීත්, ඊට පසුව කීප විටකදීත්, දේශ සංචාරක ව්‍යාපාරයෙන් අපේ රට අවුරුද්දකට ලබන ආදායම කොපමණදැයි මා ප්‍රශ්න කළා. මේ තරම් විශාල මුදලක් වියදම් කරනවා නම් අප කොතරම් ආදායමක් වර්ෂයකට බලාපොරොත්තු වෙනවාද යන ප්‍රශ්නය නැවත අසන්නට සිදු වී තිබෙනවා. අද ලෝකයේ හැම රටකම දේශ සංචාරකයන්ගෙන් ලැබෙන ආදායම ක්‍රම ක්‍රමයෙන් අඩු වේගෙන යනවා. ගරු රාජ්‍ය ඇමතිතුමා ඒක පිළිගන්නවද?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඔව්,

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
තත්ත්වය එසේ නම්, මේ වැඩට අප මේ තරම් විශාල මුදලක් වියදම් කරන්නෙ ඇයි?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
කොහේද වියදම් කරන්නෙ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
මේ සහනය දීමෙන් කරන්නෙ මුදලක් වියදම් කිරීමක් නොවෙයිද? භාණ්ඩාගාරයට ලැබෙන්නට තිබෙන ආදායමක් නොවෙයිද කපා හරින්නෙ? මේ ආදායම් බදු සංශෝධන පනතින් බලාපොරොත්තු වන පරමාර්ථය එය නොවෙයිද?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ලැබෙන්නට තිබෙන ආදායමක් නොවෙයි, නොලැබෙන්නට තිබෙන ආදායමක් අප බලාපොරොත්තු වෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

හොඳයි, එහෙනම් ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් මා මේ ප්‍රශ්නය අහනවා. ගරු අගමැතිතුමාගේ කොළඹ නිල නිවාසයට මෙහා පැත්තෙ ආදායම් බදු ගෙවන කෙනකු ඉන්නවාය කියා සිතමු.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මේ විදේශිකයන්ගෙ මුදල් නේ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

බදු සහන ගැනයි, මා කියන්නේ. එතුමාගේ ගෙයක් තියෙනවා.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)

කාගෙද ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ඔබතුමාගෙ සහෝදරයකුගේය කියමු. අප මේ පුද්ගලයන් ගැන කථා කරනවා නොවෙයි, උදාහරණයක් වශයෙන් කියන්නෙ. ඒ ගෙයි වටිනාකම රුපියල් ලක්ෂ 50 යි කියමු. ඒ ගෙට හුණු ගාලා, මා මේ ගේ දේශ සංචාරක ව්‍යාපාරය පිණිස දෙන්නට යනවාය කියනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

එහෙම බැහැ. පනත කියවන්න. පරණ ගෙයක් අරගෙන හුණු ගාලා විදේශිකයන්ට දෙන්ට පුළුවන් යැ ? අළුත් ගෙවල් ගැනයි, පනතෙ තියෙන්නෙ. පරණ ගෙවල් අළුත්වැඩියා කරලා ගන්නට බැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

මේ කොටස බලමු :

"5 වන අන්තර් වාක්‍යය :

මෙම අන්තර් වාක්‍යයේ පරමාර්ථය වනුයේ විදේශීය කොන්ත්‍රාත්කරුවන්ට පැනනගින ලාභ, බද්දෙන් නිදහස් කිරීමට වන අතර ඒ කොන්ත්‍රාත්තුවලට සම්බන්ධ විධිවිධාන අදාළ වන්නේ—

(අ) ලංකා රජය සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙන හෝ ;

(ආ) දේශ සංචාරකයන් සඳහා අනුමත කළ ඉඳුම් හිටුම් සහිත භොජනාගාරයක් තැනීම සඳහා ක්‍රියා කරන කිසියම් පුද්ගලයකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙන හෝ ;

(ඇ) ව්‍යවස්ථාපිත සංස්ථාවක් සමග හෝ ආයතනයක් සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙන

යන මේ අවස්ථාවන්හිදීය."

මා සඳහන් කළ ඒ පුද්ගලයා හෝටල් සංස්ථාවත් සමග ගිවිසුමක් අත්සන් කළොත් අළුත් හෝටලයක් හදන්ට හෝ තියෙන හෝටලයක් අළුත්වැඩියා කරන්ට——

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

එතකොට ඔය සහනය ලැබෙන්නෙ නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ඇයි නොලැබෙන්නෙ ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

නීතිය ඒකයි. වෙනස් කරන්නට වුවමනා නම් කාරක සභා අවස්ථාවෙදී සංශෝධනයක් ඉදිරිපත් කරන්න.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

ඒ බව පැහැදිලි වන නීතිය පෙන්වන්න පුළුවන්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඔය පනතෙ තියෙනවා. ඔක හැදුවෙ මමයි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
සොයා ගන්නට බැරි නිසයි, පෙන්වන්නය කියන්නෙ. අසවල් කොටස අනුව බැහැ කියා පෙන්වා දෙන්න.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මා උත්තර දෙන විට පෙන්වා දෙන්නම්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
දැන් පෙන්වා දුන්නොත් පැහැදිලි කරන්නට ලෙහෙසියි. හොඳයි, මගේ චෝදනාව මෙයයි. ආදායම් බදු ගෙවන පුද්ගලයෙක් ආදායම් බද්දෙන් නිදහස් වීම පිණිස——

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
පරණ ගේකට බැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
අළුත් හෝටලයකට පුළුවන්.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඒක තමයි, මම කිව්වෙ. මේකෙන් නොලැබෙන ආදායමක් ලැබෙනවා. මුදල් යොදවා අළුතෙන් හෝටලයක් හැදුවොත්, ඒ සඳහා සහනයක් දීම යුතුය කියා සංචාරක මණ්ඩලය පිළිගත්තොත් සහනය ලැබෙනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ආදායමක් ලැබෙන්නෙ නැත්නම් හෝටලය වෙනුවෙන් ? එතුමාගේ මුදල් වැය කර හෝටලය හදනවා. මුදල් ඇමතිතුමා එතුමාට බදු සහනයක් දෙනවා. මා කලින් සඳහන් කළ අත්දමට, සංචාරකයන්ගෙන් ආදායමක් බලාපොරොත්තුවෙන් අර විධියේ බදු නිදහසක් දුන්නත්, සංචාරකයන්ගෙන් එවැනි ආදායමක් ලැබෙන්නේ නැත්නම් ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
එහෙම නම් ඒ මනුෂ්‍යයා බංකොලොත් වෙයි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ඒ මනුෂ්‍යයා විතරක් නොවෙයි ; ආණ්ඩුවත් බංකොලොත් වෙයි.

**ගරු ඩඩ්ලි සේනානායක**
*(கௌரவ டட்லி சேனநாயக்க)*
(The Hon. Dudley Senanayake)
ආණ්ඩුව මුදල් වියදම් කරනවාද ?

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ඇයි, ආණ්ඩුව බංකොලොත් වන්නෙ නැත්තෙ ? ආණ්ඩුවට ලැබෙන්නට තිබෙන මුදලක් බදු නිදහස නිසා නොලැබී යන්නෙ නැද්ද ? [බාධා කිරීම්] කොහොම වුණත් රාජ්‍ය ඇමතිතුමා දෙන පිළිතුර අපට පිළිගන්නට බැහැ. එවැනි පුද්ගලයන්ට බදු නිදහසක් තිබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඔව්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ඒ බදු නිදහස, නිසා භාණ්ඩාගාරයට ලැබිය යුතු මුදලක් අඩු වෙනවා නේද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සේගේ ඔය පොත දුන්නොත් මම පෙන්වන්නම්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
මේ පනත?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
නැහැ, පොත.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
පොතේ තිබෙන්නේ විදේශිකයන්ගේ මුදල් ගැනයි. මා කියන්නේ ස්වදේශිකයන්ගේ මුදල් පාවිච්චිය ගැනයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
වෙනසක් නැහැ

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
මේ සංස්ථාව සම්බන්ධ කොට ගත් කූට උපක්‍රමයක් නිසා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් භාණ්ඩාගාරයට ලැබිය යුතු මුදලක් නොලැබී යනවා. මේ ව්‍යාපාරය, එක් අතෙකින් අපේ භාණ්ඩාගාරයට ලැබිය යුතු මුදලක් නැති වන ව්‍යාපාරයක්. අනෙක් අතින් අපේ රටේ මුදල් පිටරටවලට යවන ව්‍යාපාරයක්. ඒ දෙකටම වඩා භයානක කාරණය, මේ ව්‍යාපාරය හේතුකොටගෙන අපේ සංස්කෘතියට හා නිදහසට හානියක් වීමයි. එම නිසා, මේ පනත් කෙටුම්පත එවැනි භයානක එකක් බවට අප චෝදනා කරනවා. මේ දේශ සංචාරක ව්‍යාපාරය නිසා අපේ දේශපාලන නිදහසට පවා ලෙහෙසියෙන්ම හානි සිදු වන්නට ඉඩ තිබෙන බවට මා රාජ්‍ය ඇමතිතුමාට නිර්භයව චෝදනා කරනවා. යම් දවසක විදේශීය සංචාරකයන්—විශේෂයෙන් ඇමෙරිකන් අධිරාජ්‍යවාදී සංචාරකයන්—අතින් මේ රටේ නිදහසට තර්ජනයක් ඇති වුණොත් එහි සම්පූර්ණ වගකීම රාජ්‍ය ඇමතිතුමා මෙන්ම මේ රජය පිටත් පැවරෙන බවට මා නිර්භයව චෝදනා කරනවා. [බාධා කිරීම්] මොනවා වෙනවාදැයි අගමැතිතුමා දන්නෙවත් නැහැ. [බාධා කිරීම්] මේ පනත් කෙටුම්පතේ හැටියට නම් මුදල් තිබෙන ලාංකිකයාට වඩා හොඳයි, ලංකාවේ මුදල් තිබෙන විදේශිකයාට.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සේගේ පොත දෙන්න.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
මගේ නොවෙයි, පොත තමුන්නාන්සේලාගෙයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සෙ මේ පොතේ තීන්තෙන් කටුගා තිබෙන්නේ ! මේ පොතේ මෙසේ සඳහන් වී තිබෙනවා :

"Where a person purchases any plant, machinery or fixtures for the purpose of modernizing an existing hotel, he will be allowed to claim lump sum depreciation."

**ටී. බී. ඇම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
සිංහලෙන් කියන්න.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මේ, එයාගෙ පොතනේ ?

"For deduction of capital expenses, see section 3 of this brochure."

ඒ කියන්නේ, තිබෙන ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කරනවා නම් යන්ත්‍රසූත්‍ර ආදියට, බඩුවලට විශේෂ සහනයක් දෙනවා. එහෙත් අළුතෙන් හෝටලයක් හදනවා නම්, එය අළුත් හෝටලයක් හැටියට සංචාරක මණ්ඩලය පිළිගන්නවා නම්, අර නැන්පත් කළ මුදල සම්බන්ධයෙන් විශේෂ සහනයක් ලැබෙනවා. ඒ කියන්නේ, ඒ මහතාගේ නැත්නම් ආදායම් බදු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙවන්නාගේ ආදායමෙන් ඒ මුදල අඩු කරනවා. අළුත් ව්‍යාපාරයෙන් ලැබෙන ආදායම අවුරුදු 5 කට ආදායම් බද්දෙන් නිදහස් කරනවා. එහෙත් පරණ ගෙයකට හුණු ගා ඒ සහන ලබා ගන්නට බැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ඒක තමයි, මා කීවේ. අළුත් හෝටලයක් හැදීමට නැත්නම් හෝටලයක් වෙනුවෙන් අළුත් ගෙයක් හැදීමට යම් කෙනකු මුදලක් වැය කළාම, එය ආදායම් බදු ගෙවන්නට තිබෙන මුදලින් අඩු වෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
"කැපිටල් සම්" එකෙන් ආදායම් බදු ගෙවන්නෙ නැහැනේ ? එය ආදායම් බදු නොගෙවන මුදලක්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
ඒ මුදල බැංකුවේ තිබුණා නම් ආදායම් බදු ගෙවන්නට සිදු වෙනවානේ ? කරුණා කර රාජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී එයට පිළිතුරක් දෙන්න.

මෙපමණ වේලා දේශ සංචාරක දෙපාර්තමේන්තුව ගැන කථා කළත් දැන් මේ පනත් කෙටුම්පත මුදල් ඇමතිතුමාටත් එල්ල කරන්නට ඕනෑ. ගරු මුදල් ඇමතිතුමා වගා කරන්නන්ට විශාල වශයෙන් බදු සහන දීලා තිබෙනවා. ඒ විධියට විශේෂ බදු සහන ඇතිව විශේෂ බදු මණ්ඩල යටතේ වගා කිරීම සඳහා නොයෙක් විධියේ සහනයන් දීම නිසා 1965 සිට මේ වනතුරු භාණ්ඩාගාරයට ලැබෙන්නට තිබුණු මුදලෙන් කොපමණ ගණනක් අඩු වී තිබෙනවාද යන වග ගරු මුදල් ඇමතිතුමාට කියන්නට පුළුවන්ද ? දේශීය ආදායම් කොමසාරිස්තුමාට ලැබෙන්නට තිබුණු ආදායම කොපමණ ගණනකින් අඩු වී තිබෙනවාද ? අප වරක් මෙම ගරු සභාවෙහිදී ගරු මුදල් ඇමතිතුමාගෙන් මේ ප්‍රශ්නය පැහැදිලි වශයෙන් ඇහුවා. ඊට පිළිතුරු දෙනවා වෙනුවට එතුමා කිව්වේ එවැනි ප්‍රශ්නවලට [illegible]යෙන් උත්තර දෙන්නට බැරි බවයි. එහෙත් ප්‍රමාද වෙලාවත් අපට ඒ ප්‍රශ්නයට පිළිතුරු කවදාවත් ලැබුණේ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මම උත්තර දෙන්නම්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
හොඳයි, එහෙනම්, 1965 සිට මේ වනතුරු දේශීය ආදායම් කොමසාරිස්තුමාට ලැබෙන්නට තිබුණු ආදායමෙන් කොපමණ අඩු තිබෙනවාද.——

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ශතයක්වත් නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
වැවීම සඳහා විශේෂ බදු සහන දී නිසා ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඒක වෙන දෙයක්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
එහෙනම් තමුන්නාන්සේ උත්තර දෙන්නම් කිව්වෙ ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මා කිව්වේ සංචාරක කටයුතු සම්බන්ධයෙන්.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)
ඕව පටලවා ගන්න එපා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னக்கோன்)
(Mr. M. Tennakoon)

මා දැන් කථා කරන්නේ තමුන්නාන්සේගේ සංචාරක අංශය ගැන නොවෙයි. මා කථා කරන්නේ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව ගැනයි. මේ පනතින් කෙරෙන්නේ ආදායම් බදු වශයෙන් රජයට ලැබෙන ආදායම අඩු කිරීමක්. එම නිසා, 1965 සිට මේ වනතුරු ගොවිතැන් කටයුතු සඳහා දී තිබෙන විශේෂ බදු සහන නිසා භාණ්ඩාගාරයට ලැබෙන්නට තිබුණු ආදායමෙන් මෙපමණ මුදලක් අඩු වී තිබෙනවායයි රටටත් මෙම ගරු සභාවටත් කියන්නට තමුන්නාන්සේලාට යුතුකමක් තිබෙනවා නේද? යම් ප්‍රමාණයක් අඩු වී තිබෙන බව අප දන්නවා. ඒ කොපමණද යන වග තමුන්නාන්සේලා අපට කියන්නට ඕනෑ.

ඒවාගේම, මේ විශේෂ බදු සහන යටතේ විශේෂ බදු මණ්ඩල මගින් වගා කිරීම සඳහා දෙන ලද ඉඩම් හිතුවක්කාර පිළිවෙළට පාවිච්චි කිරීම නිසා, ගරු ඉඩම් ඇමතිතුමා යටතේ තිබෙන කැලෑ දෙපාර්තමේන්තුවට ලැබෙන්නට තිබුණු ආදායමෙන් කොපමණ මුදලක් අඩු වී තිබෙනවාද යන වග ගරු මුදල් ඇමතිතුමාට කියන්නට පුළුවන්ද? බලංගොඩ ආදී ප්‍රදේශයන්හි එවැනි ඉඩම්වල තිබුණු වටිනා ඇව කපා විනාශ කිරීම නිසා කැලෑ දෙපාර්තමේන්තුවට සිදු වුණු පාඩුව කොපමණද? අප මේවා සාකච්ඡා කිරීමෙන් ඇති වන ප්‍රයෝජනය කුමක්ද ගරු කථානායකතුමනි? මේ විධියේ වැඩ කරන්නට එපායයි මේ උදවියට කියන්නට තමුන්නාන්සේටවත් බලයක් නැද්ද? ඔබතුමා කෙරෙහි නම් අප සම්පූර්ණ විශ්වාසය තබනවා. මේ ප්‍රශ්න සඳහා පිළිතුරු සම්පාදනය කරන්නට මෙම ඇමතිවරුන්ට යුතුකමක් තිබෙනවා.

වගා කිරීම සඳහාය කියා විදේශික රටවලින් මේ රටවලට ගෙන්වන ලද ජීප්, මිනිමෝක් කාර්, ලැන්ඩ් රෝවර් ආදී යාන වාහන සඳහා වැය වුණු මුදල කොපමණදැයි කියන්නට ගරු මුදල් ඇමතිතුමාට පුළුවන්ද? [බාධා කිරීම්] අද ඒ වාහනවලින් කෙරෙන්නේ වගාවද? කොළඹ හතේ නෝනලා "මිනි ස්කර්ට්ස්"—ඒ සඳහා යොදන්නට තිබෙන සිංහල වචනය "මිනිය" යන්නයි—ඇඳගෙන, ඔය වගාවට ගෙන්වූ මිනිමෝක් ලැන්ඩ්රෝවර් වාහනවලින් ඉස්කෝලවලට ළමයින් එක්ක යන හැටිත් ආපසු ඔවුන් ගෙදර එක්කර ගෙන එන හැටිත් අපට දකින්නට ලැබෙනවා. ඔන්න වගාවේ හැටි. ඔය වගාව නිසා මේ රටේ නිෂ්පාදනය කොයි තරමකින් වැඩි වෙලා තිබෙනවාද කියා කියන්න පුළුවන්ද? අල, මිරිස්, ලූනු වැවීම කොයි තරම් දුරට දියුණු වී තිබෙනවාද? ආදායම් බදු දෙපාර්තමේන්තුවට නැත්නම් ආදායම් කොමසාරිස්තුමාට ලැබුණු ආදායම කොයි තරම් ප්‍රමාණයකින් වැඩි වී තිබෙනවාද? ගරු කථානායකතුමනි, ඔය සහනාධාර ක්‍රමය නිසා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලැබෙන්නට තිබුණ මුදල් නොලැබී යාමේ හේතුවෙන් ආහාර ලබාදීම සඳහා ආහාර කොමසාරිස්තුමා විසින් වැය කළ යුතු මුදල කොයි තරමින් අඩු වී තිබෙනවාද කියා කියන්න පුළුවන්ද? අපි කොතෙකුත් ක්‍රමවලින් යම් යම් දේවලට මුදල් ලබා දෙනවා. නොයෙකුත් නිෂ්පාදයන් දියුණු කිරීම සඳහා සහනාධාරයන් ලබා දීමට පනත් මෙහිදී සම්මත කර ගන්නවා. නමුත් අපට කවදාවත් කියන්නේ නැහැ, මේ සහනාධාර දීම නිසා මෙන්න මේ තරම් ලාභයක් ලැබී තිබෙනවාය කියා. ඒ නිසා අපට කිසිම විශ්වාසයක් තබන්න බැහැ, මේ ගෙන යන ව්‍යාපාරය ගැන.

ගරු කථානායකතුමනි, මේ දේශ සංචාරක ව්‍යාපාරයෙන් කෙරෙන්නේ මේ රටේ ආදායම අඩු වීම පමණක් නම් කමක් නැහැ. මුදල් අපට ඒ තරම් අගේ නැහැ. ඒවා නැති වුණාට අපට නැවත හම්බ කර ගන්න පුළුවනි. නමුත් අපට නිදහස තිබෙන්න ඕනෑ. බඩගින්නේ ඉඳලා හෝ අපේ නිදහස ආරක්ෂා කර ගන්න ඕනෑ. නිදහස තිබෙනවා නම් අපට හම්බ කර ගන්න පුළුවනි. මේ රටේ සිංහලකම, බෞද්ධකම, ඒ වගේම සංස්කෘතිය යනාදී හැම දෙයක්ම රැකුනේ අපේ ගම්බද පෙදෙස්වලයි. රුහුණු පළාතේ පමණක් නොවෙයි, හැම ගම්බද පළාතකම වාගේ අපේ සිරිත් විරිත්, ගති පැවතුම්, සිංහල කලාව ආරක්ෂා වී තිබෙනවා.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

යටත් විජිත යුගයේදීත් ඒවට හානියක් සිදු වන්න ඉඩ දුන්නේ නැහැ. විදේශීය අධිරාජ්‍යවාදීන්ගේ බලපෑම නිසාවත් ඒවාට හානියක් වීමට ඉඩ දුන්නේ නැහැ. නමුත් අපට බියක් තිබෙනවා, අපේ රටේ ජාතික නිදහස මේ ව්‍යාපාරය නිසා නැති වී යාවිය කියා. අපේ මුදල් කොයි තරම් නැති වුණත් කමක් නැහැ. එහෙත්, අපේ ජාතික නිදහස නැති වී ගියොත් කාට කියන්නද කියායි අපට බියක් තිබෙන්නෙ. අපේ රාජ්‍ය ඇමතිතුමාටත් එතුමාගේ මාර්ගයෙන් රජයටත් දන්වන්නේ අන්න ඒ කාරණයයි. අපේ රාජ්‍ය ඇමතිතුමා ව්‍යාපාරය කර ගෙන යනවා. අනික් අය දන්නේ නැහැ, මොන වාද වෙන්නේ කියාවත්. ඒ නිසා මුදල් ඇමතිතුමාත්, ඒ වාගේම අනික් ඇමතිවරුනුත් මේ විධියට ජාති ද්‍රෝහී ව්‍යාපාරවලට සහයෝගය දෙනවා නම් යම් දවසක මේ රටේ ස්වාධීනත්වයට—නිදහසට—හානියක් වුණොත් එයට මේ රජය සම්පූර්ණයෙන්ම වගකියන්නට ඕනෑ බව කියමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 2.58

**පර්සි වික්‍රමසිංහ මයා.** (කඹුරුපිටිය)
*(திரு. பேர்சி விக்கிரமசிங்ஹ—கம்புருப் பிட்டிய)*
(Mr. Percy Wickremasinghe—Kamburupitiya)

ගරු කථානායකතුමනි, මේ දේශීය ආදායම් සංශෝධන පනත ගැන වචනයක් කියන්න මා අදහස් කරනවා. මේ පනත සම්පූර්ණයෙන්ම වාගේ අදාළ වන්නේ දේශ සංචාරක කටයුතුවලටයි. දේශ සංචාරක දෙපාර්තමේන්තුව මගින් මේ රටේ ඇති කරන්නට යන වැඩ පිළිවෙලකට ආදායම් බදු සහනය දීමටයි මේ පනත අදාළ වන්නේ. ගරු කථානායකතුමනි, මේ සංචාරක ව්‍යාපාරයෙන් ලබා ගැනීමට බලාපොරොත්තුවන මුදල් ප්‍රමාණය මෙතෙක්ය කියා රාජ්‍ය ඇමතිතුමා විසින් අපට ඉදිරිපත් කර තිබෙනවා. මෙම ව්‍යාපාරය මගින් රුපියල් දෙකෝටි පනස් පන් ලක්ෂයක පමණ ආදායමක් අපට ලැබෙන්න පුළුවන් බව එතුමා පෙන්නුම් කර තිබෙනවා. ඒ එතුමාගේ බලාපොරොත්තුවයි. නමුත් නාත්සේ දන්නවා ඇති අද සමහර උදවිය කතරගම දෙවියන් වඳින්න යනවා. තවත් සමහර උදවිය ලූනාවට යනවා. සමහර උදවිය තවත් තැන්වලට යනවා.

නමුත් අපේ රටේ රාජ්‍ය ඇමතිතුමා ඇතුළු මේ රටේ උදවිය යන්නේ කොහාටද? ඒ අයගේ දෙවියන් කව්ද? ලෝක බැංකුවයි. මෙහි පැමිණි ලෝක බැංකු නියෝජිතයා කියා තිබෙන්නේ මොකක්ද? රාජ්‍ය ඇමතිතුමාගේ මේ සංචාරක කටයුතුවලින් රාජ්‍ය ඇමතිතුමා බලාපොරොත්තු වන ආදායම ලැබෙන්නේ නැත, ලැබේවියයි බලාපොරොත්තු විය හැක්කේ රු. 3 කෝටි 90 ලක්ෂයක ආදායමක් පමණය කියා ලෝක බැංකු වාර්තාවේ පෙන්නුම් කර තිබෙනවා. රාජ්‍ය ඇමතිතුමාගේ බලාපොරොත්තුව සුන් වන බව එයින්ම පෙනෙනවා නොවේද? එතුමන්ලා පිළිගන්නා ලෝක බැංකු වාර්තාවේම පෙන්නුම් කර තිබෙනවා මේ දේශ සංචාරක ව්‍යාපාරවලින් රාජ්‍ය ඇමතිතුමා බලාපොරොත්තු වන ප්‍රයෝජනය ලැබෙන්නේ නැත කියා. ලෝක බැංකු වාර්තාවේත් එසේ කරුණු පෙන්වා දී තිබෙන නමුත් මේ තරම් විශාල බදු සහනයන් දීම රටට හානිකර නැත කියා ගරු රාජ්‍ය ඇමතිතුමා තවමත් කියනවා. එතුමා බොහොම ලක්ෂණට බබා වගෙ නාහෙ අත ගගා, අපෙන් ශතයක්වත් මේවාට වැය වෙන්නෙ නැත, මේ හෝටල් ඇති කරන්නෙ පෞද්ගලික සමිති සමාගම්ය කියා අපට කියනවා. නමුත් මා අසන ප්‍රශ්නය මේකයි. පෞද්ගලික සමිති සමාගම් මේ හෝටල් ඇති කරන විට ඒ අයට නොයෙකුත් බදු සහනයක් දෙනවා. එසේ බදු සහනයන් දෙන විට රජයට ලැබෙන්නට තිබෙන මුදල් ප්‍රමාණයක් නොවේද ඒ සහනයන් මාර්ගයෙන් ඔවුනට ලැබෙන්නෙ. ඒ අය තනන ගොඩනැගිලිවලට වුවමනා කරන සියළුම උපකරණවලට බදු සහනයන් දී තිබෙනවා: මුදල් ඇමතිතුමාට ලැබෙන්නට තිබුණු මුදල් ප්‍රමාණයක් නොවේද එතැන නැති වුණේ? හෝටල් ගොඩනැගිලි සෑදීමට ගන්නා උපකරණ ඇතුළු අනිකුත් සියළුම කටයුතුවලට සහනයන් දී තිබෙනවා. ඒ සහනයන් නොදුන්නා නම් භාණ්ඩාගාරයටත් අර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවටත් මේ මුදල් ගෙවන්නට සිදු වෙනවා නොවේද? එසේ නම් මේ සහනයන් දීමෙන් රජයට පාඩුවක් නො වෙනවාය කියා කොහොමද කියන්නෙ? දැන් මා යම්කිසි බදු ප්‍රමාණයක් ගන්නා විට සහනයක් ලැබෙනවා නම් ඒ සහනය ලැබෙන්නේ පෞද්ගලිකව මටයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පර්සි වික්‍රමසිංහ මයා.]

මට යම් සහනයක් නොලැබෙනවා නම් ඒ මුදල යන්නේ රජයටයි. හෝටල් සංස්ථාව යටතේත් සංචාරක සංවර්ධන පනත යටතේත් කරන මේ සියලුම කටයුතුවලට බදු සහනයන් දී තිබෙනවා නොවේද?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තිරු බදු.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
ඒක තමයි කියන්නෙ. මේ විධියට සහන දෙන විට මොකක්ද ලැබෙන ප්‍රයෝජනය? මේ ආකාරයට තමුන්නාන්සේ බලාපොරොත්තු වන ප්‍රයෝජනය ලැබෙන්නේ නැහැ නොවැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඇයි නැත්තෙ?

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
තමුන්නාන්සේ පිළිගන්නා ලෝක බැංකු වාර්තාවම කියනවා නැත කියා. අප නොවෙයි. ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේට වැරදුණා. කාට වුණත් වරදින වේලාවල් තිබෙනවා. එම නිසා නැවත වරක් මේ ගැන කල්පනා කර බලන්න. තමුන්නාන්සේ මේ කටයුතුවලින් බලාපොරොත්තු වන ආදායම ලැබෙන්නේ නැත, මෙවැනි බදු සහනයන් දීමෙන් අපට පාඩුවක් වෙනවාය යන්නයි මා පෙන්නුම් කරන්නෙ. එය අප පිළිගන්නට ඕනෑ. මට පෙර කථා කළ නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා (එම්. තෙන්නකෝන් මයා.) කිව්වා වාගේ තමුන්නාන්සේලා නොයෙකුත් සහනයන් දී තිබෙනවා. මේ රටේ ආහාර වගාව සඳහා තමුන්නාන්සේලා නොයෙකුත් පහසුකම් සලසා දුන්නා. ඔය ජීප් රථ එහෙම ගෙන්වන්නට නොයෙකුත් පහසුකම් සලසා දුන්නා. නමුත් ඒ සැලසූ පහසුකම් තුළින් අපට ප්‍රයෝජනයක් ලැබුණාද? නැහැ. ඒ සහනයන් නොදුන්නා නම් ඒ ප්‍රයෝජනය ලැබෙන්නේ රජයට නොවේද? ආහාර වගාව සඳහා දුන් සහනයන්ගෙන් අපට පාඩුවක් වූ බව තමුන්නාන්සේලාගේ අයත් පිළිගන්නවා. ඉඩම් ලබා ගත් අය දැව තොග ගණන් අර ගත්තා. කැලෑවල් විනාශ වුණා. එහෙම වුණේ නැත කියා ගරු ඉඩම් ඇමතිතුමාට කියන්නට පුළුවන්ද? ඒ අනුව කල්පනා කරන විට ආහාර වගාව සඳහාය කියා දුන් සහනවලින් රටට ප්‍රයෝජනයක් ලැබුණාද, නැද්ද කියා ප්‍රශ්නයක් තිබෙනවා. මෙතැන තිබෙන්නේත් එවැනිම ප්‍රශ්නයක් තමයි. සංචාරක දෙපාර්තමේන්තුවට අදාළ වන විධියටයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නෙ. ඒ සංචාරක දෙපාර්තමේන්තුවෙන් කරන කටයුතුවලින් ගරු රාජ්‍ය ඇමතිතුමා අපේක්ෂා කරන ආදායම ලැබෙන්නේ නැත කියා එතුමන්ලාගේම විශේෂඥයන් අනාගත වාක්‍යයක් කියා තිබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඒක එයාගෙ අනාගත වාක්‍යයක්.

**පර්සි වික්‍රමසිංහ මයා.**
*(திரு. பேர்ஸி விக்ரமசிங்ஹ)*
(Mr. Percy Wickremasinghe)
ඒක එයාගෙත් අනාගත වාක්‍යය, තමුන්නාන්සේගේත් අනාගත වාක්‍යය. තමුන්නාන්සේගෙ බලාපොරොත්තු ඉෂ්ට වේවිය කියා තමුන්නාන්සේ සිතනවා. විශේෂඥයො සිතනවා ඒ බලාපොරොත්තු ඉෂ්ට වෙන්නේ නැත කියා. කවුරු හරිද කියා අප දන්නේ නැහැ. දෙගොල්ලම එක මල්ලෙ. නමුත් මේ තරම් විශාල සහනයක් දෙන විට රජයට පාඩුවක් නොවෙනවාය කියා කියන්නට බැහැ. යම් යම් පුද්ගලයන්ට, යම් ව්‍යාපාරිකයන්ට තීරුබදු සහන දෙනවා නම් රජයට ලැබෙන්නට තිබෙන මුදලකින් නොවෙද ඒ සහන දෙන්නෙ? දැන් මා පෞද්ගලික කටයුත්තක් සඳහා ගෙයක් සාදනවාය කියමු. මා මුදල් උපයනවා නම් ඒ සියලුම විස්තර මා ආදායම් බදු දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නට වුවමනායි. එහෙත් දැන් මේ කටයුතු සඳහා ලක්ෂ සංඛ්‍යාත මුදලක් වියදම් කරන්නට බලාපොරොත්තු වුණත් ඒ උද වියට—ඒ ගෙය නොහොත් ගොඩනැගිල්ල සාදාගන්නා උදවියට—ඒ සඳහා ගන්නා බඩුවලට සහනයක් ලැබෙනවා. එතකොට කොහොමද පාඩුවක් වෙන්නෙ නැත කියන්නේ.?

මා අවසාන වශයෙන් ගරු රාජ්‍ය ඇමති තුමාට මතක් කරන්න කැමතියි, මේ විධි යේ බදු සහන දෙන විට අප බොහෝම කලපනාකාරී විය යුතු බව. මොන විධි යෙන් පෙරළා බැලුවත් අවසානයේදී පාඩු සිදු වන්නේ අපටයි, අපේ රටටයි, අපේ භාණ්ඩාගාරයටයි. අද අප සියලු දෙනාම දන්නවා මේ අවස්ථාව, අපේ රටට අවශ්‍ය බඩු හා අත්‍යවශ්‍ය ආහාර ආදී ද්‍රව්‍ය ගෙන් වීමටවත් මුදල් නැති නිසා ජනතාව ඉතා අමාරු තත්ත්වයකට මුහුණ පා සිටින අවස්ථාවක් බව. එවැනි අවස්ථාවකදී රටේ මුදල් ආරක්ෂා කරගෙන නව නවත් මුදල් රජයට ලබා ගැනීමට තිබෙන මාර්ග ඔස් සේ අප ගමන් කර අන්තිම ශතය දක්වා භාණ්ඩාගාරයට ලබා ගැනීමට අප ක්‍රියා කළ යුතුයි. එසේ නැතිව, නොයෙකුත් ආඥා පනත් මගින් පුද්ගලයන්ට යම් යම් පෞද්ගලික ලාබ ප්‍රයෝජන ගැනීමට සලස්වා ඒ අතින් රජයට පාඩුවක් සිදු වනවා නම් එය මුළු රටටම කරන හානි යක් බව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 3.07

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

කථානායකතුමනි, කථාවක් තිබෙනවා, කාක්කො කොටන්නේ නැත්නම් කාක් කො වසන්නේ රසවත් ඉදුණු පළතුරු තිබෙන ගසකටය කියා. මෑත කාලයක සිට සංචාරක ව්‍යාපාරය ගැන ලොකු උනන්දු වකින් විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරුන් කථා කරනවා, ඒ වාගේම විවේචනය කර නවා. මීට ප්‍රථම මේ කාරණය සම්බන්ධ යෙන් මෙවැනි විවේචන ඇති වුණේ නැහැ. අප දැන් මේ අවස්ථාවේදී සාකච්ඡා කරන්නේ මගේ පනතක් නොවෙයි. මුදල් ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද පන තක් ගැනයි දැන් සාකච්ඡා කෙරෙන්නේ. එහෙත් හුඟක් දුරට සාකච්ඡා කෙළේ, විවේචනය කෙළේ විදේශික සංචාරක ව්‍යාපාරය ගැනයි. ඒ නිසා මා කල්පනා කළා, මේ විදේශික සංචාරක ව්‍යාපාරය රසවත්, ඉදුණු පළතුරු ගසක්දෝ කියා. ඒ මොකද සියලුම කුරුල්ලන්—මා කියන්නේ නැහැ කපුටන් කියා—සියලුම කුරුල්ලන්.

**එල්. සී. ද සිල්වා මයා. (බලපිටිය)**
*(திரு. எல். சி. டி சில்வா—பலப்பிட்டிய)*
(Mr. L. C. de Silva—Balapitiya)

වවුලො, වවුලො. දැන් ඔහේ පදිංචි වී ඉන්නවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒ කෙසේ වෙතත්, විරුද්ධ පක්ෂයේ හෝ ආණ්ඩු පක්ෂයේ හෝ මන්ත්‍රීවරුන් —මහජන වැඩ කරන කවුරුත්—මෙවැනි ව්‍යාපාරයක් ගැන කථා කරනවා නම්, අදහස් දක්වනවා නම් ඒ ගැන සොයා බැලීමට අපේ යුතුකමක් තිබෙනවා. මෙම ගරු සභාවේදී ඊයෙ පෙරේදා පැවැත්වුණු මෙම විවාදයේදී විදේශික සංචාරක ව්‍යාපා රය ගැන අදහස් දෙකක්, මත දෙකක් තිබුණු බව අපට පෙනී ගියා. එක අදහසක් නම් අපට සංචාරක ව්‍යාපාරයක් වුවමනා නැත කියන අදහසයි. මා දන්නේ නැහැ, මා හරිද කියා. අපට විදේශ සංචාරක ව්‍යාපාරයක් වුවමනා නැත, විදේශිකයන් ලංකාවට පැමිණෙන විට, අපේ සංස්කෘ තිය නැති වනවාය, සීගිරි ගල මුහුදට තල්ලු වෙනවාය ආදී වශයෙන් අදහස් ඉදිරිපත් වුණා. අපේ නිකවැරටිය ගරු මන්ත්‍රීතුමා ගේ පොතෙන් පේනවා, සීගිරිය ඈද තිබෙන්නේ ලංකාවෙන් පිට බව. ඔය විධි යට සංචාරක ව්‍යාපාරය වුවමනා නැත කියන විධියේ නොයෙකුත් අදහස් ඉදිරි පත් වී තිබෙනවා. ඒ තර්කය ගැන මේ අවසථාවේදී මා කථා කරන්නට බලාපො රොත්තු වන්නේ නැහැ.

සංචාරක ව්‍යාපාරය වුවමනාය කියා අපේ රජයෙන් පිළිගෙන තිබෙනවා. එපමණක් නොවෙයි, අප යම් දෙයක් කරන සෑම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

අවස්ථාවකදීම විරුද්ධ පක්ෂයේ නායිකාව නැගිට කියනවා, " අපි ඊට ඉස්සෙල්ලා කෙරුවා " කියා. සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙනුත්, සංචාරකයන් ගෙන්වා ගැනීමට නොයෙක් නොයෙක් සහය දුන්නාය, නොයෙක් නොයෙක් ප්‍රතිපත්ති අනුව ක්‍රියා කළාය කියනවා. ඒ නිසා මට පෙනෙන හැටියට සංචාරක ව්‍යාපාරය දියුණු වනවාට විරුද්ධ පක්ෂයේ වග කිය යුතු වැඩි දෙනෙක් කැමතියි.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

කවුද එපයි කිව්වෙ ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

සමහර උදවියගේ තර්කවලින් එහෙම අදහසක් පෙනුණා. නිකවැරටියේ මන්ත්‍රීතුමාගේ කථාවෙනුත්, බෙන්තර ඇල්පිටිය මන්ත්‍රීතුමාගේ (එච්. ජී. ඇල්බට් කාරියවසම් මයා.) කථාවෙනුත්——

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

නැහැ, නැහැ, මම එහෙම කියන්නේ නැහැ. සංචාරකයන් එන්නත් ඕනෑ ; අපේ සංස්කෘතිය ඉවත දමන්නත් බැහැ. ඒකයි මා කියන්නේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒ නිසා එවැන්නක් තිබුණා නම් ඒ ගැන වාද කරන්න හෝ සටන් කරන්න හෝ මා මේ අවස්ථාවේදී බලාපොරොත්තු වන්නේ නැහැ. අනික සංචාරක ව්‍යාපාරයක් අවශ්‍යයයි කියන අදහසයි. එය දියුණු කරන්නේ කොහොමද කියන එක ගැන නොයෙක් නොයෙක් අදහස් ඇති. ඒ නිසා තමුන්නාන්සේලා සමග ඒ ගැන සාකච්ඡා කර අපි වැරදි නම් හරිගස්සා ගන්නට අපි නිතරම ලැහැස්තියි. අපේ ආණ්ඩුවත් විදේශ විනිමය වැඩි කර ගැනීමට බලාපොරොත්තු වෙනවා. ලංකාවට විදේශ රටවලින් අමුත්තන් එන බව අපි දන්නවා. එය නතර කරන්න පුළුවන් කමක් නැහැ. එය නතර කළොත් එය මෝඩකමක්. රට වටේ විශාල තාප්පයක් බැඳ ගෙන කිසි කෙනෙක් ලංකාවෙන් පිට යා යුතුත් නැත, කිසි කෙනෙක් ලංකාවට ආ යුතුත් නැත, රුසියන්කාරයෝවත්, අමෙරිකන්කාරයෝවත් ජර්මන්කාරයෝවත්, ඉංග්‍රීසිකාරයෝවත්, කාපිරිවත් අපට වුවමනා නැත, කියා මේ ගරු සභාවේ සිටින කිසි කෙනෙක් කියන්නේ නැහැ. එහෙනම් ලංකාවට විදේශිකයින් ආ යුතුයි. විදේශිකයින් ලංකාවට පැමිණෙනවා. ඒ පැමිණීම අපි තවත් වැඩි කරන්නට ඕනෑ. නොයෙක් නොයෙක් සහනයන් හා ප්‍රචාරයන් ඇති කර ඔවුන්ගේ පැමිණීම අපි වැඩි කරනවා.

අවුරුදු 10 ක 15 ක කාලයේ සිට මුළු ලෝකයේ හැම රටක්ම සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නට බලාපොරොත්තු වෙනවා. එවැනි තත්ත්වයක් ඇති වුණේ කොහොමද කියා නම් මා දන්නේ නැහැ. එහෙත් එය ඇති වී තිබෙන ප්‍රතිපත්තියක්. ලෝකයේ රටවල් හුඟකම අද විදේශ විනිමය හුවමාරු වන්නේ සංචාරක ව්‍යාපාරවලින්. එංගලන්තය—ප්‍රධාන පෙළේ කාර්මික රටක්—ජර්මනිය, අමෙරිකාව, රුසියාව—සෝෂලිස්ට් රටක්—යුගෝස්ලාවියාව, ජපන් රට, ඉන්දියාව ආදී දියුණු රටවලුත් නොදියුණු රටවලුත්, ධනේශ්වර රටවලුත් සෝෂලිස්ට් රටවලුත්, පුංචි රටවලුත් ලොකු රටවලුත්, කළු රටවලුත්, සුදු රටවලුත් ආදී හැම රටක්ම තමන්ගේ රටට සංචාරකයින්ගේ පැමිණීම බලාපොරොත්තු වෙන් මුදල් වියදම් කර හෝටල් ආදිය සාදා දීමෙන් හා පහසුකම් සලසා දීමෙන් විදේශ විනිමය උපයා ගැනීමට කල්පනා කරනවා. ඉතින් ලෝකයේ ඇති මේ ජල ගැල්මෙන් අපි පිට වී ඉන්නද ? අපි එයින් පිට වී සිටිය යුතු නැත, ඒ රළත් සමග අපිත් යන්නට ඕනෑය කියා නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා දුන් ප්‍රකාශ කළා. කොහොමද යන්නේ කියන එක ගැන අප අතර කතාවක් ඇති වුණා. පසුගිය අවුරුදු දෙක තුන තුළ විදේශ සංචාරක ව්‍යාපාරය දියුණු කර ගන්නට අපි බලාපොරොත්තු වුණා. මේ රටට පිටරටින් සංචාරකයින් එනවා නම් ඔවුන්ට ස්වල්ප කාලයක්වත් මෙහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පදිංචි වී නැත්නම් නතර වී සිටීමට අපට තිබෙන හෝටල්, අපට තිබෙන තානායම්, අපට තිබෙන ඇඳන්, ඉඳුම් හිටුම් පහසුකම් මදියි කියා පිළිගන්නට ඕනෑ. එය කවුරුත් කිව්වා.

ඬේවිස් කියන මහත්මයකුගේ වාර්තාවක් පත්තරයේ තිබුණා. උන්නැහේ කවුද කියා මා නම් දන්නේ නැහැ. උන්නැහෙත් කියා තිබුණා හෝටල් මදි, ඇඳන් මදි, කාමර ගණන මදි, කියා. අපේ ඇස්තමේන්තුවත් වැරදි වෙන්න පුළුවන්. එහෙත් දැනට තිබෙන ප්‍රමාණය මදි බව කවුරුත් පිළිගන්නට ඕනෑ. එය කවුරුත් කියන එකක්. එහෙනම් ඒවා වැඩි කරන්නට ඕනෑ. සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නට නම් සංචාරකයින් පැමිණි විට ඔවුන්ට නතර වී සිටීමට නොයෙක් නොයෙක් පළාත්වල හෝටල්, ඇඳන් ආදී ඉඳුම් හිටුම් පහසුකම් දියුණු කරන්නට ඕනෑ. කොහොමද එය කරන්නට ඕනෑ? එය දෙවිධියකින් කරන්නට පුළුවන්. ඒ කොයි විධියට කළත් මුදල් වියදම් කරන්නට සිදු වෙනවා. ඇඳක් කියන්නේ ඇඳ පමණක් නොවෙයි. කාමරයක්, කෑම කාමරයක්, ඉස්තෝප්පුවක්, පිට්ටනියක් ආදී අංගයන් එයට ඇතුළත් වෙනවා. එක ඇඳකට මෙපමණයි කියා සීමාවක් ලෝකයේ තිබෙනවා. ඒ අන්දමට ඇඳන් ගණන වැඩි කිරීමට මුදල් වියදම් කරන්නට ආණ්ඩුවට ඉඩක් ලැබෙන්නේ නැහැ. ඊට වඩා වැදගත් වැඩවලට මුදල් වියදම් කරන්නට අපේ මුදල් ඇමතිතුමාට සිදු වී තිබෙනවා.

කෘෂිකර්ම වැඩවලටත්, අධ්‍යාපන කටයුතුවලටත්, සමාජසේවා අංශවලටත්, ඒ වාගේම නිකම් ආහාර දීමටත් අපට මුදල් බෙහෙවින් වුවමනා කරනවා. ඒ නිසා පුද්ගලයන්ගෙන් මුදල් ටිකක් ගැනීමට ආණ්ඩුව කල්පනා කළා. හෝටල් හදන්නැයි පුද්ගලයන්ට කියන්නට ආණ්ඩුව අදහස් කළා. තානායම් අරන් පාලනය කරන්නැයි කියන්නටත්, අවුරුදු හතරක් පහක්ම රජයෙන් මුදල් වියදම් නොකර පෞද්ගලික ධනය තිබෙන උදවියගේ—ධනපතියන්ගේ—මුදල් අපට පාවිච්චි කරන්නට පුළුවන්දැයි සොයා බලන්නට අපට වුවමනා කළා. ඒක වැරද්දක් ද? සමහර විට සමසමාජ, කොමියුනිස්ට් අදහස් තිබෙන උදවිය ඒක වැරදියයි කියාවි. එහෙම කරන්නට වුවමනාවක් නැතැයි ඒ අය කියන්නට ඉඩ තිබෙනවා. හැම එකක්ම රජයට ගන්නැයි ඒ අය කියන්නට පුළුවනි. එහෙත් යුගෝස්ලේවියාව වැනි සමාජවාදී රටකත් අද නීතියක් ගෙනැවිත් ධනපතියන්ගේ මුදල් පාවිච්චි කර හෝටල් හදන්නැයි කියනවා. ඒ වාගේම ඒ අන්දමට හෝටල් හදලත් තිබෙනවා. ඉන්ටර් කොන්ටිනෙන්ටල් හොටේල් නැමැති සංස්ථාවේ කොටස් සියේට පණහකටත් වඩා ඇමෙරිකානු සමාගමකට විකුණා තිබෙනවා. ඇමෙරිකාකාවට හැම දෙනාම වාගේ දොස් කියනවා. එහෙත් ඒ මොකක් නිසාදැයි මා දන්නේ නැහැ. යුගෝස්ලේවියාව සෝෂලිස්ට් රටක්; කොමියුනිස්ට් රටක්. එහෙත් ඇමෙරිකානු ධනපතියන්ට ඉන්ටර් කොන්ටිනෙන්ටල් හෝටලයේ අයිති කොටස් සියේට පණහකට වඩා විකුණා හෝටලයක් හදන්නට බලය දී තිබෙනවා. ඒ අයට දී ඇති සහනය කුමක්ද? තැන්පත් කරන ලද ධනය වුවමනා වූ විටෙක සම්පූර්ණයෙන්ම වුවත් ආපසු ගෙන යන්නට පුළුවනි. සම්පූර්ණ තැන්පත් මුදල ආපසු ගන්නට පුළුවනි. ලැබෙන ආදායමත් අවුරුදු කිහිපයකට බදුවලින් නිදහස්. එහි සම්පූර්ණ පාලනයෙන් සියේට 50 ක් විදේශික මුදල් අයිති අයටයි. යුගෝස්ලේවියාවට ඉතිරි කොටස අයිතියි. ඔය වාගේ සහන රාශියක් අනුව විදේශිකයන්ගේ මුදල් අරන්—ධනපතියන්ගේ මුදල් අරන්—විශේෂයෙන්ම ඇමෙරිකානුන්ගේ මුදල් අරන් ඉන්ටර් කොන්ටිනෙන්ටල් හෝටලය හදලා තිබෙනවා. මුදල් තැන්පත් කර තව තවත් යුගෝස්ලේවියාවේ හෝටල් හදන්නට පුළුවනි. යුගෝස්ලේවියාව පමණක් නොවෙයි, යුරෝපයේ හැම රටක්ම වාගේ එහෙමයි. ඒ නිසා මේ ගැන අපේ ආණ්ඩුවත් කල්පනා කළා. මෙය අපේ අදහසක් පමණක් නොවෙයි. මීට ප්‍රථමයෙන් තිබුණු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුවත් විදේශිකයන්ගේ මුදල් ලංකාවට ගැනීමට උපකාර කරන නීතිය අනුවත් ක්‍රියා කර මේ ව්‍යාපාරය දියුණු කරන්නට අපටත් විදේශිකයන්ගේ මුදල් ලබා ගන්නට බැරිදැයි අපේ ආණ්ඩුවත් කල්පනා කළා. වැඩ බලන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]
කර්මාන්ත ඇමතිතුමා මේ පිළිබඳව මීට වඩා විස්තර වශයෙන් පොත්පත්වලින් කරුණු ඉදිරිපත් කරනවාඇති. මෛත්‍රීපාල සේනානායක ඇමතිතුමා, ෆිලික්ස් ඩයස් බණ්ඩාරනායක ඇමතිතුමා ආදීන් මොන ප්‍රතිපත්තියක් අනුව කටයුතු කර ඇද්දැයි එතුමා විස්තර කර දෙනවා ඇති. ලංකාවට ඇවිත් තමුන්නාන්සේලා තමන්ගේ මුදල් ලංකාවේ තැන්පත් කරන්නැයි එතුමන්ලා විදේශික ධනපතියන්ට කිව්වා. ඒ සඳහා මේ මේ සහන දෙනවාය, අවුරුදු කිහිපයකට බදු අය කරන්නේත් නැහැ, යනාදි වශයෙන් කිව්වා. තැන්පත් කරන ලද මුදලත් තමන්ගේ රටට ආපසු ගෙන යන්නට පුළුවනි. ආදායමත් ගෙන යන්නට පුළුවනි. ඒ නිසා කරුණා කර මෙහාට ඇවිල්ලා අපේ වැඩ කටයුතු දියුණු කරන්නට තමුන්ගේ මුදල් යොදන්නැයි කිව්වා. ඒවා අඩංගු වී තිබෙන පොත්පත්වලින් වැඩ බලන කර්මාන්ත ඇමතිතුමා කියාවි. ඒ වැඩ පිළිවෙළ සුදුසුයයි අපේ ආණ්ඩුවත් පිළිගත්තා. වැඩිපුර කළේ කුමක්ද? ඒ කාලයේ සංචාරක ව්‍යාපාරවලට සහන දුන්නේ නැහැ. සහන දුන්නේ කර්මාන්ත දියුණු කරන්නට පමණයි. සංචාරක ව්‍යාපාරයටත් ඒ සහනයන්ම අපි දෙමුයි අපේ ආණ්ඩුව කිව්වා. ඒ ගැන නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා කියන්නේ මොකක්ද? උන්නැහේ මේ වේලාවේ නිසොල්මන්ව ඉන්නවා.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)
ඒ සහනය විදේශිකයන්ට නොවෙයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මීට පෙර විදේශික මුදල්වලට පමණයි. එය විදේශිකයන් අතර ප්‍රසිද්ධ කළා. අපේ ආණ්ඩුවත් ප්‍රසිද්ධ කළා. ලංකාවේ ධනපතියන්ටත් අපේ ක්‍රමය යටතේ සහනය ගන්නට පුළුවනි. Concessions for the promotion of tourism. මෙහි විදේශිකයන්ට කියා වෙන් වශයෙන් කියා නැහැ. එහෙත් විදේශීන්ට කාටැදෙන විධියට, තමුන්නාන්සේලා මෙහාට ඇවිත් ආපසු මුදල් අරන් යන්නැයි කිව්වා. එහෙත් ලංකාවේ අයටත් දැන් පුළුවනි සහනයක් ලබා ගන්නට. මේ සහනමයි පරණ ආණ්ඩුවත් දුන්නේ. එහෙත් ඒ ආණ්ඩුව සංචාරක ව්‍යාපාරවලට දුන්නේ නැහැ. එහෙත්, කර්මාන්තවලටත් කෘෂිකර්මාන්තයටත් දෙන සහන සංචාරක ව්‍යාපාරවලට මුදල් තැන්පත් කරන උදවියටත් ලබා දෙන්නට අපේ ආණ්ඩුව බලාපොරොත්තු වෙනවා. තමුන්නාන්සේ කියන්නෙ දෙන්ට එපා කියා නම්, අපි දෙන්න අතරේ වාදයක් තිබෙනව. එහෙත් අපේ කල්පනාව එහෙම දීම ප්‍රයෝජනවත් බවයි. එසේ නැත්නම් මේ ඔක්කොම මුදල් ආණ්ඩුව සොයන්ට ඕනෑ.

මම එක උදාහරණයක් දෙන්නම්. ඊයෙ-පෙරේදා අපි ලංකාවේ හෝටල් සංස්ථාවක් ඇති කෙරුව. අපි ඒ නීතිය ගෙනා අවස්ථාවේ විරුද්ධ පාර්ශ්වයේ නායක බණ්ඩාරනායක මැතිණිය මෙහෙම කිව්ව, "මේ නීතිය සකස් කළේ අපියි. අපට ඒක පාර්ලිමේන්තුවට ගෙනෙන්ට බැරි වුණා. දැන් තමුන්නාන්සේලා ගෙනෙනවා" කියා. හරි. ඒක ගෙනාව. දැන් මේ හෝටල් සංස්ථාව "පෑන් ඇමෙරිකන් වර්ල්ඩ් එයාලයින්" නමැති සමාගමත් සමග සම්බන්ධකම් ඇති "ඉන්ටර්කොන්ටිනෙන්ටල් හොටෙල්ස්" නමැති සමාගමත් සමග ගිවිසුමක් ඇති කරගෙන ගෝල්ෆේස් කණුව ළඟ මේ හෝටලය හදන්ට අපි බලාපොරොත්තු වෙනව. ඉතින් මොකක්ද තිබෙන වරද? ආණ්ඩුවෙන් සතයක්වත් වියදම් කරන්නෙ නැහැ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
මේක හදන්න කොයිතරම් මුදලක් වියදම් වෙනවද?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මුදල් යොදවන්නෙ නැතුව හෝටල් හදන්න බැහැනෙ. බිත්තරයක් කඩන්නෙ නැතුව "ඔම්ලට්" එකක් හදන්න බැහැනෙ. මුදල් වියදම් කරන්ට ඕනෑ, හෝටල් හදන්න.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)

අපි අහන්නෙ ගණන කොච්චරද කියලයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මම කියන්නම්, හංගන්න දෙයක් නැහැ.

The cost of this project subsequent to devaluation will be in the region of Rs. 37 million.

රුපියලේ වටිනාකම අඩු කළාට පසුව හෝටලය හැදීමට රුපියල් තුන් කෝටි හැත්තෑ ලක්ෂයක් වැය කරන්ට සිද්ධ වෙනවා. ආණ්ඩුව ශතයක්වත් වියදම් කරන්නේ නැහැ. [බාධා කිරීමක්] ආණ්ඩුවෙන් වියදම් කරන්ටද කියන්නෙ? අපේ මුදල් ඇමතිතුමා මට සල්ලි දෙන්නෙ නැහැ. එහෙම නම් අපට හදන්ට බැහැ. හොටේල් ඉන්ටර්කොන්ටිනෙන්ටල් කියන සමාගම මුදල් තැන්පත් කරන්ට යනවා. තවත් ලංකාවේ ධනපතියනුත් මුදල් තැන්පත් කරන්ට යනවා. අපි මේ ලස්සණ හෝටලය හදනවා. ඒක මම තමුන්නාන්සේලාට පෙන්වන්නම්. (පින්තූරයක් පෙන්වමින්) මේ හෝටලය දැක්කට පස්සෙ තමුන්නාන්සේලා මේක හදනවාට විරුද්ධ වෙයි කියා මම හිතන්නෙ නැහැ. ඉන්ටර්කොන්ටිනෙන්ටල් හෝටල් සමාගමේ නායකයෙක් වන ඩ්‍රේටන් නමැති මහත්මයා මේ පිළිබඳව අවසාන වශයෙන් තීරණයක් ගැනීම සඳහා දැන් ලංකාවට පැමිණ සිටිනවා.

ලංකා හෝටල් සංස්ථාව පිහිටුවීමේදී එහි කොටස් මිළ දී ගැනීම සඳහා ආණ්ඩුවෙන් රුපියල් ලක්ෂ 15 ක තරම මුදල් තැන්පත් කළා. අද ලාංකිකයන් 8,750 ක් මේ හෝටල් සංස්ථාවේ කොටස් ලබාගෙන සිටිනවා. මෙය කොයිතරම් වැදගත් දෙයක්ද? අපේ වැසියන් 8,750 ක් මේ හෝටල් සංස්ථාවේ රුපියල් දෙකේ කොටස් ලබාගෙන තිබෙනවා. ඒ විස්තර මම පාර්ලිමේන්තුවට කලින් ඉදිරිපත් කළා. කිසිම කෙනෙකුට ඒ සංස්ථාවේ කොටස් 25,000 කට වඩා මිලදී ගන්න බැහැ. ඒ නිසා මේ හෝටල් සංස්ථාවේ මහා සභාව පවත්වන්ට සිදු වෙලා තිබෙන්නෙ ගෝල්ෆේස් පිට්ටනියේයි. එතරම් විශාල ශාලාවක් නැහැ. මේ සංස්ථාවේ ඔක්කොම වැඩ කටයුතු කෙරෙන්නෙ සිංහලෙන්. මේව වැරදියි කියනවද? මේව වැරදි යයි කියන්ට පුළුවන් වෙන්නෙ හැම දෙයක්ම ආණ්ඩුවෙන් කළ යුතුයි කියා තමුන්නාන්සේලා කියනවා නම් විතරයි. ඒකත් අපට පිළිගන්ට පුළුවන් ප්‍රතිපත්තියක්. එහෙම නම් මට මුදල් ලබා දෙන්ට ඕනෑ. අපේ මුදල් ඇමතිතුමා මට සතයක්වත් දෙන්නෙ නැහැ. උන්නැහේ මා එක්ක තරහදැයි මා දන්නෙ නැහැ, මට සතයක්වත් දෙන්නෙ නැහැ. උඹට පුළුවන් නම් කර ගනින් කියා නියම කර තිබෙනවා.

ඉතින් අපි කල්පනා කළා, මා සම්බන්ධ වී සිටින සංචාරක මණ්ඩලය කල්පනා කළා, ආණ්ඩුවෙන් මුදල් ලබාගන්ට බැරි නම් මුදල් සොයා ගන්නෙ කොහොමද කියා. රුපියල් කෝටි හතරක්-පහක් තරම මුදල් මේ සඳහා වුවමනා කරනවා. අපි කිව්වා, හොඳයි අපි හෝටල් සංස්ථාව මඟින් හදනවා කියා. එහි රජයේ මුදල් තැන්පත් කර තිබෙන්නෙ රුපියල් ලක්ෂ පහළොවක් විතරයි. අනික් මුදල් තැන්පත් කර තිබෙන්නෙ කොටස් කරුවන් 8,750 දෙනකු විසිනුයි. ඉතින් යුගොස්ලාවියාව සමග සම්බන්ධකම් ඇති කරගෙන කටයුතු කරන මේ ඉන්ටර් කොන්ටිනෙන්ටල් හෝටල් සමාගමට අපි කිව්වා, "තමුන්නාන්සේලාත් මේකට සම්බන්ධ වෙන්න. මේකෙ කොටස් ගන්න. රුපියල් තුන් කෝටි හැත්තෑ ලක්ෂයක වියදමින් මේ හෝටලය අපි හදමු" කියා. දැන් ඒ වැඩේ පටන් ගෙන තිබෙනවා. එය නතර කරන්නද කියන්නේ? නැහැ. ඒක කෙරීගෙන යනවා. හිල්ටන් හෝටලය සම්පූර්ණයෙන්ම පෞද්ගලික වැඩක් බව සඳහන් කරන්නට කැමතියි. රජය ඊට ශතයක්වත් වියදම් කරන්නේ නැහැ. ඒක කෙරෙයිද නැද්ද යන්න කියන්නට මා දන්නේ නැහැ. අපි ඒකට ඇඟිලි ගහන්න යන්නේ නැහැ. අපෙන් යම්කිසි ආධාරයක් ඉල්ලුවොත් ඒ ගැන අපි කල්පනා කර බලනවා. ආණ්ඩුවට එහි සම්බන්ධකමක් ඇත්තේ නැහැ. පුද්ගලයනට යම් යම් බදු සහන සලසා දී තිබෙනවා නම් ඒවාත් ලබා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

ගෙන විදේශිකයන් සමග සම්බන්ධ වී කරන වැඩක් ඒක. [බාධා කිරීමක්] ඊයේ කතා කරද්දී දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) ඒ ගැන යම් යම් කරුණු ඉදිරිපත් කළා. ඒ පිළිබඳව විභාග කර බලා වුවමනා නම් වාර්තාවක් ඉදිරිපත් කරන්නට වුවත් පුළුවනි. බී. ඕ. ඒ. සී. එකත් සමග එකතුවී මීගමුවේ උස්වැටකෙයියාවේ කරන්නට යන Pegasus Reef හෝටලයත් පෞද්ගලික වැඩක්. එහි වැඩ හෙට අනිද්දා ආරම්භ කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒකටත් රජයෙන් කිසි වියදමක් නැහැ. එම ස්ථානය ආරම්භ කිරීම නිසා සිදු වන්නේ කුමක්ද?

අද "ඔබ්සර්වර්" පත්‍රයේ පළ වී තිබුණා මීගමුවේ පැත්තේ හෝටල් සෑදීමේ අළුත් ව්‍යාපාරයක් ආරම්භ වී තිබෙන බව. ඉඩ කඩම් මිල දී ගෙන අද එවැනි ව්‍යාපාර ගෙන යන බව පෙනෙනවා. [බාධාකිරීමක්] සහනයක් ලැබෙන නිසා තමයි එහෙම කරන්නේ. නැත්නම් ඒ සහනයෙන් ප්‍රයෝජනයක් තිබෙනවාද? එවැනි සහන ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවත් දුන්නා. ඒ උදවිය දෙන විට හොඳයි. අපි දෙන විට වැරදියි. ඒ සඳහන් කළේ හෝටල් සම්බන්ධවයි. Pegasus Reef, U. T. A., Hilton, Inter-Continental.—

මෙන්න අද දින "ඔබ්සර්වර්" පත්‍රයේ පළ වී තිබෙන කොටස :

"Tourism sparks building boom

There is a building boom in Negombo, consequent to the development of the Tourist Trade. Private tourist agents and several big hotel firms have moved in.

These businessmen are moving fast to be in time for the completion of the Katunayake International Airport, so that they could get tourists to Negombo before the Colombo man touches them....

...... attractively constructed houses with an enchanting view of the sea could not be given out at rents of Rs. 25 a month. Some of these were four-roomed houses with garages and lawns....."

But hotels are coming up in the Negombo area. මීගමුව පළාතේ හෝටල් හැදෙනවා.

හෙට අනිද්දාට "ජම්බෝජෙට්" නමැති අළුත් ගුවන් යානා වගයක් ඒවි. ඒ එක යානයක හාර පන් සියයක් විදේශිකයන්ට ආ හැකියි.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)
ඒවත් මිලට අරගෙනද?

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)
නැහැ. ලංකාවට විතරක් නොවෙයි, ඒවා එන්නේ. ජාත්‍යන්තර අහස් යානා ව්‍යාපාරයට අළුතින් ඇතුළත් වුණු යන්ත්‍ර වර්ගයක් හැටියට ඒවා හඳුන්වන්නට පුළුවනි. එම යාත්‍රාවක පළමුවෙන්ම ගියේ තිදෙනෙක් පමණයි. 1940 දී පමණ මා ඉන්දියාවට යන විට එම යාත්‍රාවක ගෙන ගියේ තිදෙනායි. දැන් 150 ක් විතර ගෙන යනවා. හෙට අනිද්දා එක් අළුත් යන්ත්‍රයක් මාර්ගයෙන් වරකට 500 ක් පමණ ගෙන යාවි. ලංකාවට විතරක් නොවෙයි, එවැනි පිරිස් එන්නේ. තව අවුරුදු 6 ක් යන්නට ප්‍රථම ඒ යානයකින් වරකට 1,000 ක් පමණත් ඒවි. අප ඒවා ගැන අවබෝධයකින් යුක්තව කටයුතු කරන්නට ඕනෑ.

බණ්ඩාරනායක මැතිනිය කටුනායක අළුත් අහස්යාත්‍රාංගනයට අත්තිවාරම දැම්මේ මා මුලින් කී අන්දමට තිදෙනෙක් පමණක් එන අහස් යාත්‍රා පිළි ගැනීමටද? නැහැ. 500 ක් පමණ ගෙන එන අහස් යාත්‍රාවලට සහනයක් සලසා දීමටයි. හෙට අනිද්දා විදේශයන් රාශියකින් ලංකාවට පැමිණිය හැකි බව අපේ අහස්යාත්‍රා සම්බන්ධ කටයුතු පැවරී ඇති ගරු ඇමතිතුමා කිව්වා. එක ගමනටම නොවෙයි. සාමාන්‍ය තත්ත්වය ඒකයි. දවසින් දවස අහස් යානා විශාල වෙනවා, පිපිරෙන තරමට ලොකු වෙනවා. පැයකට සැතපුම් දහස් ගණනක වේගයෙන් ගමන් කරනවා. පැය තුනක පමණ කාලයක් තුළදී එංගලන්තයටත් යන්න හැකියි. ලෝකයේ සංචාරක ව්‍යාපාරයෙහි තත්ත්වය ඒකයි. එහෙම නම් සංචාරකයින් මෙරටට ආවාම ඒ අය බහින්නෙ කොතැනකටද? අපේ පරණ අහස් යාත්‍රාංගනයටද ඒ අය බහින්නෙ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එම නිසා තමයි බණ්ඩාරනායක මැතිනිය බොහොම දුර දිග කල්පනා කර බලා, කොළඹ ක්‍රමය යටත කැනඩාවෙන් මුදල් නැගි ලබාගෙන අහස් යාත්‍රා තොටුපල විශාල කිරීමේ කටයුතු කරගෙන ගියේ. හෙට අනිද්දා අප එය විවෘත කරනවා.

අහස් යාත්‍රා තොටුපල විශාල කළ විට සංචාරක ව්‍යාපාරය දියුණු වන විට, මෙ රටට පැමිණෙන විදේශික සංචාරකයින් කොහේද ඉන්නෙ? වලපනේ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. එම්. හේරත් මයා.) කීවා ඒ අය මුහුදට තල්ලු කරන්න ඕනෑය කියා. නැහැ. ගරු කථානායකතුමනි, ඒ අන්දමට පැමිණෙන සංචාරකයින්ට මෙරට ඉන්න තැනක් තිබෙන්න ඕනෑ. මෙරටට පැමිණෙන සංචාරකයින් එසේ පැමිණෙන්නේ සාක්කුවල හිල් තබාගෙන නොවෙයි, සාක්කුවල මුදල් තබා ගෙන. එසේ ගෙනෙන මුදල් අද්දවා ගන්න මාර්ග සකස් කරන්න ඕනෑ. [බාධා කිරීමක්] කථා කිරීම නවතා වලපනේ මන්ත්‍රීතුමාට ඔය අන්දමට උත්තර දෙන්න ගියොත් අප අතර හබයකුයි ඇති වෙන්නෙ.

ගරු කථානායකතුමනි, එම නිසා මේ ප්‍රශ්නය ගැන කල්පනා කර බලා ඒ අයට සහනයන් සලසා දෙන්න ඕනෑ. දහස් ගණනක් විදේශිකයින් ඒ ඒ රටවලින් මෙරටට පැමිණීමට බලාපොරොත්තුවෙන් සිටිනවා. එසේ පැමිණෙන අයට පහසුකම් සලසා දීමේ අදහසින් තමයි අහස් යාත්‍රාංගනයට නුදුරුව, මීගමුවේ, හෝටල් කීප යක්ම පිහිටුවන්න යන්නෙ. මෙබඳු සහන යක් දුන්නෙ නැති නම් ඒ උදවිය හෝටල් පිහිටුවන්න යන්නෙ නැහැ. දැනට ඒ අය ආදායම් බදු නොගෙවන මුදලිනුයි මේවා හදන්න යන්නෙ. තමන්ගෙ මූල ධන යෙන්, එසේ නැති නම් නාස්ති කරන මුදලින්, එසේත් නැතිනම් ගෙයක් හැදීමට හෝ වෙනත් කටයුත්තකට වැය කිරීමට අදහස් කරන මුදලිනුයි, මේ හෝටල් තනන්න යන්නෙ. බදු නොගෙවන මුදලක් වෙනත් කටයුත්තක් සඳහා යෙදීමෙන් ලැබිය යුතු ආදායමේ අඩුවක් වෙන්නෙ නැහැ. ඒ අන්දමට හෝටල් තැනීම සඳහා නැන්පත් කරන මුදලට අවුරුදු පහකට බදු සහනයන් දෙනවා. ඒක ඇත්ත. අවුරුදු පහකට පස්සෙ කලින් නොලැබුණු ආදායමක් නැති නම් බද්දක් ලැබෙනවා.. අන්න ඒකයි, කඹුරුපිටියෙ ගරු මන්ත්‍රීතුමාට (පර්සි වික්‍රමසිංහ මයා.) මා දෙන පිළිතුර. ලැබෙන ආදායම නැති වී යනවා නොවෙයි, මෙතෙක් නොලැබුණු ආදාය මක් අවුරුදු පහකට පස්සෙ ලැබෙනවා.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னக்கோன்)*
(Mr. M. Tennakoon)
කොපමණ වෙයි ද?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සේලා නිශ්ශබ්දව සිටි තර මට ආදායම වැඩි වෙයි. විරුද්ධ පක්ෂය කට අරින තරමට මෙම ව්‍යාපාරයට ගොම වැටෙනවා. අපේ කොලොන්නාවෙ ගරු මන්ත්‍රීතුමා (ටී. බී. ඉලංගරත්න මයා.) මෙම ගරු සභාවේදී ප්‍රකාශ කළා, බලයට ආවාම හෝටල් සියල්ලක්ම පවරා ගන්න වාය කියා. ඒ අන්දමට අදහස් ප්‍රකාශ කරන විට කවුද මේවාට මුදල් යොදවන්නෙ? විරුද්ධ පක්ෂය, ආණ්ඩුවක් හැදීමේ විශාල බලාපොරොත්තුවකින් සිටිනවා. එහෙම වුණොත් නැවත වරක් අපේ මැදවච්චියෙ ගරු මන්ත්‍රීතුමා (මෛත්‍රීපාල සේනානායක මයා.) කෘෂිකර්ම ඇමති වෙයි නැති නම් කර්මාන්ත ඇමති වෙයි. මට මතකයි උන්නැහෙ ඇමතිවරයකු වශයෙන් සිටි කාලයේ කර්මාන්තවලට දුන් සහන ගැන. එතුමා නැතැයි කියන්නෙ නැහැ. උන්නැහේ ගරු සභාවට පැමිණෙන බව පෙනෙනවා. උන්නැහෙගෙ වැද ගත් මොලය පාවිච්චි කරමින් කර්මාන්ත වලට සහනයක් දුන්නා. අප සහනයක් දුන්නෙ සංචාරක වැඩ වලට. නමුත් කොලොන්නාවේ ගරු මන්ත්‍රීතුමා කිය නවා බලයට ආවාම, ආණ්ඩුව පිහිටෙව්වාම, හෝටල් සියල්ලක්ම ආණ්ඩුවට ගන්නවාය කියා.

**මෛත්‍රීපාල සේනානායක මයා.** (මැදවච්චිය)
*(திரு. மைத்திரிபால சேனநாயக்க—மதவாச்சி)*
(Mr. Maithripala Senanayeke—Medawachchiya)
නැහැ, එහෙම කිව්වෙ නැහැ.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

එසේ කීවෙ නැතැයි කියනවා නම් ලෝකයේ සෑම තැනකටම ඇහෙන්න එය හඬනගා කියන්න.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

මා හිතන්නෙ නැහැ එවැනි ප්‍රකාශයක් කළාය කියා. එහෙම ප්‍රතිපත්තියක් අපේ පක්ෂයෙ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා (මුදියන්සෙ තෙන්නකෝන් මයා.) මෙම සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න ඕනෑ යයි කීවා. අප හැකි තරම් උත්සාහ කරනවා දියුණු කරන්න. අප හදනවා කිරි මුට්ටියක් දොවන්න. විරුද්ධ පක්ෂය උත්සාහ කරන්නෙ එයට ගොම දමන්නයි. ගොම වෙනුවට මුහුන් දමන්න. ගොම දමනවා වෙනුවට මුහුන් ටිකක් දමන ලෙස, අපට මෙම ව්‍යාපාරයට සහයෝගය දෙන ලෙස තමුන්නාන්සේලාගෙන් සැමදාම ඉල්ලනවා. මෙම ව්‍යාපාරය හොඳ නම්, සාර්ථක වුණොත් එයින් ප්‍රයෝජන අප සියලු දෙනාටම ලැබෙනවා. විදේශ විනිමය නැති නිසා අපට වුවමනා කරන යන්ත්‍ර සූත්‍ර, වෙනත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය වුවමනා ප්‍රමාණයට ලබා ගන්න අපහසු වී තිබෙනවා. මෙය, පිට රටින් කිසිම කරදරයක් නැතුව නිරායාසයෙන් ලැබෙන මුදලක්. විදේශිකයින් මෙ රටට ඇවිත් මුදල් වැය කරන විට අපේ විදේශ විනිමය වැඩි වෙනවා. බාගෙදා අපේ ඇස්තමේන්තු වැරදි වෙන්නත් පුළුවනි, හරි යන්නත් පුළුවනි. ජාත්‍යන්තර බැංකුවල ඇස්තමේන්තු හරියන්නත් පුළුවනි, වැරදි වෙන්නත් පුළුවනි. නමුත් එක් අවස්ථාවක ජාත්‍යන්තර බැංකුවට බැණ බැණ, අනික් පැත්තෙන් ඒ ගොල්ලන් අපේ වැඩ කටයුතු සම්බන්ධයෙන් යම් වරදක් පෙන්වනවා නම් එම වාර්තාව බණ පොතක් වාගේ හිස උඩ තබා ගෙන, මේ ලෝකයේ අනාගත වාක්‍යයන් හරියටම කියන්නෙ අප තමයි කියමින්, අපේ සමසමාජ පක්ෂයේ උදවිය ලෝක බැංකුවට වඳිනවා.

**ලෙස්ලි ගුණවර්ධන මයා. (පානදුර)**
*(திரு. லெஸ்லி குணவர்தன—பாணந்துறை)*
(Mr. Leslie Goonewardene—Panadura)

ඒ නිසයි, තමුන්නාන්සේලාට සල්ලි දෙන්නේ නැත්තේ ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

පංගුවක් වෙලාවට ජාත්‍යන්තර බැංකු වාර්තාව බයිබලයක්. පංගුවක් වෙලාවට පුළුස්සා දැමිය යුතු පොතක්. ඔය විධියට වැදගත් පොත් පාවිච්චි කරන්නට බැහැ. ත්‍රිපිටකය කවදත් ත්‍රිපිටකයමයි. බයිබලය කවදත් බයිබලයමයි. එක වෙලාවකට වැඳුම් පිදුම් කරන්නටත්, තවත් වේලාවක පාගා දමන්නටත් ගියොත් ඇති වන තත්ත්වය මොකක්ද ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

දශ රාජ ධර්මය කවදත් දශ රාජ ධර්මයමයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඔව්, දශ රාජ ධර්මය කදවත් දශ රාජ ධර්මයමයි. ඒක වෙනස් වන්නේ නැහැ. එහෙත් විරුද්ධ පාර්ශ්වයේ සමහර මන්ත්‍රීවරුන් පංගුවක් වේලාවට වැඳුම් පිදුම් කරන පොත තවත් වේලාවක පාගනවා. ඒක නරක වැඩක්. ජාත්‍යන්තර බැංකුව යම් දෙයක් කියන විට එය දෙවියන්ගේ කථාවක් හැටියට සලකන්නට වුවමනාවක් නැහැ. එය හරිද වැරදිදැයි සොයා බලා අපේ අදහස අනුව ක්‍රියා කිරීම අපේ යුතුකමයි. ඩේවිස් නම් වූ ජාත්‍යන්තර බැංකුවේ කෙනකු, අප ඇස්තමේන්තු කළ හෝටල් ගණන වැඩි බව කියනවාලු. ඒක හරි වන්නට පුළුවනි. පුද්ගලයන් සල්ලි ලබාගෙන හෝටල් සාදා ගැනීමෙන් පසුව ඒවා කඩා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැටුණාම අපට ඇති ප්‍රශ්නය මොකක්ද? එතකොට ඒ අය ඒ ගොඩනැඟිලි වෙනත් කටයුතු සඳහා යොදවා ගන්නවා ඇති. ජී. ඕ. එච්. එකේ දැනට බැංකුවක් විවෘත කර තිබෙන බව තමුන්නාන්සේලා දන්නවා ඇති. ඒ වාගේම තවත් හෝටලයක් දැන් ආරෝග්‍යශාලාවක් බවට පරිවර්තනය වී තිබෙනවා. මේවා කරන්නේ ආණ්ඩුව නොවෙයි. විදේශිකයන් නැත්නම් ධනපතියන් මේවාට වියදම් කරනවා. ඒ සම්බන්ධව තමන් කැමති අන්දමට වියදම් කරන්නට පුද්ගලයන්ට නිදහස තිබෙනවා. එදා කර්මාන්ත ඇමතිව සිටි මෛත්‍රීපාල සේනානායක මහතාත්, මුදල් ඇමතිව සිටි එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මහතාත් යම් යම් කර්මාන්ත සහ කෘෂිකර්මාන්ත කටයුතු සඳහා දෙන ලද සහන අප දේශ සංචාරක වැඩ කටයුතුවලටත් දෙනවා. අප දැන් ඉල්ලන්නේ ඒ සහන අනුමත කරන ලෙසටයි. ගරු මුදල් ඇමතිතුමා ගෙන් මේ සහන ලබා ගන්නට මට බොහොම අමාරු වුණා.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

දෙපැත්තේ වෙනස ඇත්තේ ප්‍රමුඛස්ථානය දීම පිළිබඳවයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

අපට වුවමනා මුදල් නොවෙයිද? දැන් රුසියාවත්, යුගෝස්ලාවියාවත්, ඉන්දියාවත් දේශ සංචාරක වැඩ දියුණු කිරීම සඳහා උනන්දුවෙන් ක්‍රියා කරනවා. ඇත්තෙන්ම මෙය ප්‍රමුඛස්ථානය දෙන්නට වටින වැඩක් නොවෙයිද? මුදල් නැත්නම් ප්‍රමුඛස්ථානය මොකටද? මේක ප්‍රමුඛස්ථානය දෙන්නට සුදුසු ව්‍යාපාරයක් නොවෙයිද?

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

ඊට වඩා වැදගත් දේවල් තිබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(திரு. டி. சொய்ஸா சிறிவர்தன)*
(The Hon. J. R. Jayewardene)

අපට ඕනෑ, මුදල්. මුදල් නැතිව කිසිම දෙයක් කරන්නට බැහැ.

**ද සොයිසා සිරිවර්ධන මයා.**
*(திரு. டி. சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

සමහර දෙනකුට භයක් තිබෙන්නේ මෙහිත් හොංකොංවල මෙන් හෝටල් ඇති වේය කියලයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ආ, ඒක වෙනම ප්‍රශ්නයක්. ඒකට පසුව එන්නම්.

අපට වුවමනාව ඇත්තේ හොඳ හෝටල් ගණනාවක් ඉක්මනින් සාදා ගැනීමටයි. ඒ නිසා සංචාරක මණ්ඩලයට අයත්ව තිබුණු හෝටල් හතරක් පහක් පෞද්ගලික අංශයට දෙන්නට අප ක්‍රියා කළා. හික්කඩුව, බෙන්තර සහ අනුරාධපුරය යනාදී ස්ථානවල තානායම් හතරක් පහක් පෞද්ගලික අංශයට පවරා දුන්නා. එසේ දීමේ අදහස පුළුවන් තරම් ඉක්මනින් ඒවා නියම තත්ත්වයට ගෙන ඒමට මං සැලසීමයි.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

ඒවා අලුත්වැඩියා කෙළේ ආණ්ඩුවේ මුදලින්.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

නෑ, නෑ; ඒවා භාර දුන්නායින් පසුව ආණ්ඩුවෙන් ශතයක්වත් වියදම් කෙළේ නැහැ. රජයෙන් සාදා තිබුණු තානායම් වහළක් සුළඟට කැඩී ගියා. හික්කඩුව, අනුරාධපුරය තානායම් පෞද්ගලික අංශයට දුන්නා. තවත් එකක් දෙකක් දුන්නා. පෞද්ගලික අංශය ඒ තානායම් සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ජේ. ආර්. ජයවර්ධන]

රුපියල් ලක්ෂ ගණන් වියදම් කළා. අප ඒවා භාර නුදුන්නා නම් ඒ මුදල වියදම් කරන්නට සිදු වන්නේ ආණ්ඩුවටයි.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

ලැබෙන ලාභයෙන් වියදම් කරන්නට පුළුවනි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මොන ලාභයක්ද? ලැබෙන්නේ ස්වල්ප ලාභයයි. පුළුවන් තරම් ඉක්මනින් ඒවා නියම විධියට සකස් කොට සංචාරක ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා යොදා ගත යුතු ඒවා පවරා දුන්නා. තවත් කීපයක් හෝටල් සංස්ථාවට අයිතියි.

මේ තානායම්වල අය කරන මුදල් වැඩි බව පිළිගන්නවා. එහෙත් ඒ පිළිබඳ පාලනයක් කරන්නට බලයක් නැහැ. පාලනය කිරීමට බලය ලැබෙන නීතිය මෙම ගරු සභාව පිළිගෙන ඇතත් තවම සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙන් එය අනුමත වුණේ නැහැ. එය සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයෙනුත් අනුමත වුණාම මිළ පාලනය කරන්නට අප බලාපොරොත්තු වෙනවා. කෙසේ වෙතත් හෝටල් සංස්ථාවෙන් පාලනය වන තානායම්වල අය කරන්නේ අඩු මිළක්. ඒ ගැන සතුටු වන්නට පුළුවනි. හෝටල් සංස්ථාවෙන් රෙස්ට් හවුසස් 13 ක් පාලනය කරනවා. එක්කෙනකු ඉන්න කාමරයකට අය කරන්නෙ රුපියල් 10 යි. දෙදෙනකු ඉන්න කාමරයකට අය කරන්නේ රුපියල් 15 යි. ලංකාවෙ කෑම වුවමනා නම් එක්කෙනකුට දවසකට රුපියල් 18 ක් අය කරනවා. දෙදෙනකුට රුපියල් 33 ක් අය කරනවා. කෑම වර්ගවල මිලත්, සේවකයන්ට ගෙවන්නට වන පඩිත් සලකා බලායි, මේ ගණන් නියම කර තිබෙන්නේ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඒ මුදල දුප්පත් මිනිහකුට මාසයකටම ඇති.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

දුප්පත් මිනිහකුට බැහැ නේ, තමුන්නාන්සේ ඉන්න විධියට ඉන්න. රුපියල් 25 ක් ලැබෙන දුප්පත් මිනිහකුට, රුපියල් 800 ක් ලැබෙන මන්ත්‍රීවරයකු ඉන්න විධියට ඉන්න බැහැ නේ. ඒක ලෝකයේ හැටි. රුසියාවෙත් එහෙමයි. පන්ති භේදය එහෙත් තියෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

මන්ත්‍රීවරයකුට ලැබෙන්නෙ රුපියල් 600 යි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ආදායම් බද්ද නැතිව තව රුපියල් 200ක් ලැබෙන්නෙ.

**මෛත්‍රීපාල සේනානායක මයා.**
*(திரு. மைத்திரிபால சேனநாயக்க)*
(Mr. Maithripala Senanayeke)

600 න් 300 කට ආදායම් බදු ගෙවනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

හොඳයි, අපි 600 ය කියමු. මාසයකට රුපියල් 25 ක් ලැබෙන කෙනකුට රුපියල් 600 ක් ලැබෙන කෙනකු ඉන්න විධියට ඉන්න පුළුවන්ද? බැහැ නේද? ඒක වෙනස් කරන්නට අපට බැහැ. විප්ලවය කින්වත් ඒක වෙනස් කරන්නට බැහැ. ඒක ලෝකයේ ස්වභාවයක්. මා ඉපදී තිබෙන්නෙ මේ ලෝකයේ පිළිවෙළ වෙනස් කරන්නට නොවෙයි. තියෙන පිළිවෙළේ හැටියට ක්‍රියා කරන්නටයි. සමහර හෝටල් වල ටිකක් වැඩි ගණන් නියම කර තිබෙනවා. හික්කඩුවේ මටත් ගිහින් ඉන්නට අමාරුයි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඒ බොරු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

අමාරුය කියායි කිව්වෙ. ඉන්න බැරිය කිව්වෙ නැහැ. ඒක ලෝකයේ ස්වභාව යක්. අවුරුදු 10 ක් තිස්සෙ තමුන්නාන්සේලා මේ රට පාලනය කළා. එහෙත් මේ ක්‍රමය වෙනස් කළේ නැහැ. අප වෙනස් කරනවාය කියා කියන්නෙ නැහැ, වෙනස් කරන්නට බැරි නිසා. එක් එක්කෙනාගේ ආදායම් හැටියටයි, වියදම් කරන්නෙ. හික්කඩුවෙ එක විධියක්. ගේල්ෆේස් හෝටලයේ තව විධියක්. හිල්ටන් හෝටල යේ තව විධියක්. අනුරාධපුරේ තව විධියක්. එක් එක්කෙනාගේ ආදායමේ හැටියට ඉන්නට තැන් හදනවා ඇති. අඩු ගණනට ඉන්න හෝටලයක් හැදීමට ඉඩමක් අනුරාධපුරයෙන් දෙන්නය කියා මා සංචාරක මණ්ඩලයෙන් ඉල්ලා තිබෙන වා. ඉඩම දෙන්නෙ නැහැ. අර දෙක භාර දීලා තියෙන්නෙ සංචාරකයන්ට ඉන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ඉඩම් ඇමතිතුමා විරුද්ධද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

එතුමා නොවෙයි. අනුරාධපුර සංවර්ධන මණ්ඩලය ඉඩම දෙන්නෙ නැහැ. සර්කිට් ගියාම ලාබෙට ඉන්නට පුළුවන් විධියට හෝටලයක් හදන්නට ඉඩමක් ඉල්ලා තිබෙනවා. රෙස්ට් හවුසස් දෙක පෞද්ගලික අංශයට දුන්නා. නීතිය සකස් වුනාම මිල පාලනය කරනවා. කොයි තරම් පාලනය කළත් දූන් නියම කර තිබෙන ගණන් අය කර ඒවා ගෙන යන්නට බැහැ. ඒ පුද්ගලයන් පාලනය කරන්නට බැහැ. ඒ අයටත් ආදායමක් ඕනෑ; වාසියක් ඕනෑ. මේවා ධනපතීන්ට දුන්න කොටස්. අපි ධනපතීනුත් පාවිච්චි කරනවා. යුගෝස්ලාවියාවත් ධනපතීන් පාවිච්චි කරනවා. ඇමෙරිකාවත් ධනපතීන් පාවිච්චි කර නවා. ඒක වැරදිද ? නැහැ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

ධනපති ආණ්ඩුවක් නේ තියෙන්නෙ ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

යුගෝස්ලාවියාවේ තියෙන්නෙ ධනපති ආණ්ඩුවක්ද ? ඒ ප්‍රතිපත්තිය අනුවයි, අප සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නට බලාපොරොත්තු වන්නේ. අප මුදල් ඇමතිතුමාත්, ආදායම් බදු නිලධාරීනුත් හමු වී මේ ගැන මාස ගණනක් සාකච්ඡා කර බොහොම අමාරුවෙන් මේ සහනය ලබා ගත්තා, සංචාරක ව්‍යාපාරය සඳහා. බණ්ඩාරනායක මැතිනියගේ කාලයේදී කෘෂිකර්මාන්ත ව්‍යාපාරයට දුන්නෙත් මේ සහනයමයි. ඒ නිසා මේක වැරදිය කියන්නට එපා. අත්හදා බලා දියුණු වෙනවා නම් දියුණු වන්නට ඉඩ දෙමු. වෙන විධියකට දියුනු කරන්නට පුළුවන් නම් කියන්න. [බාධා කිරීමක්] නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා (එම්. තෙන්නකෝන් මයා.) මේ ව්‍යාපාරයට කැමැත්ත පළ කිරීම ගැන මට බොහොම සන්තෝෂයි. එහෙත් අපේ සංස්කෘතිය ගැන උන්නැහේට බොහොම ලොකු කැක්කුමක් තිබෙනවා. සිංහලය රාජ්‍ය භාෂාව විය යුතු යැයි පළමු වෙන්ම යෝජනා කළේ මා බව උන් නැහේට මතක් කරන්න කැමැතියි. එතුමා ඉපදෙන්නත් ඉස්සර—1943 දී—මා ඒ යෝජනාව ගෙනාවා. බණ්ඩාරනායක මහතා ඊට විරුද්ධ වුණා. අන්න එහෙමයි, මේ වැඩ කටයුතු පටන් ගත්තේ. මේ රජය කිසිම දවසක අපේ සංස්කෘතියකට විරුද්ධව මොනම පියවරක්වත් ගන්නේ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

උන්නැහේ 1956 දී ගෙනා ඒවාට තමුන්නාන්සේලා විරුද්ධ වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මා පැරදුණා. දිනුවා නම් ඒවා කරන්නේ බණ්ඩාරනායක මහත්මයා නොවෙයි, අපියි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
අටට බැස්සා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඔව්. ඊට පස්සේ 65 ට ආවා. ලෝකෙ හැටි ඔහොම තමයි. ඉහළ නගිනවා, පහළ බහිනවා. එය කිසි කෙනකුට වළක්වන්නට බැහැ. ඒක, ස්වභාව ධර්මයේ හැටි.

මේ ව්‍යාපාරය සංස්කෘතියට විරුද්ධයි කියන්නේ ඇයි? මට එය තේරෙන්නේ නැහැ. අනෙක් රටවල සංස්කෘතියක් නැද්ද. ඉන්දියාවේ නැද්ද? යුගෝස්ලෝවියාවේ නැද්ද? රුසියාවේ නැද්ද? එංගලන්තයේ නැද්ද? මේ ලංකාවේ විතරක්, විදේශිකයන් ඒමෙන් සංස්කෘතියට පහරක් වදිනවාලු. අපේ සංස්කෘතිය ඒ තරම් දුර්වලද? අවුරුදු 2,500 ක් මුල් බැස ගත් සංස්කෘතියක් අපට තිබෙනවා නම්, ඊයේ පෙරේදා ඇති වුණු අමෙරිකාවට පුළුවන්ද, එය කඩකප්පල් කරන්නට? අමෙරිකාව එය කරන්නේ කොහොමද? අමෙරිකාවට වියට්කොංවරුන් පරාද කරන්නට බැහැ. නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමා වැනි අය ඉද්දී අපේ සංස්කෘතිය නැති කරන්නට අමෙරිකාවට පුළුවන්ද? සංස්කෘතිය ආරක්ෂා කිරීම සඳහා අපි එතුමාට උදව් දෙන්නම්. අමෙරිකාව හෝ වෙන කිසියම් රටක් හෝ අප පාගන්නට හදනවා නම් ප්‍රථමයෙන්ම එයට විරුද්ධව ක්‍රියා කරන්නේ අපේ පක්ෂයයි. අප කිසිම රටකට බැඳී නැහැ. රුසියාවට හෝ අමෙරිකාවට අප කත් අදින්නේ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
එංගලන්තයට?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
එංගලන්තයට කත් අදින්නෙත් නැහැ. අපේ රට එංගලන්තයෙන් නිදහස් වුණේ අපේ අගමැතිතුමාගේ පියාගේ ව්‍යාපාරය නිසයි. තමුන්නාන්සේලාගේ පියවරුන්ගේ ව්‍යාපාරයක් නිසා නොවෙයි. [බාධා කිරීම්] එහෙම කියා නැහැ. ඒ බොරු. අප කිසිම රටකට යටත් වන්නේ නැහැ. එහෙත් ඒ අයගේ ආධාර ලබා ගන්නවා. ඒවා ගන්නට ඕනෑ. අප හැම රටෙන්ම ඉගෙන ගන්නවා. බුදු හාමුදුරුවො ලංකාවෙ පුද්ගලයෙක් නොවෙයි; ඉන්දියාවේ කෙනෙක්. ජේසුස් වහන්සේ ඊශ්‍රායෙලයේ කෙනෙක්. මොහමඩ්තුමා අරාබියේ. ඒ අය විදේශිකයෝ. හැම රටකම තිබෙන හොඳ අරගෙන මේ රටේ දියුණුවට, ලාංකිකයන්ගේ දියුණුවට, ප්‍රථමයෙන්ම සිංහල බෞද්ධයන්ගේ දියුණුවට මේ ව්‍යාපාරය ගෙන යන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසාන කරනවා.

අ. භා. 3.50

**ගරු ෂෙල්ටන් ජයසිංහ**
*(கௌரவ ஷெல்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)
කථානායකතුමනි, මට ප්‍රථමයෙන් කථා කළ රාජ්‍ය ඇමතිතුමා විශේෂයෙන්ම කරුණු දෙකක් ගැන සඳහන් කළා. එතුමා සඳහන් කළ එක් කරුණක්, ඉදිරිපත් කර ඇති සංශෝධන පනත් කෙටුම්පතින් සහන ලැබෙන්නේ තැන්පත් මුදලට පමණක් බව. ඒ වාගේම එතුමා පෙන්වා දුන්නා, තමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන සංචාරක ව්‍යාපාරයෙන් කිසියම් හානියක් වේ යැයි බලාපොරොත්තු නොවිය යුතු බව.

නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමාත් (එම්. තෙන්නකෝන් මයා.), බෙන්තර-ඇල්පිටිය ගරු මන්ත්‍රීතුමාත් (කාරියවසම් මයා.), කඹුරුපිටියේ ගරු මන්ත්‍රීතුමාත් (පර්සි වික්‍රමසිංහ මයා.) ඉදිරිපත් කළ ප්‍රශ්න කීපයක් සම්බන්ධයෙන් බදු ක්‍රමය අළලා පිළිතුරු කථාවක් කිරීමට රාජ්‍ය ඇමතිතුමා මට භාර දුන්නා. බදු ක්‍රමය ගැන කථා කරන විට ඉංග්‍රීසියෙන් කථා කරන්නට සිදු වීම ගැන මා සමාව ඉල්ල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නවා. බදු ක්‍රමය සම්බන්ධයෙන් මට ලැබී ඇති පොත් ඔක්කොම තිබෙන්නේ ඉංග්‍රීසියෙන්. [බාධා කිරීම්] තමුන්නාන්සේලා ආණ්ඩු කළ කාලය ගැනත් වචන ස්වල්පයක් කථා කරන්නට මා බලාපොරොත්තු වෙනවා. මා ළඟ තිබෙන මේ පොත ප්‍රකාශයට පත් කර තිබෙන්නේ, එවකට සිටි කර්මාන්ත ඇමති, මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමායි (මෛත්‍රීපාල සේනානායක මයා.) මේකත් එක්තරා පින්තූරයක් තමයි. නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමාගේ පින්තූරයට වැඩිය මෙය හොඳයි. විදේශිකයින් මෙය දැක්කා නම් ඔවුන් මේ රටට විශාල වශයෙන් ඇදී එනවාට කිසිම සැකයක් නැහැ. නිකවැරටියේ ගරු මන්ත්‍රීතුමාට එදා තිබුණේ අද එතුමාට තිබෙන තත්ත්වය නොවෙයි. එදා එතුමන්ලා සකස් කළ පින්තූර දැක්කා නම් විදේශිකයින් මේ රට පමණක් නොව එතුමාත් බලන්නට එනවාට සැකයක් නැහැ.

මා මගේ කථාවේ ඉංග්‍රීසි කොටස ආරම්භ කරන්නට බලාපොරොත්තු වන්නේ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමියගේ (සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය.) ප්‍රකාශනයෙකින් කොටසක් කියවීමෙනුයි. මේ බදු සහනයන් සම්බන්ධව කථා කිරීමේදී, මැදවච්චියේ ගරු මන්ත්‍රීතුමාගේත්, දොම්පේ ගරු මන්ත්‍රීතුමාගේත් (එෆ්. ආර්. ඩයස් බණ්ඩාරනායක මයා.) යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගේත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) ප්‍රකාශන මගේ කථාවට සම්බන්ධ කර ගන්නට මා බලාපොරොත්තු වෙනවා. ඒ සැමදෙනාටම වඩා වැඩි තැනක් මගේ කථාවෙහිදී දෙන්නට මා බලාපොරොත්තු වන්නේ අත්තනගල්ලේ ගරු මන්ත්‍රීතුමියටයි.

Sir, the draft Short-Term Implementation Programme of 1962 was presented to us under the auspices of the then Prime Minister, Mrs. Bandaranaike. I want to read to you one or two things from this document. The first thing I would like to show is that at that stage the then Prime Minister mentioned that, apart from agriculture and industries, there was a third potential source of foreign exchange income for this country, and that was tourism. She had specially taken it under her Ministry so that pride of place could be given to tourism.

I want to make this clear because some hon. Members think that you must not engage in tourism. They ask, "Why do you give these concessions to tourism? It is all right your giving concessions to industries and agriculture, but why do you give concessions to tourism?" Therefore, I want to point out to you that this is not merely our opinion; it was the opinion of the then Prime Minister. I am very happy that she is coming in. I was referring to their Short-Term Implementation Programme and what she said regarding these tax incentives.

I think in the matter of tax incentives nobody has been so liberal as my good Friend, the hon. Member for Yatiyantota (Dr. N. M. Perera). He was the most liberal Finance Minister, a Finance Minister who gave a tax concession of 67 per cent without any investment.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

Where? What are you saying?

ගරු ෂෙල්ටන් ජයසිංහ
*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)

Why, what about your tax amnesty?

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

That is not a tax concession. You do not understand what it is.

ගරු ෂෙල්ටන් ජයසිංහ
*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)

He was the most liberal of them all. I say it is very good, and I am congratulating him on it.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரோ)*
(Dr. N. M. Perera)

You are attacking me for it; you are congratulating me for it; where do we stand? Now you imitate me by carrying the thing through.

ගරු ෂෙල්ටන් ජයසිංහ
*(கௌரவ ஷெல்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)

I wish we could follow you in this Debate also. I would like to read to you what the then Prime Minister, Mrs. Bandaranaike, said about tax incentives in her Short Term Implementation Plan. This is a subject that has received the continuing attention of the Government. This was referred to in a White Paper entitled "The Budget and Economic Development" published last year.

I shall read first the speech of the hon. Member for Dompe (Mr. F. R. Dias Bandaranaike) on tax incentives. The Government's policy on private and foreign capital was set out in the Budget speech of 1960-61 as follows:

........"Foreign capital that will conform to these requirements will be welcome in Ceylon. Such capital will enjoy all the tax, tariff and other benefits ........" [OFFICIAL REPORT, 15th September 1960; Vol. 39, c. 1636.]

This refers to tax concessions for all types of investment including tourism, which came under the special attention of the then Prime Minister.

It was stated that foreign capital would enjoy all tax concessions and other benefits accruing to local capital and would be given the following further facilities in addition to what local capital would enjoy. These were the additional benefits given by the then Prime Minister. I am reading from page 254 of the Short-Term Implementation Programme:

"(1) Permission to repatriate freely dividends and, eventually, the assets." ——.

I want to know from any one honourable Member, in what way have we deviated from what the then Prime Minister said, and in the grant of concessions included in this amending Bill in what way have we deviated?

——"(2) Permission to bring in necessary technical and managerial personnel;

(3) Remittance abroad of part of the earnings of such personnel;

(4) Avoidance of double taxation."

Even the hon. Member for Yatiyantota when he became Finance Minister endorsed this policy. He never revised it. I shall show you by reading out from his Budget speech that he in fact went a little further than that.

ද සොයිසා සිරිවර්ධන මයා.
*(திரு. டி சொய்ஸா சிறிவர்தன)*
(Mr. de Zoysa Siriwardena)

He continued the policy.

ගරු ෂෙල්ටන් ජයසිංහ
*(கௌரவ ஷெல்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)

Very good. We are continuing that further.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

I thought you came to change it.

ගරු ෂෙල්ටන් ජයසිංහ
*(கௌரவ ஷெல்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)

Only parts of it.

සිරිමාවෝ බණ්ඩාරනායක මිය.
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)

What suits you?

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Only the bad parts.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)

The majority of it is good. Only very little is bad. We are trying to change that little.

With regard to tax incentives, they said :

"Consideration is being given to embody these and other aspects of Government's policy in regard to private foreign capital in a Parliamentary Resolution. A Committee on foreign investments has now been set up in the Ministry of Industries to consider proposals for investment in which foreign capital will participate."

That is why I want to read what the then Prime Minister said. She said that tourism should be encouraged, and as a matter of fact I remember that the maiden speech of the good Lady was in regard to tourism. She got up and said that she was the author of this proposal. We are not disputing it.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please ! The Sitting is suspended till 4.30 P.M. On resumption, the Hon. Deputy Speaker will take the Chair.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ. භා. 4.30 ට නියෝජ්‍ය කථානායකතුමාගේ [ශ්‍රීමත් රසික් ෆරීඩ්, ඕ.බී.ඊ.] සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

இதன்படி அமர்வு பி. ப. 4.30 மணிவரை இடைநிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று. உப சபாநாயகர் [ஸ்ரீமான் ருசிக் பரீத், ஓ.பீ.ஈ.] தலைமை தாங்கினார்.

*Sitting accordingly suspended till* 4.30 P.M. *and then resumed,* MR. DEPUTY SPEAKER [SIR RAZIK FAREED, O.B.E.] *in the Chair.*

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)
The Hon. Shelton Jayasinghe)

Mr. Deputy Speaker, when the tea interval was taken I was on the point that the idea of encouraging tourism was first considered in a serious way by the hon. Leader of the Opposition, who was then the Prime Minister. She considered it so important that she took the subject directly under her control, and in the Short-Term Implementation Programme—I read extracts from it earlier—she announced the concessions that would be made. She went further and said that, apart from the concessions that already existed, certain extra concessions would be allowed. The same concessions that she mentioned are now being allowed.

I must say that in this instance there is one exception, and that is the tax exemption period—[*Interruption*]. That is a matter of policy between the hon. Member and myself. I wish I could agree with him. If he thinks it is wrong, I say he is entitled to think it is wrong.—[*Interruption*]. He himself said that. He said that in certain matters we disagree, and I am sorry that in this instance we disagree. I only wish we could agree. It is unfortunate that on a matter which the S. L. F. P. Government and also the Coalition Government thought was of paramount importance we are disagreed now. I would be only too happy if agreement among all parties was possible on this matter.

I only want to show that some of the statements made, may I say, were partially true. They said : "What is this tourism ? What are you trying to earn out of it ? Is it so very important ? What are these concessions that you are making ? " I have refuted two of those allegations. I have shown that tourism is very important, and, secondly, that the scheme must be implemented as quickly as possible.

The implementation of a programme for the development of tourism was taken up in the Budget speech of the hon. Member for Dompe (Mr. F. R. Dias Bandaranaike), the then Minister of Finance. I want to read to the House some extracts from the booklet, "Budget and Economic Development", presented by the hon. Member for Dompe on 27th July

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1961. I do not want to read out the whole thing. I shall only read one relevant paragraph. This is what it says at page 51 :

"TOURISM

It is very clear that Tourism is a potential foreign exchange earner of considerable importance. Several countries that have addressed their minds seriously to this industry in the post-war years have reaped rich harvests."

It gives the examples of India, Japan, Greece, and so on. It further says :

"The economics of Tourist industry varies in a number of ways from that of ordinary industrial investment."

I want the hon. Member for Balapitiya (Mr. L. C. de Silva) to remember this. Investments in tourism, conceded the hon. Member for Dompe, the then Finance Minister, vary from other types of industrial investment.

This is what he said :

"The economics of the Tourist industry varies in a number of ways from that of ordinary industrial investment. . . . "——

According to him, it requires added incentives ; it requires various other forms of incentives.

". . . . Successful earnings depend not merely on certain capital provisions, but also on a great deal of appropriate administrative and organisational changes, as well as right publicity. A first step in this direction has already been taken by the subject of Tourism being assigned to the Ministry of Defence and External Affairs."

That was the opinion of the then Government. Their opinion was that tourism required something more in the way of incentives than what was already allowed then.—[*Interruption*]. That is the view expressed by the then Minister of Finance. You ask the leader of your party. If you want to dig into the economics of the industry and find an answer, ask the hon. Member for Yatiyantota (Dr. N. M. Perera) because I have not the time to explain all that.

It required further incentives for the full realization of all the expectations from the tourist industry. So said the then Minister of Finance, Mr. F. R. Dias Bandaranaike. Now let us see what were the incentives that were then given. The then Minister of Finance wanted to do something better. He said that this industry deserved more attention, more incentives, and more administrative care than other industries.

The first thing that comes in the annexe to this document is Tax Holiday, the five-year tax holiday. This is what it says :

"New industrial and deep-sea fishing undertakings which use power and employ at least 25 persons—exempt for 5 years on profits not exceeding 5 per cent of the capital invested."

The present Minister of Finance says that five years tax exemption is not sufficient, and that something more than five years must be allowed. It may be six years ; it may be seven years, or it may be 20 years. We think that an additional 15 years is necessary. We may be wrong, Sir, but that is not something which is diametrically opposed to what was then permitted. When this Bill comes before the Standing Committee let us thrash out that point. The Hon. Minister of Finance and the Hon. Minister of State may agree to some of your suggestions. I do not know. Let us wait and see.—[*Interruption*]. But it is an established fact that hon. Members on both sides of the House say that the five-year tax exemption is not sufficient for the tourist industry. Let us get that clear.

To quote :

"Lump sum allowance for depreciation :

In lieu of the former annual depreciation allowance, a once-and-for-all lump sum depreciation allowance is granted in respect of plant, machinery, fixtures and buildings."

Why are you now grousing over this lump sum allowance for depreciation ? The hon. Member for Nikaweratiya (Mr. M. Tennakoon) asked : why are you giving this exemption ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

The depreciation anticipated or calculated to be given was even more at that time. What were the rebates then allowed ?

"Industrial buildings : 33 1/3 per cent of the cost. Durable plant and machinery : 50 per cent of the cost. Normal machinery : 66 2/3 per cent of the cost. Short-lived equipment : 80 per cent of the cost."

You will thus see that the then Minister of Finance said that these rebates were not sufficient. What is your grouse now ? What is your argument ? And there come the development rebates and the various exemptions which I do not want to go into.—[*Interruption*]. I am only refuting the charges that have been made in general, and that is why I do not want to be too specific. I only want to show hon. Members opposite that we are agreed, that we are on common ground. It is only on the quantum that we differ, and when this Bill goes before the Standing Committee I am sure we shall find agreement on that aspect of it too.

The argument was raised that we are going to freely allow the investors to repatriate dividends. Let us see how far we differ on that too—whether we disagree in any way on that matter. This is what the hon. Member for Dompe (Mr. F. R. Dias Bandaranaike), the then Minister of Finance, and at that time :

"The repatriation of dividends and eventual repatriation of assets will be freely permitted."—

"will be freely permitted"

—"The bringing in of necessary technical and managerial personnel will be freely permitted. Such personnel will be permitted to transmit a part of their earnings abroad."

And again :

—"In principle make provision for the avoidance of double taxation by means of government to government agreement."

Have we done anything more ? Have we brought anything diabolical into our taxation amendments ? I do not see why they should differ in this fashion. Mr. Deputy Speaker, as you remind me that this Bill is going before a Standing Committee, I do not want to amplify my statements any further on that matter.

We are now agreed that industrial development, agricultural development and the development of tourism were accepted by the previous Government as they are being accepted by us. I have shown you that the tax concessions that they then proposed are in no way different from what we are offering. Probably, they may have gone further. Of course, for argument's sake they say, "No", but there is nothing to substantiate their argument. I have read out to you what that Government proposed then. The then Minister of Finance made a statement inviting foreign investment, setting out the government policy, offering tax exemptions, permitting technical and managerial personnel to come here and stating the advantages that such personnel will enjoy in employment in Ceylon in these industries. The various incentives offered in respect of the tourist industry in particular are contained in the Investors' Guide, Bulletin No. 1, on Industrial Development, issued by the then Minister of Industries the hon. Member for Medawachchiya (Mr. Maithripala Senanayeke).

I have shown the House what the S. L. F. P. Government proposed. I want to show you what the hon. Member for Yatiyantota, leader of the second party in the Coalition Government, said. What did he say ? Did he differ from our policy in any way ?—[*Interruption*]. Did he say that the concessions that were offered then were too magnanimous, that they were too wide, that they must be curtailed ? I refer to his Budget speech of 1964-65.

He says :

"At present, there is no control over the quality or the price of local products. While the State has given all encouragement to local industries by way of tax incentives and protection from foreign competition, certain private industrialists have not been slow to exploit the consumer by producing goods of low quality and limited durability."—[OFFICIAL REPORT, 30th July 1964 ; Vol. 56, c. 1648.]

Digitized by Noolaham Foundation. noolaham.org | aavanaham.org

[ගරු ෂෙල්ටන් ජයසිංහ]

The then Minister of Finance states that no impediment would be placed on foreign investment. If it is argued that large combines should not be permitted to form themselves into cartels, as the hon. Joint Member for Colombo South (Mr. Bernard Soysa) says, I want to read to the House what the hon. Member for Yatiyantota said then. I read further from his Budget speech :

"Capital formation in the private sector is encouraged by the relief granted to approved investments under Section 69 of the Inland Revenue Act and the five year tax holiday under Section 6 of the same Act."

ආචාර්ය එන්. එම්. පෙරේරා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

This has already been done.

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்றன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)

I am not contesting that. I am not disagreeing with the hon. Member. I am only pointing out to this House that the hon. Member for Yatiyantota, if he wanted to, could have revised these tax concessions ; but he did not do so because he thought that these tax incentives, in the context of present-day industries, were eminently suitable.

I want to read further because this is very important. I have a high regard for the hon. Member. But some people think that he is of a different opinion. His ideology may be anything, but he is a person who has applied that to circumstances in the context of existing conditions.

I well remember the hon. Member's words to the then Member for Bulathsinhala when the latter left the Lanka Sama Samaja Party. He said, "You are living in the Victorian days. Times have changed. You must change with the times."

So, he is of the opinion that the tax concessions given to industry were fitting and right ; that they must be continued ; that the same concessions as were given previously must be given.

I read further :

"This relief together with the exemption of dividends up to 10 per cent from personal income tax are sufficient incentives for the promotion of development and should provide adequate capital for this purpose."

And he gave an additional relief. He says :

"In addition, a development rebate in respect of new investments in plant and machinery is available at a general rate of 20 per cent and a special rate of 40 per cent for approved undertakings."—[OFFICIAL REPORT, 30th July 1964 ; Vol. 56, c. 1648.]

Now, that was an additional rebate that was given by the hon. Member for Yatiyantota, a rebate in addition to those already made available. He gave a further 20 per cent and a 40 per cent rebate for new investments in plant and machinery for approved undertakings.

That was how he helped capital formation. He knew what capital formation was and he knew how difficult was the process of capital formation in regard to new projects like these. I am applying what he said to what the hon. Leader of the Opposition and the hon. Member for Dompe said. They said that tourism requires more incentives than what is normally allowed to industrialists. I presume that when the hon. Member for Yatiyantota gave those added incentives he had in mind extended rates to tourism because he himself said, in the context of what the then Prime Minister had said, that tourism requires added incentives. Therefore, the hon. Member for Yatiyantota allowed those added incentives. What is your grouse now ?

I am aware of the other tax rebates that were given by the hon. Member for Yatiyantota. One was a rebate that was never contemplated in Ceylon, never before implemented, namely, the tax rebate on capital.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

On what ?

**ගරු ෂෙල්ටන් ජයසිංහ**
*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)

On undisclosed capital. There was capital formation in a big way. Your opening balance jumped by two to three hundred per cent. So why are we at cross-proposes at this moment ? How is it that you can find it in your heart to disagree with the avowed intent of the hon. Leader of the Opposition proposed by the hon. Member for Dompe, seconded by the hon. Member for Medawachchiya and implemented by the hon. Member for Yatiyantota ? The hon. Members who spoke had the cheek to oppose such eminent brains on that side ! I only hope that when it comes to refer this Bill to a Standing Committee it will not be difficult for us to agree as I find that on the question of tourism all the parties and hon. Members of this House are agreed that tourism is a potential source of large earnings for this country, and I sincerely hope that in the coming year there will be a physical appreciation of these earnings.

අ. භා. 4.53

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සාකච්ඡා කෙරෙන මෙම පනතින් දී තිබෙන බදු සහනයන් පසුගිය ආණ්ඩුව විසින් දී තිබුණු බදු සහනයන්ට සමාන බව මේ ගරු සභාවට ඔප්පු කරන්නට, මට පෙර කථා කළ කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ වැඩ බලන ගරු ඇමතිතුමාත් ගරු රාජ්‍ය ඇමතිතුමාත් උත්සාහ ගත්තා. ගරු රාජ්‍ය ඇමතිතුමා නම් මෙම බදු සහන දීමේ කාල සීමාව පිළිබඳ වෙනස වත් සඳහන් කෙළේ නැහැ. එහෙත්, වැඩ බලන ගරු ඇමතිතුමා කියවාගෙන ගිය හැන්සාඩ් වාර්තාවෙහි එම වෙනස සඳහන් වී තිබුණු නිසා එතුමාට එය නොකියවා සිටින්නට බැරි වුණා. යම් රටක සංවර්ධනය සඳහා එම රටේ පෞද්ගලික අංශය යොදවතොත් ඔවුන් යොදවන මුදල් සඳහා බදු සහනයන් දීම අවශ්‍ය වන බව මා පිළිගන්නවා. පසුගිය ආණ්ඩු දෙකත් මේ රටේ කර්මාන්ත සංවර්ධනයක් ඇති කිරීම සඳහා බදු සහන දුන්නා. එහෙත් එම සහන ඇත්ත වශයෙන්ම අවුරුදු 5 කට පමණක් සීමා වුණා. අද මේ රජය යෝජනා කරන අන්දමට, සංචාරක ව්‍යාපාරය සඳහා යොදවනු ලබන මුදල්වලට, පසුගිය ආණ්ඩුව දුන්නාක් මෙන් හතර ගුණයක සහන ලැබෙනවා. එම නිසා, මට පෙර කථා කළ ගරු වැඩ බලන ඇමතිතුමා කී හැටියට, මේ සහන දෙක සමාන වන්නේ කොහොමද යන වග මට නම් තේරුම් ගන්නට බැහැ. අවුරුදු 5 ක කාලය තුළ සම්පූර්ණ බද්දෙන් නිදහසත්, ඉනික්බිති ව අවුරුදු 15 ක කාලය තුළ සියයට 50 ක බදු නිදහසත් මෙම පනතින් යෝජනා කර තිබෙනවා.

මේ රටේ සංචාරක ව්‍යාපාරය දියුණු කර ගත්තොත් එයින් රටට විශාල ආදායමක් ලබන්නට පුළුවන් වෙනවා වාගේම අපේ කෘෂිකර්ම හා කර්මාන්ත සංවර්ධනයක් ඇති කර ගැනීම ඊට වඩා වැදගත් ව්‍යාපාරයක් වන බව ගරු රාජ්‍ය ඇමතිතුමාත් රජයත් පිළිගන්නවා ඇතැයි මා අදහස් කරනවා. මෙම පනතින් යෝජනා කෙරෙන බදු සහනවලිනුත් වැඩි තැනක් දෙන්නේ සංචාරක කටයුතුවලටයි. ආහාරයෙන් රට ස්වයංපෝෂිත කරන්නට ගරු අගමැතිතුමා ප්‍රධාන රජය විශාල වෑයමක්, ප්‍රයත්නයක් දරන මෙවැනි යුගයකදී කෘෂිකර්ම කටයුතු සඳහා දෙන බදු සහන සංචාරක ව්‍යාපාරය සඳහා දෙන සහනවලට සමාන තත්ත්වයක් ගන්නේ නැහැ. කෘෂිකර්මාන්ත සංවර්ධනයෙහි යෙදෙන අයට ලැබෙන්නේ අවුරුදු 5 ක බදු සහනයක් පමණයි. එහෙත් සංචාරක ව්‍යාපාරය සඳහා—මා කලිනුත් කී අන්දමට—කෙළින්ම අවුරුදු 20 ක බදු සහනයක් ලැබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

වැරදියි. අවුරුදු 20ක සහනයක් ලැබෙන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

පණතේ එම කොටස මම කියවන්නම්.

"මෙම අන්තර් වාක්‍යයේ පරමාර්ථය වනුයේ අවුරුදු පහක කාලසීමාවකට බදු නිදහස් වීමේ වරය ලබා ඇති, 1969 මාර්තු 31 වන දිනට පෙර අනුමත කරනු ලැබූ ඉදුම් හිටුම් සහිත භෝජනාගාරයක් වෙතොත්, ඒ අතරම එය වගකීම් සීමා සහිත කරන ලද සමාගමක් ද වී ඇත්නම්, සම්පූර්ණ බදු නිදහස් වීමේ වරය දී ඇති කාලය ඉකුත් වූ පසුවත් එයින් ඉක්බිතිවම තවත් අවුරුදු 15 ක කාලයක් යන තෙක් සාමාන්‍යයෙන් ගෙවිය යුතු බද්දෙන් දෙකෙන් පංගුවක බද්දකට පමණක් යටත් කිරීමයි."

මේ බදු සහන දෙන කාල සීමාව කොපමණද යන වග ගරු රාජ්‍ය ඇමතිතුමා දන්නේ නැහැ. ගරු මුදල් ඇමතිතුමාවත් දන්නේ නැහැ. ව්‍යාපාරිකයින් එතුමාගේ කනෙනුත් රිංගලා. මේ ආණ්ඩුව ගෙන යන්නේ ඇමතිවරුන් නොව මේ ව්‍යාපාරිකයින් විසිනුයි. මේ පනත් හදන්නේ පෞද්ගලික ව්‍යාපාරිකයින් විසින්. මේවායෙහි මොනවා තිබෙනවාද යන වග ගරු ඇමතිවරුන් දන්නේ නැහැ.

මේ ව්‍යාපාරිකයන් එතුමාගේ කනිනුත් රිංගා යනවා. මේ ආණ්ඩුව ගෙන යන්නේ ඇමතිවරුන් නොව, ව්‍යාපාරිකයනුයි. පනත් හදන්නේත් ව්‍යාපාරිකයන් විසිනුයි. ගරු ඇමතිතුමා දන්නේ නැහැ, කොයි තරම් ප්‍රමාණයක සහනයක් දෙනවාද කියාවත්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්මයට ප්‍රධාන තැන දෙනවා යයි අඬබෙර ගසමින් කෑ ගසන මේ ආණ්ඩුව මෙවැනි සහනයන් කෘෂිකර්මයට නොදෙන්නේ ඇයි? කෘෂිකර්ම අංශයේ තිබෙන දුෂ්කරකම් ගැන මා පසුව කියන්නම්. සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමෙන් අපේ රටට ආදායමක් ලබාගන්න පුළුවන් වන බව අප පිළිගන්නවා. නමුත් අද අපේ රටේ පවත්නා තත්ත්වයේ හැටියට මේ විදේශිකයන් මේ රටට පැමිණේවිදෝ කියා අපට බියක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න ප්‍රථම අපේ රටට විදේශික සංචාරකයින්ට එන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න ඕනෑ. මේ රටේ වෙසෙන ජනතාව වසංගත රෝගවලින් පෙළෙනවා. මැලේරියා රෝගයට ගොදුරු වූ විශාල සංඛ්‍යාවක් ඉස්පිරිතාලවල සිටිනවා. එවැනි භයානක රෝගයක් රටේ හැම තැනම වාගේ පැතිර තිබෙන අවස්ථාවක එම රෝගය ඔවුන්ගේ රටවලටත් ගෙන යාම සඳහා විදේශිකයන් මේ රටට පැමිණේවිද? ඒ නිසා විදේශික සංචාරකයන් මේ රටට ඇද ගන්න නම් අපේ රටේ ජීවන තත්ත්වය මීට වඩා උසස් කරන්න ඕනෑ.

සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමෙන් අපට විදේශ විනිමය ලබා ගන්න පුළුවන් වුණත්, ඒ මගින් රටේ සංවර්ධනයක් ඇති වේවිය කියා අපට හිතන්න බැහැ. කර්මාන්ත සංවර්ධනය, කෘෂිකර්ම සංවර්ධනය වැනි දේවලින් රටේ තිබෙන වැදගත්ම ප්‍රශ්නයක් වන රක්ෂා රහිත ප්‍රශ්නය, ජීවන වියදම ඉහළ යාමේ ප්‍රශ්නය ආදී ප්‍රශ්න විසඳෙන්න පුළුවනි. ලිහිල් වෙන්න පුළුවනි. නමුත් සංචාරක ව්‍යාපාරය කොයි තරම් දියුණු වුණත්—ඇත්ත වශයෙන්ම ඒ ව්‍යාපාරය දියුණු වෙන්න වෙන්න මා කලින් කී ප්‍රශ්න තව තවත් උග්‍ර වෙනවා. සංචාරක ව්‍යාපාරයට මා විරුද්ධ වෙනවා නොවෙයි. මා කියන්නේ සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට පළමු මේ රටේ කෘෂිකර්මය සහ කර්මාන්ත සංවර්ධනයක් ඇති කළ යුතු බවයි. මේ තරම් විශාල සහනයක් ලබා දී දේශීය හා විදේශීය ධනපතියන්ට මුදල් ගරා ගැනීමට අවස්ථාව දෙමින් කරන්න යන මේ ව්‍යාපාරයෙන් අපි බලාපොරොත්තු වන ප්‍රයෝජනය ලැබේද කියන එක සැක සහිත කරුණක්. ගරු රාජ්‍ය ඇමතිතුමාත් ඒ බව පිළිගත්තා. එය අනාගත වැකියක් පමණයි. එය සමහරවිට වෙන්නත් පුළුවනි, නොවෙන්නත් පුළුවනි. නමුත් කෘෂිකර්ම සහ කර්මාන්ත ව්‍යාපාරයක් රටේ ඇති කළොත් එයින් හොඳ ප්‍රතිඵල ලැබෙන බව ස්ථිර වශයෙන්ම අපට කියන්න පුළුවනි. අපේ ගරු රාජ්‍ය ඇමතිතුමා විසින් කියන්න යෙදුනා, අනුරාධපුරේ තිබුණ තානායම විදේශ සංචාරකයන් ලොකු හෝටලයක් බවට පත් කරන්නය කියා කොම්පැණියකට භාර දුන් බව. ඒ නිසා අනුරාධපුරයට ගිය සාමාන්‍ය රටවැසියෙකුට නවතින්න තැනක් නැහැ. ඔවුන්ට නවාතැන් ගැනීම සඳහා තානායමක් හදන්න ඉඩමක් නැතිලු. මා අසන්නේ අර තිබුණු තානායම මේ රටේ සාමාන්‍ය ජනතාව සඳහා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙද්දී අර ලොකු හෝටලය සෑදීම සඳහා ඉඩම් හෙව්වා නම් ඔයිට වඩා නරකද කියායි. තිබුන තානායම වෙන අයට භාර දී දුන් කියනවා සාමාන්‍ය රටවැසියා සඳහා තානායමක් හදන්න ඉඩමක් නැහැ කියා. ඒ නිසා ඇත්ත වශයෙන්ම කෙළින් ම චෝදනා මුඛයෙන් කිව යුතු දෙයක් නම් මේ රජයට වුවමනා කර තිබෙන්නේ මේ රට සංවර්ධනය කිරීම නොව, මේ රජයට ආධාර කළ පුද්ගලයන් අතළොස්සකට පුළුවන් තරම් මුදල් ගරා ගැනීමට අවස්ථාවක් සලසා දීමටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමට මේ තරම් සහන දෙන ආණ්ඩුව අද කර්මාන්ත ගැන නිසොල්මන් වී සිටින්නෙ ඇයි? ගරු වැඩ බලන කර්මාන්ත ඇමතිතුමා නම් මෙහි නැහැ. කර්මාන්තවලින් රට දැන් සම්පූර්ණයෙන්ම සංවර්ධනය කර අවසානද කියා අප ප්‍රශ්න කරනවා. ධීවර අමාත්‍යාංශයක් තිබෙනවා. නමුත් මේ ආණ්ඩුව එහෙම අමාත්‍යාංශයක් තිබෙනවාය කියා ජනතාව තුළ හැඟීමක් ඇති කරවන්නට වත් අපොහොසත් වී සිටිනවා. අපේ රටට විදේශීය විනිමය ආදායමක් ලබා ගන්නට, අපේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කරන්නට, අපේ රටේ ජනතාවගේ රැකීරක්ෂා ප්‍රශ්නය විසඳන්නට උපයෝගි කරගත හැකි ඉතාම වැදගත් කර්මාන්තයක් තමයි ධීවර කර්මාන්තය. දියුණු කළ යුතු එවැනි කර්මාන්තයක් සම්පූර්ණයෙන්ම අමතක කර සංචාරක ව්‍යාපාරයකට මේ තරම් විශාල තැනක් දී, පනත් කෙටුම්පත් පිට පනත් කෙටුම්පත් ඉදිරිපත් කරමින් මේ ගරු සභාවේ කාලය ඒ වෙනුවෙන්ම මිඩංගු කරමින් මේ තරම් විශාල උනන්දුවක් මේ සංචාරක කටයුතුවලට දක්වන්නේ තමුන්නාන්සේලා ඇත්ත වශයෙන්ම මේ රටේ සාමාන්‍ය ජනතාවට ආදරයක් ඇතිවදැයි යන ප්‍රශ්නය මා ඉදිරිපත් කරනවා. අප මේ ආණ්ඩුවට කෙළින්ම චෝදනා කරනවා. තමුන්නාන්සේලාට වුවමනා කරන්නේ රට සංවර්ධනය කරන්නට නොවෙයි, තමුන්නාන්සේලාගේ ආධාරකරුවන් සංවර්ධනය කරන්නටයි. කෘෂිකාර්මික කටයුතු සඳහා ගරු මුදල් ඇමතිතුමා අවුරුදු පහක බදු සහනයක් දී තිබෙනවා. මුදල් ඇමතිතුමාගෙන් මා තවත් ප්‍රශ්නයක් අසන්නට සතුටුයි. කෘෂිකර්මය සඳහා දැන් තමුන්නාන්සේලා රජයේ ඉඩම් අක්කර 92,000 ක් පමණ දී තිබෙනවා. ඒ ඉඩම් ලබා ගත් අයට අවශ්‍ය උපකරණ ගෙන්වීමට විදේශ විනිමය කෝටි ගණන් දී තිබෙනවා. ඔය ජීප් රථ, ලොරි, ට්‍රැක්ටර්, මෝටර් කාර් හා වෙනත් රථ වාහන ගෙන්වා ගන්නට කෝටි ගණන් විදේශ විනිමය පහසුකම් සලසා දුන්නා. තමුන්නාන්සේලාගේ මේ ව්‍යාපාරය ආරම්භ කර දැන් අවුරුදු තුනක් පමණ ගතවී තිබෙනවා. නමුත් තමුන්නාන්සේලාගෙන් දැන් මා අසන ප්‍රශ්නයට හෘද සාක්ෂ්‍යයට අනුව පිළිතුරක් දෙන්නට පුළුවන්ද? ගරු මුදල් ඇමතිතුමා වන්නි ප්‍රදේශයේ ගොවිතැන ගැන හොඳාකාරව දන්නවා. වන්නි ප්‍රදේශයේ ගොවිතැනට යන කාල සීමාව ගැන, ගොවිතැන් කළාට පසු අස්වැන්න ලබා ගැනීමට යන කාල සීමාව ගැන එතුමා හොඳට දන්නවා. ඒ ප්‍රදේශයේ කෘෂිකර්මය සඳහා වෙන් කළ ඉඩම් බලාපොරොත්තු වූ පරිදි වගා කර තිබෙනවාද නැද්ද, ඒ ඉඩම් ලබා ගත් අයට විශේෂ සහනයන් යටතේ ලබා දුන් රථ වාහන හා උපකරණ ඒ කර්තව්‍යය ඉෂ්ට කරන්නටම පාවිච්චි කරනවාද නැද්ද යන ප්‍රශ්නයට එතුමාට හෘද සාක්ෂියට එකඟව පිළිතුරක් දෙන්නට පුළුවන්ද? ඇත්ත වශයෙන්ම ඒ ප්‍රශ්නයට උත්තරයක් දෙන්නට තමුන්නාන්සේට බැහැ. කෘෂිකර්මය සඳහා ඉඩම් ලබාගත් අයට බදු සහන දෙන්නට නොවෙයි, ඒ අය මේ ඉඩම්වලින් ලබාගත් ඇවවලට ඒ අයගෙන් වහාම ආදායම් බදු අය කරන්නට ක්‍රියා කළ යුතු යයි මා යෝජනා කරනවා. පසුගිය දිනක දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) මේ ගරු සභාවේදී කළ ප්‍රකාශයක් මට මේ අවස්ථාවේදී මතක් වෙනවා. එතුමාත් රාජ්‍ය කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු ලේකම්තුමාත් සහභාගිවූ භෝජන සංග්‍රහයකදී මේ ඉඩම් ලබාගත් කෙනෙකු, වගා නොකළ ඉඩම් ආපසු රජයට ගන්නවාය කියා පත්‍රවල තිබුණු කෘෂිකර්ම ඇමතිතුමාගේ කථාවක් පිළිබඳව එක්තරා ප්‍රකාශයක් කළාලු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

There is a Motion of No Confidence on this.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

On what ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

On the Government in regard to the special leases. We have given a date for that Debate.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

I am not speaking about special leases. I am speaking about development.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

No.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

I am talking of tax concessions to agriculturists.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

The hon. Member spoke of some lunch——

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

The Motion of No Confidence is not on the lunch ?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please ! I think it is not correct to refer to any subject in respect of which there is a Motion of No Confidence.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

No, Sir. I referred to tax concessions given to agriculturists.

**ගරු යූ. බී. වන්නිනායක (මුදල් ඇමති) ඇමති)**
*(கௌரவ யூ. பி. வன்னிநாயக்க—நிதி அமைச்சர்)*
(The Hon. U. B. Wanninayake—Minister of Finance)

Lands given on leases.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

Of course, in referring to that I refer to lands too. The Hon. Minister of State will realize that we have ample material when the Motion of No Confidence is discussed.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I do not want him to waste his material now.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

I assure the Hon. Minister of State that he will not come in for any criticism on that. He will be completely exonerated. There are others who are responsible for it.

මා කියමින් සිටියේ ඉඩම් අක්කර 92,000කුත් දී, වුවමනා කරන උපකරණත් දී, දැන් මේ විධියට තවත් බදු සහන ලබා දෙන්නට යන උදවිය දැනටමත් ඒ ඉඩම් වලින් ගරාගෙන ඇති මුදල් ප්‍රමාණයේ විශාලත්වය ගැනයි. දකුණු කොළඹ මන්ත්‍රීතුමාත්, රාජ්‍ය උප ඇමතිතුමාත් සහභාගි වුණ භෝජන සංග්‍රහයකදී, එවැනි ඉඩම් ලබා ගත් එක් අයෙක් කථා කරමින් කිව්වලු, " ඔව්, ඒ ඉඩම් ආපසු ගත්තත් මට කමක් නැහැ, මම දැන් ඇව වලින් ලක්ෂයක් හම්බ කරගෙන තිබෙනවා " කියා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)

රට කනවා.

**සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක මිය. (අත්තනගල්ල)**
*(திருமதி சிறிமாவோ ஆர். டீ. பண்டாரநாயக்க—அத்தனகல்ல)*
(Mrs. Sirimavo R. D. Bandaranaike—Attanagalla)

කැලෑවලුත් කනවා.

**එල්,. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

තමුන්නාන්සේලාගේ මේ ව්‍යාපාරය ආරම්භ කෙළේ දැනට අවුරුදු තුනකට කලිනුයි. මිරිස්, ලූනු, මෙනේරි, කුරක්කන්, වී ආදිය වගා කිරීමට පටන්ගත්තේ කොයි කාලයේ සිටද කියා මේ ගරු සභාවේ කවුරුත් දන්නවා. එහෙත් අවුරුදු තුනකට පසුවත් අපට දිනපතා පුවත්පත්වල දකින්නට ලැබෙන දැන්වීම හා ප්‍රවෘත්ති මොනවා ද? ඒ ව්‍යාපාරය සාර්ථක වුණා නම් කුරක්කන් මෙපමණ තිබෙනවාය, මෙනේරි මෙපමණ තිබෙනවාය, මිරිස් මෙපමණ තිබෙනවාය, බොම්බයි ලූනු මෙපමණ තිබෙනවාය, අර්තාපල් මෙපමණ තිබෙනවාය ආදී පුවත් සහ දැන්වීම් අපට පුවත්පත් මාර්ගයෙන් පෙනෙන්න තිබෙන්න ඕනෑ. එහෙත් අපට මොනවාද දකින්න ලැබෙන්නේ? හැමදාම, හල්මිල්ල කඳන්, බුරුත කඳන්, මිල්ල කඳන්, කොලොන් කඳන් ආදිය වෙළඳාමට තිබෙනවාය කියා අපට පුවත්පත් වලින් දකින්න ලැබෙනවා. තමුන්නාන්සේලාගේ කෘෂිකර්ම සංවර්ධනයත් අද ඒ තැනට වැටී තිබෙනවා. එහෙම නම් ඇයි මේ තවදුරටත් අවුරුදු 5ඝේ බදු සහන දෙන්නට යන්නේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

සංචාරක ව්‍යාපාරයටයි දෙන්නේ.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

නැහැ එපමණක් නොවෙයි, අනික් දේවලටත් තිබෙනවා. මෙය තමුන්නාන්සේගේ නොවෙයි මුදල් ඇමතිතුමාගේ පනතක්. තමුන්නාන්සේගේ සංචාරක ව්‍යාපාරයට පමණයි තමුන්නාන්සේ ඔළුව දුන්නේ. එහෙත් මේ වෙනත් දේවලටත් සහන දෙන්නට යනවා. කෘෂිකර්ම සහන තවදුරටත් ලැබෙන්නට යන පුද්ගලයන් දැනටමත් විශාල මුදලක් ලබාගෙන තිබෙනව. ඇත්ත වශයෙන්ම මේ කාරණය ගැන අද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක විය යුතුව තිබෙනවා. වගා කිරීමට කලින් ඒ ඉඩම්වලින් ලබාගත් දැව විකුණා ලත් ආදායමෙනුත් බදු අය කරන්න ඕනෑ.

අනික් කාරණය, ඔවුන්ට අවුරුදු 5ක් ආදායම් බද්දෙන් නිදහස ලබා ගැනීමට මේ පනතින් ඉඩ ප්‍රස්ථාව සලසා තිබෙනවා. ඒ අනුව ඉඩමට වියදම් කරන මුදල් අනික් ආදායම්වලින් කපා හරින්න ඔවුන්ට ඉඩ ලැබෙනවා. අද මේ කෘෂිකර්ම ව්‍යාපාරයේ යෙදී සිටින පුද්ගලයනුත් සමාගමුත් මොන මොන අයද කියා මුළු රටම හොඳින් දන්නවා. ඒ උදවිය ලොකු ව්‍යාපාරිකයෝ. වෙනත් නොයෙකුත් ව්‍යාපාරවලට හිමිකම් ඇති උදවිය. රජයේ ඉඩම්වලින් අක්කර 92,000කුත් දී, ඔවුන්ට අවශ්‍ය උපකරණ ගැනීම සඳහා විදේශ විනිමයත් නිදහස් කර අන්තිමේදී ඔවුන් අනික් ව්‍යාපාරවලිනුත් ලබා ගන්නා ආදායම් බද්දෙනුත් නිදහස් කිරීමෙන් ආදායම් බදු නොගෙවා හැරීම සඳහා, බොරු ගණන් ඉදිරිපත් කරනවාට කිසිම සැකයක් නැහැ. කුරක්කන් මෙනේරි දකින්න ලැබෙන්නෙත් නැහැ. ඒ වාගේම වගා කිරීම සඳහා වියදම් කළ මුදල් ප්‍රමාණය ඒ ව්‍යාපාරිකයන්ගේ අන් ව්‍යාපාරවලින් ලැබෙන ආදායමට වඩා වැඩි වනවාට කිසිම සැකයක් නැහැ. මෙම සංශෝධන පනත සම්මත වුණාට පසුව, ඇත්ත වශයෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට කරන්නට සිද්ධ වන්නේ ආදායම් එකතු කිරීම නොවෙයි, එකතු කළ ආදායම් ආපසු ගෙවීමයි; ආදායම් බද්දෙන් ඒ උදවිය නිදහස් කිරීමයි. ඒ වගේම මේ පනත සම්මත වුණාට පස්සේ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මගින් ආදායම් බදු එකතු කළ හැකි වන්නේ මාසික වැටුප් ලබන උදවියගෙන් පමණය කියා මා ප්‍රකාශ කරනවා. අද මේ රටේ සිටින වෙළඳ ව්‍යාපාරිකයින් හැම දෙනාම පාහේ තමුන්නාන්සේලාගේ මේ සංවර්ධන ව්‍යාපාරවලට සහභාගී වී සිටිනවා. කෘෂිකාර්මික සංවර්ධනයට වේවා, සංචාරක සංවර්ධනයට වේවා, කර්මාන්ත සංවර්ධනයට වේවා, නැත්නම් වෙන යම් සංවර්ධනයකට වේවා, මොන විධියේ හෝ සංවර්ධන ව්‍යාපාරයකට අද ඔවුන් සම්බන්ධ වී සිටිනවා. ආදායම් බදු නොගෙවා සම්පූර්ණයෙන්ම මඟ හැරීමට අද ඔවුන් මාර්ග සොයා ගෙන සිටිනවා. ඒ නිසා මේ අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පාලන ශාස්තු ගෙවීම පවා අපරාධයක් වෙනවාය කියා මා තමුන්නාන්සේලාට කියනවා. තමුන්නාන්සේලා බලාපොරොත්තු වන ආදායම මේ උදවිය කවදාවත් නොපෙන්වන බවට මා ගරු මුදල් ඇමතිතුමාටත් රජයටත් අනතුරු ඇඟවීමක් කරන්න කැමතියි. ඔවුන්ගේ පෞද්ගලික ව්‍යාපාරවලින් ලැබෙන ආදාය මෙනුත් ආදායම් බදු නොගෙවා පැහැර හැරීමට මේ පනතින් තමුන්නාන්සේලා ඔවුන්ට අවස්ථාව දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැඩ බලන ගරු කර්මාන්ත ඇමතිතුමා **හැන්සාඩ්** වාර්තා පෙරළමින් යටියන්තොග ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමති හැටියට සිටිය දී කරන්නට බලාපොරොත්තු වූ දේවල් යටියන්තොට ගරු මන්ත්‍රීතුමාගේ හිතේ තිබුණු දේවල්, ප්‍රකාශ කරන්නට යෙදුණා. එසේ කියා තමුන්නාන්සේලා ඉදිරිපත් කර ඇති මේ පනතේත් කලින් තිබුණු ආණ්ඩුව අනුගමනය කළ ප්‍රතිපත්තියේත් වෙනසක් නැත කියා සංසන්දනය කර පෙන්වන්නට හැදුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේලාගේ ආණ්ඩුවට මෙවැනි සහනයන් දෙන්නට පුළුවන්කම තිබෙනවා නම්, තමුන්නාන්සේලා රුපියලේ අගය අඩු කිරීම නිසා අද දුඃඛිත තත්ත්වයට වැටී සිටින අහිංසක ජනතාව වෙත තමුන්නාන්සේලාගේ බැල්ම හෙළා, රජය මගින් ආනයනය කරන ආහාර වර්ගවලවත් වැඩි වූ මිළ රජය මගින් දරන්නට බැරි මන්ද කියා මා අහනවා. අද මේ රටේ දුප්පත් ජනතාවට ජීවත් වන්නට බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. සාමාන්‍ය ජනතාවට රොටියක් වත් කා ජීවත් වීමට බැරි තත්ත්වයක් දැන් තිබෙන්නේ. ඒ අය ගැන තැකීමක් නැතිව තමුන්නාන්සේලා මේ රටත් ජනතාවත් ගසා කන ව්‍යාපාරිකයින්ට තව තවත් සහන සැලසීම යුක්ති සහගත දෙයක්ද, මනුෂ්‍ය ධර්මයක්ද, කියා මා අහනවා.

**නීල් ද අල්විස් මයා.**
*(திரு. நீல் டி அல்விஸ்)*
(Mr. Neal de Alwis)
ගොඩ කිඹුල්ලු.

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சி. டி சில்வா)*
(Mr. L. C. de Silva)

තමුන්නාන්සේලාගේ මේ රජය රුපියලේ අගය අඩු කිරීමට පියවර ගැනීමට තමුන්නාන්සේලාට උපදෙස් දුන් අය එදා බලාපොරොත්තු වූ ආදායම් කිසිවක් නොලැබෙන බව මාස කීපයක් දැන් ගත වී ඇති නිසා තමුන්නාන්සේලාට පෙනෙනවා ඇති. එහෙත් ඒ හේතුව නිසා අද මේ රටේ ජීවන තත්ත්වය කොපමණ ඉහළ නැග තිබෙනවාද ? මෙවැනි සහන ධනපතියන්ට දෙන්නට තමුන්නාන්සේලාගේ රජයට පුළුවන් නම්, මේ අහිංසක ජනතාව වෙනුවෙන් මේ ආහාර වර්ගවල මිළවත්—රුපියලේ අගය අඩු කිරීම නිසා වැඩි වූ මිළවත්—රජය මගින් දරන්නය කියා මා ඉල්ලා සිටිනවා. එවැනි පියවරක් මේ අවස්ථාවේදීවත් නොගත්තොත් තමුන්නාන්සේලා මේ රටට ගෙන්වන දේශ සංචාරකයින්ට බලන්නට පුළුවන් වන්නේ කෑම නැතිව—ඉන්දියාවේ සමහර ප්‍රදේශවල මෙන්—කුසගින්නේ දිනපතා මැරී වැටෙන ජනතාව යයි මා කියනවා. ලංකාවේ කවදාවත් අසා නොතිබුණු තත්ත්වයක් දැන් ඇති වී තිබෙනවා. එක සතියට තුන් දෙනෙක් කුසගින්නේ මැරී තිබෙනවාය කියා පුවත්පත්වල පළ වී තිබුණා. තවත් කෙනෙක් කන්න නැතිව ජීවිතය නැති කරගෙන තිබෙනවා. තවත් කෙනෙක් දරුවන්ට කන්න දෙන්න බැරිව, ජීවිතය නැති කරගෙන තිබෙනවා. ඒ නිසා මේ ධනපතියන්ට දෙන සහන ටිකක් අඩු කර, ඔවුන්ට දෙන සහනය අඩකින්වත් අඩු කර, ඒ සහනය අර දුප්පත් ජනතාව වෙත යොමු කරන්නය කියා

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

තමුන්නාසේලාගෙන් ඉල්ලන අතරම ධන පතියන් තර කරන මෙවැනි යෝජනාවලට කිසිසේත්ම සහයෝගය දෙන්නට නො හැකි බව කියමින් මගේ කථාව මෙයින් අවසාන කරනවා.

අ. භා. 5.18

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශීය ආදායම් සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳ සාකච්ඡාව කරගෙන යන අවස්ථාවේදී ඊට සහභාගි වී කථා කරන්නට මුලදී මා බලාපොරොත්තු නොවූවත්, ශාන්ත භාව යක් දක්වමින් දෙපැත්තේම ගරු මන්ත්‍රීන්ගේ සහයෝගය ලබා ගැනීමට කරන ලද තරමක් කරුණු වසන් කළ රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ කථාවට ඇහුම්කන් දීමෙන් පසු මාත් කථාවක් කළ යුතු යයි මට හිතුනා.

මේ ආණ්ඩුව ඇති වන්නට—මේ ආණ්ඩුව පිහිටුවන්නට—ඉස්සරවෙලා මේ උදවිය මුළු රට පුරාම කියාගෙන ගියේ අපට ආණ්ඩු බලය ලැබුණොත් මේ රට දශරාජ ධර්ම යෙන් ආණ්ඩු කරනවාය කියායි. බලය ලැබුණොත් දශරාජ ධර්මයෙන් ආණ්ඩු කර නවායයි රටවාසීන් ඉදිරියේ කියා පෑ මේ උදවිය තමන් වෙත ආණ්ඩු කිරීමේ බලය ලැබීමෙන් පසු ඇත්ත වශයෙන්ම දශරාජ ධර්මය ක්‍රියාවට පරිවර්තනය කරගෙන යන බව රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ කථාවෙන් අපට ටිකක් දුරටවත් පැහැදිලි වේගන ගියා.

දශරාජ ධර්මය යන්න නොයෙක් අවස්ථාවලදී මේ ගරු සභාවේදී සඳහන් වෙනවා. කොයි තරම් වාර ගණනක් එය සඳහන් කරනු ලැබුවත් ඒවා ඇත්ත වශයෙන්ම මොනවාදැයි මේ ගරු සභාවේදී කවුරුවත් කිව්වේ නැහැ.

නීල් ද අල්විස් මයා.
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

කියන්න බලන්න, "රෙකෝඩ්" වෙන්න.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

ඒ නිසා දශරාජ ධර්මය යනුවෙන් හඳුන්වනු ලබන්නේ මොනවාදැයි පාර්ලිමේන්තු නිල වාර්තාවට ඇතුළු කරන්න ඕනෑයයි මා හිතුවා. පාලි භාෂාවෙන් දශරාජ ධර්මය දැක්වෙන්නේ මෙන්න මේ ආකාරයටයි:

දානං ශීලං පරිච්චාගං—අජ්ජවං මජ්ජවං තපං
අක්කෝධෝ අවිහිංසාච—ඛන්තීච අවිරෝධතා

දශරාජ ධර්මයන් මොනවාදැයි මේ පාලි ගාථාවෙන් කියැවෙනවා. ඉන් පළමුවැන්න දානයයි. එය කුමක්දැයි කාටත් තේරෙනවා. දෙවැන්න ශීලයයි. ඒ ධර්මයත් පැහැදිලියි. තුන්වැන්න පරිත්‍යාගයයි. මෙන්න මේ තුන්වැන්න තමයි මට එක පාරටම මතක් වුනේ රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමාගේ කථාවට සවන් දෙද්දී. දශරාජ ධර්මයන් අතුරින් එතුමාගේ පරිත්‍යාගය දැන් මේ රටේ සිටින ධනපතියන්ට පමණක් නොවෙයි ප්‍රයෝජනවත් වී තිබෙන්නේ. සංචාරකයන් වශයෙන් මේ රටට පැමිණෙන ධනපතියන්ටත් රජයේ පරිත්‍යාගය පිරිනැමීමට යන බව අපට එතුමාගේ කථාවෙන් පැහැදිලි කළා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)
(The Hon. J. R. Jayewardene)

ගරු මන්ත්‍රීතුමා ඉඩ දෙනවා නම් මම කාරණය පැහැදිලි කර දෙන්නම්. මා කිව්වෙ එහෙම දෙයක් නොවෙයි. සංචාරකයන්ට නොවෙයි සහන දෙනවාය කිව්වේ. විදේශීය ධනපතියන් මෙහි තමන්ගේ ධනය තැන්පත් කළොත් සහන දෙනවා. සංචාරකයන්ට සහනක් ලැබෙන්නේ නැහැ.

ටී. බී. එම්. හේරත් මයා.
(திரு. ரி. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)

එතුමාගේ පරිත්‍යාග ධර්මය මම පැහැදිලි කරන්නම්.

නීල් ද අල්විස් මයා.
(திரு. நீல் டி அல்விஸ்)
(Mr. Neal de Alwis)

ඒකයි "ලයින්" එක.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු මුදල් ඇමතිතුමාගේ ආදායම් බදු සහන ක්‍රමය යටතේ අවුරුදු පහක පරිත්‍යාගයක් ලැබෙනව. ඒක අවුරුදු පහක සම්පූර්ණ පරිත්‍යාගයක්. ඊට පස්සේ අවුරුදු 15ක සියේට 50ක පරිත්‍යාගයක් ලැබෙනවා. එතකොට එකතුව මුළු පරිත්‍යාගය අවුරුදු 20 දක්වා පැමිණ තිබෙනවා. අවුරුදු විස්සක පරිත්‍යාගයක්! මට මතකයි වරක් ගරු රාජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේදී කළ ප්‍රකාශයක්. එතුමා සඳහන් කළා, අපට අවුරුදු දහයක් මේ රට ආණ්ඩු කරන්නට පුළුවනි; ආණ්ඩුවක් වෙනස්වන්නේ සාමාන්‍යයෙන් අවුරුදු දහයකට පස්සේ, යනුවෙන්. ඒ අනුව 1975 දක්වා ගෙන යන්නට පුළුවනි.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

අවුරුදු නවයක්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඒ කොයි හැටි වෙතත් මේ ප්‍රතිපත්තිය දිහා බලන විට මේ පරිත්‍යාගය දෙන්නට යන්නේ අවුරුදු විස්සකටයි. එතකොට ගරු රාජ්‍ය ඇමතිතුමා තුළ දැන් තිබෙන අදහස එදා, 1965 දී, තිබුණු අදහසට වඩා වෙනස්. කාල සීමාව දැන් දෙගුණයක් වෙලා; දෙගුණයකින් වෙනස්වෙලා තිබෙනව.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

නැහැ, නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

අවුරුදු විස්සක් මේ රට ආණ්ඩු කරන්නට පුළුවන් වෙතැයි එතුමා දැන් කල්පනා කරනවා වෙන්නට ඇති.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මා හිතුවෙ අවුරුදු දහයකින් පස්සේ අප කී දේවල් ඉෂ්ට කරන්නට තමුන්නාන්සේලාට මොළය ඇති වේය කියායි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මේ අවුරුදු දහයේ කතාවෙන් පස්සේ අපිත් අර විධියට හිතුවා. එහෙත් දැන් නම් අපට පෙනී යනවා, තව දුරටත් ඇමෙරිකාව ආදී නොයෙක් රටවල සංචාරය කර නොයෙක් විධියේ මත දරන විවිධ දේශපාලනඥයන් අතර සාකච්ඡා ඇරඹී තිබුණු නිසා ඒ මාර්ගයෙන් දැන් නම් අවුරුදු දහයකින් බලාපොරොත්තු වන පරමාර්ථයට යන්නට බැරිය, ඒ නිසා අවුරුදු විස්සක් වුවමනා කරනවාය යන මතය ඇති වූ බව. පරිත්‍යාගය දැන් මෙතැනින් අවුරුදු 20කට සීමා කර තිබෙනවා. දේශීය ධනපතියන්ට කළ පරිත්‍යාගය විදේශීය සංචාරකයන්ටත් කරන්නට යනවාය යන්න මම පැහැදිලි කර දෙන්නම්. විදේශීය සංචාරකයන් මේ රටට ආවාම ඔවුන්ට නවතින්ට හොඳ හෝටල් සකස් කර තිබෙනව. "හොඳ හෝටල්වලින් කාල නැහැ" කියා මීගමුවේ ගරු මන්ත්‍රීතුමා (ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.) කියනවා මට ඇහුනා. හොඳ හෝටල් ඇති කරගෙන යන්නෙ ඒ නිසා වෙන්ට ඇති. මේ ඇමතිතුමාගේ මිත්‍ර සංචාරකයන්ට—මම මේ වචන පාවිච්චි කරන්නේ අදහසක් ඇතුවයි—රාජ්‍ය ඇමතිතුමාගේ මිත්‍ර සංචාරකයන්ට තමයි, මේ හෝටල්. මිනිසුන් 500ක් 1,000ක් තරම් විශාල සංඛ්‍යාවක් පටවා ගෙන එන්ට පුළුවන් සුඛෝපභෝගී ගුවන් යානා හෙට අනිද්දා කටුනායක ගුවන් තොටුපොළට එන්ට පටන් ගන්න බව රාජ්‍ය ඇමතිතුමා ප්‍රකාශ කළා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

කොහෙන්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඇමෙරිකාව පැත්තෙන්. එවැනි සුඛෝපභෝගී අහස් යානාවලින් විදේශීය සංචාරකයන්ට කටුනායකට ගොඩ බසින්න ඉඩ දෙනවා නම් ඒකත් එක්තරා ආකාරයක පරිත්‍යාගයක්. මෙපමණ කලක් නොතිබුණු දෙයක් ඒ මගින් ලබා දෙනවා. ඒක පරිත්‍යාගයක්. මෙපමණ කලක් මෙහාට ආවෙ නැති ඒ සුඛෝපභෝගී අහස් යානාවලට දැන් කටුනායක ගුවන් තොටුපොළ ඉඩ දී තිබෙනවා නම් ඒක ඒ අහස් යානා සමාගමටත් ඒවායින් ගමන් කරන සංචාරකයන්ටත් කර තිබෙන එක්තරා පරිත්‍යාගයක්. මම මේ කියන්නෙ සිංහලෙන් නිසා තමුන්නාන්සේට මේවා තේරෙනවාදැයි මා දන්නෙ නැහැ. ඊළඟට ගරු රාජ්‍ය ඇමතිතුමා කිව්වා, කටුනායක ගුවන් තොටුපොළින් මේ රටට ගොඩ බසින අය වලපනේ මන්ත්‍රීතුමා කියන නිසා මහ මුහුදට දමන්න බැරිය, ඔවුන්ට සුඛෝපභෝගී හෝටල් ඕනෑය, ඇඳන් ඕනෑය කාමර ඕනෑය, වැසිකිළි ඕනෑය, වෙනත් පහසුකම් ඕනෑය කියා. ඒ උදවිය මේ රටට ගොඩ බැසීමෙන් පසුව ඔවුන්ට ඉතා සුළු මුදලකට හොඳ කාමර ලැබෙනව නම්, තමුන්නාන්සේ පසුගිය කාලයේ ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කර තිබුණු සම්බාහන මණ්ඩල වැනි ඒව පිහිටුවා සිංහල තරුණියන් ලවා ඒ උදවියගෙ අත පය මිරිකවන්ට පහසුකම් යොදනව නම් ඒක ඒ දේශ සංචාරක ධනපතියන්ට කරන පරිත්‍යාගයක්. එපමණක් නොවෙයි. ප්‍රථමයෙන් කටුනායක අවට හෝටලයක නවත්වන සංචාරකයන් තමුන්නාන්සේ එතැනින් අනුරාධපුරයට හික්කඩුවට හෝ ත්‍රිකුණාමලය වැනි ස්ථානයකට කැඳවාගෙන යනවා. ලංකාවේ උසස් යයි සම්මතව තිබුණු හෝටල් සංස්ථාවට අයත් තානායම් ගරු රාජ්‍ය ඇමතිතුමා විසින් පසුගිය කාලයේ පුද්ගලික ධනපතියන්ට භාර දුන්නා. ඒවා භාර දෙන්ට පෙර හොඳට ප්‍රතිසංස්කරණය කළා. දැන් ඒවායේ සංචාරකයන්ට ඉඩ ප්‍රස්තා සලසා තිබෙනවා.

ඉස්සර ගමේ ගොඩේ මධ්‍යම පන්තියේ තරුණයෙක් කසාදයක් බැන්දම තමන්ගේ මනාලියත් කැඳවාගෙන මධු සමය ගත කරන්ට දවස් තුන හතරකට තානායමට යන පුරුද්දක් තිබුණා. රුපියල් විසිපහක තිහක වියදමකින් තමන්ගේ ඒ කටයුත්ත ඉෂ්ට කරගෙන ආපසු එනවා. දැන් සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? රාජ්‍ය ඇමති තුමාගේ පරිත්‍යාගයේ ප්‍රතිඵලය බලා තිබෙන්නෙ මොකක් ද? අද කෙනෙක් හික්කඩුවේ තානායමට නවතින්න ගියොත් එක රැයකට රුපියල් 85 ගෙවන්න සිද්ධ වෙනවා. කලින් දිනකට නවතින්න රුපියල් 5 ක් අය කළ හික්කඩුව තානායම අද රුපියල් 85 ක් ගෙවල නවතින්න තමුන්නාන්සේ ධනපතියන්ට පරිත්‍යාග කර තිබෙනවා. දැන් අනික් අයට මධු සමය ගත කරන්ට එහෙ යන්ට විධියක් නැහැ. දැන් රාජ්‍ය ඇමතිතුමා අපට කියනව සාමාන්‍ය අයගේ පාවිච්චිය සඳහා අනුරාධපුරයේ තානායමක් හදන්න අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයෙන් අපි ඉඩමක් ඉල්ලා තිබෙනවාය, ඒ ඉඩම ලැබුණායින් පසුව අපි ඒ ගැන කල්පනා කරනවාය කියා. මම අහන්නෙ ඇයි රාජ්‍ය ඇමතිතුමනි, "වත්ත බද්දට දීල ඇස්සට දත නියවන්නෙ" කියලයි. තිබුණු වත්ත පරිස්සම් කර ගත්ත නම් ඉවරයි නේද? තිබුණු තානායම අපේ මිනිසුන්ට ඉඩ දීල බලපිටියේ ගරු මන්ත්‍රීතුමා (එල්. සී. ද සිල්වා මයා.) කිව්ව වගේ තමුන්නාන්සේට කරන්ට තිබුණේ තමුන්නාන්සේට වුවමනා කරන විධියට සුඛෝපභෝගී නවීන පන්නයේ හෝටලයක් සංචාරකයන් සඳහා අනුරාධපුරයේ අළුතෙන් පිහිටුවන්නයි. එහෙම කළා නම් මේ ප්‍රශ්නය අද නැහැ. අපි කියන්නේ තමුන්නාන්සේලා මේ සහන දෙන්ට යන්නේ තමුන්නාන්සේලාගේ දේශීය හා විදේශීය ධනපති මිත්‍රයන්ට බවයි. පසුගිය මැයි ජූනි මාසවල මා ගියා නැගෙනහිර ජර්මනියේ සමහර නගරවලට සහ මොස්කව් නගරයට. එම අවස්ථාවේදී මට දැනගන්නට ලැබුණා, එක්තරා කාරණයක්. එම උදවිය විශේෂ චෝදනාවක් වශයෙන් කීවා, මොස්කව් නගරයේ සිටින අපේ තානාපතිවරයා කිසිම සංචාරකයකුට මේ රටට ඇතුළු වන්නට වීසා බලපත්‍ර නිකුත් කරන්නෙ නැත කියා. තත්ත්වය එසේ නම් තමුන්නාන්සේලා අමෙරිකන් අධිරාජ්‍යවාදී මිත්‍රයනට පමණයි, මෙම සංචාරක හෝටලයට එන්න අවසර දෙන්නේ. තමුන්නාන්සේලාගේ මිත්‍රයන්ගේ සල්ලි පමණයි වලංගු. අනික් අයගේ සල්ලි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

වලංගු නැහැ. ඒ උදවියගේ සල්ලි තමුන් නාන්සේලාට වලංගු නැහැ. තමුන්නාන්සේලාගේ අගමැතිතුමා කියනවා, " මගේ විදේශ ප්‍රතිපත්තිය පරණ ආණ්ඩුවේ තිබුණු විදේශ ප්‍රතිපත්තියමයි; අපි බණ්ඩාරනායක මැතිතුමාගේ මධ්‍යස්ථභාවය ආරක්ෂා කරනවා" යනාදි වශයෙන්. [බාධා කිරීමක්] වැඩබලන කර්මාන්ත ඇමතිතුමාට කතා කරන්නට වුව මනා කරනවා නම් මා නිකම් ඉන්නම්. කෝ, මෙතන මධ්‍යස්ථභාවයක් ? තමුන්නාන්සේලාගේ පරම පවිත්‍ර අවංක කල්පනාව මෙයයි. සංචාරක යන් මේ රටට වැඩි වැඩියෙන් ගෙන්වන්නේ වැඩි වැඩියෙන් මිල මුදල් හම්බ කිරීමේ පරමාර්ථයෙන් නම් තමුන්නාන්සේලාගේ අධිරාජවාදී මිත්‍ර රටවලින් එන අයට පමණක් නොවෙයි, සමාජවාදී රටවලින් එන අයටත් මේ රටට ඇතුළු වීමේ දොරටුව විවෘතව තැබිය යුතුයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
බොහොම හරි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඇයි ඒක නොකරන්නේ ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඇයි, කරල තියෙන්නෙ ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ලංකාව වෙනුවෙන් පෙනී සිටින නානායක්කාර පතිගෙන් අහන්න.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මම අහන්නම්. ඒ බව කිව්වෙ නැහැනෙ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මේ කියන්නෙ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
තමුන්නාන්සේ නොවෙයි අපට ඒ බව උන්නැහේ කිව්වෙ නැහැනෙ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
දෙවතාවක් මේ ගරු සභාවේදී මා කියා තිබෙනවා. මේ කියන්නේ තෙවන වතාවට.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
කවුද ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
මම. " මම " කිව්වාම තේරෙන්නේ නැද්ද ? මම, වලපනේ ගරු මන්ත්‍රීවරයා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
විශේෂ අහස් යාත්‍රා ගෙන්වනවා, තුන් සැරයක්. [බාධා කිරීමක්.]

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
එක සැරයයි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
එහෙම බලය දෙන්නට යනවා. අහස් යාත්‍රාවලට එන්නට පුළුවනි. ඒ උදවියට බහින්න වීසා බලපත්‍ර දෙන්නේ නැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
ඒක වැරදියි. දෙන්නට ඕනෑ.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
දෙන්නේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath)**
රාජ්‍ය ඇමතිතුමා වචනවලින් පරිස්සම් වන බව අපි දන්නවා. අපි අහන්නේ, දෙනවාද, නැද්ද කියායි. දෙනවා නම් දෙනවා කියන්න. නැතිනම් නැහැ කියන්න. දෙනවා කියන්නට කැමති නැහැ. දෙන්න ඕනෑ යනුවෙන් කියනවා. රාජ්‍ය ඇමතිතුමාට තනිවම ඔක කියන්නට බැරිකමකුත් තිබෙනවා.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
**(Dr. N. M. Perera)**
අගමැතිතුමායි දෙන්නේ. එයා කොහොමද දෙන්නේ. ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath)**
සමහරවිට ඒ ගැන තීරණය කරන්නේ ගරු අගමැතිතුමා තමයි.

රාජ්‍ය ඇමතිතුමා සංචාරක ව්‍යාපාරය මේ තත්ත්වයට ගන්නට කල්පනා කරනවා නම් ලෝකයේ හැම රටකම සංචාරකයන්ට මේ රට විවෘත වන්නට ඕනෑ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
**(The Hon. J. R. Jayewardene)**
බොහොම හරි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath)**
තමුන්නාන්සේ එය පිළිගන්නවාද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
**(The Hon. J. R. Jayewardene)**
ඔව්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath)**
බොහොම ස්තුතියි.

අපි තව දුරටත් මේ ගැන කල්පනා කර බලමු. මේ ගරු රාජ්‍ය ඇමතිතුමාත් වැඩ බලන කර්මාන්ත ඇමතිතුමාත් ලොකු මහන්සියක් ගත්තා, මෙම සංචාරක ව්‍යාපාරය තමන් විසින් සම්පූර්ණ කරන් නට යන අළුත් දෙයක් නොවේය ; එය පරණ ආණ්ඩුවේ තිබුණු ප්‍රතිපත්තියක් ඉදිරියට ගෙන යාමක්ය කියා පෙන්නුම් කරන්නට. එතුමන්ලා දෙපොළම උත්සාහ කළේ එසේ පෙන්නුම් කරන්නටයි. මෙම රජයට හොඳම හොඳ පලපුරුද්දක් තිබෙන්නා වාගේම සෑහෙන අන්දමේ ලජ්ජා නැතිකමක්ද තිබෙන බව අපට පෙනෙනවා. මෙම රජය පිහිටුවන්නට ප්‍රථම, වේදිකාවට ගොස් මුළු රටටම හඬගා කීවේ, " බණ්ඩාරනායක මැතිනිය ගේ සභාග ආණ්ඩුවේ ප්‍රතිපත්ති වැරදියි ; අසුවල් ප්‍රතිපත්තිය වැරදියි ; අසුවල් ප්‍රතිපත්තිය වැරදියි ; හැම එකක්ම වැරදියි ; එම නිසා මෙම රජය පෙරළා දමා අපට රට භාර දුන්නොත් අපට පුළුවනි රට මුදවා ගන්නට " යනුවෙනුයි.

**ගරු ෂෙල්ටන් ජයසිංහ**
*(கௌரவ ஷெல்றன் ஜயசிங்ஹ)*
**(The Hon. Shelton Jayasinghe)**
" සෑම එකක්ම වැරදියි " කියා කීවේ නැහැ. සමහර ඒවා බොහොම හොඳයි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
**(Mr. T. B. M. Herath)**
වැඩ බලන කර්මාන්ත හා ධීවර ඇමතිතුමා අපේ ආණ්ඩුව තිබුණු කාලයේදී—ඔය පැත්තෙ ඉන්න කාලයේදී—එතුමාට බණ්ඩාරනායක මැතිණියගෙ ආණ්ඩුවෙ වෙළඳ ඇමති ධුරය දෙන්න යනවායයි එංගලන්තයෙ වෙළඳ සමාගමකට ලිපියක් ලියා තිබෙනවා. එතුමා, ඒ ධුරයට පත් වෙන්න ආසාවෙන් සිටි බව දන්නවා. එනිසාම අප ඒ දවස්වල එතුමා බක වෙළඳ ඇමතිතුමායයි හැඳින් වූවා.

**ගරු ෂෙල්ටන් ජයසිංහ**
*(கௌரவ ஷெல்றன் ஜயசிங்ஹ)*
**(The Hon. Shelton Jayasinghe)**
කොහොමද එහෙම කියන්නෙ ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සෙ යවා තිබුණු ලිපියක් මේ ගරු සභාවෙ කියෙව්වානෙ. තමුන්නාන්සේට එය භාර ගන්නත් සිද්ධ වුණානෙ. කොහොම වුණත් එදා තමුන්නාන්සේව බක වෙළඳ ඇමති හැටියට හඳුන්වන්න අපට සිද්ධ වුණා. බක කියන වචනය නරක වචනයක් නොවෙයි, සාමාන්‍යයෙන් සිංහල භාෂාවෙ බක කියන වචනයට බලාපොරොත්තු කඩවුණ කියායි තේරුම දෙන්නෙ [බාධා කිරීමක්] සමහර විට එතුමා අපේ ප්‍රතිපත්ති පිළිගෙන ඉන්න ඇති. කොහොම වුණත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ කාලයේ තමුන්නාන්සේලා කිව්වේ, සිරිමා බණ්ඩාරනායක මැතිණියගෙ ප්‍රතිපත්ති වැරදියි, සභාග රජයෙ ප්‍රතිපත්ති වැරදියි, ඒවා හැදීමට ඒ අයට බලය දෙන්නටය කියායි. ඒ විධියට මහ ජනතාවගෙන් බලය ලබාගෙන තමුන්නාන්සේලා ආණ්ඩුව පිහිටෙව්ව දවසේ සිට අද දක්වාම, ඕනෑම වැදගත් විවාදයක් මෙම ගරු සභාවේ ඇති වුණු අවස්ථාවේදී තමුන්නාන්සේලා හැම වෙලාවෙම කීවේ, එය අපේ වැඩක් නොවෙයි, අප කළ දෙයක් නොවෙයි, අප කරන්නෙත් මෙයට පෙර රජය කළ දේමයි කියා නොවේද? අගමැතිතුමාත්, රාජ්‍ය ඇමතිතුමාත් අනික් ඇමතිවරුනුත් කියන්නෙ ඒ දෙයමයි. කලින් සිටි රජය කළ දේවල්ම කරනවා යයි කියනවා නම් තමුන්නාන්සේලා බලයට ඇවිත් තිබෙන්නෙ අනුන් කළ දේ කරන්නටම නේද? හැබැයි ඒ අන්දමට රටට ප්‍රකාශ කර තමුන්නාන්සේලා කරන තරමක් කරන්නෙ ඊට හාත්පසින්ම වෙනස් දේවල්. මා එසේ කියන්නෙ අපේ රජය තිබුණු කාලයේදී ඉදිරිපත් කරන ලද සෑම පනතක්ම වාගේ ඉදිරිපත් කළේ දුප්පතාගේ යහපත පිණිසයි; සාමාන්‍ය ජනතාවගේ යහපත පිණිසයි. නමුත් තමුන්නාන්සේලා පනත් ඉදිරිපත් කරන්නෙ, විශේෂයෙන්ම මේ පනත ගෙනාවෙ දුප්පතාට යහපතක් කරන්ටද? රටේ වැඩි දෙනාගේ යහපත පිණිසද? නැහැ. අන්න ඒකයි අපේ ආණ්ඩුවෙත් මේ ආණ්ඩුවෙත් මූලික වෙනස. එදා බලයේ සිටි අපේ ආණ්ඩුව යම්කිසි ප්‍රතිපත්තියක් සකස් කළා නම්, එසේ සකස් කළේ මේ රටේ කර්මාන්ත සංවර්ධනයට නැති නම් මේ රටේ වැඩ සාමාන්‍ය බහුතර ජනතාවගේ සුභ සිද්ධියට අදාළ වන ලෙසටයි. නමුත් තමුන්නාන්සේලා මේ මුදල් යොදන්න බලාපොරොත්තු වන්නේ ඇමෙරිකානු අධිරාජ්‍යවාදීන් ඕනෑවටත් වඩා පිනවීමටයි. මේ මුදල්, අල් පෙනෙත්ති කට්ටක් සෑදීමට, ඇඳුමකට ගහන කටුවක් සෑදීමට, අභ්‍යාස පොතක් සෑදීමට, සූට් කේසයක් සෑදීමට, අයිස් පෙට්ටියක් සෑදීමට ඔය ආදී උපකරණයක් සෑදීමට, වැය කරනවා නම් අපේ ඇති අකමැත්තක් නැහැ. නමුත් මේ මුදල් යොදවන්නෙ ඇමෙරිකානු අධිරාජ්‍යවාදීන් සන්තෝෂ කිරීමට නොවේද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එසේ කරමින් තමුන්නාන්සේලා කියනවා බණ්ඩාරනායක ප්‍රතිපත්තිය අනුවම ක්‍රියා කරනවාය කියා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

අහස් යාත්‍රා තොටුපල හැදුවෙ මොකටද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කටුනායක අහස්යාත්‍රා තොටුපල හැදුවෙ අහස් යාත්‍රා බස්වන්න. වෙනත් කිසි වැඩක් එයින් කරන්න බැහැ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ජම්බෝ ජෙට්ස්වලට.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

අප කළ වැඩවලින් තමුන්නාන්සේලා ප්‍රයෝජන ගන්න. ඒ ගැන අපේ විරුද්ධත්වයක් නැහැ. නමුත් අදහස් විකෘති කර, වැරදි අන්දමට මහජනතාවට පෙන්වන්න උත්සාහ දරන්න එපා. කර්මාන්තවලට සහනයක් සැලසීමෙන්, මුදල් යෙද... අප අදහස් කළ පරමාර්ථයන් හා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මේ රජය දේශ සංචාරකයින් සඳහා පහසුකම් සැලසීමෙන් අදහස් කරන පරමාර්ථයන් අතරේ විශාල පරතරයක් තිබෙනවා; අහසත් පොළවත් තරමේ වෙනසක් තිබෙනවා.

සමහර විට සංචාරකයින් මෙරටට පැමිණීමෙන් විශාල ආදායමක් ලැබෙනවාය, විදේශ විනිමයක් ලැබෙනවාය කියා තමුන්නාන්සේලා කියන්න පුළුවනි. නමුත් මේ අන්දමට බදු සහනයන් සැලසීමෙන් සිදු වන්නෙ මොකක්ද? එයින් නැති වෙන්නෙ විදේශ විනිමය නේද? මා එය පැහැදිලි කර දෙන්නම්. විදේශිකයන් මේ රටේ ව්‍යාපාර සඳහා මුදල් යොදවනවා නම්, ඒ මුදල් සඳහා අවුරුදු පහකට ආදායම් බද්දෙන් නිදහසක් දී තිබෙනවා. ඊළඟ අවුරුදු පහළොව තුළ ආදායම් බද්දෙන් සියයට පණහක් නිදහස් කරනවා. ඒ අනුව කල්පනා කර බලන විට අවුරුදු විස්සක පමණ කාලයක් මේ රටේ සංචාරකයින්ගේ මාර්ගයෙන් ලැබෙන ලාභය විදේශවලට ඇදී යනවාද නැද්ද කියන ප්‍රශ්නයට ගරු මුදල් ඇමතිතුමාගෙන් අප පිළිතුරු බලාපොරොත්තු වෙනවා. එහෙමනම් තමුන්නාන්සේලා බලාපොරොත්තු වන වාසිය මොකක්ද? එපමණක් නොවෙයි, ඒ අන්දමට විශාල මුදලක් පිටරට ඇදී යන අතර සංචාරකයින් සඳහා ඇති කරන්න යන මධ්‍යස්ථාන, හෝටල් ආදිය තැනීමේ කටයුතුත් විදේශීය කොන්ත්‍රාත් කාරයින්ට භාර දෙන්න යනවා. ඇයි, අපේ රටේ කොන්ත්‍රාත්කාරයන්ට මේ කොන්ත්‍රාත් වැඩ නොදී පිටරටින් කොන්ත්‍රාත් කාරයන් ගෙන්වා මේ කොන්ත්‍රාත් භාර දෙන්නට යන්නේ? මේ හෝටල් ගොඩනැගිලි සාදන්නට පිටරට කොන්ත්‍රාත්කාරයන් මොකටද? මේ විදේශීය කොන්ත්‍රාත්කාරයන් ලබන ලාභ සියල්ලම ආපසු ගෙන යන්නට ඉඩ දෙනවා. මේ පනතෙන් කරන්නේ ඒකයි. එහෙත් මෙතැන අවුත් මේවා මොකවත් නොදන්නා පුංචි බබ්බුන් මෙන්, "එදා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව අදහස් කළ දේමයි අප කරන්නට යන්නේත්" යනුවෙන් කියනවා. විදේශික කොන්ත්‍රාත්කාරයන් මේ රටට ගෙන්නා ඔවුන් ලවා හෝටල්වලට අවශ්‍ය වන ගොඩනැඟිලි සාදවා ගැනීමේදී ඔවුන් ලබන ලාභ නැවත ඔවුන් පැමිණි රටවල් වන ඇමෙරිකා එක්සත් ජනපදයට, එංගලන්තයට, ප්‍රංශයට, බෙල්ජියමට ගෙන යන්නට ඉඩ දෙනවා. අපේ යටියන්තොට ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) මුදල් ඇමතිවරයා වශයෙන් සිටියදී කළ එක්තරා දෙයක් නම් මේ රටෙන් විදේශිකයන් උපයන ආදායම් පිටරට ගෙන යෑම තහනම් කිරීමයි. ඔවුන් උපයන ආදායම පිටරටවලට ගෙන යෑම තහනම් කිරීමට එතුමා නියෝගයක් දුන්නා. එහෙත් මේ ආණ්ඩුව පත් වුණු හැටියේම ඒ තහනම ඉවත් කළා. විදේශික කොම්පැනිකාරයන් සතුව මේ රටේ තිබෙන තේ සහ රබර් වතුවලින් උපයන ආදායම කිසිම අවහිරයක් නොමැතිව ඔවුන්ගේ රටවලට ගෙන යන්නට මේ ආණ්ඩුව ඉඩ දුන්නා. මේ ආණ්ඩුව විදේශිකයන් සම්බන්ධයෙන් වෙස්සන්තර ක්‍රියා මාර්ගයක් අනුගමනය කරන්නට පටන් ගත්තා. ඒ මදිවටා හෝටල් ගොඩනැගිලි සෑදීම සඳහා ලන්ඩන්වලින්, පැරිස්වලින් මෙහි ගෙන්වා ගන්නා විදේශික මිත්‍රයන්ට තමන්ගේ ලාභ ගෙන යන්නට මං සැලසීමට මේ ආණ්ඩුව ක්‍රියා කරනවා. ලාභ ගෙන යන්නට ඉඩ දෙනවා. වැටුප් ගෙන යන්නට ඉඩ දෙනවා. විදේශ විනිමය ආරක්ෂා කර ගන්නට ක්‍රියා කරන්නේ ඔහොමද?

හිටපු මුදල් ඇමතිවරුන් අදුර්දර්ශී ලෙස කටයුතු කළ බව මේ ආණ්ඩුවේ උදවිය නිතරම කියනවා. පසුගිය ආණ්ඩුවේ අදුර්දර්ශී ක්‍රියා මාර්ගයන් නිසා අපේ විදේශ විනිමය ප්‍රමාණය අඩු වූ බව මෙහි දීත් රටේ හැම තැනකදීත් කියනවා. හොඳයි, මේ ආණ්ඩුවේ ඇමතිවරුන්ගේ දුර්දර්ශී වැඩ පිළිවෙළ මේකෙන් මනා ලෙස පැහැදිලි වෙනවා නේද? එපමණක්ද? මේ හෝටල්වල වැඩ කිරීම සඳහා විදේශවල සිට පැමිණෙන සේවකයන් ලබන වැටුප් ආදායම් බද්දෙන් නිදහස් වෙනවා. තවද, මේ හෝටල්වල සේවය සඳහා විදේශයක සිට කුසල ශෝධකයකු හෝ පැමිණියහොත් අවුරුදු තුනක් යන තුරු ඔහුගේ වැටුප ආපසු තමන් පැමිණි රටට ගෙන යන්නට මේ පනතෙන් අවසර දෙනවා. දෙන්නට පුළුවන් මේ හැම දෙයක්ම විදේශිකයන්ට දෙමින් අපේ රාජ්‍ය ඇමතිතුමා මෙතැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වී. බී. එම්. හේරත් මයා.]

අවුත් අමුතු පිංතූරයක් මවා පාන්නට හදනවා. "මේක හොඳ වැඩක්. මේක තමුන්නාන්සේලාගේ ඇමතිවරුනුත් කළ වැඩක්. අප මේ අලුත් දෙයක් කරන්නට යනවා නොවෙයි. මේ රට දිව්‍ය ලෝකයක් හැටියට පෙන්වමින් ආදායම් ලැබීමටයි, අප මේ වැඩ කරන්නේ. අප කවුරුනුත් සහයෝගයෙන් මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නට ඕනෑ," යනුවෙන් ගරු රාජ්‍ය ඇමතිතුමා මෙහිදී කියතත් ඇත්ත වශයෙන් දැනට වැඩ කෙරී ගෙන යන අන්දම දෙස බලන විට මෙය ස්වදේශික ධනපතියන්ටත්, විදේශික ධනපති මිත්‍රයන්ටත් සහනයක් සැලසීම සඳහා ආරම්භ කරන ලද වැඩක් බව අපට කියන්නට සිදු වී තිබෙනවා. අපේ ස්වදේශික ධනපතියන්ට බදු සහනයක් මෙන්ම විනිමය සහනයක්ද සලසා තිබෙනවා. මේ අන්දමට වැඩ කරගෙන යමින් මේ රටට විදේශික සංචාරකයන් වැඩි වැඩියෙන් ගෙන්වා ගන්නට තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙනවා නම් ඇත්තෙන්ම එය පුස්සක් බවට පත් වෙනවාට කිසිම සැකයක් නැහැ. වැඩි වැඩියෙන් සහන දී වැඩි වැඩියෙන් ආදායම් ලබන්නට ගෙන යන මෙම කටයුතු වලින් රටට කිසිම ප්‍රයෝජනයක් නැති වෙනවා.

හෝටල් ගොඩනැගිලි සාදන්නෝ, විදේශීය කොන්ත්‍රාත්කාරයෝ. හෝටල්වලට මුදල් යොදන්නෝ, විදේශිකයෝ. ඔවුන් යොදවන ධනය ආපසු ගෙන යන්නට ඉඩ දෙනවා. ඒ අතර ඔවුන් අවුරුදු පහක් තුළ ලබන ලාභය ගෙන යන්නට ඔවුන්ට ඉඩ තිබෙනවා. එපමණක්ද? ඊට පසු අවුරුදු පහළොවක් යන තුරු ලාභයෙන් භාගයක් ගෙන යන්නට ඔවුන්ට ඉඩ තිබෙනවා. කොන්ත්‍රාත්කරුවන් වශයෙන්, ව්‍යාපාරිකයන් වශයෙන්, සේවකයන් වශයෙන් පිටරට මුදල් ගෙන යන්නට විදේශිකයන්ට ඉඩ සලසා තිබෙනවා. සේවකයකුට අවුරුදු තුනක් යන තුරු තම වැටුප් පිටරට ගෙන යන්නට පුළුවන් බව මා මුලින් කිව්වා. ආදායම් බදු සහනය ඇතිවයි, ඒ වැටුප් ගෙන යන්නට පුළුවන් වන්නේ. මේ තරම් දුරට විදේශිකයන්ට ආධාර දෙමින් ක්‍රියා කරන තමුන්නාන්සේලාට ආත්ම ගෞරවයක් තිබෙනවාද? තමුන්නාන්සේලා ආත්ම ගෞරවයක් ඇති අයවලුන් හැටියට නොව, අපේ රට පිටරටවලට පාවා දෙන්නන් හැටියටයි, අපට සලකන්නට සිදු වන්නේ, හඳුන්වා දෙන්නට සිදු වී තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ මිත්‍රයන් සතුටු කරන්නට කළ හැකි සියල්ලම තමුන්නාන්සේලා කරනවා. දැන් දේශ සංචාරකයන් බොහොම එනවාලු. දේශ සංචාරකයන් එනවා නම් සතුටු විය යුතුයි. එහෙත් ඒ සමගම අප ඒ අයගෙන් පරෙස්සම් විය යුතුයි. සමහර රටවලට පැමිණි දේශ සංචාරකයන් අද ඒ රටවල් ගිළගෙන සිටිනවා. ලංකාවට ඇවිත් තිබෙන සමහර දේශ සංචාරකයන් අද ලංකාවේ සිටින ඇමෙරිකන් රහස් ඔත්තු සේවයට අයිති පිරිසක් හැටියට චෝදනා කරන්නට අපට සිදු වී තිබෙනවා. තමුන්නාන්සේගේ දේශසංචාරක ව්‍යාපාරය, අද වියට්නාමයේ තිබෙන තත්ත්වයට හෙට ලංකාව පත් කිරීමට හේතුවක් වුණොත් ඊට වගකිව යුත්තා රාජ්‍ය ඇමතිතුමාය—දකුණු කොළඹ මන්ත්‍රී ජේ. ආර්. ජයවර්ධන මහත්මයාය—කියා අනාගත පරම්පරාව කියාවි. එතුමාගේ අදූරදර්ශීකම නිසා අද ඇමෙරිකානුත් ලංකාවේ බෞද්ධයන් මරනවාය කියා කවදා හෝ මේ රටේ බෞද්ධයකු කිව්වොත්, එදාට ඒ පුද්ගලයාට විරුද්ධව නඩුවක් පවරන්නට තමුන්නාන්සේට ජීවත් වන්නට බැරි වෙනවා. අද එහෙම කිව්වොත් තමුන්නාන්සේට පුළුවන් වෙයි නඩුවක් පවරා සමහරවිට අච්චු කරවන්නට. එහෙත් තමුන්නාන්සේ නැති වුණාට පස්සෙ—පරම්පරා කීපයකට පස්සෙ—යම්කිසි මිනිහකු එහෙම කිව්වොත්, තමුන්නාන්සෙට නඩුවක් දමන්නට බැහැ. රුපියල් 250ක් දඩ ගස්සවන්නටවත් හිරේ යවන්නටවත් බැහැ. ඒ නිසා අප කරන ක්‍රියා සියල්ලක්ම අපේ ජීවිත කාලයටත්, අපේ පෞද්ගලික වාසියටත්, ඒ ඒ අවස්ථාවේදී තර්කයටත් පමණක් සීමා කරන්නට බැහැ. අප කරන දේ මේ රටේ අනාගතයට බල පාන්නේ කොයි ආකාරයෙන්ද කියා කල්පනා කරන්නට තමුන්නාන්සේටත්, අපටත්, මේ රටේ ජීවත් වන සෑම මිනිසකුටත්, යුතුකමක් තිබෙනවා. ඒ නිසා එය පෙන්වා දීම අපේ යුතුකමක්.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

ඒ නිසා දේශ සංචාරක සේවය දියුණු කිරීම පිණිසය කියා විදේශිකයන්ට ගැති කම් කර ඔවුන්ට වුවමනාවට වඩා සුඛෝප භෝගී පහසුකම් ලබා දීමෙන් ඔවුන් නිසා මේ රටට සිදු වන්නට යන අනතුරු ගැනත් අප කල්පනා කරන්නට ඕනෑ. අප එසිනුත් පරෙස්සම් වන්නට ඕනෑ.

දේශ සංචාරකයන් නිසා ලංකාව හොංකොං නගරයක් කරන්නට අපට වුව මනාවක් නැත කියා එක මන්ත්‍රීතුමකු සඳහන් කළා. ලංකාව දේශ සංචාරකයන් නිසා පැරිස් නගරයක් කරන්නටවත් අපට වුවමනාවක් නැහැ. ලංකාව දේශ සංචාරකයන් නිසා ළඟම තිබෙන ඉන්දියාවේ බොම්බාය නගරයේ තත්ත්වයට පත් කරන්නට අපට වුවමනාවක් නැහැ. මේ දේශ සංචාරක ව්‍යාපාරය නිසා ඒ වගේ නින්දිත තත්ත්වයකට යම්කිසි දවසක මේ රට පත් වුනොත්, ඊට වගකිව යුත්තා, ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා බවට මා ඔබතුමාට අවවාදයක් කරන්නට කැමතියි; අනතුරු ඇඟවීමක් කරන්නට කැමතියි. ඒ නිසා අප පරෙස්සමින් කට යුතු කරන්නට ඕනෑ. සල්ලි හම්බ කිරීමම නොවෙයි, පරමාර්ථය. සල්ලි හම්බ කිරීමට නොයෙකුත් විධි තිබෙනවා. විදේශ විනිමය ලබා ගැනීමට නොයෙකුත් විධි තිබෙනවා. එහෙත් බෞද්ධ රටක් හැටියට, දියුණු වූ රටක් හැටියට, සංස්කෘතියක් ඇති රටක් හැටියට, අප කටයුතු කරන්නට ඕනෑ. සල්ලි හම්බ කිරීමේ පරමාර්ථයෙන්ම කටයුතු කරන්නට එපා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, තමුන්නාන්සේගේ වචන මිහිරි වුනත් තමුන්නාන්සේගේ ක්‍රියාවෙන් මේ රටට කවදාවත් මිහිරක් ලැබෙන්නෙ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි සඳහන් වන්නේ දේශ සංචාරකයන්ට ලැබෙන සහන පමණක්ය කියා පෙන්වීමට ගරු රාජ්‍ය ඇමතිතුමා මහන්සි ගත්තා. ඒක සම්පූර්ණ අසත්‍යයක්. ගරු රාජ්‍ය ඇමතිතුමා එන්නේත් මේ පනත නොකියවා නම්, මම එය කියවන්නම්. මේ රටේ තිබෙන්නෙ කැබිනට් ආණ්ඩුවක්. මේ රටේ අනාගතය තිබෙන්නේ කැබිනට් මණ්ඩලය අතෙයි. කැබිනට් මණ්ඩලය මේ සියල්ලක්ම කියවා අනුමත කර තමයි, පාර්ලිමේන්තුවට එවන්නේ. ඒ එව්වාට පසුව තමයි, ආණ්ඩු පක්ෂයේ පිටුපස අසුන්වල සිටින මන්ත්‍රීවරුනුත් අපත් ඒවා දැනගන්නේ. මේ ගැන සම්පූර්ණයෙන් වග කිව යුතු ඇමතිතුමකු කියනවා, මේ පනතේ ගොවීන් ගැන වචනයක්වත් නැත කියා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
කව්ද කිව්වෙ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
බලපිටියේ මන්ත්‍රීතුමාට (එල්. සී. ද සිල්වා මයා.) බාධා කරමින් තමුන්නාන්සේ කිව්වෙ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
එහෙම කිව්වේ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
බොහොම ලෙසෙසියි කියන්න. මනුෂ්‍යයාගේ දිව පුදුම අවයවයක්. අනික් හැම අවයවයකටම වඩා ඒක ඕනෑම පැත්තකට නමන්නට පුළුවන්. පැරණි මිනිසුන් කියනවා, ඇට නැති දිවය කියා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
මන්ත්‍රීතුමකු යමක් කිව්වොත් පිළිගන්නට ඕනෑ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
පිළිගන්නට බැහැ කිව්වේ නැහැ. දිව පිළිබඳ විස්තරයක් මා කළේ. මෙහි 7 වන අන්තර් වාක්‍යය යටතේ මෙහෙම සඳහන් වෙනවා.

" බදු නිදහස් වීමේ වරයට හිමිකම කියන රජයේ ඉඩම උපයෝගී කරගෙන ඇති කෘෂිකාර්මික ව්‍යාපාර සම්බන්ධයෙන්, බදු නිදහස් වීමේ වරය ලබා ගැනීමට හෝ ලැබූ පාඩු ඔහුගේ අනෙක් ආදායම් ප්‍රභව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යන්ට හිලව් කිරීමට හෝ යන දෙකින් බදු ගෙවන්නා කැමැත්තක් ඉල්ලා සිටීමට විධිවිධාන සලසනු ලැබේ."

වගාව සඳහා යැයි රජයේ ඉඩම් අක්කර දහස් ගණන් බෙදා දී අවුරුදු 5 ක් බදු සහන දෙනවා පමණක් නොවෙයි. කලින් වර්ෂවල වුණු පාඩුව ඒ අවුරුදු 5 න් පසුව එන අවුරුදුවලදී ලබන ආදායමෙන් කපා හරින්නටත් ඉඩ සලස්වා තිබෙනවා. ඒ බදු සහන දෙන්නේ කාටද? රජයේ ඉඩම් අක්කර 97,000 ක් විතර බෙදා දී තිබෙන ධනපති උදවියටයි.

නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය හොඳට තේරුම් ගන්න. මේ රටේ ධනපතියෙක් තම මුදල් කෘෂිකර්ම ව්‍යාපාරයක යෙදුවොත් ඒ යොදවන මුදලත් ආදායම් බද්දෙන් නිදහස්, ඒ යෙදවීමෙන් ලබන ආදායමත් ආදායම් බද්දෙන් නිදහස්. මේ රටේ ධනපතියෙක් තම මුදල් දේශ සංචාරක ව්‍යාපාරවලට යෙදුවොත් ඒ යොදවන මුදලත් ආදායම් බද්දෙන් නිදහස්, යෙදවීමෙන් ලබන ආදායමත් ආදායම් බද්දෙන් නිදහස්. ඒ කියන්නේ, අවුරුදු 5 ක් සම්පූර්ණයෙන් නිදහස් තවත් අවුරුදු 15 ක් හරි අඩක් නිදහස්. කොහොමද, තමුන්නාන්සේලා මේ රට කිරියෙන් පැණියෙන් උතුරුවා තිබෙනවා නේද? කාටද, කිරියෙන් පැණියෙන් උතුරුවා තිබෙන්නේ? තමුන්නාන්සේලාගේම පන්තියට හෙවත් ධනපති පන්තියටයි. තමුන්නාන්සේලාගේ ඊනියා වගා ව්‍යාපාරය සඳහා අද ඒ ධනපතියකුට අක්කර දහසක් ලැබෙනවා නම් ඒවායේ තිබෙන මැහොගනි, කරුවල, බුරුත, නැදුම්, හුළං හික් වැනි හොඳ ගස් කඳන් පිටින් කපා විකුණනවා. ඒ මාර්ගයෙන් රුපියල් ලක්ෂ ගණනක, කෝටි ගණනක ආදායමක් ලබා ගන්නවා. අනෙක් අතට, ඉතුරු වන ටික පුළුස්සා වී, කුරක්කන් වැනි මොනවා හෝ ධාන්‍ය වර්ගයක් වපුරනවා, තුන් මාසයකින් නැත්නම් හාර මාසයකින් විතර ලැබෙන අස්වැන්නෙනුත් ආදායමක් ලැබෙනවා. අද වී බුසලක් කීයද? ආණ්ඩුවේ සහතික මිල රුපියල් 14 යි. එහෙත් අද රුපියල් 17ට 18 ට වී බුසලක් විකුණන්නට පුළුවනි. අවුරුද්දට එක ඉඩමක කන්න දෙකක් වැඩ කරන්නට පුළුවනි. ඒ අනුව අවුරුදු 5 කට කන්න 10 ක් වැඩ කරන්නට පුළුවනි. හොඳයි, අපි එක් අවුරුද්දකට විතරක් ගණන් බලමු. අවුරුද්දට කන්න දෙක බැගින් අක්කර දාහකින් ලැබෙන ආදායම ගණන් බලන්න. තමුන්නාන්සේලාගේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංඛ්‍යා ලේඛන අනුව අක්කරයකින් වී බුසල් 50 ක් ලැබෙනවා නම් අක්කර 1,000 කින් වී බුසල් 50,000 ක් එක කන්නයකට පමණක් ලැබෙනවා.

**ගරු ෂෙල්ටන් ජයසිංහ**
*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)
වගාවෙන් පාඩු වුණොත්?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
පාඩු වුණොත් තව අවුරුදු 15 ක් ආදායම් බදු සහන දෙනවානේ? මේකත් හරියට රේස් ටිකට් එකක් ඇදුණ වාගේ එකක්. ලොතරැයි මණ්ඩලයක් ඕනෑ නැහැ. ඒ විධියට අවුරුදු 5 ක් හෙවත් කන්න 10 ක් ආදායම් බද්දෙන් සම්පූර්ණයෙන් නිදහස්ව ආදායම ලබනවා. ඊට කලින්, ඉඩමේ තිබුණු හොඳ ගස් ටික කපා විකුණා මුදල් ගත්තා. 6 වැනි අවුරුද්දේ ආදායම ඉදිරිපත් කරන්නට කීවාම, "මට 1 වැනි අවුරුද්දේ මෙපමණ පාඩු වුණාය" කියයි. ඒවා ගණන් බලන්නට පුළුවන් කාටද? කොතැනද, සංඛ්‍යා ලේඛන තිබෙන්නේ? මේ අනුව බලන විට අක්කර 97,000 ක ඉඩම් ප්‍රමාණයක් ධනපතියන්ට බෙදා දීමෙන් කර තිබෙන්නේ ඔවුන්ට රුපියල් දහස් ගණන්, ලක්ෂ ගණන් හරිහම්බ කර ගන්නට දොර ඇර දීමක් නොවෙයිද? එය, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයට පත් කරන්නට උදව් කළ ධනපතියන්ට මුදල් ගරා ගන්නට අවස්ථාව සලසා දීමක් නොවෙයිද? වගා ව්‍යාපාරය යනුවෙන් තමුන්නාන්සේලා කරන්නේ වෙන කිසිවක් නොවෙයි, එයයි. වගා කරලත් නැහැ. රට ස්වයංපෝෂිත වෙලත් නැහැ. වගා කරනවාය කියන්නේ බොරුවක්. මේ තරම් සහන සලසා ඇති වගා ව්‍යාපාරය පිළිබඳව වුණත් රටට ඇත්ත කියන්න එපායැ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අද ගුවන් විදුලියෙන් කියන්නේ මොන වාද? "ඈ බං, මොකද බං, කොහෙද බං, ඇයි බං" යනුවෙන් ගුවන් විදුලියෙන් කියන්නේ, එහි ඉන්න මිනිසුන්ට මේ රටේ මිනිසුන් පාවිච්චි කරන වචන කියන්නට බැරිද? "ඇයි බං? මොකද බං? වැඩ වර්ජන බං, රාත්තල් 2 කින් හොණ්ඩර 4ක් හම්බ වුණා බං රතුළුණු" එක සුමානයක් ඔය කතාව කිව්වොත් ඊළඟ සුමානෙදි කියන්නෙ නෑ. ගණන් හිලවු පිළිබඳව රාජ්‍ය ඇමතිතුමාට හොඳ දැනීමක් තිබෙනවා. හොණ්ඩරයකට රාත්තල් 112 යි. හොණ්ඩර 4 ට රාත්තල් 448 යි. රාත්තල් දෙකෙන් රාත්තල් 448 ක් ලැබුණා නම් එක රාත්තලකින් රාත්තල් 224 යි. එහෙම නම් එක රතුළුණු අලයකින් අල 224 ක් බහින්න ඕනෑ. ඔන්න බදු සහන දිදී වචන හැටි. කොහේද ඔය අල බැස්සෙ? ගුවන් විදුලියෙන් ප්‍රචාරය කරන්නේ ඔහොමයි.

**ගරු එම්. ඩී. බණ්ඩා (කෘෂිකර්ම හා ආහාර ඇමති)**
*(கௌரவ எம். டீ. பண்டா—விவசாய, உணவு அமைச்சர்)*
(The Hon. M. D. Banda—Minister of Agriculture and Food)

දඹදෙණියේ ගරු මන්ත්‍රීතුමා (ආර්. ජී. සේනානායක මයා.) ගෙන් ඇහුවොත් කියයි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

දඹදෙණියේ මන්ත්‍රීතුමාගෙන් අහන්න මට වුවමනාවක් නැහැ. එක අලයකින් අල 224 ක් බැස්සායයි එතුමා කොහේදීවත් කියනවා මට ඇසුණේ නැහැ. තමුන්නාන්සේලාගේ ගුවන් විදුලියයි ඕවා කියන්නේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

එතුමා අක්කර සිය ගණනක් බද්දට අර ගෙන වවනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

අක්කර කීයක් ගත්තත් එක රතුළුණු අලයකින් අල 224 ක් බහින්නේ කොහේද? [බාධා කිරීම්] බොරුවක් කිය නත් ජනතාවට පිළිගන්නට පුළුවන් බොරුවක් කියන්නට ඕනෑ. රතුළුණු හොණ්ඩරයකින් හොණ්ඩර 8 ක 10 ක අස්වැන්නක් ලැබුණු බව කියනවා නම් එය ඇත්තක්. හොණ්ඩරයකින් හොණ්ඩර 224 ක් හම්බ වුණායයි කීම විශ්වාස කරන්නේ මොන මිනිහාද? බොරුවෙත් සීමාවක් තිබෙන්නට ඕනෑ. [බාධා කිරීම්]

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

තමුන්නාන්සේලාම බොරු මවාගෙන ඒවා නොයෙක් අතට පෙරළනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

බොරු මවන්නේ අප නොවෙයි, තමුන්නාන්සේලාගේ ගුවන් විදුලියයි. "බොරු කිව්වා" ය කියන්නට මෙම ගරු සභාවේ අවසර නැහැ. එහෙත් "බොරු මවනවා" යි කියන්නට ඉඩ තිබෙනවා. සිංහල භාෂාව ඉංග්‍රීසි භාෂාවට වඩා බොහෝම දියුණුයි. ඕනෑ ඕනෑ අතට හරවා පාවිච්චි කරන්නට පුළුවන් වචන තිබෙනවා. බොරු කිව්වාය කිව්වොත් වැරදියි. බොරු මැව්වාය කිව් වොත් වරදක් නැහැ. තවත් ඕනෑ නම් බොරු නිපදෙව්වාය කියන්නටත් පුළුවනි.

ඒ කොයි හැටි වෙතත් පිටරටවලින් එන සංචාරකයින් සඳහා තමුන්නාන්සේලා හොඳ හෝටල්, හොඳ පාරවල්, හොඳ වැසිකිළි, හොඳ ඇඳන්, හොඳ සම්බාහන ආයතන හෙවත් "මසාජ් ක්ලිනික්ස්" හදනවා. ඒ සමගම, ඒවා හදන අයට බදු සහනත් දෙනවා. එහෙත් මේ රටේ මිනිසුන්ට කන්න නැහැ. දුප්පත් මිනිහාගේ හාල් සේරු දෙකෙන් එකක් තමුන්නාන්සේලා කැපුවා; කොත්තමල්ලි ටික, සූදුරු මාදුරු ටික, පරිප්පු ටික තමුන්නාන්සේලා කැපුවා; රෙදි කෑල්ලත් කපා දැම්මා. මේ රටේ ජනතාවගේ ආහාර ද්‍රව්‍ය ඒ විධියට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

කපා දමමින්, පිටරටින් එන විදේශික යින්ට හැම පහසුකමක්ම දුන්නා. එපම ණක් නොව, විදේශ විනිමය නැතැයි කියන තමුන්නාන්සේලා සංචාරකයින් සඳහා දහස් ගණනින් මේ රටට කාර් ගෙන්වා තිබෙනවා. [බාධා කිරීමක්] දැනටම කාර් දෙදාස් ගණනක් ගෙන්වා තිබෙනවා. කාර් සම්බන්ධයෙන් තමුන් නාන්සේලා මේ රටේ මහජන මන්ත්‍රී වරුන් වන අපටත් වංචාවක්, තක්කඩි කමක් කළා. වාහන වුවමනාදැයි තමුන් නාන්සේලා අපෙන් ඇහුවා. වුවමනා නම් මේ ඉල්ලුම්පත් පුරවා එවන්නයයි ඊළඟට අපට කිව්වා. අලුත් කාර් ලබා ගන්නට ඉල් ලුම්පත් යැවූ අප ආණ්ඩුවේ කීම විශ්වාස කරගෙන අප ළඟ තිබුණු කාර් වික්කා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)
මාත් ඉල්ලුවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
තමුන්නාන්සේලාට ආණ්ඩුවේ බෙන්ස් කාර් තියෙන්නේ.

**සිරිමාවෝ බණ්ඩාරනායක මිය.**
*(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)*
(Mrs. Sirimavo Bandaranaike)
එකක් නොවෙයි, තුනහතරක්ම තියෙනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ස්වදේශ කටයුතු භාර ගරු ඇමතිතුමා උදේට එන කාරකේ නොවෙයි, හවසට එන්නේ. අපේ ඇමතිවරුන් බෙන්ස් කාර්වලින් යනවාය කියා තමුන්නාන්සේලා ඒ දවස්වල කොයි තරම් පිළිකුල් අන්දමටද ඒ ගැන කථා කළේ? ඒ කාර් ලොතරැයි ක්‍රමයට විකුණූ තමුන්නාන්සේලා දැන් කොහොමද ගමන් බිමන් යන්නෙ? මා අසන්නේ, කව්ද මේ රවටන්නේ, කියායි. කවුරුන් රවටන්නද මේ මහන්සි ගන්නෙ?

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)
දශරාජ ධර්මය.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඔව්, දශරාජ ධර්මයෙන් තමයි පාලනය කර ගෙන යන්නෙ. ධනපතියන්ට පම ණක් පරිත්‍යාග කරන, ඇමතිවරුන්ට පම ණක් පරිත්‍යාගයන් කරන, දශ රාජ ධර්මය තමයි මේ. මේ අන්දමට හැම විටම කරන් නේ බොරුවක්, වංචාවක්, නැත්නම් තක් කඩිකමක්. ජනතාව පුළුවන් තරම් රවට රවටා, නව නවත් ජනතාවගේ කර උඩම මේ බදු පටවා, ඔවුන්ගේම මුදල් ලබාගෙන විදේශීය සංචාරකයින්ට, අධිරාජ්‍යවාදීන්ට මේ රටේ සංචාරය කිරීමට පහසුකම් සල සනවා.

**ගරු ෂෙල්ටන් ජයසිංහ**
*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)
වේලාව 6 යි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)
ඒකට මට කමක් නැහැ. හෙටත් වෙලාව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විදෙශීය සංචාරකයින් මේ රටට ගෙන්වී මෙන් එතුමන්ලා බලාපොරොත්තු වන ප්‍රයෝජනවලට වඩා අප්‍රයෝජන ලැබෙන්න පුළුවනි. තමුන්නාන්සේට අද යුරෝපීය ඇඳුමක් ඇඳ ගෙන ඔය පුටුවේ වාඩි වී සිටීමට සිදු වී තිබෙන්නේ සුද්දන් මේ රටට පැමිණි නිසයි. නැත්නම් ඔය ඇඳුම අඳින්නේ නැහැ. අධිරාජ්‍යවාදීන්ගේ ඇඳුමේ, භාෂාවේ හා ක්‍රියාවල නෂ්ටා වශේෂයන් මේ රටේ තවමත් ඉතිරි වී තිබෙනවා. තමුන්නාන්සේලාට අද ලැබී තිබෙන්නේ එංගලන්තයෙන් පැමිණි නෂ්ටාවශේෂයන් පමණයි. නමුත් තමුන් නාන්සේලගෙ මේ සංචාරක ව්‍යාපාරය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දියුණු වුණාට පසු ලෝකයේ හැම තැනම තිබෙන දේවල්—හැම වසංගතයක්ම—මේ රටට බෝ වෙන්න පුළුවනි.

අ. භා. 6

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

**අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා [එම්. සිවසිතම්පරම් මයා.] මූලාසනාරූඪ විය.**

*அதன்பிறகு, உப சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, குழுக்களின் உப அக்கிராசனர் [திரு. எம். சிவசிதம்பரம்] தலைமை தாங்கினார்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [MR. *M.* SIVASITHAMPARAM] *took the Chair.*

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමනි, මා කියමින් සිටියේ අධිරාජ්‍යවාදී නෂ්ටාවශේෂයන් මේ රටේ ඉතිරි වී තිබෙන ආකාරය ගැනයි. ඒ අධිරාජ්‍යවාදී නෂ්ටාවශේෂයන් මේ රටේ කොයි තරම් දුරට බලපානවාද කිව්වොත්, අද අපේ රටේ ළමයෙකුට සිංහලෙන් ඉගෙන ගෙන, සිංහලෙන් ජ්‍යෙෂ්ඨ පංක්තිය සමත් කර, විශ්ව විද්‍යාලයකට ඇතුළු වී සිංහල උපාධිධරයෙක් හැටියට පිට වෙන්න පුළුවන්කමක් නැහැ. සිංහල රටේ සිංහල ළමයෙකුට සිංහලෙන් උපාධියක් අරගෙන පිට වෙන්න බැරි තත්ත්වයක් අද තිබෙන්නෙ. කොයි තරම් දුරට අධිරාජ්‍යවාදීන්ගේ නෂ්ටාවශේෂවලට ගැති වී තිබෙනවාද? සිංහල රටේ සිංහල කටවලින්ම කියනවා යම් යම් විෂයයන් සිංහලෙන් උගන්වන්න බැරිය කියා. අධිරාජ්‍යවාදීන්ට කොයි තරම් ගැති වී තිබෙනවාද කියා තමුන්නාන්සේට පෙනෙනවා ඇති. තමුන්නාන්සේලාගේ දේශ සංචාරකයින් හෙට අනිද්දා පැමිණුනායින් පසු ප්‍රංශ භාෂාවත් අපේ ළමයින්ට ඉගෙන ගන්න කියාවි. ඕලන්ද භාෂාවත් ඉගෙන ගන්න කියාවි. බෙල්ජියන් භාෂාවත් ඉගෙන ගන්න කියාවි. ඔය විධියට හැම භාෂාවක්ම වාගේ ඉගෙන ගන්න සිදු වේවි. අපේ ඉස්කෝල වල සිටින අපේ ළමයින්ට සිදු වන්නේ වෙනත් භාෂාවලින් උපාධි ලබා ගන්නයි.

ඊළඟට තමුන්නාන්සේලාගේ ඔය කුමාර හෝටල් විදේශීය ධනපතියන්ට පමණක් වෙන් වේවි. දෙවැනි පංතියේ කුමාර හෝටල් දේශීය ධනපතියන්ට පමණයි. අපේ විශ්ව විද්‍යාල ධනපතියන්ගේ ළමයින්ට පමණක් සීමා වේවි. ඉඩම්, තව නොයෙකුත් වරප්‍රසාද, ආදායම් බදු සහන, ධනපතියන්ට පමණයි. තමුන්නාන්සේලා කරන හැම ක්‍රියාවක්ම මේ රටේ ධපතියන්ට පමණක් වේවි. තමුන්නාන්සේලා අන්තිමට කියාවි, අපේ ආණ්ඩුව ධනපති ආණ්ඩුවක්ය, අපි ආවේ මේ රටේ වෙන කාටවත් වැඩ කරන්න නොව, අපේ පංක්තියේ ධනපතියන්ට පමණක් සේවය කිරීම පිණිසය, කියා. තමුන්නාන්සේලා කර තිබෙන හැම දෙයක්ම එහෙමයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

සිහිනයක්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

හාල් ගෙන්වන්නට මුදල් නැත කියන තමුන්නාන්සේලාට ධනපතියන්ට වුවමනා කරන විස්කි ගෙන්වන්නට මුදල් තිබෙනවා. කොත්තමල්ලි ටික ගෙන්වන්නට මුදල් නැහැ. නමුත් බ්‍රැන්ඩි ගෙන්වන්නට මුදල් තිබෙනවා. මිරිස් කරල ගෙන්වන්නට මුදල් නැහැ. නමුත් රුපියල් කෝටි කීයක ලොරි ගෙන් වූවාද? රුපියල කෝටි කීයක කාර් ගෙන් වූවාද? රුපියල් කෝටි කීයක ජීප් රථ මිනි මොක්ස් ගෙන්වූවාද? කොහේද ඒවා දුවන්නෙ? කෘෂිකර්මයටය කියා ගෙන්වා ගෙන ඒවායින් ඉස්කෝලවලට ළමයින් එක්ක යනවා. වචන සැටි පෙනෙනවා නොවේද? තමුන්නාන්සේලාටත් ඔය පාරවල්වල යන විට පෙනෙනවා නොවැ. එපමණක්ද? ධනපතියන්ගේ සැප පහසුවට වුවමනා කරන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

සෑම දෙයක්ම මේ ආණ්ඩුව ගෙන්වනවා. හැම්, බේකන් පවා ගෙන්වනවා. තොල් රතු කරන්නට වුවමනා දේවල් පවා ගෙන්වනවා. බදු සහන දී හුලං බල්ලො වුණත් ගෙන්වනවා. ඒ ආකාරයට මේ ආණ්ඩුව ධනපතියන්ට වුවමනා කරන සෑම ද්‍රව්‍යයක්ම ගෙන්වනවා. ධනපතියන්ට වුවමනා කරන ඉඩම් දුන්නා. අක්කර 97,000 ක් දුන්නා. ධනපතියන්ට වුවමනා කරන ආදායම් බදු සහන දුන්නේ අද පමණක්ද? නැහැ. පළමුවැනි අයවැය ලේඛනයෙන්ම ඔවුන්ට ආදායම් බදු සහන දුන්නා. පළමුවැනි අයවැය ලේඛනයෙන්ම ධනපතියන්ට බැංකු බදු සහන දුන්නා. අද මාර්ග දෙකකින් ආදායම් බදු සහන දෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පටන් ගත්තේ කවදාද එදා සිට අද දක්වා තමුන්නාන්සේලා ධනපතියන්ට වුවමනා කරන සෑම සහනයක්ම දුන් අතර දුප්පතාට ගසන්නට පුළුවන් සෑම පහරක්ම ගසා තිබෙනවා. තමුන්නාන්සේලා ධනපතියන්ගේ අතකොළු බව අප කෙළින්ම කියනවා. තමුන්නාන්සේලා ධනපතියන්ගේ නියෝජිතයනුයි. මේ ආණ්ඩුවත් කැබිනට් මණ්ඩලයත් ධනපතියන්ගේ අතකොළුය කියා අපට කියන්නට සිද්ධ වී තිබෙනවා. ඒක සම්පූර්ණ ඇත්තක්. තමුන්නාන්සේලා තේ වවන ධනපතියාට සෑම පහසුකමක්ම දෙනවා. රබර් වවන ධනපතියාට සෑම පහසුකමක්ම දෙනවා. ඔවුන්ට පොහොර ටික නොමිලයේ දෙනවා. වෙනත් ආපසු අය නොකරන මුදල් ආධාර දෙනවා. පරිත්‍යාග කරනවා. තමුන්නාන්සේලා ගොවීන් ගැන කොපමණ කෑගැසුවත් මේ රටේ ගොවීන්ට දුන් ණයවලට අය කළ පොළිය වැඩි කළා නොවේද? කලින් අය කළේ සියයට හයයි. නමුත් තමුන්නාන්සේලා එය සියයට 12 ක් කළා. නැත කියන්නට පුළුවන්ද? දුප්පතාට හාල් සේරුව ලබා ගන්නට තිබෙන හාල් පොත උකසට අරගෙනයි තමුන්නාන්සේලා ගොවීන්ට ණය දෙන්නෙ. කුඹුර පාළු වීමකින් හෝ ණය මුදල ගෙවා ගන්නට බැරි වුණොත් ඒ හාල් පොත රාජසන්තක වෙනවා. මේ රටේ දුප්පතා බඩගින්නෙ මැරෙන්නට ඕනෑ. ඒ විධියට කටයුතු කරන ආණ්ඩුවක් තමයි මේ අප ඉදිරියට අවුත් සිහිනයක්ය කියන්නෙ. සිහින පෙනී නවතින එකක් නැහැ. ඊට වැඩි දේවලුත් සිද්ධ වන්නට ඉඩ තිබෙනවා. සිහින වත් පෙනෙනවා නම් ඒ ගැනත් අප සන්තෝෂ වෙනවා. ඔව්, මහ ජනතාව දුක් විඳින බව ඇත්තයි, එය මා පිළිගන්නවාය කියා ප්‍රසිද්ධ රැස්වීම්වලදී කථා කරන ඇමතිවරුත් තමුන්නාන්සේලා අතර වාඩිවී සිටිනවා. එවැනි ඇමතිවරුන් සිටීම ගැන මා සතුටු වෙනවා. ඒ අවංක ඇමතිවරුන්ගෙන් මා ඉල්ලීමක් කරනවා. මොන මොන අදහස් හා බලාපොරොත්තු ඇතිව ඔය කැබිනට් මණ්ඩලයට ඇතුළු වුවත් මේ රටේ පොදු ජනතාව පාවාදී ධනපති පන්තිය පමණක් ආරක්ෂා කරන මේ ආණ්ඩුව බිඳ දැමීමට ඉදිරිපත් වන මෙන් මා ඒ අවංක ඇමතිවරුන්ට ගෞරවයෙන් ආරාධනය කරනවා. කා අතරත් යම් යම් පෞද්ගලික මත භේද තිබෙන්නට පුළුවනි. නමුත් ඒ මත භේදවලට වඩා ජන මතය, ජනතාව ප්‍රධාන කොට සලකන්නට ඕනෑ. ඊට වැඩි යමක් මා ඒ ගැන කියන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පනත් කෙටුම්පතේ ආදායම් බදු සහන ලබා දීමේ ප්‍රතිපත්තිය ගැන පැහැදිලිවම විස්තර කර තිබෙනවා. [බාධා කිරීමක්] මේ කියන දේවල් අපත් පිළිගන්නවාය, මේවා හරිගස්සන්නට අප යම් තරමකින් හෝ කටයුතු කරන්නට සූදානම්ය කියා කියනවා නම් මා වාඩි වෙන්නම්. එහෙම කියන්නෙ නැතිව මට වාඩිවෙන්නය කීම හරි නැහැ නේද? දස රාජ ධර්මය ගැන සඳහන් කරමිනුයි මා කථාව ආරම්භ කළේ. මෙතෙක් මා කථා කළේ එක් රාජ ධර්මයක් ගැනයි. තව නමයක් තිබෙනවා කථා කරන්න. පරිත්‍යාගය ගැන පමණයි තවමත් මා කථා කර තිබෙන්නේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඔක්කොම එක දවසෙ කියන්න ඕනෑ ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මොන්ටේගු ජයවික්‍රම (රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ ඇමති)**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம—அரசாங்கக் கட்டுவேலை, தபால், தந்திப் போக்குவரத்து அமைச்சர்)*
(The Hon. Montague Jayewickreme—Minister of Public Works, Posts and Telecommunications)

දැන් ටිකක් කියා තව 6 මාසෙකින් නවත් ටිකක් කියන්න පුළුවන්.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේ තව 6 මාසයක් ඔතැන ඉන්නද කල්පනාව? එහෙනම් සිංහලයා මළා.

**කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Shall we get on to the Debate?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ඇමතිතුමන්ලා බාධා කරන විට එතුමන්ලාගේ කාලයත් ටිකක් වැඩියෙන් ගත වෙනවා. මට පෙනෙන්නේ එපමණයි.

අපි මේ ආදායම් බදු සහන පනත මුළුමනින් අරගෙන කල්පනා කරන විට මා අපේ මුදල් ඇමතිතුමාට චෝදනාවක් ඉදිරිපත් කරන්න කැමතියි, මේ රටේ ජීවත් වන සාමාන්‍ය මහජනතාවගේ සහන දිනෙන් දින එකින් එක කපන අතර, මේ රටේ ධනපතියන්ට දෙන සහන දිනෙන් දින එකින් එක වැඩි කරන මුදල් ඇමතිවරයෙක්ය කියා. ධනපතියන්ට දී තිබෙන සහන මොනවාද කියා මා පැහැදිලි කළා. ඒ වාගේම මා සාමාන්‍යයෙන් සඳහන් කළා මොනවාද දුප්පතුන්ට දී තිබෙන සහන කියා. ඒ නිසා මා අහන්න කැමතියි, දුප්පතුන්ට දී තිබෙන සහන කැපීම තමුන්නාන්සේලා මෙතැනින් නවත්වනවාද, එසේ නැත්නම් තව දුරටත් ඒ කැපීම කරගෙන යනවාද, කියා.

තමුන්නාන්සේලා දැන් අධ්‍යාපන සංශෝධන පනතක් ඉදිරිපත් කර තිබෙනවා. අපට පෙනෙනවා, මේ රටේ ළමයින්ට දී තිබෙන නිදහස් අධ්‍යාපන සහන වෙනස් කිරීමේ සංශෝධනයක් තමුන්නාන්සේලා ඉදිරිපත් කර තිබෙන බව. පාසල් යන ළමයින්ගෙන්, නිදහස් අධ්‍යාපනය ලබන දරුවන්ගෙන්, මුදල් අය කිරීමට හැකි වන පනතක් දැන් තමුන්නාන්සේලා ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මැතිණියත් යනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඔව්, කවුරු ගියත් අපි අධිරාජ්‍යවාදීන් දණ ගස්සන තුරු මේ සටන ගෙන යනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

අපිත් එහෙමයි. අපියි ඒක ඉස්සෙල්ලා කෙළේ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඔව්, තමුන්නාන්සේලා කළා. දැන් ආයිත් ඒ පැත්තට ගිහින්. ලංකාවේ හුඟක් දෙනෙක් ඔහොම තමයි. පටන් ගන්නේ එතැනින්. එහෙත් ගිහින් අවසාන වන විට ඔය පැත්තේ.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

හරි. නවතින්නේ මේ පැත්තෙ තමයි.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මම කියන්නෙ ඔය පැත්තෙ කියන එක නොවෙයි, අධිරාජ්‍යවාදී පැත්තෙ කියන එකයි. ඊයෙ පෙරේදා අධ්‍යාපන


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org
3053

[ටී. බී. එම්. හේරත් මයා.]

ඇමතිතුමා චක්‍ර ලේඛයක් නිකුත් කර තිබෙනවා, පාඨශාලාවල 8 වෙනි ශ්‍රේණියේ ළමයින්ට—7 වන ශ්‍රේණියෙන් සමත් ළමයින්ට—කෑම දෙන්න එපාය කියා. තමුන්නාන්සේලා විදේශිකයන්ට කොපමණවත් සහන දෙනවා. එසේ දෙන අතර මේ රටේ ඉගෙන ගන්න ළමයාට නොමිලේ දුන් විස්කෝතු කෑල්ල නවත්වන්නය කියා චක්‍ර ලේඛ යවනවා. [බාධා කිරීම්] තමුන්නාන්සේ කොහේ ඉඳලද ආවෙ? මේ කථා කරන්නේ ආදායම් බදු සහන පනත ගැනයි. මෙහි ධනපතින්ට දුන් සහන ගැනත් දුප්පතුන්ගෙන් කපා තිබෙන සහන ගැනත් පැහැදිලි කර දීමයි මා කරන්නේ. දුප්පතෙකුගේ ළමයෙක් පාසලට ගියාම දවල් පාසලේදී දෙන විස්කෝතුවෙන් සහ කිරි විදුරුවෙන් තමයි ඒ දුප්පත් ළමයා කුසගින්න නිවාගන්නේ. එදා දවසට ඒ ළමයා කන්නේ එපමණයි. තමුන්නාන්සෙලාගේ ළමයින් නම් බෙන්ස් කාර් වලින් පාසලට ඇරලනවා. කෑමට ආපසු බංගලාවට කැටුව විත් නැවත කාර්වලින් ගොස් ඇරලනවා. දුප්පත් ළමයා එසේ නොවෙයි. පාසලේදී දෙන විස්කෝතුව නැත්නම් බනිස් ගෙඩිය සහ කිරි වීදුරුවයි ඒ ළමයා ආහාරය වශයෙන් ගන්නේ. අපේ දුප්පත් ළමයින් ඉගෙන ගන්නේ ඒ විධියේ අමාරුවකින්. එහෙත් තමුන්නාන්සේලාගේ අධ්‍යාපන ඇමතිතුමා හැම පාසලකටම චක්‍ර ලේඛ යවනවා 7 වෙනි ශ්‍රේණියෙන් ඉහළ සිටින ළමයින්ට කෑම දෙන්න එපාය, කෑම දීම නවත්වන්නය, කියා. මෙන්න තමුන්නාන්සේලා දුප්පතුන්ට දෙන සහන. ධනපතියන්ට නම් මේ පනතින් ආදායම් බදු සහන සලසනවා. තමුන්නාන්සේලා 1952 දී හාල් සහනය නතර කළා; පාසැල් ළමයින්ට දුන් කෑමත් නතර කළා. එයට මහජනතාව දුන් පිළිතුර මතක නේද? 8 වැන්නෙන් ඉහළ පාසැල් ළමයින්ට දුන් විස්කෝතුව නතර කර අනික් අයටත් ටික ටික දෙන්නය කියා තිබෙනවා. මේ රටේ කිරි බොන දරුවාට වුවමනා කරන කිරිටික ගෙනැවිත් දෙන්නේ නැහැ. පාසැල් ළමයාට වුවමනා කරන බනිස් ගෙඩිය නැත්නම් කිරි වීදුරුව දෙන්නේ නැහැ. ටිකක් ලොකු අයට වුවමනා කරන බත් ටික දෙන්නේ නැහැ. කටට රහට කන්නට මිරිස් කරලත් නැහැ. හෙම්බිරිස්සාව හැදුණාම බොන්නට කොත්තමල්ලි ටිකක් නැහැ.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

ජනතාව ජීවත් වන්නේ ඔය මොනවත්ම නැතුවද?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තිබෙනවද නැද්ද කියන එක මහජනතාව එළියට ආ දවසට පෙනේවි.

**ගරු එම්. ඩී. බණ්ඩා**
*(கௌரவ எம். டீ. பண்டா)*
(The Hon. M. D. Banda)

තමුන්නාන්සේ කියන විධියට මොකවත්ම නැහැනේ. කිරිත් නෑ, මිරිසුත් නෑ, උම්බලකඩත් නෑ, කොත්තමල්ලිත් මොකවත්ම නෑ. ජනතාව ජීවත්වන්නේ සුළං බීලා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තියෙනව තමයි. අර පොතට ලැබෙන අවුන්ස——

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

තමුන්නාන්සේලාගේ කාලයේ අමුඩ ලේන්සුවත් නැහැ. ඇයි මතක නැද්ද දහනායක මහත්මයා අමුඩ ගහගෙන ආවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කල්මුනේට වෙන්න ඇති.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

Please address the Chair.

Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

The Minister of Home Affairs had to wear an *amuda lensu* during their time.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

අමුඩෙ ගැන කලින් කිව්වේ ගරු ඇමතිතුමා. එතුමාගේ වැඩ ගැන අපි දන්නවා. රුපියල් 500 ක් හොරකම් කළ තැනැත්තාට උප තැපැල් ස්ථානාධිකම. තැපැල් පතිවරයා චෝදනාවලින් නිදහස් කළ තැනැත්තාට රක්ෂාව නැහැ. ඒ විධියේ කැත වැඩයි කරන්නේ.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

How is it relevant to the Debate ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඇමතිතුමා කියන දේවලට අපි පිළිතුරු දෙන්න ඕනෑ.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

I have stopped him. Please continue.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

බාධා කරන්න එනවා නම් ඇමතිතුමා හරියට කටයුතු කර තිබෙන්නට ඕනෑ. එතුමා කළොත් වැඩක් ගඳගහනවා.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

අල්ලස් !

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඔව්, අල්ලස් කොමිසමක් ගෙනෙන්න අපි ලැහැස්තියි. කෝ ඉතින් අල්ලස් කොමිසමක් ගෙනෙනවා ? එදා ඉඳලාම ගෙනෙනවා කියනවා. කෝ ඉතින් ? කොමිසම ගෙනෙන්න ; අපි ඉදිරිපත් වෙන්න ලැහැස්තියි.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

I do not think he made an allegation against the hon. Member.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මොකක්ද ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමතිවරයෙක් මන්ත්‍රීවරයෙකුට අල්ලස් චෝදනාවක් නගන්නේ ?

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

I do not think the Hon. Minister referred to the hon. Member.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

No, Sir, I never referred to anybody.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මටයි ඒ චෝදනාව කළේ. මීට කලින් ගරු රාජ්‍ය ඇමතිතුමාත් මගේ නම පාවිච්චි කර තිබෙනවා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මම ?

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඔව්. 1962 දී තමුන්නාන්සේත් ඕක කිව්වා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

ඒ 1962 නේ. දැන් මං කීවේ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

අල්ලස් ගැන කියන විට අපටත් මැණික් ගැන කියන්න පුළුවන්. එහෙත් අපි එවැනි දේවල් කියන්නේ නැහැ. කියන්න තිබෙන එක කෙලින්ම කියනවා. මේ රටේ දරුවෙකුට කිරි ටිකක් නැතෙයි කිව්වාය කියා ඇමතිවරුන්ට කේන්ති යනවා. අපි මේවා කියන්නේ අනුන්ගෙන් අසාගෙන ඇවිත් නොවෙයි. මගේ දරුවාට මාස 6 කට ලැබී තිබෙන්නේ එක කිරි ටින් එකයි. ඕනෑ නම් හාල් පොත ගෙනැවිත් පෙන් වන්න පුළුවන්. ඇමතිවරුන් කියනවා කිරි තිබෙනවාය කියා. මන්ත්‍රීවරයෙකුටත් ලැබෙන්නේ මාස 6 කට එක කිරි ටින් එක නම් ගම්බද දුප්පත් අයට ලැබෙන් නේ කොහොමද කියා හිතාගන්න පුළුවන්. ගරු ඇමතිතුමාගේ නිලධාරීන්ට ලිපි මාර්ගයෙන් පැමිණිලි කර තිබෙනවා. තවමත් පිළිතුරක් නැහැ. මන්ත්‍රීවරයා කිරි ගන්න පෝලිම්වල යනවා. බෙන්තර-ඇල්පිටිය මන්ත්‍රීතුමා (එච්. ජී. ඒ. කාරියවසම් මයා.) මිරිස් ගන්න පෝලිමේ ගියා. එය ඡායාරූප යත් එක්ක පත්තරේ පළ වුණා. ධනපති පංක්තියේ උදවියට නම් ඔය කියන කර දර එකක්වත් නැහැ. ඒ උදවියට කන්නට බොන්නට ඕනෑ කරන හැම දෙයක්ම පාහේ පහසුවෙන් ලබා ගන්නට පුළුවන් මාර්ග තිබෙනවා. ඕනෑම දෙයක් ඒ උදවියට පහසුවෙන් හම්බ වන නිසා අප කියන දේවල් ගැන සැලකිල්ලක් දක්වන්නේ නැහැ. කෑමට හැම්, බේකන් ආදියත්, බීමට විස්කි, බ්‍රැන්ඩි ආදියත් ඕනෑ තරම් හම්බ වෙනවා.

**ගරු ෂෙල්ටන් ජයසිංහ**
*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)

උන්නැහේ පොටෝකාරයින් එක්ක යන්නට ඇති.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කොහොම හරි, ඡායාරූපයත් එක්ක පත්තරේ පළ වුණා. ඒ විධියට නොක ලොත් තමුන්නාන්සේලාට දැන් තිබෙන තත්ත්වයේ තිබෙන බරපතලකම නිසි විධියට තේරුම් ගන්නට ලැබෙන්නේ නැහැ. හැම් බේකන් කමින්, 5 ශ්‍රී නොම්මර දරණ කාර්වලින් ගමන් බිමන් ආදිය කරමින්, විස්කි බ්‍රැන්ඩි වැනි බිම වර්ග බොමින් ධනපති පංක්තියේ තමුන්නාන්සේලා තව්තිසා දිව්‍යලෝකයේ යහතින් සැපතින් වැජඹෙන සේක. ඒ අතර ලෙඩට දුකට වුවමනා කරන කොත්තමල්ලි ටිකවත්, බතට මාලුවට වුවමනා කරන දුරු වර්ග ටිකවත් නැතිව, මිරිස් කරල වැනි දේ පවා නැතිව, ඉස්කෝලේ යන අහිංසක ළමයින්ට බනිස් ගෙඩියවත් නැතිව, ළදරුවාට වුවමනා කරන කිරි ටික පවා නැතිව සෙසු නිරිසතුන් ටික නිරා දුක් විඳින්නාහ. ඒවා ලැබෙන්නට එපාය. එහෙම නැත්නම් මොකටද කතිරය ගැහැව් වෙ ? පොදු ජනතාව ඔය ආකාරයට දුකසේ ජීවත් වන නමුත් විදේශවලින් මේ රටට සංචාරකයන් ගෙන්වා සැප පහසු අඩුවක් නැතිව ලබා දී—ඇඳන් සහිත කුටි ලබා දී, හොඳ ආහාර පාන ආදියෙන් සතපා, ඒත් මදිවට නව අත පය ඇතුළු අඟ පසඟ මිරි කන්නට සම්බාහන ආයතනත් ඇති කර දී—5 ශ්‍රී 404 පෝජෝ කාර්ද ලබා දීමට කට යුතු කරගෙන යනවා. තොපි පව් කළ එවුන් ඉතින් දුක් විඳපියව්. පූර්ව ජාතියේ කළ කර්ම විපාක තොපි විඳපියව් කියලයි සමහර හාමුදුරුවන් කියන්නේ. මිටියා ගොඩ ගුණරතන හාමුදුරුවොත් කියන් නේ එහෙමයි. ඉස්සර ආත්මයේදී කළ පව්වලට දැන් තොපි ඔය විධියට දුක් විඳ පියව් කියලයි කියන්නේ.

**ගරු ෂෙල්ටන් ජයසිංහ**
*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)

කව්ද ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரி. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මීටියාගොඩ ගුණරතන නායක සවාමීන් වහන්සේ. මේකද ප්‍රජාතන්ත්‍රවාදය? තමුන්නාන්සේලා මේ විධියටද මේ රට ආණ්ඩු කරන්නට කල්පනා කරගෙන ඉන්නේ? මේ තත්ත්වය තව දුරටත් තිබෙන්නට ඉඩ දීමට පුළුවන්කමක් නැහැ. ඒ නිසා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආදායම් බදු සහන පනතට අපේ විරුද්ධත්වය පළ කළ යුතුව තිබෙනවා. මේ ආදායම් බදු සහන පනත සම්පූර්ණයෙන්ම ධනපතියන්ට නොයෙක් නොයෙක් විධියේ සහන දෙමින් දුප්පත් ජනතාව තව තවත් දුකට පත් කරවන්නට ඇති වූවක් හැටියට හඳුන්වමින්, මේ විධියේ භයානක වැඩ තව දුරටත් කරගෙන යාමට හැකි වන පරිදි මේ ආණ්ඩුවට වැඩි කාලයක් ජීවත් වීමට ඉඩ නොලැබේවායි ප්‍රාර්ථනා කරමින් අපේ දෙහිඕවිට ගරු මන්ත්‍රීතුමාගේ කථාවට ඉඩ දෙමින් මගේ කථාව අවසන් කරනවා.

අ. භා. 6.20

**ඩී. පී. ආර්. වීරසේකර මයා.** (දෙහිඕවිට)
*(திரு. டீ. பி. ஆர். வீரசேக்கர—தெகியோவிற்ற)*
(Mr. D. P. R. Weerasekera—Dehiowita)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාවේදී ප්‍රථමයෙන්ම ගරු රාජ්‍ය අමතිතුමාට මතක් කරන්නට කැමතියි, දැන් කාටත් හිස රදයක්ව තිබෙන මේ රටින් පිට වී සිටින චිබ් මහත්මයා ගැන මීට පෙර ගරු සභාවේදී ප්‍රශ්න කරමින් මා සඳහන් කළ කාරණය. එදා චිබ් මහත්මයා ගැන මා මේ ගරු සභාවේදී සඳහන් කළ අවස්ථාවේදී කිව්වෙ මොකක්ද? එතකොට ලොකු වර්ණනාවක් කළා, චිබ් මහත්මයා ගැන. එදා අප චෝදනා කිරීම ලොකු වරදකැයි කියා ඒ තරම් උතුම් මහත්මයකු ගැන ඒ විධියට චෝදනා කරන්නට එපාය කිව්වා. පෞද්ගලිකව අපට කිසිම ප්‍රශ්නයක් නැහැ, චිබ් මහත්මයා ගැන. දේශ සංචාරක දෙපාර්තමේන්තුව ගැනත්, දේශ සංචාරක ව්‍යාපාරය ගැනත් එක්තරා ප්‍රමාණයක ලැදියාවක් සෑහෙන තරමකින් අප තුළ තිබෙන නිසයි එදා අවවාදයක් හැටියට කරුණු ඉදිරිපත් කරමින් ප්‍රශ්න කළේ. ඒ වාගේ කෙනකුට මේ වාගේ වැදගත් ව්‍යාපාරයක් භාර දීමෙන් අපේ රටට බලවත් හානියක් සිදු වන්නට පුළුවන් බවයි මා එදා කියා සිටියේ. එහෙත්, එත කොට අපේ රාජ්‍ය කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා නිහඬව සිටියේ නැහැ. එතුමා මා ඉදිරිපත් කළ චෝදනාව පිළිබඳව කාරණා හොයන්නට බලාපොරොත්තු වන වාය කිව්වෙත් නැහැ. හරියටම කාරණා දන්නා කෙනකු හැටියට චිබ් මහත්මයා වෙනුවෙන් මේ ගරු සභාවේ නැඟිට ඔප්පු කරන්නට උත්සාහ කළේ එතුමා වැනි අවංක මහත්මයකු මේ තනතුරට ලබා ගන්නටත් නැහැ කියායි. එතුමා දන්නේ නැත් නම් මම දැන් ඉදිරිපත් කරන්නම්. ඉන්දියාවේ ලොක්සභාවේදී 1966 අගෝස්තු 17 වැනිදා ඒ මහත්මයාගේ ඇතැම් දූෂණ ගැන ප්‍රශ්න කිහිපයක් මතු වුණා. ඉන්දියාවේ "විජිලන්ස් කොමිටි" නමින් ආයතනයක් තිබෙනවා. එය වෙනම ආයතනයක්. එය වෙනම සංවිධානයක්. එයින් ඉතා වැදගත් දෙයක් කෙරෙනවා. නිලධාරීන්ට හෝ මන්ත්‍රීවරුන්ට හෝ විරුද්ධව යම් චෝදනාවක් ඇති වුණොත් ඒ ගැන විභාග කිරීමට ක්‍රියා කරනවා. ඒ මගින් චිබ් මහත්මයා ගැන සොයා බැලුවා. ඒ මහත්මයාට විරුද්ධව වූ චෝදනා ගැන විභාග කළා. ඒ මොකක්දයි ඉදිරිපත් කරන්නම්. හිල්ටන් සහ වෙනත් කොම්පැනි සමග එක්කහුවෙලා ඉන්දියානු ආණ්ඩුවේ මුදල් පාවිච්චි කර හෝටල් සංස්ථා ඇති කරන්නට උත්සාහ කිරීමයි මූලික චෝදනාව. එය පාර්ලිමේන්තුවට නැත්නම් ලොක් සභාවට ඉදිරිපත් කළා. ඒ විභාගය කරගෙන යද්දී—

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Now that that gentleman has gone why does he want to refer to him?

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

ඔන්න ඕක තමයි ප්‍රශ්නය. ඔප්පු කරන්නට අප බලාපොරොත්තු වන්නේ—

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

It is not relevant to the Bill.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

අප කියන දේවල් අහන්නේ නැතිව දේශ සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් වැඩ කටයුතු කළ නිසා තමයි දැන් ඩේවිස් නැමැති ලෝක බැංකු විශේෂඥයා කෙළින්ම කියන්නේ, තමුන්නාන්සේලා ඔය ව්‍යාපාරයෙන් බලාපොරොත්තු වන දේ ඉෂ්ට වන්නේ නැහැ යනුවෙන්. මේව මතක් කරල පෙන්නුම් කරල ඉදිරිපත් කරල දුන්නෙ නැත්නම් මින් ඉදිරියටත් අමාරුවෙ වැටෙන්න ඉඩ තිබෙන නිසයි, මම මේ පරණ කරුණු හෝ පෙන්වා දෙන්ට අදහස් කරන්නෙ. එක්කො ඇමතිතුමා කල්පනා කළා මදි; එසේ නැත්නම් ඇමතිතුමාට උපදෙස් දෙන නිලධාරීන් ඇමතිතුමාව නොමඟ යවා තිබෙනව. මෙතැන තිබෙන්නෙ ඇමතිතුමාගෙ ප්‍රශ්නයක් නොවෙයි. එතුමා නොමඟ ගියාට අපට ප්‍රශ්නයක් නැහැ. අපි ප්‍රාර්ථනා කරනව පුළුවන් තරම් ඉක්මණින් මඟ වැරදිල මේ රජයෙන්ම ඉවත් වෙලා ගියොත් හොඳයි කියා. එහෙත් ඒ එක්කම රටත් නොමඟ යන එකයි ප්‍රශ්නය. නැවතත් ප්‍රශ්නයට බහිමු. ඉතින් චිබ් මහත්මයා පිළිබඳව විභාගය සිදු වුණා. පසුව මොන ක්‍රමයකින් හෝ චිබ් මහත්මයා ලංකාවට පත් වුණා.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I rise to a point of Order. The hon. Member is referring to a foreigner, a gentleman who is not here. A question similar to this was raised and full answers were given in this House. I say that he cannot, except on a substantive Motion, deal with the conduct, character or life of a foreign person.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ සම්බන්ධයෙන් මම කියන්නෙ මෙපමණයි.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

The hon. Member might not refer to what happened in the Lok Sabha.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

I am quoting the proceedings of the Indian Parliament in order to make a point. There is nothing wrong in that.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

It is not fair.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

I am referring to a gentleman who was responsible for the messing up of the tourist industry in Ceylon.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

The hon. Member might refer to what he did here. It is not correct to refer to what happened in India.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

I am trying to prove that the Minister's statement was not false but that he was misled.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

His statement was related not to something he did in India but to something he did here.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වීරසේකර මයා.
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

It related to something I said. He contradicted my statement, proving that I was right.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I can deal with him on that statement on another occasion but not today.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

He might please cut it short.

වීරසේකර මයා.
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

සභාපතිතුමනි, මම කිව්ව දේ වැරදි යයි රාජ්‍ය ඇමතිතුමා එදා කිව්ව. මම දැන් ඔප්පු කරන්නෙ මම එදා කිව්ව දේ හරි බවයි. මේ පත්වීම ලැබුණායින් පසුව ලෝක් සභාවේ ප්‍රශ්නයක් පැන නැගුණ.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I rise to a point of Order again. I say that the hon. Member should not refer to that person. It is not relevant to this Debate.

වීරසේකර මයා.
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

සභාපතිතුමනි, ඔය ප්‍රශ්නය අවශ්‍ය නැහැ. මගේ තර්කය ඔප්පු වෙලා ඉවරයි. මගේ තර්කය ඇමතිතුමාම ඔප්පු කර දී තිබෙනවා. මේ ප්‍රශ්නය ඉදිරියට ගෙන යාමට ඇමතිතුමා ඔය තරම් භය නම් මම කිව්ව දේ හරි බව එයින්ම ඔප්පු වෙනවා. ඒ නිසා ඒ ප්‍රශ්නය ඕනෑ නැහැ.

කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)

It is not a question of his fear. I do not think the hon. Member can discuss, in relation to a public officer, something that happened in another country.

වීරසේකර මයා.
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

ඇමතිතුමා එච්චර අනුකම්පා කරන කෙනෙක් නම් අපේ වලපනේ මන්ත්‍රීතුමාට (පී. බී. එම්. හේරත් මයා.) එහෙම චෝදනා කරන විට ඔය විධියේ උතුම් අදහස් ඇතුව චෝදනා නොකළේ ඇයි?

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

I said that when the man was in the House and not when the man was in the Bahamas.

වීරසේකර මයා.
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

ප්‍රශ්නයක් නැහැ. මගේ තර්කය ඔප්පු වෙලා ඉවරයි. මේ ප්‍රශ්නය මතු කරන විට ඇමතිතුමාට රිකක් රිදෙන බව මම පිළිගන්නවා. කෙසේවෙතත් චිබ් මහත්මයා අපි අත්හරිමු. උන්නැහේ දැන් රටින් පිටවී ගිහින්නෙ. ඇමතිතුමාගේ හිත රිදෙන නිසා මම චිබ් මහත්මයාගේ ප්‍රශ්නය අත හරිනවා.

ගරු ජේ. ආර්. ජයවර්ධන
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

Never mind the reason. The hon. Member should not refer to it.

වීරසේකර මයා.
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

I must give the reason. That is why I am avoiding it. It is not that I shall hurt Chib. It would appear that the Hon. Minister is hurt by the reference to Chib.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් මම අනික් ප්‍රශ්නයට බහිනවා. ලෝක බැංකුවේ වාර්තාව අනුව අපට පෙනී යනවා, සංචාරක ව්‍යාපාරය මගින් මේ රජයේ ඉලක්ක

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසේකර මයා.]

ඉෂ්ට කරගන්ට බැරි බව. මා ඒ ගැන විස්තර කරන්ට යන්නෙ නැහැ. දකුණු කොළඹ ගරු මන්ත්‍රීතුමා (බර්නාඩ් සොයිසා මයා.) විස්තර සහිතව ඒ කාරණා ඉදිරිපත් කළා. කෙසේ වෙතත් මේ රජයත් සංචාරක දෙපාර්තමේන්තුවත් ඉදිරි කාලයේදී කරන්ට යන වැඩ ගැන අපි පරීක්ෂාකාරී වන්ට ඕනෑ.

දැන් සංචාරක ව්‍යාපාර සඳහා බදු සහන දෙන්වයි යන්නෙ. කර්මාන්ත හා වෙනත් ව්‍යාපාරවලින් රටට ලැබෙන විදේශ ධනය අනික් පැත්තෙන් සංචාරක ව්‍යාපාර සඳහා වියදම් කරල නාස්ති කරන්ටයි යන්නෙ. දැනටම ගිය අවුරුද්දේත් මේ අවුරුද්දේත් සංචාරක ව්‍යාපාරවලින් පාඩුයි. බලාපොරොත්තුව නම් විශාල ලාභයක් ලැබෙයි කියලයි. 1972 වන විට මේ ව්‍යාපාර යෙන් විශාල ලාභයක් බලාපොරොත්තුව මේ ව්‍යාපාරය කරගෙන ගියාට ලෝක බැංකු වාර්තාව කෙලින්ම කියනව, ඒ බලාපොරොත්තුව ඉෂ්ට වන්නේ නැහැ කියා. බදු සහන ගැන කල්පනා කරන විට තත්ත්වය මොකක්ද? මේ රජය ලැහැස්තියි ධනපතියන්ට බදු සහන දෙන්න. ගොවිතැන ගැන බලමු. ඉඩම් අක්කර 97,000 ක් පමණ ධනපතියන්ට බෙදා දීල, බැංකුවලින් ණය ලබා ගන්ට පහසුකම් සලසල, ට්‍රැක්ටර් සහ වෙනත් යන්ත්‍රෝප කරණ ගෙන්වා ගන්න විදේශ විනිමය පහසුකම් පවා සලසා දුන්න. ඒ හැර බදු සහනත් දුන්න. මෙතෙක් අපේ රටේ ගොවිතැන් කටයුතු දියුණු කළේ, අපට ආහාර නිෂ්පාදනය කර දුන්නේ අපේ සාමාන්‍ය ගම්බද ගොවි ජනතාවයි. එහෙත් අද එම ගොවියාගේ කුඹුර ගං වතුරකින් නැතිනම් කුනාටුවකින් හානි වී ගියාම ඒ සඳහා වන්දියක්වත් ලබා ගැනීම දුෂ්කරයි; ආධාරයක්වත් ඉල්ලා ගැනීම අමාරුයි. ගොවිතැන් කරන ඉඩකඩම් සෝදාගෙන ගිය විට ඒ සඳහා ආධාරයක් ලබා ගැනීමට අවුරුදු ගණන් මේ රජය පසුපස එල්ලී ගෙන යන්නට ඕනෑ. එහෙත් ධනපතියන ට නම් ඉඩමුත් දීලා විදේශ ධනයත් දීලා ණයත් දීලා බදු සහනත් දෙන්නට ලැස්තියි. පාඩු වුණොත් ඊටත් සහන දෙන්නට ලැස්තියි. ඇයි එහෙම කරන්නේ? ආහාර නිෂ්පාදන කටයුතුවලදී පළමුවෙන්ම ආධාර කළයුත්තේ සාමාන්‍ය ගොවියාටයි. එහෙත් ගොවියා වෙනුවෙන් වියදම් කර තිබෙන ප්‍රමාණයට වඩා දහස් ගුණයක් වැඩියි, ධනපතියාට තැන දීම සඳහා වියදම් කර තිබෙන ප්‍රමාණය. මන්ත්‍රීවරුන්ට පවා අක්කර දහස් ගණන් දෙනවා. අපේ පත්‍රවලින් නොවෙයි. ධනපති පත්‍රවලින්ම ඒ පිළිබඳව කෙළින්ම චෝදනා කර තිබෙනවා. කැලේ තිබෙන ලී ටික කපාගෙන ලක්ෂ ගණන් හරිහම්බ කර ගෙන තිබෙන බව ඒවායින් එළිදරව් කර තිබෙනවා. තත්ත්වය මෙසේ තිබියදී තවත් බදු සහන සහ වෙනත් ආධාර දෙන්නට යනවා.

තවත් ප්‍රශ්නයකට මා රජයේ කල්පනාව යොමු කරවන්නට කැමතියි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තමුන්නාන්සේ මෙම කාරණය ඉදිරිපත් කරන්නට ප්‍රථම යෙන් ඔය ආසනයට පැමිණීම ගැන මා එක අතකින් කනගාටු වෙනවා. ඒ මන්ද, අපේ නියෝජ්‍ය කථානායක ශ්‍රීමත් රසික් ෆරීඩ් මැතිතුමාත් හොඳින් දන්නා ප්‍රශ්න යක් පිළිබඳවයි, මා දැන් කරුණු ඉදිරිපත් කරන්නට යන්නේ. මීට අවුරුද්දකට පමණ පෙරත් මා අදහසක් වශයෙන් මෙය රජයට ඉදිරිපත් කර තිබෙනවා. මා සිතනවා, කෘෂිකම් ඇමතිතුමාත් ඒ ගැන දන්නවා ඇත කියා. පොල්, තේ සහ රබර් වලින් පමණක් නොව වෙනත් වැවිලි වලිනුත් ලංකාවට විදේශ ධනය හරිහම්බ කරන්නට පුළුවන් බව අප දන්නවා. මෙම කාර්ය පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමගත් සාකච්ඡා කළා. එනම් පිටරට පැටවීම සඳහා මල් වර්ග වගා කිරීමයි. අදත් එය ඒතරම් ලොකු කාරණයක් හැටියට රජය කල්පනා කරන්නේ නැහැ. හවායි දූපතේ ඩොලර් කෝටි 4 ක ආදායමක් ලබා ගන්නවා. මල් පමණක් පිටරට යැවීමෙන්. ඒ මුදල රුපියල් වලින් බැලුවොත් 460 ලක්ෂයක් 500 ලක්ෂයක් පමණ වෙනවා. ඕකිඩ් පැල යැවීමෙන් නොවෙයි, ඕකිඩ් මල් යැවීමෙන් තමයි එතරම් මුදලක් ලබා ගන්නේ.

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

හොඳාපුළුලු.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

සිංගප්පූරුව ඉන් බාගයක් විතර ආදායමක් ලබා ගන්නවා. ඕකිඩ් මල් යැවී මෙන්. ලඟදී බටහිර ජර්මනියේ තානාපතිතුමා ලංකාවට ඇවිත් මේ ගැන නොදන්නා අය කීප දෙනෙකු සමග සාකච්ඡා කර තිබෙනවා. උන්නැහේට ඒ උදවිය කියා තිබෙනවා, මල් යවන්නට සූදානම් බව. මටම ලැබී තිබෙනවා ඕඩර් 4 ක්, ලක්ෂ 5 ක මල් එවන්නටය කියා. ඒ, මට විතරයි. මින් එක ඕඩරයක මල්වත් යවන්නට බැහැ; නිෂ්පාදනය මදියි. ඒ අය එක ඕඩරයකට ඉල්ලන අඩුම ප්‍රමාණය රාත්තල් 100 යි. සතියකට දෙවරක් යවන්නට ඕනෑ. ඒ අය ඉල්ලන්නේ ඕකිඩ් මල්. එක වරකට රාත්තල් 100 ක් යවන්න ඕනෑ. ලංකාවේ ඕකිඩ් මල් සේරම එකතු කළත් ඒක කරන්න අමාරුයි. රජයෙන් ආධාර ඇතුව මල් වගා කිරීමේ කටයුතු පටන්ගත්තොත් අවුරුද්දක් යන විට එම ඉල්ලීම ඉටු කරන්නට පුළුවනි. එක් අයකුට ලක්ෂ 5 ක ඕඩර්ස් භාර ගත හැකි වුණොත් ඒ කටයුත්තෙන් ලංකාවට සැහෙන විදේශ ධනයක් ඉතිරි කර ගන්නට පුළුවනි. අර රේස්කෝස් එක ලඟ එහෙම මහ විකාර වැඩ පිළිවෙළක් යොදා තිබෙනවා ආහාර වගාව පිළිබදව. ආහාර වගාවටය කියා බණ්ඩක්කයි බටුයි වවා තිබෙනවා. රේස්කෝස් එක අද්දර වැනි තැන්වල මේ අන්දමට බටුයි බණ්ඩක්කයි වැව්වාට රටේ ආහාර ප්‍රශ්නය විසඳන්නට අමාරුයි. එහෙත් මේ කියන ව්‍යාපාරය ගැන හොඳින් දන්නා ශ්‍රීමත් රසික් fපරීඩ් මැතිතුමා වැනි උදවියගේ සහාය ඇතුව ඒ උදවිය දන්නා සංගම්වලට මල් යැවීම සඳහා කටයුතු යෙදුවොත් අපේ බලාපොරොත්තු දෙකක් ඉටු වෙනවා ඇති. ඉන් එකක් නම් විදේශ ධනය ලැබීමයි. අනික, අපේ නගර අලංකාරව තබා ගැනීමට හැකි වීමයි. එතකොට සංචාරකයන් එහෙම ආවත් ඒ අයට බලන්නට තරම් හොඳ ලොකු මල් උයන් තිබෙනවා. [බාධා කිරීමක්] ජාවාරම් කාරයන් ඊට විරුද්ධයි. ඒ අය ගැනත් මා කියන්නම්. විදේශ සංචාරකයන් මේ වාගේ දෙගුණයක් ආවත් කමක් නැහැ. එහෙත් විදේශිකයින් අපේ රටට ඇවිත් නෙ අපේ මැණික් හොරකම් කරගෙන අපේ විදේශ ධනය සූරාගන්න නම්, අපේ කෙල්ලන් දූෂණය කරන්න නම් අප ඒ වැඩ පිළිවෙළට සම්පූර්ණයෙන්ම විරුද්ධයි. මෙහි වෙනසක් තිබෙනවා. ප්‍රශ්නය පටලවා ගන්න එපා. මං මේ ප්‍රශ්නය කෙරෙහි රජයේ කල්පනාව යොමු කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විදේශවලින් ධනය අද්දවා ගන්න, තේ රබර් පොල් වගා කරනවා වාගේ මෙවැනි වගාවන් ඇති කිරීම ගැනත් ටිකක් කල්පනා කර බැලුවොත් හොඳ බවයි මට කියන්න තිබෙන්නෙ.

අනික් ප්‍රශ්නයත් වැදගත්. දැන් තිබෙන තත්ත්වය අනුව රේගු නිලධාරීන් හට මා කිසිම විධියකින් දොස් කියන්නෙ නැහැ. මගේ කල්පනාවෙ හැටියට වැඩි දෙනකු තමන්ට පැවරී ඇති රාජකාරිය හොඳ හැටි ඉටු කරනවා. නොයෙකුත් විධියේ චෝදනා ඒ අයට විරුද්ධව කරනවා. බොහොම ලෙහෙසියි චෝදනා නගන්න. සංචාරකයින් නොයෙකුත් අන්දමට පරීක්ෂා කළාය, එයින් හිරිහැරයක් වුණාය ආදී වශයෙන් චෝදනා නගනවා. කොයි අන්දමින් චෝදනා නැඟුවත් ලෝකයෙ හැම රටකම රේගු දෙපාර්තමේන්තුව ක්‍රියා කරන්නෙ එක හා සමාන විධියකටයි. ඒ අතරම කියන්න ඕනෑ අපේ රේගු දෙපාර්තමේන්තුවෙ නිලධාරීන් පිට රට යවා පුහුණුවක් ලබා දුන්නොත් හොඳ බව. ඒක කළ යුතු දෙයක්. මා මතු කරන ප්‍රශ්නය මෙම යෝජනාවට අදාළ වෙනවා. මා අදාල වන හැටි පෙන්නා දෙන්නම්. ලංකාවෙ අවුරුද්දකට රුපියල් කෝටි 35 ක පමණ මැණික් නිපදවනවා. ඒ ගැන කිසිම වාදභේදයක් නැහැ. මා හිතන්නෙ නිලධාරීන් තමුන්නාන්සේලාට මේවා ගැන හෙළි කර ඇති. කොහොම වුණත් මැණික්වලින් ඇත්ත වශයෙන්ම විදේශ ධනය වශයෙන් ලංකාවට ලැබෙන්නෙ රුපියල් ලක්ෂ 50 ක් පමණයි. එහෙම නම් ලක්ෂ තුන්දහස් හාරසිය පණහක පමණ ධනයක් හොරෙන් යනවා; අප රටට නොලැබී යනවා. තමුන්නාන්සේලා සංචාරක ව්‍යාපාර ආරම්භ කර පාඩු විදිනවා වෙනුවට මෙම රුපියල් ලක්ෂ 3,500 ලබා ගන්න වැඩ කරන්නෙ නැත්තෙ කුමක් නිසාදැයි මා අහනවා. බොහොම් පහසුයි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[වීරසේකර මයා.]

වෙළඳුන්ට කියන්න, වෙළඳුන්ගෙන් ඉල්ලා සිටින්න, හොරෙන් මැණික් යවන්නට එපා, නියම මාර්ගයෙන් මැණික් යවන්නය කියා. ඒක කරන්න බැරි දෙයක්. මාත් එදා ඒ ගැන තමුන්නාන්සේලාට දොස් නැගුවා. ඒ ප්‍රශ්නය ගැන පරීක්ෂා කර බැලුවාට පසුව මට පෙනී ගියා අද තිබෙන තත්ත්වය අනුව නීත්‍යානුකූලව මටවත් මැණික් ගලක් යවන්න බැරි බව. කොටින්ම, ගරු මුදල් ඇමතිතුමාට මැණික් ගලක් සම්බ වුණොත් එහෙම නැතිනම් වෙන්දේසියකට ගිහින් මැණික් ගලක් මිලදී ගත්තොත් ඒ මැණික් ගල තමුන්නාන්සේට වුණත් හොරෙන් යන කෙනෙකුට දෙන්නයි සිද්ධ වෙන්නෙ. එහෙම නැතිනම් පාඩුවට යවන්න සිද්ධ වෙයි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

මැණික් තිබෙන්නෙ නින්දගම් ඉඩම්වලද ?

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

කොයි නින්දගම්වලද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

සමහර නින්දගම්වල මැණික් තිබෙනවා.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

එහෙම නම් අනික් පනත ගැන අපට කථා කරන්න බැරි ද ?

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

තමුන්නාන්සෙල ඒක ගන්න ඉඩ දෙන්නෙ නැහැනෙ. [බාධා කිරීමක්]

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

නින්දගම් විකුණා හමාර වුණාට පස්සෙ පනත ඉදිරිපත් කරාවි.

**ගරු ජේ. ආර්. ජයවර්ධන**
*(கௌரவ ஜே. ஆர். ஜயவர்தன)*
(The Hon. J. R. Jayewardene)

තමුන්නාන්සෙ වහාම වාඩි වුණොත්, මිනිත්තු පහකින් ගන්නවා.

**වීරසේකර මයා.**
*(திரு. வீரசேக்கர)*
(Mr. Weerasekera)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මැණික් ප්‍රශ්නයට මා බැස්ස පමණයි. ඊට පසුව ඇමෙරිකානු සංචාරක ප්‍රශ්නය ගැනත් කථා කරනවා. මා පෙන්නා දුන්නෙ මැණික් ව්‍යාපාරයෙ අද පවතින තත්ත්වය ගැනයි. [බාධා කිරීමක්] විශේෂයෙන්ම මෙහිදී මට කියන්න තිබෙන්නෙ අද තිබෙන තත්ත්වය අනුව සංචාරකයින්ගේ පැමිණීම වැඩි වෙන්න වැඩි වෙන්න මැණික් ජාවාරමත් වැඩි වන බවයි. මැණික් වැඩි හරියක් පිටරට ඇදී යන්නේ සංචාරකයන්ගේ මාර්ගයෙනුයි. ඒ බව රේගු දෙපාර්තමේන්තුවත් ගරු මුදල් ඇමතිතුමාත් දන්නවා. මේ ප්‍රශ්නය ගැන කිසියම් ක්‍රියා මාර්ගයක් නොයෙදා සංචාරකයන් වැඩි කර ගැනීමෙන් මැණික් ජාවාරම වැඩි වෙනවා මිස රජයට එයින් ලාභයක් ලැබෙන්නේ නැහැ. කළුකඩ ජාවාරම් ක්‍රමය නිසා, කොපමණ සංචාරකයන් මේ රටට ආවත් මැණික්වලින් මේ රටට මුදල් ලැබෙන්නේ නැහැ. දැනට සිදු වන්නේත්, ඉදිරියට සිදු විය හැක්කේත්, ඒකමයි. "Tourist agencies, travel agencies" නමින් සංවිධාන තිබෙනවා. ඒ සංවිධාන සංචාරකයන් මෙහි ගෙන්වීම සඳහා ඒ අයගෙන් මුදල් ලබාගෙන ඒවා බැංකුවල තැන්පත් කොට පසුව මේ රටේ රුපියල්වලින් වියදම් කරවනවා. අර සංවිධානවල "එකවුන්ට්ස්" තර වෙනවා. මේ සිදුරු වැසීමේ වැඩ පිළිවෙළක් අනුගමනය කරන්නෙ නැතිව සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නට බැහැ. ඒ ව්‍යාපාරවලින් වාසි ලබන්නට බැහැ. එංගලන්තයෙන් හෝ ඇමෙරිකාවෙන් සංචාරකයන් මෙහි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

එන්නේ හිල්ටන් හෝටලයේ නැවතී "බිස්වේක්" කන්නට නොවන බව අප මතක තබා ගන්නට ඕනෑ. ඒ අය මෙහි එන්නේ තමන්ට පුරුදු ක්‍රමයෙන් ඉවත් වී දවස් කීපයක් ගත කරන්නටයි.

මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු කාරණයක් තිබෙනවා. දැන් ඇමෙරිකාව නව සංචාරක ප්‍රතිපත්තියක් අනුගමනය කරගෙන යනවා. ඇමෙරිකාවෙන් පිට වන සංචාරකයන්ගෙන් විශේෂ බද්දක් අය කරනට ඇමෙරිකානු ආණ්ඩුව කට යුතු සලස්වා තිබෙනවා. මෙහි අදහස මොකද? විදේශ රටවලට ගොස් තම රටේ මුදල් වියදම් කිරීමෙන් ඇමෙරිකානුවන් සෑහෙන දුරට වළක්වා ගැනීම මෙහි අදහසයි. ඇමෙරිකානුවන් මෙහි එතැයි අප බලාපොරොත්තු වුණත් ඔවුන්ට මෙහි එන්නට එපා යයි ඒ රට ඒ බද්දේ මුවාවෙන් ස්වකීය වැසියන්ට කියනවා. හැබැයි, ආසියාවට එන සංචාරකයන්ගෙනුයි, මේ බද්ද අය කරන්නේ. "තමුන්නාන්සේලා කරුණා කර යුරෝපයට ගොස් මුදල් වියදම් කරන්න. හබැයි, ආසියාවට ගොස් මුදල් වියදම් කරන්න එපා" යන ආකාරයේ හැඟීමක් ඇති කරවන ඒ බද්ද නිසා ඇමෙරිකානු සංචාරකයන්ගේ පැමිණීම සීමා වුවහොත් මේ බලාපොරොත්තු වන ලාභය උපයා ගන්නේ කොහොමද? ඇත්තෙන්ම තත්ත්වය මෙසේ වන හෙයින් මේ වියදම් කරන විශාල මුදලට සරිලන ලාභයක් නො ලැබෙන බව පිළි ගන්නට සිදු වෙනවා.

පසුගිය දවස්වල සංචාරක කටයුතු සඳහා යයි කියමින් මෝටර් රථ 80ක් ගෙන්වන්නට යෙදුණා. අද මේ මෝටර් රථ පාවිච්චි කරන්නේ මොන කාර්යයන් සඳහා ද? පසුගියදා ගල්කිස්සේ හෝටලයේ ඇති වුණු සේවක වැඩ වර්ජනයේදී එදිරිවීර මහතා මැරවරයන් ගෙන්වා ගත්තේ මේ කාර් වලිනුයි. ඔන්න, සංචාරක ව්‍යාපාරය සඳහා දෙන ලද කාර් පාවිච්චි වන හැටි! ගාලු පාරේ එහාට මෙහාට ධාවනය වන මේ කාර් සංචාරකයන් ගමන් කරනවා ද? මේ මෝටර් රථ ගෙන්වීමේ අදහස හොඳ විය හැකියි. අදහස හොඳ වුවත්, වැරදි උපදෙස් ලබාගෙන ඒ අනුව ක්‍රියා කර තිබෙන බව පෙනී යනවා.

මැණික් ජාවාරම සහ ආහාර වගාව ගැන දීර්ඝ වශයෙන් කථා කරන්නට ගිය හොත් කාලය ගත වෙනවා. එසේ හෙයින් කථාව කෙටි කිරීමේ බලාපොරොත්තුවෙන් මා මේ ඉල්ලීම කරනවා. කරුණා කර මැණික් ජාවාරම මැඩීමට ක්‍රියා මාර්ගයක් යොදන්න. වෙළඳුන්ට බෝනස් දෙන ක්‍රමයක් ඇති කළ හොත් මැණික් වෙළෙඳාමේදී ආණ්ඩුවට ආධාර දෙන්නට වෙළඳුන් ලෑස්තිව සිටිනවා. ඉන්දියාව දැන් සියයට 65ක බෝනස් එකක් වෙළඳුන්ට දෙනවා. ඉන්දියාවට මැණික් නැහැ. ඉන්දියාවට මැණික් යන්නේ ලංකාවෙනුයි. කුමන මාර්ගයකින් හෝ ලංකාවේ මැණික් ඉන්දියාවට යනවා. ඒ විධියට ඉන්දියාවට ලැබෙන මැණික් යළිත් වරක් පිටරට යවා විදේශ විනිමය උපයා ගැනීම පිණිස ඉන්දියාව වෙළඳුන් සමඟ සහයෝගයෙන් කට යුතු කරනවා ලංකාණ්ඩුවත් වෙළඳුන්ට බෝනස් දීමේ ක්‍රමයක් සකස් කරගෙන මැණික් ව්‍යාපාරය සම්බන්ධයෙන් ආදරයක් ඇතිව ක්‍රියා කළ හොත්, ඒ සඳහා, අපේ සහයෝගය ලැබෙනවා ඇති. කාරණා දෙකක් ගැන පමණයි, මා ඉල්ලීම් කරන්නේ. මැණික් ජාවාරම් නැති වී රටට ආදායමක් ලැබෙන පරිද්දෙන් ඒ ව්‍යාපාරය සකස් කර ගන්න. ගරු කෘෂිකර්ම ඇමතිතුමා අතිරේක වගාවන් ගැන සැලකිල්ලක් දක්වා ස්වකීය නිලධාරීන් යොදවා ඒ සම්බන්ධයෙන් ක්‍රමානුකූල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරවන්න.

අ. භා. 6.43

**ගරු වන්නිනායක**
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)

I have just ten minutes. I do not propose to make a long speech in reply. I do not want to weary the House tomorrow as well in connection with this Bill. I propose to refer this Bill to a Standing Committee, and any outstanding points will be discussed at that stage.

The main criticism against this Bill was that we were allowing some concessions to the private sector which hon. Members opposite considered too generous.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු වන්නිනායක]

Of course there is a fundamental difference. I have referred to this earlier. We are a Government that believe in a mixed economy. We believe that certain sectors of the economy must be under public control, and that certain other sectors of the economy must be in the hands of the private sector, under the guidance and control of the private sector.

Now, of course, the Opposition comprises various elements ; some Members believe in the private sector, some do not believe in the private sector, and some believe that everything must belong to the State. They are pretending to be united on the political front, but their differences are legion. There are people who believe that everything in this country excepting personal belongings like shoes, spectacles, wristlet watches and things of that sort, must belong to the State, and that the State must control them and the individuals must use them according to the directives issued by the State. That is one philosophy. There are quite a number of hon. Members on that side of the House who believe in that philosophy and who contribute to it. Naturally, it is not surprising that they criticize our Bill and say that by means of this Bill we are paving the way to giving some concessions to the private sector to engage in development activity in keeping with the political philosophy of this Government. In fact, I am surprised that they said that the concessions given are too generous. I expected them to say : " Why do you give concessions to the private sector at all ? We believe in the public sector. The private sector will never do this development and therefore why do you propose to give concessions to the private sector at all ? "

This Government does not subscribe to that philosophy. There is a fundamental difference between their philosophy and ours. We believe in the private sector, we believe that the private sector has a role to play in the economy of this country. Naturally we are taking certain measures to give certain concessions to them so that they may engage in developmental activity in the fields of industry, agriculture and tourism.

Hon. Members opposite referred to certain abuses. We give certain concessions and there will, perhaps, be a certain measure of abuse. Well, you cannot judge a thing by its abuses. The Government should try, and the Opposition should give us the fullest co-operation, to reduce, if not eliminate, those abuses.

They talked about the special leases and said that this Government has been in power for three years but they have not been able to produce the food. They should remember that the land was given only one year or one and a half years back. Sir, there are certain seasons during which you can clear the land and there are certain seasons during which you can plant the crops, so that if you expect those people who took this land to produce the maximum results in one and a half years, I think you are asking for the impossible. Hon. Members opposite take the period in which the Government has been in power into account and say, " The leases may have been given only one and a half years back ; you have been in power for three years, and you should have given this land to be cultivated as soon as the Government started functioning." Maybe there are abuses. We must examine the position and try to reduce them. We want the co-operation of the Opposition to do that, although they do not contribute to our philosophy of a mixed economy.—[*Interruption*]. Some of them do ; others do not. But I can assure you that if, as expected by the Government, the private sector plays its part, the benefits of their activities will accrue not only to those who believe in a mixed economy but also to those who preach only public sector economic activity in this country.

I do not want to take any more time, but there were certain specific questions raised by the hon. Member for Colombo South (Mr. Bernard Soysa). I want to give replies to them

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

so that they will go on record, and if there are any further issues to be tackled we can do so in the Committee stage.

I shall reply to some of the points raised by the hon. Member for Colombo South.

In regard to registered auditors, as I mentioned at the outset, in response to a request made by the hon. Member for Colombo South, provision has been made in the Bill to enable registered auditors who are approved by the commissioner to appear as authorized representatives of taxpayers for any particular purpose as may be specified in the taxpayer's authorization.

The registration for the purpose of the Companies Ordinance is only for carrying out the audit of private companies. The regulation provides that no person who is registered under this regulation shall, unless he is a person who possesses a certificate to practice issued by the Council of the Institute of Chartered Accountants of Ceylon, be eligible to be appointed an auditor of any company other than a private company registered under the Companies Ordinance (Chapter 145).

Thus registered auditors are eligible to perform only limited functions as they do not possess the same qualifications in accountancy as chartered accountants.

The Institute of Chartered Accountants of Ceylon is a recognized body set up by statute and the council is vested with special powers to ensure the maintenance of a proper code of conduct on the part of the members. The term "professional misconduct" is defined exhaustively in the Second Schedule to the Institute of Chartered Accountants Act, No. 23 of 1959, whilst detailed rules as to inquiries by disciplinary committees are contained in the First Scheduled to the Act.

In the case of registered auditors, however, there is no similar body (other than the advisory board whose functions are limited) to exercise control and to ensure the maintenance of a proper code of conduct. It is necessary, therefore, for the commissioner to approve the registered auditors so that in cases of misconduct the appproval can be withdrawn.

The hon. Member for Colombo South also mentioned that the effect of the proposed provisions would be that a registered auditor will have to get the commissioner's approval each time before he appears on behalf of a taxpayer. Let me inform the hon. Member that this is not so. Once a registered auditor is approved by the commissioner, he can appear on behalf of a taxpayer for any particular purpose which the taxpayer may specify in the letter of authority. Once an auditor gets into the approved list what is wanted is the letter of authority from the person on behalf of whom he appears.

In regard to approved savings, the hon. Member stated that there is no reference in the latest administration report of the Inland Revenue Department to the savings relief scheme. I wish to point out that the relevant statistics are given on page B91 of the report. As stated in the report, the amount of savings relief granted during the year under review was Rs. 2,718,788. It is also mentioned in the report that owing to the delay in making the 1965-66 assessments (as the law was passed only in December 1965), this figure does not reflect the full extent of the revenue lost from the savings relief scheme.

The success of the savings relief scheme can be seen from the increase in the investments made after the introduction of the scheme. For the six months ending on 30th September 1965 only Rs. 5.9 million was invested in savings certificates and in government loans, whereas for the twelve months ending on 30th September 1966 Rs. 47.2 million was invested.

It is also the considered view of the administration that the savings relief scheme has induced taxpayers


Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු වන්නිනායක]

to disclose income which otherwise would have been hidden from their returns.

In regard to tax concessions for tourism, the hon. Member for Colombo South has stated that the tax concessions for tourism are far too generous.

Let me point out that the concessions which are being offered are basically the same as what is already available for new industries and agriculture.

**බර්නාඩ් සොයිසා මයා.**
(திரு. பெர்னட் சொய்ஸா)
(Mr. Bernard Soysa)

That is not correct.

**ගරු වන්නිනායක**
(கௌரவ வன்னிநாயக்க)
(The Hon. Wanninayake)

In fact the concessions for agriculture are much more substantial.

It should be borne in mind that hotel undertakings require a very large capital outlay and they will not be in a position to make any profits for several years in view of their very heavy overhead expenditure. These rebates are therefore considered necessary if the Government is to promote tourism.

As requested by the hon. Member for Colombo South, I shall explain why it has become necessary to introduce a new category of provident funds called "regulated provident funds."

Under the existing law provident funds are approved by the commissioner. The following tax consequences flow from approval: (*a*) The contributions made by the employer to the credit of the employees are allowed as a deduction in the hands of the employer. (*b*) Relief is allowed to the employee (calculated at the effective rate) on his contributions to the fund. (*c*) At the time of retirement the employee is taxed on the lump sum receipts other than his own contributions from the provident fund at the effective rate not exceeding 15 per cent.

At present, most of the funds are approved funds except a certain category of funds, namely, funds set up by institutions which are exempt from income tax, such as (*a*) the Central Bank Provident Fund; (*b*) the University Provident Fund; and (*c*) the Tea Propaganda Board Provident Fund.

The trustees of these funds have not sought approval because there is no advantage accruing to them for the reason that the profits arising to institutions like the Central Bank and the universities are exempt from income tax. Therefore, the question of claiming as a deduction the employer's contributions does not arise.

The introduction of this amendment is not for the purpose of taxing the provident funds which would fall within the definition of regulated provident funds, but, rather, for the purpose of ensuring equality of treatment between employers of approved provident funds, on the one hand, and employees of institutions like the Central Bank and the universities, on the other.

I propose moving an amendment at the Committee stage giving the employees of regulated provident funds a certain measure of relief on their contributions made prior to 1st April 1966 as such contributions were hitherto not eligible for relief.

The hon. Member for Colombo South stated that the Bill seeks to increase the rates of wealth tax. This is not so. The rate schedule at the end of the Bill is merely for the purpose of clarifying the rates which were in force since 1965-66.

I also propose to move, at the Committee stage, two amendments. The first is to Clause 5 (1), which seeks to provide for tax exemption for interest paid to any approved foreign agency on borrowings by the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Agricultural and Industrial Credit Corporation, the Development Finance Corporation, the State Mortgage Bank or any commercial bank, provided the borrowing is essential for the economic progress of Ceylon.

The second amendment I propose to move is to Clause 17, which seeks to provide for relief from the tax which is to be levied by Clause 8 on withdrawals from regulated provident funds in respect of employees' contributions made prior to 1st April 1966.

I would like to say something about the gemming industry. If I am not mistaken, the Minister of Industries is taking some action in this regard. I think a Bill has already been prepared.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)
The Bill was passed.

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
That was found ineffective.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)
No fear!

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
I have handed the subject to the Minister of Industries and the Minister of Land.

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)
They will never do anything. The biggest gem merchant is his best friend, a person called Dippitigoda.

ගරු වන්නිනායක
*(கௌரவ வன்னிநாயக்க)*
(The Hon. Wanninayake)
I am glad that I have been able to finish my reply today without having to worry the House tomorrow too. I now move that the Bill be read a Second time.

**ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

**පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදින්, 57 (2) වන ස්ථාවර නියෝගය යටතේ, කාරක සභා නියෝජ්‍ය සභාපතිතුමා විසින් එය "ඒ" ස්ථාවර කාරක සභාවට පවරන ලදී.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*மசோதா, இதன்படி இரண்டாம் முறை மதிப்பிடப் பட்டு, நிலையற் கட்டளை 57 (2) இன்படி நிலையக்குழு "ஏ" க்கு குழுக்களின் உப அக்கிராசனர் அவர்களால் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time, and allocated by* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *to Standing Committee "A" under Standing Order 57 (2).*

## කල් තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**යෝජනාව ඉදිරිපත් කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී:**

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය".—[ගරු සී. පී. ද සිල්වා].

"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக" —[கௌரவ சீ. பீ. டி சில்வா] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப்பெற்றது.

*Motion made, and Question proposed:*

"That the House do now adjourn".—[*The Hon. C. P. de Silva.*]

ආචාර්ය එන්. එම්. පෙරේරා
*(கலாநிதி என். எம். பெரோரா)*
(Dr. N. M. Perera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, තැපැල් දෙපාර්තමේන්තුව සම්බන්ධව කණගාටු දායක සිද්ධියක් ගැන ගරු ඇමතිතුමාට දැනුම් දෙන්නට මා අදහස් කරනවා. අද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කල් තැබීම

[ආචාර්ය එන්. එම්. පෙරේරා]

රත්මලානේ රජ මාවතේ ටෙලිෆෝන් අත්එවැඩියා කිරීමට ගොස් සිටි ප්‍රේමචන්ද්‍ර සහ විල්බට් සිල්වා යන කම්කරුවන් දෙපළ විදුලි සැර වැදීම හේතුකොටගෙන මරණයට පත් වී තිබෙනවා. ඒ අනුව මේ මාසයට මරණ 3 යි. ත්‍රිකුණාමලයේ මීට පෙර මරණයක් ඇති වුණා. අද රත්මලානේ මරණ දෙකත් සමග මරණ 3 යි. මේ කම්කරුවන් වැඩ වර්ජනයක යෙදුනෙත් මේ ප්‍රශ්නය උඩ බව ගරු ඇමතිතුමාට මතක ඇති. අනතුරු සම්බන්ධව සැහෙන වන්දියක් ලබා ගැනීම ඒ කම්කරුවන්ගේ එක ඉල්ලීමක්. පොරොන්දුවක් දුන්නට තවමත් ඒ ගැන ක්‍රියා කර තිබෙනවාය කියා මා සිතන්නෙ නැහැ. [බාධා කිරීමක්] කොමිෂමක් පත් කරන විට මිනිස්සු මැරිලා. ඒ නිසා මේ සම්බන්ධව කරන්නට යන්නේ කුමක්ද කියා දැන ගන්නට කැමතියි.

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

වර්ජන නායකයා ඒක දැනගන්නට ඕනැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)

දැන ගන්නෙ කොහොමද? පොරොන්දු උඩයි, වර්ජනය නැවතුනේ. තවම කොමිෂන් සභාවක් පත් කර නැහැ. අපට ලැබී තිබෙන ආරංචිවල හැටියට, භාණ්ඩාගාරයේ මුදල් හිඟ ප්‍රශ්නය උඩ නොයෙක් දේ නවත්වා තිබෙනවා. මේ කණගාටුදායක සිද්ධිය උඩ මරණයට පත් වූ උදවියගෙන් යැපෙන්නන්ට සැහෙන වන්දියක් ලැබෙනවද, කොයි තරම් ඉක්මනට ඒ වන්දිය ලැබෙනවාද කියා මා දැන ගන්නට කැමතියි. ඒ සමගම පුළුවන් තරම් ඉක්මනින් ඒ කොමිෂන් සභාව පත් කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

කල් තැබීම

**සෝමරත්න සෙනරත් මයා.** (අම්පාරෙයි)
*(திரு. சோமரத்ன செனரத்—அம்பாறை)*
(Mr. Somaratne Senarath—Amparai)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඉඩම් ඇමතිතුමාගෙනුයි, මා මේ ප්‍රශ්නය අහන්නෙ. දීඝවාපි චෛත්‍ය රාජයාට 1964 පෙබරවාරි 16 වැනිදා සිට විදුලි එළිය නොමිලයේ සැපයුවා. දීඝවාපි චෛත්‍ය සංවර්ධන කොමිටියේ සභාපතිත් ගරු ඇමතිතුමාමයි. ඒ නිසා මෙහි විශේෂ වැදගත්කමක් තිබෙනවා. දීඝවාපි චෛත්‍ය රාජයාට විදුලි එළිය නොදී හදිසියේ එය කපා හැරීමට හේතු මොනවාද කියා මා දැන ගන්නට කැමතියි. ඒ සම්බන්ධයෙන් විරුද්ධ පාර්ශ්වයේ නායිකාව වෙත ලියුමකුත් එවා තිබෙනවා; ටෙලිග්‍රෑම් එකකුත් එවා තිබෙනවා. මටත් ඔය පිළිබඳ කරුණු, විහාරස්ථානයේ ස්වාමීන් වහන්සේත්, දායකසත් දන්වා තිබෙනවා. විරුද්ධ පාර්ශ්වයේ නායිකාවට එවා තිබෙන ලිපිය මා මේ ගරු සභාවේ කියවන්නට කැමතියි.

"දීඝවාපි රජමහා විහාරය,
සම්මන්තොර,
කල්මුන,
1968 පෙබරවාරි 14 දින.

දීඝවාපි විහාරස්ථානයේ කපා හැරිය විදුලි බලය ගැනයි.

ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතනියනි,

දීඝවාපි රජ මහා විහාරස්ථානය අප ගෞතම බුදු රජාණන් වහන්සේගේ පාදස්පර්ශයෙන් පවිත්‍ර වූ සිද්ධස්ථානයකි. චෛත්‍ය රාජයාණන් වන්දනමාන කර ගැනීමට නානා දිශාවෙන් පැමිණෙන මහජනයාගේ මුදුන් මල් කඩක් වැනි මෙම විහාරස්ථානයට 1964 පෙබරවාරි 16 දින රජයේ සහාය ඇතිව ගල්ඔය සංවර්ධන මණ්ඩලයෙන් විදුලිබලය සපයන ලදී. චෛත්‍යය වන්දනාමාන කර ගැනීමට පැමිණෙන මහජනයාටත් සිල් සමාදන් වී බණ භාවනා කරන පින්වතුන්ටත් මේ විදුලි බලයෙන් මහත් ප්‍රයෝජනයක් විය.

දීඝවාපි චෛත්‍යයට 1964 වර්ෂයේදී රජයෙන් සපයන ලද විදුලිබලය 1968 ජනවාරි 8 දින විදුලි බල ඉංජිනේරු තැන විසින් කපා හරින ලදී. එමනිසා උතුම් රජයට මා මතක් කර සිටින්නේ කැඩූ වීදි ලාම්පු සහ චෛත්‍යය වටා තිබුනු විදුලිය මුදලක් නොමැතිව රජය මගින් දා දෙන ලෙසය"

දීඝවාපි චෛත්‍ය සංවර්ධන මණ්ඩලයේ ඉල්ලීම පිට, 1964 සිට මේ දක්වා දීඝවාපී චෛත්‍යයට රජයෙන් විදුලිය සැපයුවේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

මුදලක් අයකරගෙන නොවෙයි. දීඝවාපි චෛත්‍ය සංවර්ධන මණ්ඩලයේ සභාපතිත්වය දරන්නේත් ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල කටයුතු පිළිබඳ ඇමතිතුමායි. එම නිසා, දීඝවාපි චෛත්‍යයට සැපයූ විදුලිය හදිසියේ කපා හැරියේ මන්දැයි මා දැනගන්නට කැමැතියි.

අ. භා. 7.04

**එල්. සී. ද සිල්වා මයා.**
*(திரு. எல். சீ. டி சில்வா)*
(Mr. L. C. de Silva)

නියෝජ්‍ය සභාපතිතුමනි, පළාත් පාලන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්තුමා වෙත ප්‍රශ්න දෙකක් ඉදිරිපත් කරන්නට මා බලාපොරොත්තු වෙනවා. එයින් පළමුවැන්න මෙයයි: ගෙවල් කුලී පාලන සමීක්ෂණ මණ්ඩලය රැස්වීම් පවත්වන දිනයන්හි, එම රැස්වීම පැවැත්වෙන්නේ විනාඩි 20 ක පමණ කාලයක් විතරයි. එම මණ්ඩලය සමන්විත වී තිබෙන්නේ නීතිඥයන්ගෙන්. ඒ මණ්ඩලය ඉදිරිපිටට කැඳවනු ලබන උදවිය ඒ නීතිඥයන්ගේ සේවය ලබා ගන්නවා. විනාඩි 20 ක සුළු කාලයකින් කරුණු සියල්ලම විසඳා අවසන් කරන්නට බැරි නිසා රැස්වීම තවත් දිනකට කල් යනවා. එම නිසා, ඒ මණ්ඩලයේ සේවය ලබා ගන්නට පැමිණෙන උදවියට තමන්ගේ කටයුත්ත වෙනුවෙන් දවස් කීපයක් නීතිඥ ගාස්තු ගෙවන්නට සිදු වෙනවා. මා හිතන හැටියට, ඒ මණ්ඩලයේ නීතිඥ මහතකුට රුපියල් 50 ක් බැගින් රජයෙන් ගෙවනවා. එම නිසා, මේ ගෙවල් කුලී පාලන සමීක්ෂණ මණ්ඩලයේ රැස්වීම් සඳහා දිනකට දැනට වඩා කාලයක් මිඩංගු කරවන සේ වැඩ පිළිවෙළක් යොදන ලෙස මා ඉල්ලා සිටිනවා.

දෙවැනි කාරණය මෙයයි: අම්බලන්ගොඩ නගර සභාවේ ඡන්ද කොට්ඨාශ සංශෝධනය කිරීම සඳහා යැයි කමිටුවක් පත් කළා. අම්බලන්ගොඩ නගර සභාවේ ඡන්ද කොට්ඨාශ සංශෝධනය කිරීමටය



කිවත්, එම කමිටුව පත් කිරීමෙන් බලාපොරොත්තු වූයේ වතුගෙදර සුළු නගර සභාවේ දියුණුම ප්‍රදේශය අම්බලන්ගොඩ නගර සභාවට ඈඳා ගැනීමට බවයි, දැන් නම් අපට පෙනී යන්නේ. මේ කමිටුව පත් කිරීම සම්බන්ධයෙන් වතුගෙදර ප්‍රදේශයේ සාමාන්‍ය මහජනතාවට සැහෙන දැනුම් දීමක් කළෙත් නැහැ. එම නිසා, වතුගෙදර පදිංචි ධනපතියන් කීප දෙනකු පමණක් මේ කමිටුව ඉදිරියට ගොස් සාක්ෂි දී තිබෙනවා. වතුගෙදර සුළු නගර සභාවේ සභාපති හැටියට මා විසින් ගරු පළාත් පාලන ඇමතිතුමා වෙත ලිපියක් යවා තිබෙනවා, මේ සම්බන්ධයෙන් ඒ පළාත්වාසීන් දක්වන විරුද්ධත්වය පැහැදිලි කරමින්. වතුගෙදර සුළු නගර සභාවේ අංක 2 දරන කොට්ඨාශය නියෝජනය කරන්නේ එක්සත් ජාතික පක්ෂයේ සභිකයෙක්. එයින් කොටසක් අම්බලන්ගොඩ නගර සභාවට ඈඳා ගැනීම ගැන ඔහුත් විරුද්ධයි. එම නිසා, අම්බලන්ගොඩ නගර සභාවට වතුගෙදර සුළු නගර සභාවෙන් යම් කොටසක් ඈඳා ගැනීමේ බලාපොරොත්තුවක් තිබෙනවා නම්, අම්බලන්ගොඩ හා වතුගෙදර යන පළාත් පාලන ආයතන දෙකේම කොට්ඨාශ සංශෝධනය කිරීම සඳහා එකම කමිටුවක් පත් කොට, සාධාරණව ප්‍රශ්නය විසඳන ලෙස මා ඉල්ලා සිටිනවා.

අ. භා. 7.06

**ආර්. ජේ. ජී. ද මැල් මයා.** (දෙවිනුවර)
*(திரு. ஆர். ஜே. ஜீ. டி மெல்—தெவிநுவர)*
(Mr. R. J. G. de Mel—Devinuwara)

නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ ධීවර කාර්මිකයන්ට දැන් මුහුණ පාන්නට සිදු වී ඇති විශාල දුෂ්කරතා රාශියක් ගැන වැඩ බලන කර්මාන්ත හා ධීවර ඇමතිතුමාගේ කාරුණික අවධානය මේ අවස්ථාවේදී යොමු කරවන්නට මා බලාපොරොත්තු වෙනවා. දැනට ධීවර සංස්ථාව අදක්ෂ හා අදූරදර්ශී ලෙස ගෙන යන ධීවර ආම්පන්න බෙදා හැරීමේ ව්‍යාපාරය නිසා, ධීවර කාර්මිකයන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## කල් තැබීම

[ද මැල් මයා.]

ට අවශ්‍ය ආම්පන්න ලබා ගැනීම ඉතා අමාරු කටයුත්තක් බවට පත් වී තිබෙන බව මුලින්ම මතක් කරන්න කැමැතියි. "තංගුස්" නමැති ආම්පන්නය ධීවර කාර්මිකයන්ට ඉතාමත් අවශ්‍ය බව තමුන්නාන්සේ දන්නවා. අද තංගුස් ලබා ගැනීම ඉතාමත් අමාරු තත්ත්වයකට පත් වී තිබෙනවා. අංක 30 සිට 80 දක්වා වූ තංගුස් තමයි, මේ රටේ ධීවර කාර්මිකයන් සියයට 90ක් පමණ පාවිච්චි කරන්නේ. එහෙත් අද ධීවර සංස්ථාව බෙදා හරින්නේ අනෙක් අනෙක් තංගුස් වර්ගයි. ධීවර සංස්ථාව මඟින් බෙදා හරින අංක 10, 15 හා 20 දරන තංගුස් නොවෙයි, අද මේ රටේ සුළු ධීවර කාර්මිකයන්ට ඉතාමත් අවශ්‍ය වී තිබෙන්නේ අංක 30 සිට 80 දක්වා තංගුසුයි. සමහර විට ධීවර සංස්ථාව ඒ බව දන්නෙ නැතුවා වන්නට පුළුවනි. ධීවර සංස්ථාවෙන් තංගුස් ලබා ගන්නට බැරි වුණත් කළුකඩයේ ඒවා ඕනෑ තරම් තිබෙනවා. මාතර හා හම්බන්තොට ධීවර සංස්ථාවලින්, අංක 30 සිට 80 දක්වා වූ තංගුස් යාරයක් වත් ලබා ගන්නට බැහැ. ධීවර සංස්ථාවේත් කළුකඩයේත් තංගුස් මිල ගැනත් තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්නට ඕනෑ. සංස්ථාවේ තංගුස් යාරයක් ශත දෙකහමාරයි, කළුකඩයේ එම යාරයක් ශත 25 යි. 10 ගුණයකින් වැඩියි. යාර දහක් වුවමනා කරන දුප්පත් ධීවර කාර්මිකයකු ඒවා මිල දී ගන්නේ කොහොමද ?

ධීවර කාර්මිකයින්ට, සියයට 90ක් පමණ වුවමනා කරන්නේ අංක 14 හා 18 දරන බිලිකටුයි. එහෙත් ධීවර සංස්ථාව විසින් ගෙන්වන්නේ වෙනත් ප්‍රමාණයක බිලී කටු පමණයි. තංගුස් මෙන්ම බිලීකටුත් සංස්ථාවෙන් ලබා ගන්නට බැරි වුවත් කළුකඩයේ ඕනෑ තරම් තිබෙනවා. සංස්ථාවේ බිලීකටු පැකැට් එකක මිළ රු. 1 යි; කළුකඩයේ රු. 3 යි. මේ කාරණයත් තමුන්නාන්සේගේ සැලකිල්ලට භාජන වන්නට ඕනෑ.



අනෙක් ප්‍රශ්නය ධීවර ආම්පන්න බෙදා හැරීමේ ව්‍යාපාරයයි. ධීවර ආම්පන්න ගැනීම සඳහා ධීවර කාර්මිකයින් සලාක කාඩ් පතක් ලබාගත යුතුයි. මාතර දිස්ත්‍රික්කයේ ධීවර කාර්මිකයින් එය ලබා ගැනීමට හම්බන්තොටට යා යුතුව තිබෙනවා. එම නිසා ධීවර සංස්ථාවේ මාතර ශාඛාවෙන් එම ආම්පන්න කාඩ් පත් බෙදා හැරීමට කටයුතු සලස්වන ලෙස මා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මාතර දිස්ත්‍රික්කයේ ධීවර සංස්ථාවේ කාර්යාලය වැලිගමට මාරු කරන්නට යන බවට ආරංචියක් අපට ලැබී තිබෙනවා. දෙවිනුවර, නිල්වැල්ල, ආදී ප්‍රදේශවල මධ්‍යස්ථානය මාතර මිස වැලිගම නොවෙයි. එම නිසා මාතර කාර්යාලය වැලිගමට ගෙන යතොත් එය හරියටම මීගමුව, ජාඇල වැනි මධ්‍යස්ථානයක පිහිටි කාර්යාලයක් එගොඩ උයන හෝ කොරළවැල්ලට හෝ ගෙන යාම වැනියි. වැලිගම තිබෙන්නේ කාඩ් පත් 40 යි, බෝට්ටු 40 යි. එහෙත් දෙවිනුවර, මාතර, ආදී ස්ථානවල කාඩ් පත් හා බෝට්ටු 400 ක් පමණ තිබෙනවා. එම නිසා තමුන්නාන්සේ 40 ගැන සලකනවාද, එසේ නැත්නම් 400 ගැන සලකනවාද යන වග මා දැන ගන්නට කැමතියි. මාතර දිස්ත්‍රික්කයේ නියම මධ්‍යස්ථානය මාතර ම නිසා, එහි තිබෙන කාර්යාලය වැලිගමට හෝ වෙනත් තැනකට හෝ ගෙන යන්නට එපායයි මා ඉල්ලා සිටිනවා.

නයිලෝන් දැල් පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් පත් කරන ලද කොමිසම දෙවිනුවර, ගන්දර, නිල්වැල්ල, ආදී ප්‍රදේශවලටත් එන බව අපට දැන්වූ නමුත් එය ඒ ප්‍රදේශවලට ඇවිත් නැහැ. එම නිසා, වහාම ඒ කොමිසම එකී පළාත් වලටත් එවන මෙන් මා ඉතා කරුණාවෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින අතරම, එම කොමිසමේ වාර්තාව හැකි ඉක්මනින් සලකා බලා මේ උග්‍ර ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන ලෙසත් මා මතක් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ඊළඟට, අපේ ප්‍රදේශවල ධීවර බෝට්ටු ආපසු ඇල්ලීම ගැන වචනයක් කියන්නට තිබෙනවා. [බාධා කිරීමක්] යාපනේ බෝට්ටු අල්ලන්නේ නැහැ. එහේ "ස්මග්ලිං" ජාවාරම තිබෙන නිසා ඒවා අල්ලන්නේ නැහැ.

**ගරු ෂෙල්ටන් ජයසිංහ මයා.**
*(கௌரவ ஷெல்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)

ඔන්න, මෙච්චර වේලා හොඳට කතා කරගෙන ඇවිත් පිලි පනිනවා.

**ද මැල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)

යාපනයේ "ස්මගල්" ජාවාරම තිබෙනවා නේ, එක වරක් "ස්මගල්" "ට්‍රිප්" එකක් ගියාම බෝට්ටුවේ ගාන ගෙවන්න පුළුවනි. ඊළඟට මා තමුන්නාන්සේගෙන් ඉතාමත් ආදරයෙන් ඉල්ලා සිටිනවා, ගොවි මහත්වරුන්ට සහනයක් දී තිබෙන්නා වාගේම මේ ධීවර කාර්මිකයන්ටත් සහනයක් ලබා දෙන ලෙස.

අ. භා. 7.13

**ගරු මොන්ටේගු ජයවික්‍රම**
*(கௌரவ மொண்டேகு ஜயவிக்ரம)*
(The Hon. Montague Jayewickreme)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු යටියන්තොට මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) ඉදිරිපත් කළ කාරණය ගැන අපි ඉතාමත් කනගාටු වෙනවා. ඒ සිද්ධිය වුණ බව අපි දන්නවා. එය මට අසන්න ලැබුණු අවස්ථාවේදී මා තුළ බලවත් කනගාටුවක් ඇති වුණා. එවැනි සිද්ධියක් ඇතිවීම ගැන අපි කනගාටු වෙනවා. ඒ වගේම මීට කලින් ත්‍රිකුණාමලයේත් එවැනි සිද්ධියක් ඇති වුණා. නමුත් මා යටියන්තොට ගරු මන්ත්‍රීතුමාට මතක් කරන්න කැමතියි ඒ වෘත්තීය සමිති ඉල්ලීම අපි ඉටු කළා නම් මේ අයගේ පවුල්වලට රුපියල් 150 කට වැඩි මුදලක් ලැබෙන්නෙ නැති බව. ඒ මක්නිසාද ? එවැනි ඉල්ලීමක් කළේ මාස 3 කට කලිනුයි. ඒ වෘත්තීය සමිතියේ සභිකයන් ඉල්ලා සිටියේ වැටුප්වලින් සියයට ගණනක් ලබා දෙන ලෙසයි. වැටුප්වලින් එසේ සියයට 25 ක් දුන්නත්, ඒ සියයට 25 රුපියල් 50 ක් වුණා නම් මේ මාස 3 ට ඔවුන්ගේ අවාසනාවන්ත දරු පවුල්වලට ලැබෙන්නේ රුපියල් 150 යි. එහෙම නැත්නම් රුපියල් 300 ත් 250 ත් අතරේ ගණනක් වෙන්න පුළුවනි. නමුත් දැන් රු. 16,000 ත් 20,000 ත් අතර ගණනක් ලැබෙනවා. ඒ හැරෙන විට ඒ මන්ත්‍රීතුමා කියන්න යෙදුනා මෙවැනි ප්‍රශ්න ගැන විසඳුමක් ඇති කිරීමට අපි පොරොන්දුවක් දී තිබෙනවාය කියා. මා මුදල් ඇමතිතුමාට ඒ සම්බන්ධයෙන් ලියවිලි යවා තිබෙනවා, ඒ සඳහා කාරක සභාවක් පත් කරන්නය කියා. මා නැවත වරක් එතුමාට මතක් කරන්නම්. විදුලි සන්දේශ දෙපාර්තමේන්තුවේ පමණක් නොවෙයි, අනිකුත් දෙපාර්තමේන්තුවලත් ඔය විධියේ දේවල් ඇති වෙනවා. ඒ සියල්ල ගැන විසඳුමක් කරන්න කාරක සභාවක් පත් කරන ලෙස මුදල් ඇමතිතුමාට දන්වන්නම්. නමුත් මා විශේෂයෙන් මතක් කරන්න අදහස් කළේ, ඒ වෘත්තීය සමිතිවල අදහස් අනුව ක්‍රියා කළා නම් ඒ දරු පරම්පරාවට බොහොම ලොකු පාඩුවක් ඇති වෙන්න ඉඩ තිබුණා. ඒ මන්ද? දැන් තිබෙන ක්‍රමයට රුපියල් 16,000 ක් පමණ ලැබෙනවා.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சி. பி. டி சில்வா)*
(The Hon. C. P. de Silva)

අම්පාරේ ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය මට කලින් දන්වා සිටියේ නැහැ.

**සෙනරත් මයා.**
*(திரு. செனரத்)*
(Mr. Senarath)

ඇයි, ඊයේ දැන්වූවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මට හම්බ වුණේ නැහැ.

**ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
මේ ආණ්ඩුවේ හැටි තමයි ඔය. අපට පියන් වැඩේ කරන්නද කියන්නෙ?

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මට නම් හම්බ වුණේ නැහැ. මගේ ලේකම්වරයා ඉන්නවා. ඔහු අතට දුන්නා නම් මට ලැබෙනවා. සාමාන්‍යයෙන් මට මීට කලින් දුන් දෙයක් නොලැබුණේ නැහැ.

**කාරකසභා නියෝජ්‍ය සභාපතිතුමා**
*(குழுக்களின் உப அக்கிராசனர் அவர்கள்)*
(Mr. Deputy Chairman of Committees)
The hon. Member had given it to the Clerk, it should have been given to the Ministry. It may have been left in the office of the Hon. Leader of the House.

**ගරු සී. පී. ද සිල්වා**
*(கௌரவ சீ. பீ. டி சில்வா)*
(The Hon. C. P. de Silva)
මා දන්නවා දීඝවාපි චෛත්‍යයට මගේ අණක් උඩ විදුලි බලය දුන් බව. ආණ්ඩුවේ වියදමින්ම විදුලි බලය ලබා දුන්නා. දැන් මේ විදුලි බලය සැපයීම ගල්ඔය මණ්ඩලයේ සිට විදුලි බල දෙපාර්තමේන්තුවට මාරු කර තිබෙනවා. ඒ අවස්ථාවේදී යම්කිසි පටලැවිල්ලක් වුණාද කියා මා දන්නේ නැහැ.

**ආර්. ප්‍රේමදාස මයා. (පළාත් පාලන ඇමතිගේ සහ ප්‍රවෘත්ති හා ගුවන් විදුලි ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. ஆர். பிரேமதாச—உள்ளூராட்சி அமைச்சரதும், தகவல், ஒலிபரப்பு அமைச்சரதும் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. R. Premadasa—Parliamentary Secretary to the Minister of Local Government and to the Minister of Information & Broadcasting)
බලපිටියේ ගරු මන්ත්‍රීතුමා (එල්. සී. ද සිල්වා මයා.) විසින් අසන ලද පළමු වැනි ප්‍රශ්නයට මා පසුව පිළිතුරු දෙන්නම්. අම්බලන්ගොඩ, වතුගෙදර කොට්ඨාශ ගැන—[බාධා කිරීමක්] මා දන්නා තරමින් ඒ කාරක සභාව සාක්ෂි විමසා බලා තිබෙනවා. දැන් දවස් කීපයකට පෙරයි ඒ වාර්තාව ලැබුණේ. දැන් ඒ වාර්තාව අපේ සැලකිල්ලට භාජන වී තිබෙනවා. යම් අඩුපාඩු කමක් සිදුවී තිබෙනවා නම්, ඒ විමසීම් හරියට කර නැත් නම්, ඒ ගැන ක්‍රියා කරන්නට බලාපොරොත්තු වෙනවා.

**අචාර්ය එන්. එම්. පෙරේරා**
*(கலாநிதி என். எம். பெரேரா)*
(Dr. N. M. Perera)
වතුගෙදර සභාපතිතුමාගෙන් අසන්නෙ නැත්තෙ මොකද?

**ප්‍රේමදාස මයා.**
*(திரு. பிரேமதாச)*
(Mr. Premadasa)
වතුගෙදර සභාපතිතුමා සාක්ෂි දී තිබෙනවා. සාක්ෂි දී තිබෙනවා පමණක් නොවෙයි ප්‍රසිද්ධ රැස්වීමකුත් පවත්වා තිබෙනවා.

**ගරු ෂෙල්ටන් ජයසිංහ**
*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)
දෙවිනුවර ගරු මන්ත්‍රීතුමා (ද මෙල් මයා.) ධීවර කාර්මිකයන් ගැන ප්‍රශ්න කීපයක් අසා තිබෙනවා. දැල්, ආම්පන්න, බිලී කටු ලබා ගැනීමේ අවහිරයක් තිබෙන්නේ ඒවා ගෙන්වන ප්‍රමාණය අඩු කිරීම නිසා නොවෙයි. මීට පෙර තිබුණු රජයකින් නියෝගයක් කර තිබුණා මේ දැල්, ආම්පන්න හා බිලී කටු සංස්ථාවෙන් ලබා දිය යුත්තේ බලපත්‍ර හිමියන්ට පමණක්ය කියා. තෙප්පමක, ඔරුවක නැත්නම් බෝට්ටුවක බලපත්‍රයක් තිබෙන අයට පමණයි මේවා සංස්ථාවෙන් ගන්නට පුළුවන් කම තිබුණේ. ඒ නියෝගය අනුව සාමාන්‍යයෙන් තෙප්පමක දෙදෙනකු ගියත් බලපත්‍රය හිමි නැතැත්තාට පමණයි ඒ ද්‍රව්‍ය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලබා ගන්නට පුළුවන්කම තිබුණේ. අනෙක් තැනැත්තාට ඒ ද්‍රව්‍ය ගන්නට බැහැ. ඒවාගේම ඔරුවක තුන් හතර දෙනෙකු ගියත් ඔරුවේ බල පත්‍රය හිමි තැනැත්තාට පමණයි ඒ බඩු ගන්නට අවස්ථාව තිබුණෙ. අනිත් අයට ඒ බඩු ගන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒවාගේම බෝට්ටුවක වුණත් හතර දෙනෙකු යනවාය කියමු. බෝට්ටුවේ බල පත්‍රය හිමි තැනැත්තාට පමණයි ඒ බඩු ගන්නට පුළුවන්කම තිබුණෙ. අනිත් තිදෙනාට ඒ බඩු ගන්නට පුළුවන්කමක් තිබුණේ නැහැ. මේ කාරණය පිළිබඳව දැනට අවුරුදු දෙකකට පමණ කලින් පැමිණිල්ලක් ලැබුණු අවස්ථේදී මා එක්තරා නියමයක් කළා. තමන් ධීවර කාර්මිකයකුය කියා ප්‍රදේශයේ ආදායම් පාලක නිලධාරි මහත්මයාගෙන් ලිපියක් අරගෙන එන සෑම කෙනෙකුටම සංස්ථාවෙන් මේ බඩු ගන්නට බල පත්‍රයක් නිකුත් කරන්නටය කියා මා නියම කර තිබෙනවා. තමුන්නාන්සේ නියෝජනය කරන ප්‍රදේශවල ධීවර කාර්මිකයන්ටත් දැන් ඒ ආකාරයට බල පත්‍ර දී ගෙන යනවා. මේ ක්‍රමය අනුව සෑම ධීවර කාර්මිකයකුටම ඒ බඩු ගන්නට බල පත්‍රයක් ලබා ගන්නට පුළුවනි.

**ද මෙල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
කාගෙන්ද ලියුමක් වුවමනා කරන්නෙ?

**ගරු ෂෙල්ටන් ජයසිංහ**
*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)
ආදායම් පාලක නිලධාරි මහත්මයාගෙන්.

**ද මෙල් මයා.**
*(திரு. டி மெல்)*
(Mr. de Mel)
ධීවර පරීක්ෂක මහත්මයාටත් මේ ගැන චක්‍ර ලේඛයකින් දැනුම් දුන්නොත් හොඳයි.

**ගරු ෂෙල්ටන් ජයසිංහ**
*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)*
(The Hon. Shelton Jayasinghe)
දැනුම් දී දැනට ක්‍රියා කරගෙනත් යනවා. තමුන්නාසේගේ ප්‍රදේශයේත් ඒ විධියට කටයුතු කරගෙන යනවා.



තවත් ප්‍රශ්නයක් තිබෙනවා. නයිලෝන් දැල් පාවිච්චිය පිළිබඳව පරීක්ෂණයක් ඇති කරනවාය කියා මා පොරොන්දු වුණා. හලාවත, මීගමුව ප්‍රදේශයේ දැන් ඒ විධියේ පරීක්ෂණයක් කරගෙන යනවා. මේ කාරණා ගැන ඕනෑම කෙනෙකුට පරීක්ෂණයක් කරන්නට බැහැ. මේ කාරණා ගැන අවබෝධයක් තිබෙන උදවියම ඒ පරීක්ෂණ පැවැත්වීම සඳහා යවන්නට ඕනෑ. ධීවරයින්ගෙන් නොයෙකුත් කරුණු ගැන ප්‍රශ්න කරන්නට තිබෙනවා. සාමාන්‍යයෙන් අපේ ධීවරයින් වැඩි දෙනා උගත් අය නොවෙයි. මේ කරුණු ගැන විභාග කරන්නට ගියාම ප්‍රශ්නය තුමක්ද කියා ඔවුන්ට පැහැදිලිව කරුණු ඉදිරිපත් කරන්නට බැහැ. ප්‍රශ්න හරියාකාරව ඉදිරිපත් නොකළොත් නියම පරීක්ෂණයක් කරන්නට බැහැ. මේ තත්ත්වය නිසා තමුන්නාන්සේගේ ප්‍රදේශයේ ඒ පරීක්ෂණ පැවැත්වීමේ සුළු ප්‍රමාදයක් තිබෙනවා. නමුත් යථා කාලයේදී තමුන්නාන්සේගේ ප්‍රදේශයේත් ඒ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරනවා.

තවත් කාරණයක් ගැන මට විශේෂයෙන්ම මතක් කළයුතු දෙයක් තිබෙනවා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් (ආචාර්ය එන්. එම්. පෙරේරා) මේ අවස්ථාවේදී සිටීම ගැන මා සතුටු වෙනවා. මේ බෝට්ටු ඇල්ලීම ගැන ප්‍රශ්නයක් තිබෙනවා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමා මුදල් ඇමති හැටියට සිටි සුළු කාලය තුළ එක්තරා නියමයක් කර තිබුණා. රජයෙන් අරගෙන ආපසු නොගෙවන ණය මුදල් ගැන වහාම භාණ්ඩාගාරයට දන්වන්නය කියා නියමයක් කළා. ඒ මුදල් ආපසු අය කර ගැනීමට විශේෂ උනන්දුවක් ගන්නය කියා නියමයක් කළා. යටියන්තොට ගරු මන්ත්‍රීතුමාත් එය පිළිගන්නවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ෂෙල්ටන් ජයසිංහ]

නාංගල්ල ප්‍රදේශයේ වූ සිද්ධියක් ගැන මා දැන් කියන්නම්. ඒ මහත්මයාගේ නම සඳහන් කරන එක හරි නැහැ. නමුත් වුවමනා නම් මා නමුන්නාන්සේට මේ ලියවිලි පෙන්වන්නම්. රුපියල් 20,169.79 ක් 1962 දී ගත්තා. 1967 වන තුරුත් කීය ද ගෙවා තිබෙන්නේ ? රු. 275 යි. එසේ නම් නමුන්නාන්සේ කියනවාද මට ඒ බෝට්ටු අල්ලන්න එපාය කියා. මොකක් කරන්නය කියලද නමුන්නාන්සේ කියන්නේ ?

**ද මැල් මයා.**

*(திரு. டி மெல்)*

(Mr. de Mel)

ටික කලකට සහනයක් දෙන්න.

**ගරු ෂෙල්ටන් ජයසිංහ**

*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)*

(The Hon. Shelton Jayasinghe)

අන්න දැන් ටිකක් නමුන්නාන්සේගෙ සැර අඩු වුණා. ඊ ළඟට බලන්න වැලිගම් කොට්ඨාශයේ—ගරු ඇමතිතුමාගේ කොට්ඨාශයේ—රු. 20,170 ක් 1963 දී ගත් කෙනෙක් අද වන තුරු ගෙවා තිබෙන්නේ රු. 170 යි.

**ද මැල් මයා.**

*(திரு. டி மெல்)*

(Mr. de Mel)

වැලිගම කොට්ඨාශයේත් "සීස්" කරනවාද ?

**ගරු ෂෙල්ටන් ජයසිංහ**

*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)*

(The Hon. Shelton Jayasinghe)

ඔව්. අදත් ඒ ප්‍රදේශයේ බෝට්ටුවක් අල්ලා පැමිණිල්ලක් ආවා. වැලිගම පී. එච්. අන්දිරිස් අප්පු නමැත්තා 1962 සැප්තැම්බර් මාසේ රු. 20,170 ක් අරගෙන අද වන තුරු ගෙවා තිබෙන්නේ රු. 529 යි. ඉතින් නමුන්නාන්සේලා කියන්නේ මොනවා කරන්න කියලද ? නමුන්නාන්සේලා කියනවා නම් මේක නොමිලේ දෙන්නය කියා, නැගිටලා එහෙම කියන්න. මහජන බදුවලින් අය කරන මුදල්වලින් මේ උදවියට නොමිලේ බෝට්ටු දෙන්නය කියනවා නම් එසේ කියන්න. දැන් ඔය විධියට සහන සැලසිය යුතු අයගේ ලැයිස්තුවක් මෙහි දී තිබෙනවා. මා කිව්වා, මාස යක් කල් දෙන්නම්, මාර්තු මාසෙ අවසන් වන්නට කලින් රුපියල් දාහක් බඳින්නය, ඉන් පසු ගෙවන්නට තිබෙන මුදල් හිඟයක් නැතිව ගෙවන්න ඕනැය කියා. අපේ යටියන්තොට මන්ත්‍රීතුමා (ආචාර්ය එන්. එම්. පෙරේරා) එදා එහෙම නොවෙයි කිව්වෙ. එක පාරටම අල්ලන්න කිව්වා. දැන් මේ විධියට සහනයක් අපි සලසා තිබීම කොපමණ හොඳද ? මා හිතනවා, දෙව්වනුර මන්ත්‍රීතුමාගේ (ද මැල් මයා.) ප්‍රශ්නයට සම්පූර්ණ වශයෙන් පිළිතුරු ලැබුණාය කියා.

ශාඛාවක් වෙනත් තැනකට ගෙන යාම ගැන එතුමා ප්‍රශ්නයක් මතු කළා. බෝට්ටු 40යි, බෝට්ටු 300 යි, බෝට්ටු 200 යි කියා බලා මේක කරන්න පුළුවන් කමක් නැහැ.

**එල්. සී. ද සිල්වා මයා.**

*(திரு. எல். சீ. டி சில்வா)*

(Mr. L. C. de Silva)

නමුත් නගරයේ මධ්‍යස්ථානය එතැනයි.

**ගරු ෂෙල්ටන් ජයසිංහ**

*(கௌரவ ஷெல்ற்றன் ஜயசிங்ஹ)*

(The Hon. Shelton Jayasinghe)

ලොකු කුඩා බලා රාජකාරි කරන්නට බැහැ. පුළුවන් තරම් ශාඛා අපි පිහිටුවන්න ඕනැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ද මෙල් මයා.
(திரு. டி மெல்)
(Mr. de Mel)
එහි තිබෙන ශාඛාව ගෙන යනවා ද?

ගරු ෂෙල්ටන් ජයසිංහ
(கௌரவ ஷெல்டன் ஜயசிங்ஹ)
(The Hon. Shelton Jayasinghe)
කිසිම වෙනසක් කරන්නේ නැහැ. අපි පුළුවන් තරම් ශාඛා ඇති කරන්නයි බලා පොරොත්තු වන්නේ.

කල් තැබීම

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பெற்று ஏற்றுக்கொள்ளப்பட்டது.
*Question put, and agreed to.*

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 7.25 ට 1968 පෙබරවාරි 25 වන ඉරිදා පූ. භා. 10 වන තෙක් කල් ගියේය.

அதன்படி சபை பி. ப. 7.25 க்கு, 1968 பெப்ருவரி 25, ஞாயிற்றுக்கிழமை மு.ப. 10 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.

*Adjourned accordingly at 7.25 P.M. until 10 A.M. on Sunday, 25th February, 1968.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

## WRITTEN ANSWERS TO QUESTIONS

### මෝටර් වාහනවලින් ආදායම

### மோட்டார் வாகன வருமானம்

### REVENUE FROM MOTOR VEHICLES

517/67

**ආර්. සිංගල්ටන්-සැමන් මයා.** (පත් කරන ලද මන්ත්‍රී)

(திரு. ஆர். சிங்கல்டன்-சமன்—நியமன அங்கத்தவர்)

(Mr. R. Singleton-Salmon—Appointed Member)

ප්‍රවාහණ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: 1962/63; 1963/64; 1964/65 සහ 1965/66 යන මූදල් වර්ෂ සඳහා පහත සඳහන් ශීර්ෂ යටතේ ලබා ගන්නා ලද මුළු ආදායම කොපමණද? (i) මෝටර් වාහන ලියාපදිංචි කිරීම; (ii) රියැදුරු බලපත්‍ර; (iii) යෝග්‍යතා සහතික; (iv) කොන්දොස්තර සහ ටිකට් පරීක්ෂක බලපත්‍ර; (v) අනුපිටපත් සහතික හා බලපත්‍ර; (vi) මෝටර් වාහන අන්සතු කිරීම්; (vii) මෝටර් වාහන නැවත විකිණීම්; (viii) ගමනාගමන බලපත්‍ර; (xi) පුද්ගලික කෝච් රථ අවසර පත්‍ර; (x) වෙළඳ බලපත්‍ර?

போக்குவரத்து அமைச்சரைக் கேட்ட வினா: 1962-63, 1963-64, 1964-65, 1965-66 ஆகிய நிதி ஆண்டுகளில் பின்வரும் தனித்தனித் தலைப்புகளில் சேகரிக்கப்பட்ட மொத்த வருமானம் என்ன: (i) மோட்டார் வாகனப் பதிவு, (ii) வாகனம் செலுத்தும் உத்தரவுச் சீட்டுகள், (iii) தகுதிச் சான்றிதழ்கள், (iv) பஸ் நடத்துநர், சீட்டுப் பரிசோதகர் உத்தரவுச் சீட்டுகள், (v) இணைப்படிச் சான்றிதழ்களும், உத்தரவுச் சீட்டுகளும், (vi) மோட்டார் வாகன மாற்றங்கள், (vii) மோட்டார் வாகன மறுவிற்பனை, (viii) வழிவரையறை அனுமதிச்சீட்டுகள், (ix) சொந்த வண்டி அனுமதிச்சீட்டுகள், (x) வணிகர் உத்தரவுச் சீட்டுகள்?

asked the Minister of Communications: What was the total revenue collected under each of the following heads for the financial years 1962-63; 1963-64; 1964-65: and 1965-66: (i) Registration of Motor Vehicles, (ii) Driving Licences, (iii) Certificates of Fitness, (iv) Conductors and Ticket Inspectors Licences, (v) Duplicate Certificate and Licences, (vi) Transfers of Motor Vehicles, (vii) Re-sale of Motor Vehicles, (viii) Stage Carriage Permits, (ix) Private Coach Permits, (x) Dealers Licences?

**ගරු ඊ. එල්. බී. හුරුල්ලේ** (ප්‍රවාහණ ඇමති)

(கௌரவ ஈ. எல். பி. ஹுருல்ல—போக்குவரத்து அமைச்சர்)

(The Hon. E. L. B. Hurulle—Minister of Communications)

1962–63, 1963–64, 1964–65 සහ 1965–66 යන මුදල් වර්ෂ සඳහා පහත සඳහන් ශීර්ෂ යටතේ ලබා ගන්නා ලද මුළු ආදායම මෙසේ ය :—

**I මෝටර් වාහන ලියාපදිංචි කිරීම**

| මුදල් වර්ෂය | | | ලැබූ ආදායම |
|---|---|---|---|
| | | | රු. |
| 1962–63 | ... | ... | 44,720 |
| 1963–64 | ... | ... | 43,465 |
| 1964–65 | ... | ... | 49,760 |
| 1965–66 | ... | ... | 50,250 |

**II රියදුරු බලපත්‍ර**

| | | | |
|---|---|---|---|
| 1962–63 | ... | ... | 4,96,049 |
| 1963–64 | ... | ... | 4,54,161 |
| 1964–65 | ... | ... | 4,68,811 |
| 1965–66 | ... | ... | 4,69,580 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

III යෝග්‍යතා සහතික

| | | | |
|---|---|---|---|
| 1962–63 | ... | ... | 6,80,268 |
| 1963–64 | ... | ... | 4,03,638 |
| 1964–65 | ... | ... | 4,92,568 |
| 1965–66 | ... | ... | 4,93,780 |

IV කොන්දෙස්තර සහ ටිකට් පරීක්ෂක බලපත්‍ර

| | | | |
|---|---|---|---|
| 1962–63 | ... | ... | 1,984 |
| 1963–64 | ... | ... | 1,434 |
| 1964–65 | ... | ... | 5,257 |
| 1965–66 | ... | ... | 4,940 |

V අනු පිටපත් සහතික සහ බලපත්‍ර

| | | | |
|---|---|---|---|
| 1962–63 | ... | ... | 25,797 |
| 1963–64 | ... | ... | 42,345 |
| 1964–65 | ... | ... | 43,307 |
| 1965–66 | ... | ... | 43,017 |

VI මෝටර් වාහන අන්සතු කිරීම

| | | | |
|---|---|---|---|
| 1962–63 | ... | ... | 6,32,744 |
| 1963–64 | ... | ... | 8,86,576 |
| 1964–65 | ... | ... | 6,77,631 |
| 1965–66 | ... | ... | 6,86,395 |

VII මෝටර් වාහන නැවත විකිණීම

| | | | |
|---|---|---|---|
| 1962–63 | ... | ... | 11,694 |
| 1963–64 | ... | ... | 3,10,513 |
| 1964–65 | ... | ... | 2,98,622 |
| 1965–66 | ... | ... | 4,33,782 |

VIII ගමනාගමන බලපත්‍ර

| | | | |
|---|---|---|---|
| 1962–63 | ... | ... | 29,537 |
| 1963–64 | ... | ... | 39,333 |
| 1964–65 | ... | ... | 31,119 |
| 1965–66 | ... | ... | 33,530 |

IX පුද්ගලික කෝච් රථ අවසර පත්‍ර

| | | | |
|---|---|---|---|
| 1962–63 | ... | ... | 450 |
| 1963–64 | ... | ... | 1,845 |
| 1964–65 | ... | ... | 4,825 |
| 1965–66 | ... | ... | 4,405 |

X වෙළඳ බලපත්‍ර

| | | | |
|---|---|---|---|
| 1962–63 | ... | ... | 502 |
| 1963–64 | ... | ... | 500 |
| 1964–65 | ... | ... | 330 |
| 1965–66 | ... | ... | 500 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1962-63 ஆம், 1963-64 ஆம், 1964-65 ஆம், 1965-66 ஆம் நிதி ஆண்டில் கீழே கொடுக்கப்பட்டுள்ள தலைப்புக்கள் ஒவ்வொன்றினதின் கீழ் வசூல் செய்யப்பட்ட முழு வருமானம் பின்வருமாறு :

### I. மோட்டார் வாகனங்களின் பதிவு

| நிதி ஆண்டு | வசூல் செய்யப் பட்ட வருமானம் ரூபா |
|---|---|
| 1962-63 .. .. .. | 44,720 |
| 1963-64 .. .. .. | 43,465 |
| 1964-65 .. .. .. | 49,760 |
| 1965-66 .. .. .. | 50,250 |

### II. சாரதி லைசென்சுகள்

| | |
|---|---|
| 1962-63 .. .. .. | 496,049 |
| 1963-64 .. .. .. | 454,161 |
| 1964-65 .. .. .. | 468,811 |
| 1965-66 .. .. .. | 469,580 |

### III. தகுதிச்சான்றிதழ்கள்

| | |
|---|---|
| 1962-63 .. .. .. | 680,268 |
| 1963-64 .. .. .. | 403,638 |
| 1964-65 .. .. .. | 492,568 |
| 1965-66 .. .. .. | 493,780 |

### IV. கண்டக்டர்களினதும் ரிக்கட் பரிசோதகர்களினதும் லைசென்சுகள்

| | |
|---|---|
| 1962-63 .. .. .. | 1,984 |
| 1963-64 .. .. .. | 1,434 |
| 1964-65 .. .. .. | 5,257 |
| 1965-66 .. .. .. | 4,940 |

### V. சான்றிதழ்களினதும் அனுமதிப்பத்திரங்களினதும் பிரதிகள்

| | |
|---|---|
| 1962-63 .. .. .. | 25,797 |
| 1963-64 .. .. .. | 42,345 |
| 1964-65 .. .. .. | 43,307 |
| 1965-66 .. .. .. | 43,017 |

### VI. மோட்டார் வாகனங்கள் மாற்றம்

| | |
|---|---|
| 1962-63 .. .. .. | 632,744 |
| 1963-64 .. .. .. | 886,576 |
| 1964-65 .. .. .. | 677,631 |
| 1965-66 .. .. .. | 686,395 |

### VII. மோட்டார் வாகனங்கள் மறு விற்பனை

| | |
|---|---|
| 1962-63 .. .. .. | 11,694 |
| 1963-64 .. .. .. | 310,513 |
| 1964-65 .. .. .. | 298,622 |
| 1965-66 .. .. .. | 433,782 |

### VIII. பிராந்திய காவு உத்தரவுப்பத்திரங்கள்

| | |
|---|---|
| 1962-63 .. .. .. | 29,537 |
| 1963-64 .. .. .. | 39,333 |
| 1964-65 .. .. .. | 31,119 |
| 1965-66 .. .. .. | 33,530 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

IX. பிரத்தியேக கோச்சு வண்டி உத்தரவுப்பத்திரங்கள்

| | | | | |
|---|---|---|---|---|
| 1962-63 | .. | .. | .. | 450 |
| 1963-64 | .. | .. | .. | 1,845 |
| 1964-65 | .. | .. | .. | 4,825 |
| 1965-66 | .. | .. | .. | 4,405 |

X. விற்பனையாளர் அனுமதிப்பத்திரங்கள்

| | | | | |
|---|---|---|---|---|
| 1962-63 | .. | .. | .. | 502 |
| 1963-64 | .. | .. | .. | 500 |
| 1964-65 | .. | .. | .. | 330 |
| 1965-66 | .. | .. | .. | 500 |

The total revenue collected under each of the following heads for the financial years 1962–63, 1963–64, 1964–65 and 1965–66 is as follows :

*I. Registration of Motor Vehicles*

| *Financial Year* | | | | *Revenue Collected Rs.* |
|---|---|---|---|---|
| 1962–63 | .. | .. | .. | 44,720 |
| 1963–64 | .. | .. | .. | 43,465 |
| 1964–65 | .. | .. | .. | 49,760 |
| 1965–66 | .. | .. | .. | 50,250 |

*II. Driving Licences*

| | | | | |
|---|---|---|---|---|
| 1962–63 | .. | .. | .. | 496,049 |
| 1963–64 | .. | .. | .. | 454,161 |
| 1964–65 | .. | .. | .. | 468,811 |
| 1965–66 | .. | .. | .. | 469,580 |

*III. Certificates of Fitness*

| | | | | |
|---|---|---|---|---|
| 1962–63 | .. | .. | .. | 680,268 |
| 1963–64 | .. | .. | .. | 403,638 |
| 1964–65 | .. | .. | .. | 492,568 |
| 1965–66 | .. | .. | .. | 493,780 |

*IV. Conductors and Ticket Inspectors Licences*

| | | | | |
|---|---|---|---|---|
| 1962–63 | .. | .. | .. | 1,984 |
| 1963–64 | .. | .. | .. | 1,434 |
| 1964–65 | .. | .. | .. | 5,257 |
| 1965–66 | .. | .. | .. | 4,940 |

*V. Duplicate Certificates and Licences*

| | | | | |
|---|---|---|---|---|
| 1962–63 | .. | .. | .. | 25,797 |
| 1963–64 | .. | .. | .. | 42,345 |
| 1964–65 | .. | .. | .. | 43,307 |
| 1965–66 | .. | .. | .. | 43,017 |

*VI. Transfer of Motor Vehicles*

| | | | | |
|---|---|---|---|---|
| 1962–63 | .. | .. | .. | 632,744 |
| 1963–64 | .. | .. | .. | 886,576 |
| 1964–65 | .. | .. | .. | 677,631 |
| 1965–66 | .. | .. | .. | 686,395 |

*VII. Re-sale of Motor Vehicles*

| | | | | |
|---|---|---|---|---|
| 1962–63 | .. | .. | .. | 11,694 |
| 1963–64 | .. | .. | .. | 310,513 |
| 1964–65 | .. | .. | .. | 298,622 |
| 1965–66 | .. | .. | .. | 433,782 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

*VIII. Stage Carriage Permits*

| | |
|---|---|
| 1962–63 .. .. .. | 29,537 |
| 1963–64 .. .. .. | 39,333 |
| 1964–65 .. .. .. | 31,119 |
| 1965–66 .. .. .. | 33,530 |

*IX. Private Coach Permits*

| | |
|---|---|
| 1962–63 .. .. .. | 450 |
| 1963–64 .. .. .. | 1,845 |
| 1964–65 .. .. .. | 4,825 |
| 1965–66 .. .. .. | 4,405 |

*X. Dealers Licences*

| | |
|---|---|
| 1962–63 .. .. .. | 502 |
| 1963–64 .. .. .. | 500 |
| 1964–65 .. .. .. | 330 |
| 1965–66 .. .. .. | 500 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

PUBLIC LIBRARY
JAFFNA.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දායක මුදල් : මුදල් ගෙවන දිනෙන් පසුව ඇරඹෙන මාසයේ සිට මාස 12ක් සඳහා රු. 32.00යි. අශෝධිත පිටපත් සඳහා නම් රු. 35.00යි. මාස 6කට ගාස්තුවෙන් අඩකි. පිටපතක් ශත 30යි. තැපෑලෙන් ශත 45යි. මුදල්, කොළඹ ගාලු මුවදොර, මහලේකම් කාර්යාලයේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කලින් එවිය යුතුය

சந்தா : பணம் கொடுத்த தேதியை யடுத்துவரும் மாதம் தொடக்கம் 12 மாதத்துக்கு ரூபா 32.00 (திருத்தப்படாத பிரதிகள் ரூபா 35.00). 6 மாதத்துக்கு அரைக்கட்டணம்; தனிப்பிரதி சதம் 30, தபால்மூலம் 45 சதம், முற்பணமாக அரசாங்க வெளியீட்டு அலுவலக அத்தியட்சரிடம் (த. பெ. 500, அரசாங்க கருமகம், கொழும்பு 1) செலுத்தலாம்

Subscriptions : 12 months commencing from month following date of payment Rs. 32.00 (uncorrected copies Rs. 35.00). Half rates for 6 months, each part 30 cents, by post 45 cents, payable in advance to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, Colombo 1

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org